204 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 204 - இல. 6
**Volume 204 - No. 6**

2011 නොවැම්බර් 28 වන සඳුදා
2011 நவம்பர் 28, திங்கட்கிழமை
**Monday, 28th November, 2011**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විසර්ජන පනත් කෙටුම්පත, 2012 - [පස්වන වෙන් කළ දිනය] :**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී

**කල් තැබීමේ යෝජනාව:**
උක් ගොවීන් මුහුණ දී ඇති ගැටලු

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012 : [ஒதுக்கப்பட்ட ஐந்தாம் நாள்]**
இரண்டாம் மதிப்பு – விவாதம் ஒத்திவைக்கப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
கரும்புச் செய்கையாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 2012 – [Fifth Allotted Day]
Second Reading – Debate Adjourned

ADJOURNMENT MOTION:
Problems faced by Sugarcane Cultivators

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2011 නොවැම්බර් 28 වන සඳුදා***
*2011 நவம்பர் 28, திங்கட்கிழமை*
*Monday, 28th November, 2011*

***පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 9.30 a.m.,* MR . SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2010 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්.- [රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2වැනි වගන්තියේ (3)වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2011 සැප්තැම්බර් 26 දිනැති අංක 1725/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නියමය.- [අධිකරණ අමාත්‍ය ගරු රවුෆ් හකීම් මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2008 වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ වාර්ෂික පාලන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ක්‍රීඩා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු බෂීර් සෙගු ඩාවුඩ් මහතා (සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பசீர் சேகு தாவூத் - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக பிரதி அமைச்சர்)
(The Hon. Basheer Segu Dawood - Deputy Minister of Co-operatives and Internal Trade)

Hon. Speaker, I present a petition received from Mr. M. H. M. Rafeek of No.45/2, Yamuna Mawatha, Katugastota, Kandy.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බලන්ගොඩ, විකිලිය ගොඩවෙල පදිංචි ඒ.ඩබ්ලිව්. විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) බලන්ගොඩ, රත්මලවින්න, ජිනරතනගම පදිංචි ජේ.ඒ.ඩී. පද්මසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### වේවැස්ස වත්තේ පේළි නිවාස : ප්‍රතිසංස්කරණය
### வேவெஸ்ஸ தோட்ட லயன் வீடுகள்: புனரமைப்பு
### LINE ROOMS IN WEWESSA ESTATE : REPAIRS

1326/’11

3. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, වේවැස්ස වත්තේ වර්ෂ

[ගරු බුද්ධික පතිරණ මහතා]

සීයයකට වඩා පැරණි පේළි නිවාසවල සෙවිලි තහඩු සහ වහලය දිරාපත් වී ඇති බවත්;

(ii) එම හේතුවෙන් කම්කරු පවුල් 120ක් පමණ දැඩි අසරණ තත්ත්වයකට පත් වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම නිවාස කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பதுளை மாவட்டத்தில் பதுளை பிரதேச செயலாளர் பிரிவைச் சேர்ந்த வேவெஸ்ஸ தோட்டத்தின் நூறு ஆண்டுகளைவிடப் பழமைவாய்ந்த 'லயன்' வீடுகளின் கூரைத்தகடுகளும் கூரையும் இற்றுப்போய் உள்ளதென்பதையும்;

(ii) இக்காரணத்தால் சுமார் 120 தொழிலாளிகளின் குடும்பங்கள் மிகவும் நிர்க்கதி நிலைக்குள்ளாகியுள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வீடுகளைத் துரிதமாகப் புனரமைக்க நடவடிக்கை எடுப்பாரா;

(ii) இதற்கென நிதி ஏற்பாடுகள் ஒதுக்கீடுகள் செய்யப்பட்டுள்ளனவா;

(iii) ஆமெனில், அப்பணிகள் ஆரம்பிக்கப்படும் திகதி யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Is he aware that-

(i) the roofing sheets and the structures of roofs of the line rooms in Wewessa Estate in Badulla Divisional Secretary's Division in Badulla District, which are more than hundred years old, have fallen into decay;

(ii) as a result, nearly 120 families of labourers have become destitute?

(b) Will he inform this House-

(i) whether action will be taken to repair these houses speedily;

(ii) whether allocations have been made for this purpose; and

(iii) the date on which repair work will be started, if allocations have been made?

If not, why ?

**ගරු මහින්ද සමරසිංහ මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க - பெருந்தோட்டக் கைத் தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ වේවැස්ස වතුයායේ පැරණිම පේළි නිවාසය අවුරුදු 80ක් පමණ පැරණිය. වතුයායේ කම්කරු නිවාස 105ක් තුළ ලයින් කාමර 482ක් ඇති අතර, එයින් නිවාස ඒකක 50ක ඇති කාමර 239ක වහල නැවත සෙවිලි කර ඇත. ලයින් කාමර 482න් 278කම ජීවත් වනුයේ වතුයායේ සේවය නොකරන පුද්ගලයින්ය.

(ii) කම්කරු නිවාස ඒකක 55ක් තුළ ලයින් කාමර 243ක වහල නැවත සෙවිලි කිරීමට ඇත.

(ආ) (i) වාර්ෂිකව වෙන් කරනු ලබන ප්‍රතිපාදන අනුව එම නිවාස ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන බව බලංගොඩ වැවිලි සමාගම දන්වා ඇත. අපි ඒ අයට ලිව්වා. ඒ අනුව පිළිතුරක් ඇවිල්ලා තිබෙනවා.

නිවාස ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස වතු සමාගම්වලට දැනටමත් දන්වා ඇත.

(ii) ඉහත (ආ) (i) පරිදි වෙන් කරනු ලබන ප්‍රතිපාදන අනුව එම නිවාස ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

(iii) වෙන් කරන ලද ප්‍රතිපාදන මත ප්‍රතිසංස්කරණ කටයුතු අඛණ්ඩව සිදු කෙරේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. වැවිලි සමාගම්වලට අයිති වතුවල ජීවත් වන අයට පහසුකම් සැලසීම වැවිලි සමාගමේ වග කීමක් කියන එක මා පිළිගන්නවා. ඊට අමතරව මෙවැනි සමහර ස්ථානවලට වැවිලි සමාගමේ මැදිහත් වීමක් නැත්නම් ඔබතුමාගේ අමාත්‍යාංශය සහ නිවාස අමාත්‍යාංශයත් මැදිහත් වෙලා ඒවායේ ජීවත් වන අහිංසක කම්කරු ජනතාවට පිළිසරණක් දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද?

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

ඒක සාධාරණ ඉල්ලීමක් කියලා මා හිතනවා. අපි ඒ පිළිබඳ නිවාස අමාත්‍යාංශය එක්කත් කථා කරලා, ඉදිරියේ දී කටයුතු කරන ආකාරය ඔබතුමාට පසුව දැනුම් දෙන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ වැවිලි සමාගම්වලට අයත් වතුවල මාර්ග පද්ධතිය බොහොම අබලන් තත්ත්වයක තිබෙනවා. එය ප්‍රතිසංස්කරණය කරන්නට ඒ අයට එච්චර වුවමනාවකුත් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මන්ත්‍රීතුමා, ඒ අතුරු ප්‍රශ්නය ප්‍රධාන ප්‍රශ්නයට අදාළද? වෙලාව ගත වනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඔව්. ඇමතිතුමා බොහොම ධනාත්මක ප්‍රතිචාර දක්වන ඇමතිතුමෙක් නේ ගරු කථානායකතුමනි. ඒ නිසා ඇමතිතුමා සතුටු නම් මට ඒ සඳහාත් මැදිහත් වීමක් කරන්න පුළුවන්කමක් තිබෙනවා.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

අපි ඒ පිළිබඳව කටයුතු කරන්න දැනටමත් පියවර ගෙන තිබෙනවා, ගරු කථානායකතුමනි. අපේ අමාත්‍යාංශය සමත් වෙලා තිබෙනවා, මුදල් කොමිසම හරහා 2012 වර්ෂය සඳහා රුපියල් මිලියන 130ක් වෙන් කර ගන්න, මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කරලා, මීට වඩා හොඳ තත්ත්වයකට ගෙනෙන්න. විශේෂයෙන්ම වතු සමාගම්වල පමණක් නොවෙයි, කුඩා වතු හිමියන්ගේත් ගමනා ගමනය අපහසු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා, මේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම අපි බලාපොරොත්තු වන විධියට කරපු නැති නිසා. ඒ නිසා මේ රුපියල් මිලියන 130න් රුපියල් මිලියන 50ක් වැවිලි සමාගම්වලට දෙන්න අපි තීරණයක් ගෙන තිබෙනවා. ඒ වාගේම රුපියල් මිලියන 80ක් කුඩා වතු හිමියන්ගේ සංවිධාන හරහා කරන ඉල්ලීම් ක්‍රියාත්මක කරන්න ලබා දෙන්නත් අපි තීරණය කර තිබෙනවා.

මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න යන්නේ අදාළ පළාත් සභා හරහායි. ඒ අයට තමයි මුදල් කොමිසමෙන් මුදල් දෙන්නේ. හැබැයි අපේ නිර්දේශය මත තමයි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළ යුත්තේ කියන එක අපි පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. ලබන වර්ෂයේ ඉඳලා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අප බලාපොරොත්තු වනවා කියන එක මම සතුටින් ප්‍රකාශ කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය. ඒ වතු කම්කරු ජනතාවට උප්පැන්න සහ ජාතික හැඳුනුම් පත් පිළිබඳ අර්බුදයක් තිබෙනවා. ඒ අර්බුදය මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස මැතිවරණ කොට්ඨාසයේ තිබෙනවා; මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේත් තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් මැදිහත් වීමක් කරන්න බලාපොරොත්තු වෙනවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නය අදාළ නැහැ.

## සපුගස්කන්ද තෙල් පිරිපහදුව: එල්පී ගෑස් නිෂ්පාදනය
### சப்புகஸ்கந்த எண்ணெய் சுத்திகரிப்பு நிலையம் : எல்.பீ. எரிவாயு உற்பத்தி
### SAPUGASKANDA OIL REFINERY : LP GAS OUTPUT

1104/'11

6. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ දෛනිකව නිෂ්පාදනය කරන එල්පී ගෑස් ප්‍රමාණය කොපමණද;

(ii) පසු ගිය වර්ෂයේ ජනවාරි මස සිට මේ දක්වා මාසිකව නිෂ්පාදනය කරන ලද එල්. පී. ගෑස් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාල සීමාව තුළදී මාසිකව අළෙවි කරන ලද එල්පී ගෑස් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්පී ගෑස් ටොන් එකක් අළෙවි කරන මිල රුපියල්වලින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසු ගිය වර්ෂයේ දෙසැම්බර් මස අගදී සහ මෙම වර්ෂයේ ජනවාරි මස මුල් කාලයේදී නිෂ්පාදනය කරන ලද එල්පී ගෑස් ප්‍රයෝජනයට නොගෙන පුලුස්සා දමා තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(iii) එල්පී ගෑස් එලෙස පුලුස්සා දැමීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சப்புகஸ்கந்த எண்ணெய் சுத்திகரிப்பு நிலையத்தில் நாளாந்தம் உற்பத்தி செய்யப்படும் எல் பீ. எரிவாயுவின் அளவு எவ்வளவு என்பதையும்;

(ii) கடந்த வருடம் ஜனவரி மாதம் தொடக்கம் இது வரை மாதாந்தம் உற்பத்தி செய்யப்பட்ட எல்.பீ. எரிவாயுவின் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) அந்த கால எல்லைக்குள் மாதாந்தம் விற்பனை செய்யப்பட்ட எல்.பீ. எரிவாயுவின் அளவு வெவ் வேறாக எவ்வளவு என்பதையும்;

(iv) ஒரு தொன் எல். பீ. எரிவாயுவின் விற்பனை விலை ரூபாக்களில் எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) கடந்த வருடம் டிசம்பர் மாத இறுதியிலும் இவ்வருடம் ஜனவரி மாத முற்பகுதியிலும் உற்பத்திசெய்யப்பட்ட எல்.பீ. எரிவாயு பயன் படுத்தப்படாமல் எரிக்கப்பட்டுள்ளதா என்ப தையும்;

(ii) அவ்வாறெனின் அதன் அளவு எவ்வளவு என்ப தையும்;

(iii) எல்.பீ. எரிவாயு அவ்வாறு எரிக்கப்படுவதற்கான காரணம் யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Petroleum Industries:

(a) Will he state-

(i) the daily L.P. Gas output of the Sapugaskanda oil refinery; separately, the L.P. Gas output from January last year up to date on monthly basis;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(ii) separately the amounts of L.P. Gas sold monthly during that period; and

(iii) the price in rupees, at which a ton of L.P. Gas is sold ?

(b) Will he state-

(a) whether L.P. Gas produced at the latter part of December last year and the early part of January this year was burnt without being used for any purpose;

(b) if so, the volume of the Gas so burnt; and

(c) the reasons that led to the burning of L.P. Gas as mentioned above ?

(c) If not, why?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ දෛනික එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 50-100ත් අතර පවතී. එය යෙදවුම් බොර තෙල් වර්ගය, බොර තෙල්වල සංයුතිය, පිරිපහදුවේ මෙහෙයුම් ධාරිතාව සහ නිෂ්පාදන ඒකකවල කාර්යක්ෂමතාව මත වෙනස් වේ.

(ii) (iii) සහ (iv) පිළිතුරු සඳහා කරුණාකර ඇමුණුම බලන්න. ඇමුණුම **සභාගත*** කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, (ii) (iii) සහ (iv) කියන කොටස් තුනටම මම එක වර උත්තර දෙන්නම්. ඒවාට අදාළ උත්තර columns තුනකයි තිබෙන්නේ.

ඇමුණුම අනුව, 2010 ජනවාරි මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,574යි. අළෙවිය මෙට්‍රික් ටොන් 2,522යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 8,480යි. පෙබරවාරි මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 463යි. අළෙවිය මෙට්‍රික් ටොන් 729යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 8,463යි. මාර්තු මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 509යි. අළෙවිය මෙට්‍රික් ටොන් 342යි. මෙට්‍රික්ටොන් එකක මිල රුපියල් 8,297යි.

සාමාන්‍යයෙන් ජනවාරි මාසයේ නිෂ්පාදනය වෙලා තිබෙන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2,574යි. පෙබරවාරි සහ මාර්තු මාස දෙකේ 463යි, 509යි කියන මෙට්‍රික් ටොන් ප්‍රමාණයට අඩු වන්න හේතුව, 2010 පෙබරවාරි 08 වන දින සිට මාර්තු 20 දක්වා කාලය තුළ නඩත්තු සඳහා තෙල් පිරිපහදුව වසා තැබීමයි.

2010 අප්‍රේල් මාසයේදී එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,317යි. අළෙවිය මෙට්‍රික් ටොන් 2,322යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 8,256යි. 2010 මැයි මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,141යි. අළෙවිය මෙට්‍රික් ටොන් 2,036යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 8,237යි. 2010 ජුනි මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,396යි. අළෙවිය මෙට්‍රික් ටොන් 2,460යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 7,678යි. 2010 ජූලි මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,337යි. අළෙවිය මෙට්‍රික් ටොන් 2,455යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 7,110යි. 2010 අගෝස්තු මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,239යි. අළෙවිය මෙට්‍රික් ටොන් 2,054යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 6,699යි. 2010 සැප්තැම්බර් මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,261යි. අළෙවිය මෙට්‍රික් ටොන් 2,252යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 7,288යි. 2010 ඔක්තෝබර් මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,196යි. අළෙවිය මෙට්‍රික් ටොන් 2,238යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 9,225යි. 2010 නොවැම්බර් මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,835යි. අළෙවිය මෙට්‍රික් ටොන් 2,056යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 10,229යි. 2010 දෙසැම්බර් මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,659යි. අළෙවිය මෙට්‍රික් ටොන් 1,316යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 12,065යි. නොවැම්බර් සහ දෙසැම්බර් මාස දෙකේදී සාමාන්‍ය ප්‍රමාණයට වඩා ටොන් 400ක් පමණ අඩු වෙලා තිබෙන්නේ උත්ප්‍රේරක යථා තත්ත්වයට පත් කිරීම සඳහා පළමුවන දා සිට 12 වන දින දක්වා වසා තැබීම නිසායි.

2011 ජනවාරි මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,845යි. විකුණුම් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2,838යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 10,338යි. 2011 පෙබරවාරි මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,633යි. අළෙවිය මෙට්‍රික් ටොන් 2,828යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 9,074යි.

2011 මාර්තු මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,584යි. අළෙවිය මෙට්‍රික් ටොන් 2,487යි. මෙට්‍රික්ටොන් එකක මිල රුපියල් 9, 467.00යි. 2011 අප්‍රේල් මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,564යි. අළෙවිය මෙට්‍රික් ටොන් 2,748යි. මෙට්‍රික් ටොන් එකක මිල රුපියල් 9833.00යි. 2011 මැයි මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,643යි. 2011 ජුනි මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,978යි. 2011 ජූලි මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,785යි. මේ මාස තුනේ සාමාන්‍ය ප්‍රමාණයට වඩා අඩු වීමක් වෙලා තිබෙන්නේ උත්ප්‍රේරක යථා තත්ත්වයට පත් කිරීම සඳහා 18 වන දා සිට 27 දක්වා වසා තැබීම නිසායි. 2011 අගෝස්තු මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 832යි. 2011 සැප්තැම්බර් මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,345යි. 2011 ඔක්තෝබර් මාසයේ එල්පී ගෑස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,561යි. උත්ප්‍රේරක අලුතින් දැමීම සඳහා 15 සිට 31 දින දක්වා පිරිපහදුව වසා තැබීම සිදු වෙලා තිබෙනවා. නැවත පෙට්‍රල් නිෂ්පාදනය වැඩිවීමත් සමඟ උත්ප්‍රේරක අලුතින් දැමීමෙන් පසු, එල්පී ගෑස් නිෂ්පාදනය අඩු වෙලා පෙට්‍රල් නිෂ්පාදනය වැඩි වී තිබෙනවා.

(ආ) (i) 2010 දෙසැම්බර් 28, 29, 30, 31 හා 2011 ජනවාරි 01 දිනයන්හි කෙටි කාල සීමාවක් තුළ පිරිපහදුවේ ඇති දියර වායු (LPG) ටැංකිවල ඉඩ ප්‍රමාණය, දෛනිකව නිෂ්පාදනය වන දියර වායු ප්‍රමාණය

ගබඩා කර ගැනීමට ප්‍රමාණවත් නොවන තත්ත්වයක් උදා විය. නමුත්, මෙම කෙටි කාල සීමාව තුළ දියර වායු නිෂ්පාදනය වන ප්‍රමාණය, පැවතුණ ටැංකිවල ඉඩ ප්‍රමාණයට සරිලන පරිදි අඩු කර ගැනීමෙන් මෙම තත්ත්වය කළමනාකරණය කර ගත හැකි විය. මෙම කාල සීමාව තුළ අඩු වූ දියර වායු ප්‍රමාණය, යන්ත්‍රාගාරයේ තාප උඳුන් හා බොයිලේරුවල දහනය කරන දැවි තෙල් (Fuel Oil) ප්‍රමාණය අඩු කර ඒ වෙනුවට දැවි වායුව (Fuel Gas) සමඟ උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනුණි.

(ii) 2010 දෙසැම්බර් මස 28 දින සිට 2011 ජනවාරි මස 01 වන දින දක්වා කාලය තුළ තාප උඳුන්වල පුලුස්සා දැමූ අමතර ගෑස් ප්‍රමාණය උපරිමය ටොන් 03කි.

(iii) මේ සඳහා හේතු වූයේ එකම පාරිභෝගිකයා වන ලාෆ්ස් ගෑස් සමාගම සතුව ප්‍රමාණවත් ගබඩා පහසුකම් ඒ වනවිට ටැංකිවල නොතිබීම නිසාත්, දෛනික එල්පී ගෑස් නිෂ්පාදනය ඔවුන් නිරන්තරයෙන් ලබා නොගත් නිසාත්ය. නමුත් මේ වන විට ලිට්‍රෝ සමාගම සහ ලාෆ්ස් සමාගම කියන සමාගම් දෙකටම පිරිපහදුව නිෂ්පාදනය කරන එල්පී ගෑස් ලබා දෙන නිසා දැන් මේ තත්ත්වය පැන නඟින්නේ නැත.

(ඈ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

2010 ජනවාරි මස සිට 2011 ඔක්තෝබර් මස දක්වා එල්.පී. ගෑස් නිෂ්පාදනය, එල්.පී. ගෑස් අලෙවිය සහ එල්.පී. ගෑස් ටොන් එකක් අලෙවි කරන මිල රුපියල් වලින්

| මාසය | එල්.පී. ගෑස් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | එල්.පී. ගෑස් අලෙවිය (මෙට්‍රික් ටොන්) | මෙට්‍රික් ටොන් එකක මිල (රු.) | වෙනත් |
|---|---|---|---|---|
| 2010 ජනවාරි | 2,574 | 2,522 | 8480.00 | |
| 2010 පෙබරවාරි | 463 | 729 | 8463.00 | 2010 පෙබරවාරි 8 සිට මාර්තු 20 දක්වා කාලය තුළ නඩත්තුව සඳහා වසා තැබීම |
| 2010 මාර්තු | 509 | 342 | 8297.00 | |
| 2010 අප්‍රේල් | 2,317 | 2,322 | 8256.00 | |
| 2010 මැයි | 2,141 | 2,036 | 8237.00 | |
| 2010 ජූනි | 2,396 | 2,460 | 7678.00 | |
| 2010 ජූලි | 2,337 | 2,455 | 7110.00 | |
| 2010 අගෝස්තු | 2,239 | 2,054 | 6699.00 | |
| 2010 සැප්තැම්බර් | 2,261 | 2,252 | 7288.00 | |
| 2010 ඔක්තෝබර් | 2,196 | 2,238 | 9225.00 | |
| 2010 නොවැම්බර් | 1,835 | 2,056 | 10229.00 | |
| 2010 දෙසැම්බර් | 1,659 | 1,316 | 12065.00 | උත්ප්‍රේරක යථාතත්ත්වයට පත් කිරීම සඳහා 1 සිට 12 දින දක්වා වසා තැබීම |
| 2011ජනවාරි | 2,845 | 2,838 | 10338.00 | |
| 2011 පෙබරවාරි | 2,633 | 2,828 | 9074.00 | |
| 2011 මාර්තු | 2,584 | 2,487 | 9467.00 | |
| 2011 අප්‍රේල් | 2,564 | 2,748 | 9833.00 | |
| 2011 මැයි | 1,643 | 1,418 | 10873.00 | උත්ප්‍රේරක යථාතත්ත්වයට පත් කිරීම සඳහා 18 සිට 27 දින දක්වා වසා තැබීම. |
| 2011 ජූනි | 1,978 | 2,158 | 9988.00 | |
| 2011 ජූලි | 1,785 | 1,765 | 9297.00 | |
| 2011 අගෝස්තු | 832 | 979 | 9584.00 | උත්ප්‍රේරක අලුතින් දැමීම සඳහා 15 සිට 31දින දක්වා වසා තැබීම. |
| 2011 සැප්තැම්බර් | 1,345 | 1,279 | 9310.00 | පෙට්‍රල් නිෂ්පාදනය වැඩි වීමත් සමඟ උත්ප්‍රේරක අලුතින් දැමීමෙන් පසු එල්.පී.ගෑස් නිෂ්පාදනය අඩු විය. |
| 2011ඔක්තෝබර් | 1,561 | 1,539 | 8766.00 | |

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඉතා කුඩා කරුණක් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා පිළිතුරක් දුන්නා. තෙල් සංස්ථාවේ සිද්ධ වෙන අපි කාටවත් සොයා ගන්න බැරි, අපි කවුරුවත් දන්නේ නැති, වැහීම සහ ඇරීම නිසා, නවතා දැමීම නිසා පිරිපහදුව හදන්න ගිහින් සිදු වෙච්ච දේවල් ගැන විස්තරයක් තමයි එතුමා කිව්වේ. ගරු ඇමතිතුමනි, මා විශේෂයෙන් කියන්න කැමැතියි, මේ පිරිපහදුව දින 16ක්ම වසා තිබුණු බව. සාමාන්‍යයෙන් මේ පිරිපහදුවේ ගෑස් මෙට්‍රික් ටොන් 16,000ක් හැදෙනවා. එක දවසකට මෙට්‍රික් ටොන් 1,000ක් හැදෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගෑස් හැදෙන්නේ 50ත් 100ත් අතරේ ප්‍රමාණයක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම කිව්වේ මෙට්‍රික් ටොන්වලින්.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

මෙට්‍රික් ටොන් 50ත් 100ත් අතරේ ප්‍රමාණයක් තමයි දවසකට හැදෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

හැබැයි වහලා තිබිච්ච දවස් ගණන බැලුවාම රුපියල් කෝටි 156ක් පාඩු වෙලා තිබෙනවා. ඒ ටික විකුණා ගත්තා නම් මුදල් කර ගන්න තිබුණා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

විකුණා ගන්න නිෂ්පාදනය වෙන්න එපායැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම කියන්නේ, දින 16ක් වසා තිබීම නිසා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ඕනෑම පිරිපහදුවක් -මේ පිරිපහදුව වුණත්- වර්ෂයකට මාස දෙකක කාලයක් වහලා, ඒ කාලය තුළ පිරිපහදුව නවීකරණය කරනවා. ඒක වාර්ෂිකව කරන්න ඕනෑ. ඒකට කියන්නේ "shutdown" කියායි. ලෝකයේ ඕනෑම පිරිපහදුවක ඒක කරනවා. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඛනිජ තෙල් කර්මාන්ත ඇමතිතුමා ඒකට උත්තර දේවි.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව මේ සැරේ එහෙම වුණේ මිලියන 200ක් වැය කරලා උත්ප්‍රේරකය කියන එක අපි අලුතෙන් ගෙනැල්ලා සවි කරපු නිසයි. ඒක සවි කරන්න නැවත වහන්න සිදු වුණා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි මම මේ අහන්නේ. මේ පාඩුව-

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
පාඩුවක් නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පාඩුවක් තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඒ කොහොමද පාඩුවක් තිබෙන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇයි, මේ දින 16ක් වැහීම නිසා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
දින 16ක් වැහුවාම නිෂ්පාදනය වෙන්නේ නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නිෂ්පාදනය වෙන්න තිබෙන එක නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මට පැටලෙන්න ඕනෑ නැහැ. මම ප්‍රශ්නය අහන්නම්. පළමුවන අතුරු ප්‍රශ්නය මම අහන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පළමුවන අතුරු ප්‍රශ්නය ඉවරයි. ඔය තුන්වන අතුරු ප්‍රශ්නයයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තෙල් සංස්ථාවේ සේවකයන් විසින් අතිගරු ජනාධිපතිතුමාට යවපු ලිපිය පදනම් කර ගෙනයි මම මේ කියන්නේ. මේකෙන් සිදු වෙච්ච කාරණය එතුමන්ලා කියලා තිබෙනවා. මම ඔබතුමාට දෙන්නම් ඒ ලිපිය. මම බොරු කථාවක් කියනවා නොවෙයි. කළමනාකරුවන් ඇතුළු ඔක්කෝම එකතු වෙලා මේකේ සිද්ධ වෙච්ච දේ තමයි මේ ලියලා තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන ප්‍රශ්නයට දීපු පිළිතුරට අනුව අතුරු ප්‍රශ්න කෙටියෙන් අහන්න ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ පාඩුව පිළිබඳව තමයි මම මේ කථා කළේ. ඒ නිසා මම පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාගෙන් අහන්නේ මෙයයි. මේ පිරිපහදුව කාන්දු වීම නිසා- [බාධා කිරීමක්] පසු ගිය කාලයෙත් තෙල් එක එක තැන්වලින් එනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විස්තර ඕනෑ නැහැ. ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉරානයේ ජනාධිපතිතුමා ඇවිල්ලා මේකට මුල්ගල තිබ්බා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මම මුල්ගලක් තිබ්බේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා නොවෙයි. ඊට කලින් හිටපු ඇමතිතුමා. ඔබතුමන්ලාගේ රජය නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමන්ලාගේ රජයෙන් තමයි මුල්ගල තිබ්බේ. දැන් ඒ මුල්ගල අනුව වැඩ කෙරෙනවාද, නැද්ද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, තෙල් පිරිපහදුවේ නවීකරණය සඳහා යෝජනාව සකස් කරලා අවසන් කරලා කේබීසී ආයතනය මඟින් ශක්‍යතා වාර්තාව ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාර්තාවේ කරුණු,

අපි මුලින් එකඟතාවට ආපු ඉරාන රජයට යවලා තිබෙනවා. ඔබතුමාත් ඉතා පැහැදිලිව දන්නවා, ජාත්‍යන්තර දේශපාලනය සහ මැද පෙරදිග තිබෙන තත්ත්වයන් තුළ අපට එයට ලැබෙන්නා වූ ප්‍රතිචාරය තවම ලැබිලා නැහැ කියලා. ඉදිරි කාලය තුළ අපට වෙනත් විකල්පයන් කරා පවා යන්න සිදු වෙන්න පුළුවන්.

ඒ වාතාවරණය තුළ වෙනත් විකල්පවලට ගිහිල්ලා තිබෙනවා. තවත් යෝජනා අපට ඇවිල්ලා තිබෙනවා. එම යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරපු SCARC එකට ඉදිරිපත් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් පිරිපහදුවක් හදන්න තීන්දු කරලා එහි සියලු දේ අවසන් කරන්න අවුරුදු 4ත්, 5ත් අතර කාලයක් යනවා. ඒක තමයි ගත වන කාලය. ලෝකයේ කොහේ හැදුවත් ඒ කාලය යනවා. හැබැයි, දැනට එහි මූලික කටයුතුවලින්, ඉඩම් පවරා ගැනීමේ කටයුතුවලින් සියයට 90ක් අපි අවසන් කරලා තිබෙනවා. ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කරමින් පරිසර වාර්තාව ලබා ගැනීමට අපි මේ වන විට කටයුතු කර තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඒක තමයි මම ඇහුවේ. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහන්නම්. ඉරාන ජනාධිපතිතුමා ඇවිල්ලා මුළු ලංකාව වටේම cut-outs ගහලා, කෝටි ගණන් වියදම් කරලා තැබුව මුල් ගල දැන් පැළ වෙලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ප්‍රශ්නය අදාළ නැත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේවා මිනිස්සුන්ගේ සල්ලි නේ. ඒ නිසා මම අහන්නේ, 2008 තිබ්බ මුල් ගල,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, දැන් ප්‍රශ්නය ඉවරයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉන්න. ඔබතුමා මගේ ප්‍රශ්නය අහන්න ඉඩ දෙයි කියලා මම විශ්වාස කරනවා. 2001දී අපේ ආණ්ඩුව යටතේ රුපියල් මිලියන 800කට ඇස්තමේන්තු කරලා හදන්න ලැහැස්ති වුණ එක තමයි ඔබතුමන්ලා ඇවිල්ලා නතර කළේ. ඒක නතර කරලා තමයි දැන් ඉරානයට දීලා තිබෙන්නේ. දැන් ඉරානයට දීපු එකත් නතර කරලා ඊටත් වඩා වැඩි ගණනකට වෙනත් රටකට ඒක දෙන්න හදනවා. මම කියන්නේ ඒකයි. කරුණාකරලා අපට කියන්න,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කියන එක නොවෙයි, දෙනවාද නැද්ද කියලා අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මොකක්ද මේකේ ක්‍රියාදාමය කියලා කරුණාකරලා අපට කියන්න. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. තෙල් ඇමතිවරු 5ක් විතර ඕනෑ නැහැ. තෙල්වලට වෙලා තිබෙන දේ ජේනවා නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හරි, මට ප්‍රශ්නය තේරුණා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හැම දාම අපේ තෙල් මිල වැඩි කරනවා. තෙල් මිල දවස ගාණේ වැඩි කරනවා. අය වැයටත් කලින් තෙල් මිල වැඩි කෙරුවා. [බාධා කිරීමක්] ඇමතිතුමා උත්තර දෙනකල් පොඩ්ඩක් ඉන්න. මේකේ තෙල් ඇමතිවරු 50ක් විතර ඉන්නවා. ඔපෙක් සංවිධානය වාගේ නේ මේක. මෙතැන ඔපෙක් එකේ වාගේ තෙල් ඇමතිවරු 50ක් විතර ඉන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන විධියට තමයි ඒක වෙන්නේ. කෙළින්ම ප්‍රශ්නය අහනවා නම් හරි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇහුවාම බාධා කරනවා නේ, ගරු කථානායකතුමනි.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මට තේරුණා, ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තෙල් ඇමතිතුමා නේ උත්තර දෙන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, අවසාන පිළිතුර.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, ඒකයි මම එතුමාට මම කිව්වේ, තෙල් පිරිපහදුවක් කියන එක දවසින් දෙකෙන්, මාසයෙන් දෙකෙන් හදලා ඉවර කරන්න බැහැයි කියලා. ලංකාවේ මෙතෙක් ආයෝජනය කරපු වැඩිම මුදල වන්නේ මේ තෙල් පිරිපහදුවට කළ ආයෝජනයයි කියලා ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දන්නවා. අපි හම්බන්තොට වරාය හැදුවා. ඊට පස්සේ ඒකට - [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැව් එන්නේ නැහැ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

මුලින්ම එකඟතාව ඇති වුණු වෙලාවේ තමයි මුල් ගල තිබ්බේ. නමුත් ලෝකයේ වාතාවරණයන් වෙනස් වනවා. දේශපාලනය වෙනස් වනවා. ඒ රටවලත් ප්‍රශ්න ඇති වනවා. අද මුළු මැද පෙරදිගම විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අපි වෙනත් විකල්පයක් කරා පවා මේ අවස්ථාවේ යොමු වෙලා තිබෙනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම මේ තෙල් පිරිපහදුව නවීකරණය කිරීම පමණක් නොවෙයි, එය දෙගුණ කිරීමේ වැඩ පිළිවෙළ අපි ඉදිරියට ගෙන යනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. මේ සම්බන්ධව දැනට ඉදිරිපත් වෙලා තිබෙන වාර්තා මොනවාද, යන වියදම මොකක්ද කියලා කරුණාකරලා අපට කියන්න පුළුවන්ද? මොකද, හම්බන්තොට හැදුවා; නැව් නැහැ. අධිවේගී මාර්ගය හැදුවා. ඒකේ කන්ටේනර්- [බාධා කිරීමක්] තෙල් පිරිපහදුවේ මුල් ගල විතරයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ඇමතිතුමා දැන් කෙටියෙන් පිළිතුරු දෙන්න.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු කථානායකතුමනි, ශක්‍යතා වාර්තාව අනුව රුපියල් බිලියන 1.5ක මූලික වියදම සහ එයින් සියයට 20ක් ධන හෝ ඍණ කියන තත්ත්වය. ඒක තීන්දු වන්නේ එන පාර්ශ්වය සහ ඒ පිළිබඳව තිබෙන එකඟතාවන් තුළයි. තවම ඒ පිළිබඳව අවසන් තීරණයකට ඇවිල්ලා නැහැ. නමුත් මූලික කටයුතු සියල්ල දැනට කර ගෙන යනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 7- 1327/'11- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මම පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කුට්ටියවත්ත කණිෂ්ඨ විද්‍යාලය: නැවත විවෘත කිරීම
## குட்டியவத்த கனிஷ்ட பாடசாலை: மீளத்திறத்தல்
## KUTTIYAWATTA KANISHTA VIDYALAYA: REOPENING

1328/'11

**11. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය අධ්‍යාපන කලාපයේ අක්කර දෙකක පමණ භූමි ප්‍රදේශයක පිහිටි කුට්ටියවත්ත කණිෂ්ඨ විද්‍යාලය වැසී ගොස් වර්ෂ විස්සකට අධික කාලයක් ගත වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම කණිෂ්ඨ විද්‍යාලය නැවත විවෘත කොට ප්‍රදේශයේ දරු දැරියන්ට අධ්‍යාපනය ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, මෙම භූමිය සහ ගොඩනැඟිලි වෙනත් ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම සැලසුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) காலி மாவட்டத்தில் எல்பிட்டிய கல்வி வலயத்தில் இரண்டு ஏக்கர் அளவிலான காணியில் அமைந்துள்ள குட்டியவத்த கனிஷ்ட பாடசாலை மூடிவிடப்பட்டு இருபது வருடங்களுக்கு மேலாகின்றது என்பதையும்;

(ஆ) (i) இக்கனிஷ்ட பாடசாலையை மீண்டும் திறந்து வைத்து பிரதேசத்தின் சிறுவர் சிறுமியர்களுக்கு கல்வி வழங்குவதற்கு நடவடிக்கை மேற் கொள்வாரா என்பதையும்;

(ii) இன்றேல், இக்காணி மற்றும் கட்டிடங்களை வேறு பொருளாதார நடவடிக்கைகளுக்குப் பயன் படுத்த திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(iii) அவ்வாறாயின் அத்திட்டம் யாது

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that Kuttiyawatta Kanishta Vidyalaya, in the Elpitiya Education Zone in the Galle District, which is located on a land which is nearly two acres in extent, has been closed for over 20 years?

(b) Will he inform this House-

(i) whether arrangements will be made to reopen this Kanishta Vidyalaya to provide education to the children of the area;

(ii) if not, whether a plan has been made to utilize this land and the buildings for some other economic activity; and

(iii) if so, what that plan is?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) කුට්ටියවත්ත කණිෂ්ඨ විද්‍යාලය 2002.01.01 දින වැසී ගොස් ඇත. එම භූමි භාගය හා ගොඩනැඟිලි වැලිවිටිය ප්‍රාදේශීය ලේකම් වෙත 2004.10.07 වන දින භාර දී ඇත. ඇමුණුම බලන්න. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) (i) මෙම පාසලට ආසන්නව පිහිටි පාසල් වන පොල්ගහවෙල මහා විද්‍යාලය, අගලිය මහා විද්‍යාලය, උන්නවිටිය මහා විද්‍යාලය යන ප්‍රදේශයේ පාසල්වලට මෙම ප්‍රදේශයේ ළමයින් යොමු කර අධ්‍යාපනය ලබා දීමට කටයුතු කර ඇත.

(ii) විදුහල වැසී යාමත් සමඟ එහි පිහිටි සියලුම ගොඩනැඟිලි හා භූමිය රජයේ ඉඩම් පිළිබඳ බලතල හිමි ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී ඇති බැවින් ඒ සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම ප්‍රාදේශීය ලේකම් සතු කාර්යයකි.

(iii) ප්‍රාදේශීය ලේකම් විසින් සකස් කර ඇති සැලසුම් පිළිබඳව දැනුවත් කර නොමැති බැවින් ඒ පිළිබඳව තොරතුරු ලබා දිය නොහැක.

(ඇ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*


දුරකථනය / தொலைபேசி / Telephone: 091-2260641, 091-2260642
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091-2260642
20 MAR 200
මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date

ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය – වැලිවිටිය, දිවිතුර, අගලිය.
DIVISIONAL SECRETARIAT - WELIVITIYA, DIVITURA, AGALIYA.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය,
ඇල්පිටිය.

02. 2004.10.07 ...

ප්‍රාදේශීය ලේකම්
වැලිවිටිය-දිවිතුර.

G. GUNASIRI
Assistant Director of Education
Zonal Education Office
ELPITIYA

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා ඇමතිතුමා වෙනුවෙන් දුන්න පිළිතුරේ අර පාසල වැහෙන කොට ඒ පාසලේ දරුවන් වෙනත් පාසල්වලට යොමු කිරීමේ කාරණයෙන් පැන නඟින ප්‍රශ්නයක් මම මේ අහන්නේ. සිකුරාදා ඇති වෙච්ච අයහපත් කාලගුණ තත්ත්වයත් එක්ක මේ මොහොත වෙන කොට දකුණු පළාතේ තවත් පාසල් කීපයක යම් මට්ටමකට මෙවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. පාසල් ගොඩනැඟිලිවලට බරපතළ හානි වෙලා තිබෙනවා. ඒ වාගේම සාමාන්‍ය පෙළ විභාගය අත ළඟයි. දරුවෝ පුනරීක්ෂණ වැඩසටහන්වලට සම්බන්ධ වෙනවා. වාර විභාගයත් පාසල්වල පැවැත්වෙනවා. එක පැත්තකින් ඒ කාරණාව තිබෙනවා. අනික් කාරණය තමයි අයහපත් කාලගුණ තත්ත්වයෙන් හානි වෙච්ච සමහර ප්‍රදේශවලට තවමත් විදුලිය ලබා දෙන්න බැරි වෙලා තිබීම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තමුන්නාන්සේ කථාවක් නේ කරන්නේ. එහෙම කථා පවත්වන්න බැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මේකත් දරුවන්ට බලපාලා තිබෙනවා. මම අහන්නේ මේකයි. මේ අයහපත් කාලගුණ තත්ත්වයත් එක්ක දකුණු පළාතේ පාසල් දරුවන් මුහුණ පා තිබෙන මේ ප්‍රශ්නවලට යම් කිසි විසඳුමක් දෙන්න ඔබතුමා මැදිහත් වෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අපි දන්නවා, මාතර දිස්ත්‍රික්කය ඇතුළු දකුණු පළාතේ ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක් මතු වෙලා තිබෙන බව. ඒ තත්ත්වය තුළ අපි මේ වන විටත් නියෝග දීලා තිබෙනවා. විශේෂයෙන් පළාත් සභා පාසල් තමයි මේ තත්ත්වයට වඩාත්ම ගොදුරු වෙලා තිබෙන්නේ. ඒ පාසල් සඳහා පළාත් අධ්‍යාපන ඇමතිවරයාටත්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ සිට කලාප හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙතත් ඒ අවශ්‍ය නියෝග ලබා දීලායි තිබෙන්නේ. ඒ කටයුතු තවදුරටත් පරීක්ෂා කිරීමට මගේ ගරු ඇමතිතුමාත්, මමත් සූදානම්ය කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. මේ දවස්වල වාර විභාග ප්‍රශ්න පත්‍ර නියමිත වෙලාවට, නියමිත දවසට ලැබෙන්නේ නැහැ. සමහර විට කලින් දිනයේ දෙන්න ඕනෑ ප්‍රශ්න පත්‍රය ඊට පසු දින දීලා තිබෙනවා. මේ පිළිබඳව සොයා බලා පරීක්ෂණයක් කරනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

මෙම අතුරු ප්‍රශ්නය එම ප්‍රශ්නයට අදාළ නැහැ. මෙම ප්‍රශ්නය වෙනම ඇහුවොත් උත්තර දෙන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඒ පිළිබඳව සොයා බලන්න පුළුවන්ද, ගරු නියෝජ්‍ය ඇමතිතුමා?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
සොයා බලන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සොයා බලා සාධාරණ ක්‍රියා මාර්ගයක් ගන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ නැති ප්‍රශ්න අහන්න එපා. ඒවාට උත්තර දෙන්න බැඳිලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පුස්තකාල සහායකයන් පිළිබඳව මා ඔබතුමාගෙන් ප්‍රශ්නයක් යොමු කළාම ඔබතුමා එය ඉතාම හොඳින් විසඳා තිබුණා. ඒ පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. හැබැයි දැන් ප්‍රශ්නය තිබෙන්නේ, ඔවුන්ගේ පඩිය අඩු කරලා ඔවුන් එම වැටුප් තලයේ පිහිටුවා තිබෙන එකයි. එම නිසා මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එම අතුරු ප්‍රශ්නය මේ ප්‍රධාන ප්‍රශ්නයට අදාළ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, වැදගත් ප්‍රශ්නයක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වැදගත් වුණාට ප්‍රධාන ප්‍රශ්නයට අදාළ නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. එම ප්‍රශ්නයට අදාළයි. මා එතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඒකට කරන්නේ මොකක්ද කියා කිව්වොත් හොඳයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම එතුමා මතු කළේ වැදගත් ප්‍රශ්නයක්. පස්සේ බලන කොට මටත් තේරුණා මෙතැන වරදක් වෙලා තිබෙනවාය කියලා. මා ලේකම්වරයාට උපදෙස් දුන්නා, එය නිවැරදි කරන්න කියලා. ඒ ගැන සොයා බලනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම හොඳයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12-1407/'11-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Speaker, on behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I ask for two weeks' time to answer this Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 14-1561/'11-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය.

## වැසි සහිත කාලගුණය නිසා පීඩාවට පත් වූ පවුල්: වන්දි

மழையுடன்கூடிய காலநிலையால் பாதிக்கப்பட்ட குடும்பங்கள்: நட்டஈடு

FAMILIES AFFECTED DUE TO RAINY WEATHER : COMPENSATION

1101/'11

**1. ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) වර්ෂ 2010 දෙසැම්බර් සහ 2011 ජනවාරි මාසවල ඇති වූ වැසි සහිත කාලගුණය යටතේ එක් එක් දිස්ත්‍රික්කය තුළ පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව,

ජනගහනය සහ හානියට පත් වූ නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආපදා තත්ත්වයට මුහුණ දීම සඳහා එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් ආපදා තත්ත්වය නිසා විනාශ වූ දේපළ වෙනුවෙන් මූල්‍යාධාර ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එක් පවුලක් සඳහා ලබා දෙන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டு டிசம்பர் மற்றும் 2011ஆம் ஆண்டு ஜனவரி ஆகிய மாதங்களில் ஏற்பட்ட மழையுடன்கூடிய காலநிலையின்கீழ் ஒவ்வொரு மாவட்டத்திலும் பாதிக்கப்பட்ட குடும்பங்களின் எண்ணிக்கை, மக்கள் தொகை மற்றும் சேதத்திற் குள்ளான வீடுகளின் எண்ணிக்கை தனித்தனி யாக எத்தனையென்பதையும்;

(ii) இந்த அனர்த்த நிலைமைக்கு முகம் கொடுப் பதற்காக ஒவ்வொரு மாவட்டம் சார்பாகவும் ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(iii) மேற்படி அனர்த்த நிலைமையினால் அழிவ டைந்த சொத்துக்கள் சார்பாக நிதியுதவி வழங்கப் படுமா என்பதையும்;

(iv) ஆமெனில் ஒரு குடும்பத்திற்காக வழங்கப்படும் பணத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Disaster Management:

(a) Will he inform this House -

(i) separately of the number of families and people affected and the number of houses damaged in each district due to the rainy weather that prevailed in December 2010 and January 2011;

(ii) separately of the amount allocated for each district to face this disaster situation;

(iii) whether financial support is provided to compensate for the property destroyed due to the aforesaid disaster situation; and

(iv) of the amount of money provided for each family, if financial support is provided ?

(b) If not, why ?

**ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ( i )

2010 දෙසැම්බර් මාසය

| දිස්ත්‍රික්කය | පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව | පීඩාවට පත් වූ පුද්ගලයින් සංඛ්‍යාව | හානි වූ නිවාස ගණන | |
|---|---|---|---|---|
| | | | පූර්ණ හානි | අර්ධ හානි |
| නුවරඑළිය | 34 | 142 | 0 | 0 |
| මහනුවර | 68 | 280 | 13 | 75 |
| පුත්තලම | 4,677 | 18,821 | 20 | 11 |
| කෑගල්ල | 1 | 5 | 0 | 0 |
| හම්බන්තොට | 1,190 | 4,866 | 0 | 70 |
| ගම්පහ | 3,164 | 14,123 | 1 | 5 |
| මාතලේ | 42 | 157 | 5 | 53 |
| මන්නාරම | 9,663 | 40,074 | 2 | 181 |
| වව්නියාව | 1,239 | 4785 | 0 | 0 |
| යාපනය | 8,365 | 30,452 | 176 | 2,246 |
| කිළිනොච්චිය | 5,628 | 21,564 | 41 | 1,627 |
| රත්නපුර | 2 | 8 | 1 | 1 |
| මුලතිවු | 5,224 | 16,991 | 0 | 0 |
| මාතර | 1,591 | 5,981 | 56 | 28 |
| ත්‍රිකුණාමලය | 444 | 1,387 | 0 | 90 |
| අනුරාධපුර | 74 | 261 | 0 | 0 |
| ගාල්ල | 1,295 | 4,706 | 0 | 17 |
| පොළොන්නරුව | 4 | 16 | 0 | 4 |
| **එකතුව** | **42,705** | **164,619** | **315** | **4,408** |

2011 ජනවාරි මාසය

| දිස්ත්‍රික්කය | පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව | පීඩාවට පත් වූ පුද්ගලයින් සංඛ්‍යාව | හානි වූ නිවාස ගණන | |
|---|---|---|---|---|
| | | | පූර්ණ හානි | අර්ධ හානි |
| අම්පාර | 120,699 | 458,475 | 1,112 | 4,522 |
| අනුරාධපුර | 3,222 | 12,174. | 333 | 1,179 |
| බදුල්ල | 355 | 1,163 | 28 | 293 |
| මඩකලපුව | 144,081 | 540,144 | 3,118 | 6,441 |
| මහනුවර | 640 | 2,643 | 92 | 315 |
| කිළිනොච්චිය | 1,464 | 5,841 | 0 | 1,074 |
| මොණරාගල | 225 | 912 | 0 | 210 |
| හම්බන්තොට | 72 | 251 | 16 | 19 |
| පොළොන්නරුව | 2,943 | 10,760 | 0 | 25 |
| රත්නපුර | 130 | 585 | 15 | 114 |
| මුලතිවු | 130 | 585 | 0 | 0 |
| මාතලේ | 182 | 766 | 2 | 26 |
| මාතර | 84 | 279 | 20 | 72 |
| කුරුණෑගල | 239 | 780 | 0 | 0 |
| ත්‍රිකුණාමලය | 8,419 | 31,910 | 0 | 0 |
| වව්නියාව | 11,714 | 41,237 | 0 | 9,312 |
| **එකතුව** | **294,599** | **1,108,505** | **4,736** | **23,602** |

(ii )
2010 දෙසැම්බර් මාසය

| දිස්ත්‍රික්කය | ලබා දී ඇති මුදල රු. |
|---|---|
| නුවරඑළිය | 300,000.00 |
| මහනුවර | 575,000.00 |
| පුත්තලම | 2,500,000.00 |
| හම්බන්තොට | 20,741,947.00 |
| ගම්පහ | 400,000.00 |
| මාතලේ | 500,000.00 |
| මන්නාරම | 1,139,414.00 |
| වව්නියාව | 1,000,000.00 |
| යාපනය | 1,000,000.00 |
| කිළිනොච්චිය | 1,000,000.00 |
| මුලතිවු | 1,065,000.00 |
| මාතර | 500,000.00 |
| ත්‍රිකුණාමලය | 1,000,000.00 |
| අනුරාධපුර | 700,000.00 |
| ගාල්ල | 500,000.00 |
| පොළොන්නරුව | 898,000.00 |
| **එකතුව** | **33,819,361.00** |

[ගරු මහින්ද අමරවීර මහතා]

2011 ජනවාරි මාසය

| දිස්ත්‍රික්කය | ලබා දී ඇති මුදල රු |
|---|---|
| අම්පාර | 30,500,000.00 |
| අනුරාධපුර | 3,800,000.00 |
| බදුල්ල | 300,000.00 |
| මඩකලපුව | 100,000,000.00 |
| මහනුවර | 1,300,000.00 |
| මොණරාගල | 2,720,000.00 |
| පොළොන්නරුව | 3,500,000.00 |
| මුලතිවු | 1,420,000.00 |
| මාතලේ | 2,500,000.00 |
| මාතර | 1,000,000.00 |
| ත්‍රිකුණාමලය | 15,000,000.00 |
| වව්නියාව | 18,000,000.00 |
| **එකතුව** | **180,040,000.00** |

(iii) ඔව්. නිවාස හානි, වගා හානි හා ස්වයං රැකියා ව්‍යාපාර හානි හා මුළුතැන්ගෙයි උපකරණ විනාශ වීම් සඳහා මූල්‍යාධාර ලබා දේ.

(iv) ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථාන චක්‍රලේඛ අංක 2007/10 අනුව එක් පවුල් ඒකකයක් සඳහා ලබා දිය හැකි උපරිම සහනාධාර මුදල රු. 71,500කි. (නිවාස/ වගා හානි සඳහා රු. 50,000ක්, ස්වයං රැකියා ව්‍යාපාර විනාශ වීම් සඳහා රු. 20,000ක් හා මුළුතැන්ගෙයි උපකරණ විනාශ වීම් සඳහා රු. 1,500ක් වශයෙන්)

(ආ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහනවා. ගරු ඇමතිතුමනි, ඒ පවුලක් සඳහා ගෙවීමට හැකියි කියලා තිබුණා රුපියල් හැත්තෑඑක්දහස් ගණනක්. ඇත්ත වශයෙන්ම දුන්නු මුදල් ප්‍රමාණය කොපමණද?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු මන්ත්‍රීතුමනි, අපට තවමත් ඒ වාර්තා අවසාන වශයෙන් ලැබිලා නැහැ. අපි දිසාපතිවරුන් වෙත අවශ්‍ය තරමට මූල්‍ය ප්‍රතිපාදන යොමු කරලා තිබෙනවා. ඒ මුදල් තවමත් ඉතිරිව තිබෙනවා. මොකද, ඒ නිවාස ඉදි කර ගැනීමට පළමුවැනි අදියර වශයෙන් මුලින් දෙන්නේ මූලික මුදලක්. ඉන් අනතුරුව ඒ අයගේ ඉදි කිරීම් ස්වරූපය අනුව තමයි වරින් වර මුදල් නිදහස් කරන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ඒ සඳහා මුදල් වෙන් කර තිබෙනවා. ඒ පිළිබඳව මා ස්තුතිවන්ත වනවා. නමුත් කොහෙන් හෝ තැනකින් කාටවත් මේ මුදල් ලබා දී නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. මම ඔබතුමාට කිව්වේ ඒකයි. ඔබතුමන්ලා වහාම ආපදා කළමනාකරණ කමිටුවේ සාකච්ඡාවක් තියලා, ඇත්ත වශයෙන්ම 2010 දෙසැම්බර් සහ 2011 ජනවාරි මාසවල ආපදාවට ලක් වුණු උදවිය සඳහා අරගෙන තිබෙන පියවර ගැන කියන්න. මොකද, මා ළඟත් තොරතුරු ගණනාවක් තිබෙනවා. ඒ මුදල් ලැබිලා නැහැ, ගරු කථානායකතුමනි. රජයෙන් මුදල් වෙන් කර තිබෙනවා. නමුත් ඒ මුදල් ටික පහළට ගිහින් අහිංසක දුප්පත් මනුෂ්‍යයාට නොලැබීමයි තිබෙන ප්‍රශ්නය. ඒ නිසා කරුණාකර, ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු ටික කරන්න ඔබතුමා සූදානම්ද කියා මා අහන්න කැමැතියි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර දීම තමයි අපි කරන්නේ. දිසාපතිවරු, ප්‍රාදේශීය ලේකම්වරු හරහා තමයි මුදල් වියදම් කිරීම කරන්නේ. ගරු මන්ත්‍රීතුමා කිව්වා, ආපදා කළමනාකරණ කමිටු රැස්වීම පිළිබඳව. විපක්ෂ නායකතුමා අපේ ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ සාමාජිකයෙක්. ඒකේ විපක්ෂයේ මන්ත්‍රීවරුත් ඉන්නවා. පසු ගිය 25 වන දා ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කැඳෙව්වා. ඒ කැඳවීම්වලදී විපක්ෂයත් සම්බන්ධ වෙලා අදහස් ඉදිරිපත් කරනවා නම් හොඳයි. සුමන්තිරන් මන්ත්‍රීතුමා පමණයි අඛණ්ඩව ඒ රැස්වීම්වලට සහභාගි වන්නේ. විපක්ෂයෙන් වෙන කවුරුවත් සහභාගි වන්නේ නැහැ. [බාධා කිරීමක්] නැහැ. මා කියන්නේ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබෙන ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව ගැනයි. ඒකෙදි මේ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරන්න පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක තිබුණේ කොහේද?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ජනාධිපති මන්දිරයේ තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මෙහේ තියන්න කියන්න. පාර්ලිමේන්තුවේ තියන්න කියන්න. එතකොට විපක්ෂ නායකතුමා සම්බන්ධ වෙයි. ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා මාසයකට වතාවක් පාර්ලිමේන්තුවට එන්න ඕනෑ. මෙහේ තියන්න කියන්න. අපි එන්නම්.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

දයාසිරි මන්ත්‍රීතුමනි, හයක් වෙන්න දෙයක් නැහැ. අරලියගහ මන්දිරය කියන්නේ -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මෙහේ තියන්න කියන්න. අපි එන්නම්. එහේ ගියාම අත ගානවා, කරන check කිරීම් ඔක්කොටම අහු වෙන්න ඕනෑ විපක්ෂ නායකතුමා. මෙහේ තියන්න කියන්න, එතකොට අපි එන්නම්.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

නැහැ. එහෙම අවශ්‍යතාවක් නැහැ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

එහේ තියා ගන්නවා ගේ ඇතුළෙ වාගේ. එහෙම කරන්න බැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට යන්න මෙහේ තියන්න කියන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, නිලධාරීන් විශාල පිරිසක් -මුදල් අමාත්‍යාංශයේ ලේකම්, ජනාධිපති ලේකම් ඇතුළු සියලු අංශවල නිලධාරීන්- සම්බන්ධ වන රැස්වීමක් ඒක. සියලු පක්ෂවල එකතුවෙන් තිබෙන රැස්වීමක්. පෞද්ගලික තැනක නොවෙයි, අරලියගහ මන්දිරයේ තිබෙන්නේ. ඒ නිසා කෝපි කෝප්පයක් බොන්නත් එක්ක ඊළඟ රැස්වීමට හෝ එන්න කියා ඔබතුමන්ලාට අපි ආරාධනා කරනවා. ඇවිල්ලා මේ ප්‍රශ්නය කථා කරන්න. ඇවිල්ලා කථා කරලා මේ වැඩසටහනට සහයෝගය ලබා දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා කෝපි කෝප්පය ගැන වෙනම කියයි. තුන්වන අතුරු ප්‍රශ්නය. මාතර දිස්ත්‍රික්කයේ සිදු වුණු ව්‍යසනය සම්බන්ධව පෙර දැනුම් දීම් කළාද? මේ කමිටු කොච්චර තිබුණත් වැඩක් නැහැ ගරු කථානායකතුමනි, මේවා වන්නේ නැත්නම්.

ගරු කථානායකතුමනි, දකුණේ මේ සිද්ධිය සිදු වන විට මේ සම්බන්ධව කලින් දැනුම් දීම් කිසිම දෙයක් සිදු වුණේ නැහැ. ඒකේ ප්‍රතිඵලයක් විධියට තමයි අද ධීවරයෝ නැති වෙලා තිබෙන්නේ. ඒ නිසා මම කියන්නේ මේකයි. වහාම මේ කමිටුව රැස් කරලා මාතර දිස්ත්‍රික්කයේ ඇති වෙලා තිබෙන ව්‍යසනය සම්බන්ධව ඔබතුමන්ලා ඉතාම ඉක්මනින් පියවරක් ගන්න. මේ කමිටුව රැස්වෙලා නතර වුණා, දැන් ආපසු රැස් වෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මම අහන්නේ මේවාට වග කිව යුතු නිලධාරීන් කවුද කියලායි. මේ ගැන කලින් දැනුම් දෙන්න අවශ්‍ය කටයුතු නොකළේ කවුද කියලා සොයලා ඒ සම්බන්ධව පියවරක් ගන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, ඒ පිළිබඳව ක්‍රියා කරනවාද?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, මේ සිද්ධිය ඇති වුණේ 25වන දා. ඒ වන විටත් ව්‍යසන කළමනාකරණ කමිටුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස් වෙලා තිබුණා. ඒ අනුව ඒ අවස්ථාවේදීම අතිගරු ජනාධිපතිතුමා මට උපදෙස් දුන්නා මේ කාරණයට සෘජුව මැදිහත් වෙලා, අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන ලබා දීලා ඒ කටයුත්තට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා. ඒ වාගේම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සම්බන්ධව මන්ත්‍රීතුමා කියපු චෝදනාව පුවත් පත්වල, මාධ්‍යවල ප්‍රකාශයට පත් වන විට මම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ඒ ගැන සොයා බැලුවා. ඒ අය කියන්නේ මුහුදේ රළු භාවය පිළිබඳව අනතුරු හැඟවීමක් කළා කියලායි. ඒක ප්‍රමාණවත් නැහැයි කියන මතය තිබෙන නිසා මම ලේකම්වරයා මාර්ගයෙන් නැවත වාර්තාවක් කැඳවලා තිබෙනවා. අද ඒ වාර්තාව ලැබෙනවා. ඒ වාර්තාවට අනුව කාගෙන් හෝ අතපසුවීමක්, වැරැද්දක් වෙලා තිබෙනවා නම් අපි ඊට එරෙහිව කටයුතු කරනවා. ඒ වාර්තාවෙන් සෑහීමකට පත් වෙන්න බැරි වුණොත්, -අතිගරු ජනාධිපතිතුමා මේ ජීවිත පිළිබඳව බොහොම අවධානයෙන් ඉන්නවා- අවශ්‍ය වුණොත්, ස්වාධීන කමිටුවක් පත් කරලා ඒ පියවර ගන්නවා. අපි කිසිම වෙලාවක කවුරුවත් ආරක්ෂා කරන්න කටයුතු කරන්නේ නැහැ. වැරැද්දක් වෙලා තිබෙනවා නම් ඒකට අවශ්‍ය පියවර ගන්නවා. අපි ජනතාව වෙනුවෙන් සහන ලබා දෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා. මම ඒ ප්‍රදේශයටම, -ගාල්ල, මාතර දිස්ත්‍රික්කවලට- ගිහිල්ලා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා දීලා අඛණ්ඩව ඒ කටයුතු සියල්ල සිදු කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, මට කාරණයක් කියන්නට තිබෙනවා. ව්‍යසන කළමනාකරණ කමිටුවට දින දෙනවා නම් අපිත් එක්කත් සාකච්ඡා කරලා අපටත් පුළුවන් දිනයක් දෙන්න. අන්තිම මොහොතේ දිනයක් දුන්නාම අපි හැම කෙනාටම සහභාගි වන්න බැහැ. අනෙක් අතට ඇමතිතුමා සඳහන් කළා ජනාධිපතිතුමා එතුමාට උපදෙස් දුන්නා කියලා. ඒකට කමක් නැහැ. මම අහන්නේ මේකයි. ඇමතිතුමා, ජනාධිපතිතුමා උපදෙස් දුන්නේ නැද්ද ආපදාවක් එනවා කියලා. මේ ගැන ඇඟ බේරා ගෙන නේ ඉන්නේ. ගිය අවුරුද්දේත් මඩකලපුවේ මේ ව්‍යසනය වුණා. ඇමතිතුමා, අන්න ඒ ගැන අපට කියන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
අතිගරු ජනාධිපතිතුමා ආපදාවක් වෙනවා කියලා උපදෙස් දෙනවා නොවෙයි, අතිගරු ජනාධිපතිතුමා හැම වෙලාවේම උපදෙස් දෙන්නේ -එන තත්ත්වයට මුහුණ දෙන්න අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා දීලා තිබෙනවා- ඒ සඳහා අපට මැදිහත් වෙන්න කියලායි. ඒ වාගේම ව්‍යසන කළමනාකරණය කිරීමේ කමිටුව හත් වතාවක් රැස් වෙලා තිබෙනවා ගරු කථානායකතුමනි. මේ හැම එකම කල් ඇතිව දැනුම් දීලා තිබෙනවා. එතුමාට හත් වතාවේම එන්න බැරි නම්, විපක්ෂ නායකතුමා එතරම්ම කාර්ය බහුලද කියා මම දන්නේ නැහැ? මට පෙනෙන්නේ ජනාධිපතිතුමාටත් වඩා විපක්ෂ නායකතුමා කාර්ය බහුල වෙලා තිබෙනවා කියලායි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. මීට පස්සේ කලින් දැනුම් දීමට අවශ්‍ය පියවර ගන්න.

ඊළඟට ප්‍රශ්න අංක 2-1165/'11-(5), ගරු අනුර දිසානායක මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස දෙකක් කල් ඉල්ලා සිටිනවා. 1980 වර්ෂයේ සිට වාර්තා මෙයින් ඉල්ලනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දීර්ඝ පිළිතුරක් නම් ඒක ලිඛිතව ඉදිරිපත් කරන්නත් පුළුවන්.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
හොඳමයි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ශ්‍රී ලංකා පොලීසිය : විස්තර
## இலங்கை பொலிஸ் : விபரம்
## SRI LANKA POLICE : DETAILS

1404/'11

**4. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) දැනට මෙරට ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) මුළු රටම ආවරණය වන පරිදි සේවයක් සැපයීමට අවශ්‍ය වන පොලිස් ස්ථාන සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 ජූලි 1 වැනි දින වන විට සේවයේ යෙදී සිටි පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) පොලිස් සේවයට සත්‍ය වශයෙන්ම අවශ්‍ය පොලිස් නිලධාරින්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකා පොලීසියට බඳවා ගැනීම් සිදු කිරීමේදී අනුගමනය කරනු ලබන ජනවාර්ගික ප්‍රතිපත්තිය කවරේද;

(iv) සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සහ මැලේ යන ජන වර්ගවලට අයත් දැනට සේවයේ යෙදී සිටින පොලිස් නිලධාරින් සංඛ්‍යාව වෙන් වශයෙන් කවරේද;

(v) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා කථා කිරීමට දක්වන හැකියාව අනුව පොලිස් නිලධාරින් බෙදා වෙන් කර දැක්විය හැකි ආකාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்தசாசன மற்றும் மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது நாட்டிலுள்ள பொலிஸ் நிலையங்களின் எண்ணிக்கையையும்;

(ii) முழு நாட்டுக்கும் சேவை வழங்குவதற்கு தேவையான பொலிஸ் நிலையங்களின் எண்ணிக்கையையும்

அவர் கூறுவாரா?

(ஆ) (i) 2011 யூலை முதலாம் திகதியிலுள்ளவாறாக சேவையிலுள்ள பொலிஸாரின் எண்ணிக்கையையும்;

(ii) உண்மையிலேயே தேவையான பொலிஸாரின் எண்ணிக்கையையும்;

(iii) இலங்கைப் பொலிஸின் இனரீதியான ஆட்சேர்ப்புக் கொள்கை யாதென்பதையும்;

(iv) சிங்கள, தமிழ், முஸ்லிம், பறங்கியர் மற்றும் மலாயர் போன்ற இனக் குழுக்களைப் பிரதிநிதித்துவப்படுத்தி சேவையில் உள்ள பொலிஸ் ஆளணியினரின் எண்ணிக்கையைத் தனித்தனியாகவும்;

(v) சிங்களம், தமிழ் மற்றும் ஆங்கிலமொழிகள் பேசக் கூடிய திறனை அடிப்படையாக வைத்து அவர்களின் எண்ணிக்கையை வெவ்வேறாகவும்

அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state-

(i) the number of police stations in the country at present; and

(ii) the number of police stations required to provide a service covering the whole country?

(b) Will he also state-

(i) the number of policemen in service as at 1st July, 2011;

(ii) the actual number of policemen required;

(iii) the ethnic recruitment policy of the Sri Lanka Police;

(iv) the number of police personnel in the service, representing the ethnic groups of Sinhala, Tamil, Muslim, Burgher and Malay separately; and

(v) the break-up of the police personnel based on their speaking skill of Sinhala,Tamil and English languages?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) හාරසිය තිහ (430)කි.

(ii) මේ සම්බන්ධයෙන් නිශ්චිත නිර්ණායකයක් නොමැති නමුත් පොලිස් ස්ථානයක් අලුතින් පිහිටුවීමේදී අදාළ ප්‍රදේශයේ උසස් පොලිස් නිලධාරින්, සිවිල් පරිපාලන බලධාරින් හා මහ ජන නියෝජිතයන් විසින් කරනු ලබන ඉල්ලීමක් හෝ යෝජනා සලකා බැලීමෙන් අනතුරුව,

දෙපාර්තමේන්තු නියෝග බී 09 පරිදි පොලිස්පති නිර්දේශය මත ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයා විසින් පොලිස් ස්ථාන පිහිටුවිය යුතු බව දන්වා ඇත. එමෙන්ම වාර්තා වන අපරාධ සංඛ්‍යාව, ජනගහනය වැඩි වීම, නව ජනාවාස බිහි වීම සහ භූගෝලීය වශයෙන් පිහිටීමේ වැදගත්කම යන කරුණු අනුව ඒ ඒ ප්‍රදේශවල නව පොලිස් ස්ථාන ආරම්භ කිරීම සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

(ආ) (i) අසූතුන්දහස් හාරසිය විසිතුන (83,423)කි.

(ii) අනූදෙදහස් විසිතුන (92,023)කි.

(iii) මෙම බඳවා ගැනීම් කිරීමේදී ජන වර්ගය අනුව බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් නොමැති අතර, පොලිස් දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු හා අවශ්‍යතාව මත ආයතන අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය පරිදි පොලිස්පතිවරයා විසින් කරනු ලබන නියෝගයන් මත සියලු බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, ජනවර්ග සඳහා විශේෂ අවස්ථාවක් ලබා දීමේ කටයුතු අරඹා ඇත.

(iv)

| | | |
|---|---|---|
| සිංහල නිලධාරින් සංඛ්‍යාව | - | 81,328 |
| දෙමළ නිලධාරින් සංඛ්‍යාව | - | 1,093 |
| මුස්ලිම් නිලධාරින් සංඛ්‍යාව | - | 952 |
| මැලේ නිලධාරින් සංඛ්‍යාව | - | 25 |
| බර්ගර් නිලධාරින් සංඛ්‍යාව | - | 09 |

(v) පොලිස් නිලධාරින් බඳවා ගැනීමේදී ජන වර්ගය අනුව සිංහල හා ද්‍රවිඩ භාෂා කථා කිරීමට හැකි නිලධාරින් බඳවා ගැනීම සිදු කරන අතර, මූලික පුහුණුවෙන් අනතුරුව ද්‍රවිඩ හා ඉංග්‍රීසි භාෂාවෙන් රාජකාරි කිරීම සඳහා සේවාස්ථ පුහුණුවක් ලබා දීම සිදු කරයි.

ඊට අමතරව කොත්මලේ භාෂා පුහුණු පාසලේ දී ද්‍රවිඩ භාෂා පිළිබඳ විශේෂ පුහුණුවක් තෝරා ගත් සිංහල නිලධාරින් වෙත ලබා දෙනු ලබේ. එම පුහුණුව ලැබූ නිලධාරින් සේවයේ අවශ්‍යතාව මත හා ජන වාර්ගික පදනම මත, ස්ථාන මාරු කර රාජකාරියේ යෙදවීම සිදු කරනු ලබයි.

(ඇ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, සවිස්තර පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වනවා. එකක්, බහුජාතික රටක මීට වැඩිය ඒ අනුපාතය ගැන සලකලා කටයුතු කරනවා නම් රටේ උන්නතියට හොඳයි කියන එක මෙතැන සිටින සියලු දෙනාම පිළිගන්නවා ඇති කියලා මා හිතනවා. මෙතැන විෂමතාවක් තිබෙනවාය කියලා අපි ශබ්ද කරන්නට අවශ්‍යතාවක් නැහැ. නමුත් පුළුවන් තරම් ඉක්මනට මේක නිවැරදි කිරීමක් කළොත්, අනාගතයේදී අනෙක් අයට මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් වන එක අපිට නවත්වන්න පුළුවන්. ඉතින් කරුණාකරලා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නයි අපි මේ ප්‍රශ්නය ඔබතුමා ඉදිරියේ තබන්නේ. වැඩි කල් යන්නට ඉස්සර වෙලා ඒක නිවැරදි කරලා, ඒ අයට හේතු සහගත උත්තර දෙන්නේ නැතිව අපි කටයුතු කරමුයි කියන එක මා පළමුවෙන්ම මතක් කරන්නට කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඒ ගමන්ම මා ඔබතුමාගෙන් ඒක පුද්ගල ආදායම ගැනත් අහන්න කැමැතියි. මේ අයගේ වැටුප රුපියල් 14,800යි. මේ, අවම ඒක පුද්ගල ආදායම වශයෙන් අප සලකන රුපියල් 26,800ක්වත් නැති අවස්ථාවක්. පොලීසියත් අවම ඒක පුද්ගල ආදායමට අඩුවෙන් වැටුප් ලබනවා නම් ඒක මේ රටට ප්‍රශ්නයක් නොවෙයිද? මෙතරම් සොරකම් වෙන්නේ ඒ නිසාද කියන ප්‍රශ්නය මා මේ අවස්ථාවේ දී අහනවා. ටිකක් අමාරු ප්‍රශ්නයක්. නමුත් ඔබතුමා දක්ෂයෙක් -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේකට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. ප්‍රශ්න දෙකක් ඇහුවා. පළමුවැනි ප්‍රශ්නයට මම රජයේ ප්‍රතිපත්තිය පැහැදිලි කළා. රජයේ ප්‍රතිපත්තිය අනුව දමිළ භාෂාව කථා කරන පොලිස් නිලධාරින් සංඛ්‍යාව වැඩිපුර බඳවා ගැනීමේ කටයුතු 2010 දී ආරම්භ කරලා තිබෙනවා. මා ඔබතුමාට සංඛ්‍යා ලේඛනයක් දෙන්නම්. දැනට බඳවා ගැනීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. දෙමළ භාෂාව කථා කරන උප පොලිස් පරීක්ෂකවරුන් 50ක්, සාමාන්‍ය උප පොලිස් පරීක්ෂකවරුන් 25ක්, පොලිස් කොස්තාපල්වරුන් 350ක් යනාදී වශයෙන් 500කට කිට්ටු වන්නට බඳවා ගෙන මේ කටයුතු සඳහා ප්‍රමුඛත්වය දීලා තිබෙනවා. ඒ වාගේම දැනට සිටින අයට දෙමළ භාෂාව කථා කිරීම, වාර්තාගත කිරීම ආදී පුහුණු පාඨමාලාවන් අනිවාර්ය කරලා කටයුතු කරගෙන යනවා. ඒ නිසා ඔබතුමා කියන කාරණය ක්‍රියාත්මක කිරීම රජය ආරම්භ කරලා තිබෙනවා. වෙනදාට වඩා දෙමළ භාෂාව කථා කරන නිලධාරින්ගේ සංඛ්‍යාව හා එක් එක් ප්‍රදේශවලින් බඳවා ගැනීමේ ප්‍රමාණය වැඩි කරන්න රජය කටයුතු කර තිබෙනවා.

ඊළඟ කාරණය සම්බන්ධයෙන් වෙනම ප්‍රශ්නයක් අහනවා නම් හොඳයි. ඒක පුද්ගල ආදායම පිළිබඳ විවාදයක් පවත්වන්න මම කැමැතියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක හොඳයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

එතකොට ඔබතුමාටයි, අපිටයි පුළුවන් ඒක පුද්ගල ආදායමේ තිබෙන ප්‍රශ්න -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වටිනාකම මොකක්ද කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අපි විවාදයක් තියමු.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක තුට්ටු දෙකක ගණනක්ද නැද්ද කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අපි Adjournment Debate එකක් දෙන්න කැමැතියි, ඒක පුද්ගල ආදායම ගැන. එතකොට ඒ කාලයේයි මේ කාලයේයි - මේ කාලේයි ඒ කාලයේයි සියලු දේ කථා කරන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරියට හරි. ඒක හොඳ යෝජනාවක්. හැබැයි, ඒක මේ අය වැය විවාද ඉවර වෙලා කරමු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්. ඉවර වෙලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඇති.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, දැන් මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමා, Central Bank - [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ගැන නොවෙයි. මම කැමැතියි හෙට තිබෙන තමුන්නාන්සේලාගේ උපවාසය ගැනත් විවාදයක් දෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක පුද්ගල ආදායම නිසා තමයි ඒක තියෙන්නේ. ඔබතුමාටත් එන්න පුළුවන්. ඔබතුමාටත් එන්න පුළුවන් සල්ලි මදි, -[බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා උපවාස කරන්න හදනවා කියලා ප්‍රකාශයක් කරලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, තුන්වන අතුරු ප්‍රශ්නයත් අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දෙවන අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වැනි එක, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අයියෝ! කථානායකතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
උපවාසය මහ පාරේද, පිට්ටනියේද තිබෙන්නේ?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඒක විරෝධතාවක්. ඔබතුමාටත් ආරාධනා කරනවා එන්න කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මා අහන්නේ, ඒක පවත්වන්නේ මහ පාරේද, පිට්ටනියේද කියලායි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා කැමැති අප මහා පාරේ ඉන්නවාට නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඒ ගැන කථා කරන්නත් අවස්ථාවක් දෙන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක වෙනම කථා කරමු.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කොහොමත් ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ මිනිස්සු මහ පාරේ තමයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ වරප්‍රසාද ආරක්ෂා කරන ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය නේද මා අහන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය අහනවා. උත්තර දෙන්න. [බාධා කිරීමක්] තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අයියෝ, ඔච්චර සැර වෙන්න එපා ගරු කථානායකතුමනි. අපේ ගරු ඇමතිතුමනි, කොළොන්නාවේ ඇති වූ ප්‍රශ්නය සම්බන්ධයෙන්, දොම්පේ ඇති වූ ප්‍රශ්නය සම්බන්ධයෙන්, නිදහස් දවසේ අපේ මන්ත්‍රීවරුන්ට, අප වෙනුවෙන් ආපු අයට ගහපු බොරැල්ලේ පොලීසිය සම්බන්ධයෙන්- [බාධා කිරීම්] පොලිසියේ තිබෙන වටිනාකම සම්පූර්ණයෙන්ම අඩු වෙලා තිබෙන්නේ මේ ආණ්ඩුව එය දේශපාලනීකරණය කර තිබෙන නිසායි. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වළලලා එය දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අදාළ නැත.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අදාළ නැත්තේ ඇයි? එහෙම නම් මම අදාළ කරන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අදාළ නැහැ. කිසිසේත්ම අදාළ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ කරන්න. නමුත් කථා පවත්වන්න බැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
උදේ පාන්දරම පීලි පැනලා. [බාධා කිරීම්] ටිකක් දවල් වෙලා නම් කමක් නැහැ. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, කරුණාකර ඒ අහිංසක පොලිස් භටයන්ට ලැබෙන්න තිබෙන මුදල් ප්‍රමාණය, කරන්න තිබෙන පඩි වැඩි කිරීම, ලැබෙන්න තිබෙන uniform දීමනාව කියන මේ ඔක්කෝම ලබා දීලා දේශපාලනය කරන්නේ නැති පොලීසියක් විධියට ගෙන යන්න කටයුතු කරනවාද නැද්ද කියන ප්‍රශ්නය මෙයට අදාළ වනවාය කියමින්ම මම අහනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ නොවනවා වාගෙයි පෙනෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක ජෝන් අමරතුංග හිටපු ඇමතිතුමාගෙන් අහන්න ඕනෑ. "ජෝන් පොලිස්" කථාව.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපි දන්නේ නැහැ. ඒ කාලයේ පොලීසිය හොඳට තිබුණා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතුමා දන්නේ නැතිලු "ජෝන් පොලිස්" කථාව. පොඩ්ඩක් කියලා දෙන්න. [බාධා කිරීම්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
දැන් ඊට වඩා අන්තයි පොලීසිය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් හොරා පොලිස්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ කියන්නේ, ඒ කාලයේත් අන්තයි කියලා පිළිගන්නවා? දැන් ඊට,- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ නොවන දේවල් ඇහුවාම තමයි ප්‍රශ්න ඇති වෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අදාළ නොවන උත්තරයක් ලැබුණා නේද,- [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමාට පුළුවන්, පොලීසිය ගැන උපදෙසක් දෙන්න ගරු කථානායකතුමනි. ඔබතුමා ඉතා විශිෂ්ට සේවයක් ඒ කාලයේ කළා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙනම් මා ගරු කථානායකතුමාගෙන් අහන්නම්. ඔබතුමාට යෝජනා කරනවා,-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ කාලයේ පොලීසිය හොඳට තිබුණා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාව පාලනය කරන්න පොලීසිය ගෙනෙන්න වෙනවා වාගෙයි මට පේන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා සභාව පාලනය කරනවා වාගේ රටත් පාලනය කරාවි, මා හිතන්නේ.

## ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය : උපදේශකයන්
කடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சின் ஆலோசகர்கள்: விபரம்
ADVISERS UNDER MINISTRY OF FISHERIES AND AQUATIC RESOURCES DEVELOPMENT : DETAILS

1470/'11

**5. ගරු දයාසිරි ජයසේකර මහතා - (ගරු අජිත් කුමාර මහතා වෙනුවට)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - மாண்புமிகு அஜித் குமார சார்பாக)
(The Hon. Dayasiri Jayasekara on behalf of the Hon. Ajith Kumara)
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මේ වන විට සේවය කරන උපදේශකයන් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබා දී ඇති උපදේශකයන්ගේ නම්, ලබා දී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබා දෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச் சரைக் கேட்ட வினா:

(அ) (i) கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சில் தற்போது சேவையாற்றுகின்ற ஆலோசகர்களின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(ii) இவர்களின் பெயர்கள், கல்வித் தகைமைகள் மற்றும் பொறுப்புகள் யாவையென்பதையும்;

(iii) இவர்களுக்கு செலுத்தப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவையென்பதையும்;

(iv) கடந்த மாதத்திற்காக செலுத்தப்பட்ட அனைத்து கொடுப்பனவுகளினதும் கூட்டுத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப் பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள், வழங்கப் பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் விபரங்கள் யாவையென்பதையும்;

(ii) இவர்களுக்கு எரிபொருள் கொடுப்பனவு வழங் கப்படும் எனின், ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்படுகின்ற எரிபொருள் கொடுப்பனவு தனித்தனியாக யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவர்களுக்கு தொலைபேசி வசதிகள் வழங்கப் படுமெனின், தற்போது தொலைபேசி வசதிகள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(ii) தொலைபேசிக் கொடுப்பனவுத் தொகை யொன்று வழங்கப்படுமெனின் ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்பட்டுள்ள கொடுப் பனவுத் தொகை தனித்தனியாக எவ்வளவென் பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development :

(a) Will he state-

(i) the number of advisers who serve in the Ministry of Fisheries and Aquatic Resources Development at present;

(ii) their names, educational qualifications and responsibilities;

(iii) the salaries and allowances paid to them;

(iv) the total of all the allowances paid during the previous month?

(b) Will he inform this House-

(i) of the names of the advisers to whom official vehicles have been provided, the number of official vehicles provided and the details of those vehicles;

(ii) separately of the fuel allowance provided to each adviser, if they are provided with a fuel allowance?

(c) Will he state-

(i) the names of the advisers to whom telephone facilities have been provided by now if telephone facilities are provided to them;

(ii) separately of the amount of the telephone allowance paid to each adviser, if they are paid a telephone allowance?

(d) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

අ) (i) 01 (එක් අයෙකි)

(ii), (iii), (iv)

| නම | අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද | වගකීම් | වැටුප්/දීමනා |
|---|---|---|---|
| 01. ආචාර්ය එස්. සුහසිංහ මහතා | * විද්‍යාවේදී උපාධිය, ලංකා විශ්වවිද්‍යාලය - 1973 වර්ෂය * මානව පෝෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය - 1976 වර්ෂය ලන්ඩන් විශ්වවිද්‍යාලය * ජීව රසායන විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය - 1979 වර්ෂය ලන්ඩන් විශ්වවිද්‍යාලය * මැලේසියාවේ පිහිටි එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් - ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ ප්‍රාදේශීය ධීවර සංවිධානය වන INFOFISH ආයතනයේ තාක්ෂණික උපදේශකයකු/ අධ්‍යක්ෂවරයකු/ ප්‍රධාන විධායක නිලධාරියකු වශයෙන් ධීවර ක්ෂේත්‍රයේ වසර 20ට ආසන්න කාලයක පළපුරුද්ද. | "මහින්ද චින්තන ඉදිරි දැක්ම"ට අනුව ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ අපේක්ෂිත සංවර්ධන අරමුණු කරා ළඟා වීම සඳහා ගරු අමාත්‍යතුමාට උපදෙස් ලබා දීමත්, අමාත්‍යාංශයේ ව්‍යාපෘතිවල තාක්ෂණ හා ආර්ථික ශක්‍යතා තක්සේරු සඳහා සහාය වීමත්, ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගීතාවය ඇති කිරීම. | මාසික දීමනාව - රු. 30,000/- මාසික ප්‍රවාහන දීමනාව - රු. 30,000/- මාසික ඉන්ධන දීමනාව - රු. 21,500/- එකතුව - රු. 81,250/- |

(ආ) (i) ලබා දී නොමැත.

(ii) ආචාර්ය එස්. සුහසිංහ මහතාට පමණක් පෙට්‍රල් ලීටර් 170ක මාසික ඉන්ධන දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) (i) ආචාර්ය එස්. සුහසිංහ මහතා

(ii) රු.12,500/-ක මාසික සීමාවකට යටත්ව දුරකථන දීමනාවක් ලබා දී ඇත.

(ඈ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 8 - 1406/'11- (1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අහලා වැඩක් නැහැ, කල් ඉල්ලයි කථානායකතුමනි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මේක තවත් අමාත්‍යාංශයක කාර්යයක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා කිව්වේ අහලා වැඩක් නැහැ කියලා. ඔය වැඩ කරන්නේ නැති මුදල් අමාත්‍යාංශය.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මාස දෙකක් කල් ඉල්ලනවා. මේ ප්‍රශ්නය පළමුවරටයි අහන්නේ. ඒ වාගේම මෙය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අදාළ කාර්යයක්. අපට අදාළ නැහැ මේක.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පුස් හත්වැනි අය වැයක් ඉදිරිපත් කරලා තියෙන්නේ. නියෝජ්‍ය ඇමතිතුමාවත් දන්නේ නැහැ මොනවාද ඒකේ තියෙන්නේ කියලා. ඔබතුමා දැන ගත්තාද විනිමය අනුපාතය අවප්‍රමාණය කරනවා කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මාසිකව උපදේශක කාරක සභා පවත්වනවා නේද? [බාධා කිරීම්] එතැනට සහභාගි වෙලා-

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
එදිනට ප්‍රශ්න නහන්න පුළුවන්.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශයේ උපදේශකයන්: විස්තර
## வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சின் ஆலோசகர்கள்: விபரம்
## ADVISERS UNDER MINISTRY OF FOREIGN EMPLOYMENT PROMOTION AND WELFARE : DETAILS

1471/'11

**9. ගරු දයාසිරි ජයසේකර මහතා - (ගරු අජිත් කුමාර මහතා වෙනුවට)**

(மாண்புமிகு தயாசிறி ஜயசேகர - மாண்புமிகு அஜித் குமார சார்பாக)

(The Hon. Dayasiri Jayasekara on behalf of the Hon. Ajith Kumara)

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශයේ මේ වන විට සේවය කරන උපදේශකයන් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබා දී ඇති උපදේශකයන්ගේ නම්, ලබා දී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබා දෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சில் தற்போது சேவை யாற்றுகின்ற ஆலோசகர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) இவர்களின் பெயர்கள், கல்வித் தகைமைகள் மற்றும் பொறுப்புகள் யாவையென்பதையும்;

(iii) இவர்களுக்கு செலுத்தப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவையென்பதையும்;

(iv) கடந்த மாதத்திற்காக செலுத்தப்பட்ட அனைத்து கொடுப்பனவுகளினதும் கூட்டுத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப் பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள், வழங்கப் பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் விபரங்கள் யாவையென்பதையும்;

(ii) இவர்களுக்கு எரிபொருள் கொடுப்பனவு வழங் கப்படும் எனின், ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்படுகின்ற எரிபொருள் கொடுப்பனவு தனித்தனியாக யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவர்களுக்கு தொலைபேசி வசதிகள் வழங்கப் படுமெனின், தற்போது தொலைபேசி வசதிகள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(ii) தொலைபேசிக் கொடுப்பனவுத் தொகை யொன்று வழங்கப்படுமெனின் ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்பட்டுள்ள கொடுப் பனவுத் தொகை தனித்தனியாக எவ்வளவென் பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Employment Promotion and Welfare :

(a) Will he state-

(i) the number of advisers who serve in the Ministry of Foreign Employment Promotion and Welfare at present;

(ii) their names, educational qualifications and responsibilities;

(iii) the salaries and allowances paid to them;

(iv) the total of all the allowances paid during the previous month?

(b) Will he inform this House-

(i) the names of the advisers to whom official vehicles have been provided, the number of official vehicles provided and the details of those vehicles;

(ii) separately of the fuel allowance provided to each adviser, if they are provided with a fuel allowance?

(c) Will he state-

(i) the names of the advisers to whom telephone facilities have been provided by now if telephone facilities are provided to them;

(ii) separately of the amount of the telephone allowance paid to each adviser, if they are paid a telephone allowance?

(d) If not, why?

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 01 (එකයි)

(ii) එම්. අයි. එස්. අහමඩ් මහතා - ගරු අමාත්‍යතුමාගේ උපදේශක
අධ්‍යාපන සුදුසුකම්
- එල්. එල්. බී. නීති උපාධිය - නීතිඥ
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ විශ්‍රාමලත් නිලධාරියෙකි.

වගකීම්
- විදේශ රැකියා හා ප්‍රවර්ධනය පිළිබඳව උපදෙස් ලබා දීම.
- එම ක්ෂේත්‍රයට අදාළ නෛතික උපදෙස් දීම.
- එම ක්ෂේත්‍රයට අදාළ හා අනුබද්ධිත ක්ෂේත්‍ර පිළිබඳව උපදෙස් ලබා දීම.

(iii) මාසික දීමනාව - රු.30,000.00
මාසික ඉන්ධන දීමනාව - රු. 17,500.00
මාසික වාහන දීමනාව - රු. 30,000.00

(iv) 2011 ඔක්තෝබර් මාසය සඳහා රු. 77,500/-ක දීමනාවක් ලබා දී ඇත.

(ආ) (i) නිල රථ ලබා දී නැත.

(ii) නිල රාජකාරි කටයුතු සඳහා පෞද්ගලික වාහන පාවිච්චි කරන බැවින් අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්ට අනුකූලව මාසිකව රු. 17,500/-ක ඉන්ධන දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) (i) ගරු අමාත්‍යතුමාගේ උපදේශක එම්. අයි. එස්. අහමඩ් මහතා

(ii) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 446 ප්‍රකාරව මාසික උපරිම ඒකාබද්ධ වියදම් සීමාව රු. 8,000/- කි.

(ඈ) පැන නොනඟී.

## ඕමන්තෙයි-පලෙයි දුම්රිය මාර්ගය ඉදි කිරීම් : විස්තර

ஓமந்தை - பளை புகையிரத வீதி நிர்மாணம் : விபரம்
CONSTRUCTION OF OMANTHAI-PALAI RAILWAY LINE : DETAILS

1697/'11

**10.** **ගරු දයාසිරි ජයසේකර මහතා (ගරු අනුර දිසානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - மாண்புமிகு அனுர திஸாநாயக்க சார்பாக)
(The Hon. Dayasiri Jayasekara on behalf of the Hon. Anura Dissanayake)

ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ඕමන්තෙයි දුම්රිය ස්ථානයේ සිට පලෙයි දක්වා දුම්රිය මාර්ගයේ දුර කොපමණද;

(ii) ඕමන්තෙයි සිට පලෙයි දක්වා දුම්රිය මාර්ගය පිළිසකර කරනු ලබන සමාගම කවරේද;

(iii) එම සමාගම තෝරාගනු ලැබීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළේද;

(iv) එම මාර්ගය ඉදිකිරීම සඳහා වැය වන මුළු මුදල කොපමණද;

(v) එම මුදල් සපයාගනු ලබන ආකාරය කවරේද;

(vi) ණය මුදලක් මගින් එම මුදල් සපයා ගනු ලබන්නේ නම්, ඊට අදාළ පොලී අනුපාතය හා එම ණය ආපසු ගෙවීමේ කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஓமந்தை புகையிரத நிலையத்திலிருந்து பளை வரையிலுள்ள புகையிரத வீதியின் தூரம் எவ்வள வென்பதையும்;

(ii) ஓமந்தையிலிருந்து பளை வரையிலுள்ள புகை யிரத வீதியை புனரமைக்கின்ற கம்பனி யாதென் பதையும்;

(iii) மேற்படி கம்பனியை தெரிவுசெய்யும்போது முறைசார்ந்த கேள்விப் பத்திரங்கள் கோரும் நடைமுறை பின்பற்றப்பட்டுள்ளதா என்ப தையும்;

(iv) மேற்படி வீதியை நிர்மாணிப்பதற்கு செலவிடப் படும் மொத்தப் பணத்தொகை எவ்வள வென்பதையும்;

(v) மேற்படி பணத்தை பெற்றுக்கொள்ளும் முறை யாதென்பதையும்;

(vi) கடன் மூலமாக மேற்படி பணத்தொகை பெற்றுக்கொள்ளப்படுமாயின் அதற்கான வட்டி வீதங்கள் மற்றும் மேற்படி கடனை மீளச் செலுத்த வேண்டிய காலம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா ?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport :

(a) Will he inform this House-

(i) the length of the railway line from Omanthai railway station up to Palai;

(ii) the name of the company which repairs the railway line from Omanthai to Palai;

(iii) whether a proper tender procedure was followed in selecting the aforesaid company;

(iv) the total amount of money spent on the construction of the aforesaid railway line;

(v) the sources of funding; and

(vi) if the aforesaid amount of money is obtained through a loan, the relevant interest rates and the period of repayment?

(b) If not, why?

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
ගරු කථානායකතුමනි, ගරු ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(i) කි. මී. 87

(ii) ඉන්දියානු ඉර්කොන් සමාගම

මෙය පූර්ණ වශයෙන් ඉන්දියානු රජයට අයත් සමාගමක් වේ.

(iii) යුද්ධය නිමවීමත් සමඟ විනාශ වී ගිය උතුරු හා නැගෙනහිර ප්‍රදේශ තුළ පිහිටි භෞතික සම්පත් නැවත ගොඩනැඟීම රජයේ ප්‍රධාන අභියෝගයක් විය. ඒ අතර උතුරු දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීම ඉතා වැදගත් වූ අතර එය කඩිනමින් ඉදි කිරීමට ද අපේක්ෂා කරන ලදී. ඒ අනුව ඉන්දියානු රජය සමඟ රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සාකච්ඡා කර මෙය ඉදි කිරීම සඳහා ඉන්දියානු ඉර්කොන් සමාගම හා ජනාධිපති කාර්ය සාධන බලකාය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම මඟින් මෙම ඉදිකිරීම් කටයුතු ඉර්කොන් සමාගමට ලබා දෙන ලදී.

(iv) ඇ. ඩො. මි. 185යි.

(v) ණය මුදලක් මඟින්

(vi) පොළී අනුපාතය 3%, කාලසීමාව වසර 05 සිට 20 දක්වාය.

(ආ) අදාළ නොවේ.

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශකයන්: විස්තර
## சுகாதார அமைச்சின் ஆலோசகர்கள்: விபரம்
## ADVISERS UNDER MINISTRY OF HEALTH : DETAILS

1472/’11

**13. ගරු දයාසිරි ජයසේකර මහතා (ගරු අජිත් කුමාර මහතා වෙනුවට)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - மாண்புமிகு அஜித் குமார சார்பாக )
(The Hon. Dayasiri Jayasekara on behalf of the Hon. Ajith Kumara)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ මේ වන විට සේවය කරන උපදේශකයන් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබා දී ඇති උපදේශකයන්ගේ නම්, ලබා දී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබා දෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சுகாதார அமைச்சில் தற்போது சேவையாற்றுகின்ற ஆலோசகர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) இவர்களின் பெயர்கள், கல்வித் தகைமைகள் மற்றும் பொறுப்புகள் யாவையென்பதையும்;

(iii) இவர்களுக்கு செலுத்தப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவையென்பதையும்;

(iv) கடந்த மாதத்திற்காக செலுத்தப்பட்ட அனைத்து கொடுப்பனவுகளினதும் கூட்டுத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள், வழங்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் விபரங்கள் யாவையென்பதையும்;

(ii) இவர்களுக்கு எரிபொருள் கொடுப்பனவு வழங்கப்படும் எனின், ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்படுகின்ற எரிபொருள் கொடுப்பனவு தனித்தனியாக யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவர்களுக்கு தொலைபேசி வசதிகள் வழங்கப்படுமெனின், தற்போது தொலைபேசி வசதிகள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(ii) தொலைபேசிக் கொடுப்பனவுத் தொகையொன்று வழங்கப்படுமெனின் ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்பட்டுள்ள கொடுப்பனவுத் தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health :

(a) Will he state-

(i) the number of advisers who serve in the Ministry of Health at present;

(ii) their names, educational qualifications and responsibilities;

(iii) the salaries and allowances paid to them;

(iv) the total of all the allowances paid during the previous month?

(b) Will he inform this House-

(i) the names of the advisers to whom official vehicles have been provided, the number of official vehicles provided and the details of those vehicles;

(ii) separately of the fuel allowance provided to each adviser, if they are provided with a fuel allowance?

(c) Will he state-

(i) the names of the advisers to whom telephone facilities have been provided by now if telephone facilities are provided to them;

(ii) separately of the amount of the telephone allowance paid to each adviser, if they are paid a telephone allowance?

(d) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 01 කි.

(ii) නම: වෛද්‍ය එච්. ආර්. යූ. ඉන්ද්‍රසිරි මහතා

හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ)

අධ්‍යාපන සුදුසුකම්:

වෛද්‍ය විද්‍යා ශල්‍ය වෛද්‍ය උපාධිය - එම්. බී. බී. එස්. (ලංකා) - 1979

විද්‍යාපති උපාධිය - එම්. එස්. සී (වෛද්‍ය පරිපාලන) - 1996

වෛද්‍ය පරිපාලන සංගම් අධි සාමාජික (එෆ්. සී. එම්. ඒ.) (Fellow of the College of Medical Administrators)

උසස් ඉංග්‍රීසි ඩිප්ලෝමාව - කොළඹ විශ්ව විද්‍යාලය - 1995

වගකීම්: විශිෂ්ට රෝගී සත්කාර සේවාවක් ඇති කිරීම අරමුණු කරගත් විශිෂ්ට රෝගී සත්කාර සේවා වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිර්දේශ හා උපදෙස් ලබා දීම.

(iii) රු. 30,000.00 ක මාසික දීමනාව සහ ඩීසල් ලීටර් 140කට සමාන ඉන්ධන දීමනාව

(iv) රු. 41,735.00

(ආ) (i) ප්‍රවාහන දීමනාව ලබා දීම වෙනුවට වෛද්‍ය එච්. ආර්. යූ. ඉන්ද්‍රසිරි මහතා වෙත WP-GA 4056 දරන රථය ලබා දී ඇත.

(ii) ඉන්ධන දීමනාව රු. 11,760/- යි. (ඉන්ධන ලීටර් 140ක් සඳහා)

(ඇ) (i) දුරකථන පහසුකම් ලබා දී නොමැත.

(ii) දුරකථන දීමනා ලබා නොදේ.

(ඈ) පැන නොනඟී.

## පලෙයි-කන්කසන්තුරේ දුම්රිය මාර්ගය ඉදි කිරීම් : විස්තර

### பளை - காங்கேசன்துறை புகையிரத வீதிநிர்மாணம் : விபரம்

### CONSTRUCTION OF PALAI-KANKASANTHURAI RAILWAY LINE : DETAILS

1698/'11

**15. ගරු දයාසිරි ජයසේකර මහතා (ගරු අනුර දිසානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - மாண்புமிகு அனுர திஸாநாயக்க சார்பாக)
(The Hon. Dayasiri Jayasekara on behalf of the Hon. Anura Dissanayake)

ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පලෙයි දුම්රිය ස්ථානයේ සිට කන්කසන්තුරේ දක්වා දුම්රිය මාර්ගයේ දුර කොපමණද;

(ii) පලෙයි සිට කන්කසන්තුරේ දක්වා දුම්රිය මාර්ගය පිළිසකර කරනු ලබන සමාගම කවරේද;

(iii) එම සමාගම තෝරා ගනු ලැබීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළේද;

(iv) එම මාර්ගය ඉදිකිරීම සඳහා වැය වන මුළු මුදල කොපමණද;

(v) එම මුදල් සපයාගනු ලබන ආකාරය කවරේද;

(vi) ණය මුදලක් මගින් එම මුදල් සපයා ගනු ලබන්නේ නම්, ඊට අදාළ පොලී අනුපාතය හා එම ණය ආපසු ගෙවීමේ කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பளை புகையிரத நிலையத்திலிருந்து காங்கேசன் துறை வரையிலான புகையிரத வீதியின் நீளம் எவ்வளவு என்பதையும்;

(ii) பளையிலிருந்து காங்கேசன்துறை வரையிலான புகையிரத வீதியைப் புனரமைக்கும் கம்பனி யாதென்பதையும்;

(iii) மேற்படி கம்பனியை தெரிவுசெய்கின்றபோது முறைசார்ந்த கேள்விப்பத்திர நடைமுறை பின்பற்றப்பட்டதா என்பதையும்;

(iv) மேற்படி வீதியைப் புனரமைப்பதற்கு செல வாகும் மொத்தப் பணத்தொகை யாதென் பதையும்;

(v) இப்பணத்தொகையை பெற்றுக்கொள்ளும் முறைமை யாதென்பதையும்;

(vi) கடன் மூலமாக மேற்படி பணத்தொகையை பெற்றுக்கொள்வதாயின் ஏற்புடைய வட்டி வீதம் மற்றும் இக்கடன் தொகையை மீளச் செலுத்து வதற்கு எடுக்கும் காலம் எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport :

(a) Will he inform this House-

(i) the length of the railway line from Palai railway station up to Kankasanthurai;

(ii) the name of the company which repairs the railway line from Palai to Kankasanthurai;

(iii) whether a proper tender procedure was followed in selecting the aforesaid company;

(iv) the total amount of money spent on the construction of the aforesaid railway line;

(v) the sources of funding; and

(vi) if the aforesaid amount of money is obtained through a loan, the relevant interest rates and the period of repayment?

(b) If not, why?

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කි. මී. 56යි.

(ii) ඉන්දියානු ඉර්කොන් සමාගම.

(iii) පලෙයි සිට කන්කසන්තුරේ දක්වා දුම්රිය මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව China Railway Engineering Company වෙත පිරිනැමීමට 2009 ඔක්තෝබර් මස 28 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය තීරණය කරන ලදී. මෙහි වටිනාකම ඇ. ඩො. මි. 245.04ක් වූ අතර ගැනුම්කරු චීනයේ EXIM බැංකුවෙන් වාසිදායක ණය පහසුකම් අපේක්ෂා කරන ලදී. නමුත් 2009 දෙසැම්බර් දක්වා මෙකී පහසුකම් පිළියෙල කිරීමට අදාළ සමාගම අපොහොසත් වූ අතර උතුරු දුම්රිය මාර්ගයේ අනෙක් කොටස නැවත ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ලබා දුන් ඉන්දියන් රජයට අයත් සමාගමක් වන ඉන්දියානු ඉර්කොන් ජාත්‍යන්තර සමාගමට මිල ගණන් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලද අතර ඔවුන් ඉදිරිපත් කළ ඇ. ඩො. මි. 152ක මුදල ඇ. ඩො. මි. 149කට තීරණය කිරීමට තාක්ෂණ ඇගයීම් කමිටුව සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව එකඟ විය.

(iv) ඇ. ඩො. මි. 149

(v) ණය මුදලක් මඟින්

(vi) පොළී අනුපාතය 3%කි. කාල සීමාව වසර 05 සිට 20 දක්වාය.

(ආ) අදාළ නොවේ.

# විසර්ජන පනත් කෙටුම්පත, 2012
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012
## APPROPRIATION BILL, 2012

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***
***ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 21]***
***"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය" [අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 21]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மேதகு மஹிந்த ராஜபக்ஷ]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [21st November]*
*"That the Bill be now read a Second time".- [His Excellency Mahinda Rajapaksa]*
*Question again proposed.*

[පූ. භා. 10.19]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, 2012 අය වැය පිළිබඳව සාකච්ඡා වන මේ අවස්ථාවේදී මට කතා කරන්නට වෙලාව ලබා දීම ගැන. පළමුවෙන්ම රජයට ප්‍රශ්න කීපයක් යොමු කරමින් මගේ කතාව ආරම්භ කරන්නයි බලාපොරොත්තු වෙන්නේ. ඒ ගැන විවේචනයකට වඩා රජයෙන් කරන පැහැදිලි කිරීමක් අද මේ රටේ ජනතාවට අවශ්‍ය වෙලා තිබෙනවා. අද රටේ ආදායමත් වියදමත් සංසන්දනය කරලා බලනකොට සියයට 50ක වෙනසක් තිබෙනවා. දේශීය හා විදේශීය ණය සහ ආධාරවලින් එයින් සියයට 50ක් පියවා ගන්න රජය යෝජනා කර තිබෙනවා.

ඒ එක්කම අපට අලුත් ප්‍රශ්නයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. දැනට අරගෙන තිබෙන ණය පිළිබඳ පැහැදිලි කිරීමක් කරලා නැහැ. ඒවා ගෙවීම පිළිබඳව පැහැදිලි කිරීමක් කරලාත් නැහැ. ඒ වාගේම අය වැයෙන් යෝජනා කර තිබෙන පරිදි රුපියල සියයට 3කින් අවප්‍රමාණය වුණාම, අපි දැනට අරගෙන තිබෙන ණය ගෙවනකොට, ඒ ණය සඳහා ගෙවන පොලියත්, ණය ප්‍රමාණයත් තවත් වැඩි වෙනවා. එතකොට අර සියයට 50ට ඒකත් එකතු වුණාම ඒ මුදල් සොයා ගන්නේ කොහෙන්ද කියන එක ගැන පැහැදිලි කිරීමක් රජය වෙනුවෙන් කවුරු හරි කරන කතාවකදී අපි බලාපොරොත්තු වෙනවා.

මෙහි නිශ්චිත වශයෙන් සඳහන් කර තිබෙන කර්මාන්තවලට අදාළ නිෂ්පාදන මෙහිම නිෂ්පාදනය කරලා පිට රට යවනවා නම්, ඒකෙන් කර්මාන්තකරුවන්ට යම් කිසි සහනයක් තිබෙන බව අපි පිළිගන්නවා. නමුත් අද මේ රටේ තිබෙන ඇඟලුම් කර්මාන්තය දෙස බලන විට, ඇඟලුම් කර්මාන්තය සඳහා අවශ්‍ය වන අමු ද්‍රව්‍ය සියයට සියයක්ම ගෙන්වන්නේ පිට රටින්. එහෙම ගෙන්වනකොට රුපියල සියයට 3කින් අවප්‍රමාණය කිරීමේ බලපෑම අපට වාසි සහගතද, අවාසි සහගතද? අමු ද්‍රව්‍යවලින් සියයට 90ක් විතර එහෙම නැත්නම් සියයට සියයක්ම මෙරටට ගෙන්වා කරන නිෂ්පාදන නැවත පිට රට යවනකොට අපට ලැබෙන වෙළෙඳ වාසිය මොකක්ද කියලා අපි අහනවා.

මම දන්න පිළිවෙළට, අද අපි මේ රටේ තිබෙන කර්මාන්ත අනුව බලන විට වැඩි අවාසියක් ලැබෙන්නේ අපේ රටටයි; ඒ වාගේම අපේ රටේ කර්මාන්තකරුවන්ටයි; ඒ වාගේම අපේ රටේ ජනතාවටයි. මේ මූලික ප්‍රශ්නය තුළ තමයි මේ 2012 අය වැයත් ඒ වාගේම 2005 ජනාධිපතිවරණයේදී දීපු පොරොන්දු ඇතුළත් මහින්ද චින්තනය පිළිබඳවත්, එහි ඉදිරි ගමන් මඟ පිළිබඳවත් අපට සාකච්ඡා කරන්න තිබෙන්නේ. ඒ නිසා මේ විවාදයේදී මම පළමුවෙන්ම "External Resources Department, 2011-Outstanding Debts" පිළිබඳ සටහන හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

එහි සඳහන් වෙලා තිබෙන්නේ අපි අරගෙන තිබෙන outstanding ණය පිළිබඳවයි. මේකේ බොහොම පැහැදිලිව තිබෙන කාරණයක් තමයි, රුපියල අවප්‍රමාණය කිරීම නිසා අපට ගෙවන්න තිබෙන මුදල තවත් වැඩි වී තිබීම. මම මේ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. මොකද අපේ කාලය සීමා වෙලා තිබෙන නිසා. මේ පිළිබඳව කථා කරන කොට හැංගිච්ච රහසක් මේ අය වැය තුළ තිබෙනවා. පියවා ගන්න බැරි ණයක් සහ රුපියල අවප්‍රමාණය වීම නිසා ඒක වැඩි වීම පිළිබඳව තිබෙන භයානක තත්ත්වය පිළිබඳව අද මේ පාර්ලිමේන්තුවේදී රජයේ වගකිව යුතු ඇමතිවරයෙකු පැහැදිලි කරනවා නම් අන්න හරි අය වැයක් පිළිබඳව අපට කථා කරන්න පුළුවන්. ඒ කිසිවක් සඳහන් නොකරපු නිසා අපට කරන්න තිබෙන්නේ මොකක්ද? උදාහරණයක් හැටියට ගත්තොත් රුපියල සියයට තුනකින් අවප්‍රමාණය කරන කොට මේ රටට ගෙන්වන්න තිබෙන ඉන්ධනවල මිල වැඩි වෙනවා. මේක තමයි සැබෑ සත්‍යය. ඒ ඉන්ධන මිල වැඩි වෙන කොට ඒ ඉන්ධන මිල වැඩි වීමේ බර පැටවෙන්නේ කාටද? මේ රටේ ප්‍රවාහන සේවයට, මේ රටේ පාරිභෝගිකයන්ට ඒ වාගේම රජයේ සේවකයන්ට, පෞද්ගලික අංශයේ සේවකයන්ට මේ මුදල් ගෙවීමේ වගකීම පැවරෙනවා. මේ ටික හංගලා තමයි මේ අය වැය ගැන අපට කථා කරන්නේ. මේ දත්ත ටික හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

ඊළඟට මම කථා කරන්නේ, රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩි වීම පිළිබඳවයි. අය වැය කථාවේදී රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩිවීම පිළිබඳව බොහොම ඉහළින් කථා කළා. අපේ ගරු මන්ත්‍රීතුමන්ලාත් බොහොම සන්තෝෂයෙන් -අපි නොහිටියත්- අත් පොඩි ගහලා ඒක පිළිගත්තා. අය වැය කථාවේ තිබෙනවා, රජයේ සේවකයන්ගේ පඩි වැඩි වීම පිළිබඳව.

නමුත්, ඇත්ත කතාන්දරය මොකක්ද? පඩි වැඩි වීමක් නැහැ. ගරු කථානායකතුමනි, පඩි වැඩි වෙන කොට වැඩි වන පඩියට ඇඳිලා ඒ හා සමානව තවත් වරප්‍රසාද එනවා. නමුත් මෙතැන වෙලා තිබෙන්නේ පඩි වැඩි වීමක් නොවෙයි, දීමනා වැඩි වීමක්. දීමනාවක් දෙනවා. දීමනාවයි, පඩියයි කියන එක හඳුනා ගන්න අපොහොසත් වුණු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා බොහොම හයියෙන් අත් පුඩි ගහනවා මම දැක්කා. නමුත්, ජනාධිපතිතුමා බොහොම ක්‍රමානුකූලව ක්ෂණිකව ඒ වෙලාවේ මේ මන්ත්‍රීවරුන්වත්, රටේ ජනතාවත් පඩි වැඩි වීමක් කියලා නොමඟ යැව්වා. "පඩි වැඩි වීම" කියලා තමයි මේකේ තිබෙන්නේ. එහෙම පඩි වැඩි වීමක් නැහැ. දීමනා වැඩි වීමක් තිබෙන්නේ. මේ කරන දේ තේරෙන්නේ නැත්නම් පැහැදිලි කර ගන්න ඕනෑ. [බාධා කිරීම්]

---

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පඩි වැඩි වීමක් නේ තිබෙන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, මේක තේරුම් ගැනීමට අමාරු වීම තමයි දැන් තිබෙන ලොකුම ප්‍රශ්නය. පඩිය වැඩි වීම කියන කොට ඒ හා සමානව බැඳුණු තවත් වැඩි වීම් රාශියක් තිබෙනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මොනරු කොළ වැඩි වීමක්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පඩි වැඩි වීම හා සමානව බලන කොට අතිකාල දීමනා වැඩි වෙනවා, ගමන් වියදම් දීමනාව වැඩි වෙනවා. විශාල ප්‍රමාණයකින් තවත් මෙවැනි වරප්‍රසාද වැඩි වෙනවා. නමුත්, දීමනා වැඩි වෙන කොට ඒ කිසිවක් වැඩි වෙන්නේ නැහැ. පඩියට දීමනාවක් එල්ලුවා විතරයි. වෙන එකක් නැහැ. රාජ්‍ය සේවකයන්ට මේක තේරුම් ගන්න පුළුවන්. මේක තේරුම් ගන්න පුළුවන් සමහර මන්ත්‍රීවරු, ඇමතිවරු ඉන්නවා. ඒ අය පිටට ගිහිල්ලා මේ ගැන කථා කරලා තිබෙනවා. නමුත් මේක තේරුම් ගන්න බැරි වුණු මන්ත්‍රීවරුන් බොහොම හයියෙන් අත් පුඩි ගහනවා අපි දැක්කා. [බාධා කිරීමක්] තමුන්නාන්සේගේ කථාවේදී කියන්න "පඩි තමයි වැඩි කළේ" කියලා. [බාධා කිරීමක්] ඒකට කමක් නැහැ. නමුත්, තවත් ප්‍රශ්න කිහිපයක් අපට තිබෙනවා. මේ අය වැය පිළිබඳව කථා කරන කොට ජනාධිපතිතුමා මෙම අය වැය හරහා මේ පාර්ලිමේන්තුවේදී කරපු ප්‍රකාශ මීට ඉස්සෙල්ලාත් කරලා තිබෙනවා. ඒවා මහින්ද චින්තනයේත් තිබෙනවා. මේවා ඉෂ්ට වෙලා නැහැ. හමුදාවේ අයගේ තුන්වැනි දරුවාට රුපියල් ලක්ෂයක් දෙන එක පිළිබඳව අපි හොයලා බැලුවා. කී දෙනෙකුට දීලා තිබෙනවාද කියලා කොහේවත් දත්තයක් නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, ඒක දීලා තිබෙනවා. මෙතුමාට හොයලා බලන්න කියන්න.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ඒක ඔබතුමාගේ කථාවේදී කියන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
එහෙම දීලා තිබෙනවා නම්, හමුදාවල අයට මෙන්න මේ ප්‍රමාණයට දීලා තිබෙනවා, මෙන්න ඒ නම් ලැයිස්තුව කියලා මගේ කථාවෙන් පස්සේ හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වීම සඳහා සභාගත කළොත් අපට පිළිගන්න පුළුවන්. නමුත්, මම විවිධ තැන්වලින් හොයලා බලපුවාම ගෙවපු එකක් කොහේවත් නැහැ.

දැන් ජනාධිපතිතුමා කියනවා, ඒ මුදල පොලීසියේ අයටත් ගෙවනවා කියලා. ඒ ගෙවන්නේ එක වරටම නොවෙයි; දරුවා හම්බ වුණ ගමන් නොවෙයි. දරුවා හම්බ වෙලා, ඒ දරුවා කසාදයක් බැඳලා එයාටත් දරුවෙක් හම්බ වන වෙලාවට තමයි මේ

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

ගෙවන්නේ; තවත් රුපියල් ලක්ෂයක් ගෙවන්නේ. මගේ ප්‍රශ්නය ඒක නොවෙයි. මේ අනතුරු ඇඟවීම, රාජ්‍ය සේවකයාව, හමුදාව, පොලීසිය රැවටීම පිළිබඳව අති භයානක තත්ත්වයක් තිබෙනවා.

අපි එන කොට දකිනවා, හමුදාවට බඳවා ගත් අය, එහෙම නැත්නම් දැනට හමුදාවේ විවිධ අංශවල වැඩ කරන අය මේ පාර්ලිමේන්තු ground එකේ, පාරවල කුණු අරන් දමනවා; කාණු ශුද්ධ කරනවා; එළවලු විකුණනවා. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, දැන් ඒ අය මේ ground එකේ තණකොළ හිටවනවා. මම අහන්නේ මේකයි. මේ කොහාටද යන්නේ? හමුදාව ලවා මේ රටේ සියලුම පාලනය ඇති කිරීමේ වැඩ පිළිවෙළකටයි. මේක තමයි භයානක තත්ත්වය. හදිසි අවස්ථාවක, හදිසි නීතිය යටතේ හමුදාව පාරට බස්සන්න පුළුවන් කියලා අපි දන්නවා. හදිසි නීතියක් නැති වෙලාවේ හමුදාව පාරට බස්සලා මේ වාගේ වැඩ කර ගන්න බැහැ. ඒ වැඩ කරන්න පළාත් පාලන ආයතනවල අය ඉන්නවා. රජයේ සේවකයෝ, සෞඛ්‍ය අංශයේ සේවකයෝ ඉන්නවා. ගරු කථානායකතුමනි, අද ඒ හැම අංශයක්ම මහා භයානක විධියට කඩා ගෙන වැටිලා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
නැහැ, නැහැ, මම පැහැදිලි කරන්න ඉඩ දෙන්නේ නැහැ. මේක ප්‍රශ්න උත්තර එකක් නොවෙයි නේ. මම මේ මගේ කථාවයි කරන්නේ. තමුන්නාන්සේ හොඳට අහ ගෙන ඉඳලා, පැහැදිලි වුණා නම් තමුන්නාන්සේගේ කථාවේ දී ඒකට උත්තර දෙන්න. ඒක තමයි සිරිත. එහෙම නැතිව තමුන්නාන්සේ අහන ප්‍රශ්නවලට මට උත්තර දිදී ඉන්න පුළුවන්යැ.

ගරු කථානායකතුමනි, මේ අය වැය පරතරය පියවා ගැනීම ගැන බලන කොට, මීට පෙර ඒවා පියවා ගැනීම සඳහා මුදල් සොයා ගෙන තිබෙන්නේ මේ රටේ පාරිභෝගික ජනතාවගෙනුයි. ඒක තමයි ඇත්ත කථාව. 2011 අය වැයේදී ඒ පරතරය පියවන්න ප්‍රධාන වශයෙන්ම මුදල් සොයා ගෙන තිබෙන්නේ මේ රටේ පාරිභෝගික ජනතාවගෙන්. අපි පාරිභෝගික ජනතාව ගැන කථා කරන කොට විශේෂයෙන්ම පාරිභෝගික ජනතාවගෙන් ප්‍රධානම කට්ටිය කවුද කියන එකට මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. කන බොන කට්ටිය විතරක් නොවෙයි. දවසට ආහාර වේලකට ගන්න හාල් ටික, පරිප්පු ටික, ඒ වාගේම සීනි ටික, බෙහෙත් ටික ආදී වශයෙන් වර්ග කරලා ගත්තාම මෙයින් ඉතාම භයානක විධියට අසරණ තත්ත්වයට වැටිලා ඉන්න පාරිභෝගිකයන් කොටසක් ඉන්නවා. ඒ සේවාවක් හැටියට සලකන කොට. අද ඒක සේවාවක් නොවෙයි. පාරිභෝගිකයෝ බවට පත්වෙලා. කවුද ඒ? මේ රටේ අසනීපවෙලා ආරෝග්‍යශාලාවලට යන ලෙඩ්ඩු.

මේක ප්‍රධානයි. ලක්ෂ ගණනක් අහිංසක ජනතාව අද රජයේ ආරෝග්‍ය ශාලාවලට -පිට ඒවාට නොවෙයි- බෙහෙත් ගන්න ගියාම ඒවායේ බෙහෙත් නැහැ. පාරිභෝගිකයෙක් බෙහෙත් ගන්න යනවා. නමුත් බෙහෙත් නැහැ. මේ රටේ බෙහෙත් හදන්නේ නැහැ. අත්‍යවශ්‍ය බෙහෙත්වලින් වැඩි හරියක් පිට රටින් ගෙන්වන්නේ. ඒ බෙහෙත්වලට ගෙවන මුදලටත් මේ රුපියල අවම කිරීමේ බලපෑම භයානක විධියට එනවා.

මෑතකදී මම එක ආරෝග්‍ය ශාලාවකට ගියා. ඒ වෙලාවේ එක හෘදය රෝගියෙක් ICU එකේ හිටියා. එයාට injection එකක් ගහන්න ඕනෑ. ඒක රුපියල් 8,000යි. Fridge එකේ injections 2ක් තිබුණා. මෙතැනදී මම ඒ දොස්තර මහත්තයාගේ නම කියන්නේත් නැහැ, ඒ ඉස්පිරිතාලයේ නම කියන්නේත් නැහැ. ඒ injection එක ගහන්න නම් ඒ රුපියල් 8,000 ගෙවන්න කියනවා. මම ගිහින් පොරොන්දු වුණා, "මම සල්ලි ගෙවන්නම්, දැනට injection එක ගහන්න" කියලා. නැත්නම් මම සල්ලි අරගෙන එන කොට ඒ මනුස්සයා මැරෙන්න පුළුවන්. මෙන්න මේ විධියට අද මේ අය වැය තුළින් භයානක තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන සේවාව පුළුල් කරන්න මේ අය වැය තුළින් මොනවාද කර තිබෙන්නේ කියලා අප අහන්න කැමැතියි. මේක තමයි මේ රටේ තිබෙන භයානකම තත්ත්වය.

අපේ නිවාස ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා වැඩ කරන්න බොහොම දක්ෂ ඇමතිවරයෙක්. එතුමා ඉස්සරත් වැඩ කර තිබෙනවා. දැනුත් දක්ෂයි. නමුත් නිවාස හදන්න එතුමාගේ අමාත්‍යාංශයට කොච්චර මුදලක් වෙන් වෙලා තිබෙනවාද? නිවාස අලුත්වැඩියා කරන්න, හුණු ගාන්න -ඒවාට- නොවෙයි. අලුත් නිවාස හදන්න කොච්චර මුදලක් වෙන් වෙලා තිබෙනවාද? එතුමාගේ අමාත්‍යාංශයට නැත්නම් වෙනත් අමාත්‍යාංශයකට හෝ අධිකාරියකට එහෙම මුදල් වෙන් වෙලා තිබෙනවාද? අපට ඒක පැහැදිලි කර දෙන්න. මොකද, අද මේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය නිවාස ප්‍රශ්නයයි. මනුස්සයෙකුට නිවාසයක් නැහැ. බෙහෙත් හේත් ටිකක් නැහැ. මේවා ප්‍රධාන දේවල්. කන බොන දේවල් පැත්තකින් තියමු. මේවාට කොච්චර මුදලක් වෙන් වෙලා තිබෙනවාද කියලා අපට කියන්න.

ගරු කථානායකතුමනි, අද අපට පේනවා, මේ අය වැය අපේ අනිකුත් අංශවලට බලපාන හැටි. විශේෂයෙන්ම රාජ්‍ය සේවකයා සහ පෞද්ගලික අංශයේ සේවකයාට මේ අය වැය බලපාන්නේ කොහොමද? හොඳ රාජ්‍ය සේවයක් ඇති වෙන්න නම් ඒ අයට ඕනෑ කරන පදනම් කීපයක් තිබෙනවා. පළමුවෙනි එක තමයි, සතුටුදායක ජීවන තත්ත්වයක් ඇති කිරීම. අද ඔවුන්ට එවැනි සතුටුදායක ජීවන තත්ත්වයක් නැහැ. හැම දාම නොයෙක් තැන්වල කියන්නේ, ප්‍රවෘත්ති පත්‍රවල පළ වන්නේ අර අහිංසක රජයේ සේවකයා, ගුරුවරයා තමුන්ගේ සේවය හරියට කරන්නේ නැහැ කියලායි. සේවය කරන්නේ කොහොමද? අපි සංවාදයකට යමුයි කියලා කථා කළා. ඒක හොඳයි. ගරු කථානායකතුමනි, අපේ පැරණි ගුරුවරයකු ගත්තොත්, ඒ ගුරුවරයා තමන්ගේ කාර්ය භාරය කරලා, පවුලක් නඩත්තු කරලා මේ සමාජයේ උත්තරීතර තත්ත්වයෙන් ජීවත් වුණා. මේක තමයි ගුරුත්වය සහ රාජ්‍ය සේවය. ඔහු සේවයට කැප වුණා. අපි ඒ ගුරුවරයාට ආදරය කළා. එතුමා කොහේවත් ගියේ නැහැ. මේ හම්බ වෙච්ච පඩියෙන් පවුලත් නඩත්තු කරලා ජීවත් වුණා.

එදා ගුරුවරුනුත්, අද ගුරුවරුනුත් අතර පරතරය බලන්න. පඩි වැඩි වීම ගැන නොවෙයි මා මේ කියන්නේ. සොච්චමකින් පඩි වැඩි කරලා ගුරුවරුන්ව සතුටු කරන්න බැහැ; ගුරු පියවරුන්, ගුරු මෑණිවරුන් සතුටු කරන්න බැහැ. ඒ අය ගුරු වෘත්තියේ යෙදිලා ඊ ළඟට යන්නේ කොහේටද? බොහොම සුළු කොටසක් යනවා, tuitionවලට. අනික් අය කුකුළු කොටුවක් කරනවා, එහෙම නැත්නම් වෙනත් ව්‍යාපාරයක් කරනවා. දුවගෙන යන්නේ ඒ කටයුතුවලටයි. සමහර වෙලාවට මේ අයට සිද්ධ වනවා, තමන්ගේ පවුල නඩත්තු කරන්න වෙනත් වැඩවල යෙදෙන්න. මේ ගුරුවරයා පාසලට යන කොට මානසික වශයෙන් ඔළුවේ තබා ගෙන යන්නේ දරුවන්ට ඉගැන්වීම ගැන නොවෙයි. එවැනි දෙයක් කරන්න තරම් මානසික තත්ත්වයක් රජයේ සේවයේ ගුරුවරයාට නැහැ; ඒ වාගේම රාජ්‍ය සේවයේ අනික් අයටත් නැහැ.

මේ අය වැය ගැන කථා කරද්දී රජයේ සේවකයා ඉන්නේ කොතැනද කියා අපි වටහා ගන්න ඕනෑ. රුපියල් 10,000කින් පඩි වැඩි කරන්න කියලා අපි ඉල්ලුවේ නිකම් නොවෙයි. අද යන්තම්

හෝ වේවා මා මේ කිව්ව මායිමට එන්න පුළුවන්, රාජකාරියක් කර ගන්න පුළුවන්, සේවයක් ඉෂ්ට කර ගන්න පුළුවන් තත්ත්වයට මේ රාජ්‍ය නිලධාරියාව ගෙනෙන්න තමයි රුපියල් 10,000කින් පඩි වැඩි කරන්න කියලා කිව්වේ. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නේ? රුපියල් 2,500ක දීමනාවක් දෙන කොට එතැනින් එහාට කල්පනා කරලා නැහැ, මේ කාල පරිච්ඡේදය තුළ මේ සියයට තුනේ අවප්‍රමාණයත් එක්කම මේ රටේ ඇති වන පාරිභෝගික භාණ්ඩවල සහ සේවාවන්වල මිල වැඩි වීම කොයි ආකාරයෙන් මේ රාජ්‍ය සේවකයාට බලපානවාද කියලා. මේක තමයි අපට ප්‍රධාන වශයෙන්ම හිතන්න තිබෙන කාරණා ටික.

ඒ විතරක් නොවෙයි. අද අධ්‍යාපනික වශයෙන් බැලුවොත්, අපට පැහැදිලි කරලා කියන්න, රජය යන්නේ කොහේටද කියලා. එක්සත් ජාතික පක්ෂය පෞද්ගලික ආරෝග්‍යශාලා ආරම්භ කළා. ඒක භය නැතුව කියන්න පුළුවන්. පෞද්ගලික ආරෝග්‍යශාලා සාර්ථකද, අසාර්ථකද කියලා ආණ්ඩුව අපට කියන්න. ඒ සඳහා තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය මොකක්ද? පෞද්ගලික ආරෝග්‍යශාලා ටිකත් වහලා රජයේ ආරෝග්‍යශාලා විතරක් ගෙන යනවාද? එහෙම නැත්නම් පෞද්ගලික ආරෝග්‍යශාලා තවදුරටත් පවත්වා ගෙන යෑමට ඉඩ දෙනවාද? මේක අපට තිබෙන විශාල ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි.

සමාජ ආරක්ෂණය පිළිබඳව ගරු ජනාධිපතිතුමා මේ අය වැය පොතේ බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා. සෞඛ්‍ය සේවයත් ඒකේ ප්‍රධාන කාරණයක්. පෞද්ගලිකව හෝ රජයේ හෝ මේ සෞඛ්‍ය සේවය ලබා ගන්නට රජයේ සේවකයින්ට දැනට තිබෙන්නේ අග්‍රහාර රක්ෂණ ක්‍රමය විතරයි. රජයේ සේවකයින්ගෙන් ඒ සඳහා රුපියල් 75ක් කපනවා. ඒ රුපියල් 75ත් එක්ක තමයි ඒ අරමුදල ගොඩනැඟිලා තිබෙන්නේ. දැන් මේ අනුව බලන විට, ලක්ෂ 12ක් වන මේ රටේ රජයේ සේවකයන් ප්‍රමාණය වෙන් කර ගත්තත් ඉතිරි ටිකට පෞද්ගලික ආරෝග්‍යශාලාවකට ගිහින් හෝ සෞඛ්‍ය සේවය ලබා ගන්නට මේ අය වැයෙන් කර තිබෙන ප්‍රතිපාදනය හෝ සමාජ රක්ෂණය මොකක් ද කියා මා අහන්නට කැමැතියි. එවැනි සමාජ රක්ෂණයක් මේකෙන් ඇති වෙලා නැහැ. අය වැය සම්බන්ධයෙන් කථා කරන කොට මේ කාරණයත් විශේෂයෙන් අපට මතක් කරන්නට තිබෙනවා. දරුවන්ට දෙන ත්‍රිපෝෂ පිළිබඳව, surgical gauze පිළිබඳව, ඖෂධ ද්‍රව්‍යයන් පිළිබඳව, පාසල් නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් අය වැයේ සඳහන්ව තිබුණත් සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත දිරි ගන්වන්නට මොකක් ද කර තිබෙන්නේ? එවැනි දිරි ගැන්වීමක් අය වැයෙන් සඳහන් කර නැහැ. විශාල පිරිසක් මේ අනුව අතරමං වන තත්ත්වයට පත් වෙනවා ගරු කථානායකතුමනි. මේ වැඩ පිළිවෙළ තුළ භාණ්ඩවල මිල වැඩි වෙනවා පමණක් නොවෙයි, මේවායේ රක්ෂාව කරන විශාල පිරිසකගේත් රක්ෂාවල් නැතිව යනවා.

විද්‍යා සහ තාක්ෂණ කටයුතු භාරව සිටි ඇමතිතුමා දැන් මේ සභාවේ ඉන්නවා. මා හිතන්නේ එතුමා තවමත් එම අංශය භාරව වෙන්න ඇති කටයුතු කරන්නේ කියලායි; Senior Ministers ගණයට වැටෙන්නේ. මේ අය වැය සකස් වෙලා තිබෙන ක්‍රමය පිළිබඳව කරුණු මා ළඟ තිබෙනවා. Senior Ministersලා බොහොම ආඩම්බරයෙන් කථා කළත් -අපි රැස්වීම් කිහිපයකට ගියා. තමුන්නාන්සේගේ ministry එකටත් එනවා.- මේ secretariat එකට -ඒ කියන්නේ මේ අමාත්‍යාංශවල ඉන්න සියලුම ඇමතිවරුන්ට- 2011 වර්ෂය සඳහා අනුමත කර තිබුණේ කීයද? රුපියල් මිලියන 358යි. 2012 වර්ෂයට මිලියන 420යි. මොකක් ද කරන්න පුළුවන්? මේ අමාත්‍යවරුන්ට කරන්නට පුළුවන් වන්නේ එතුමන්ලාට භාර දී තිබෙන අමාත්‍යාංශවල coordination එක විතරයි. වෙන එකක් නැහැ. දක්ෂ ඇමතිවරු ඉන්නවා. මා දන්නවා, මෙතුමාත් දක්ෂ ඇමතිවරයෙක්.

මෙතුමා ඉතා පුළුල් වැඩ පිළිවෙළක් ගෙන ගිහිල්ලා කිව්වා, "මට ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න සල්ලි මදි" කියලා. ඒ, මෙතුමා ආරම්භ කරපු ඒ විද්‍යා සම්පත් මධ්‍යස්ථානවලට. ඒක ඉතා හොඳ වැඩ පිළිවෙළක්. නමුත් ඒ අයට එතැනින් එහාට යන්න කිසිම වැඩ පිළිවෙළක් මේ අය වැයේ යෝජනා කරලා නැහැ. එතකොට පුහුණු වෙච්ච එක්කෙනා එලෙසම ඉන්නවා.

අලුත් තාක්ෂණය පාසලට ගෙනි යන්න. දැන් මේකත් මම කථා කළා, අපේ Consultative Committee on Education එකේදී. එදා අපිට පොරොන්දු වුණා අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමිය, සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ ඒ විෂයයන්ට අදාළ CD පටි අපිට හදලා දෙනවා කියලා. මම check කරලා බැලුවා 2011 වන කොට විභාගයට එන දරුවන්ට මේ CD පටි ටික දෙන්න පුළුවන්ද කියලා. මොකද, ගෙදර TV එකක්, VCD player එකක් තිබෙනවා නම් ගෙදර ගිහිල්ලාත් අමතරව ඉගෙන ගන්න පුළුවන්. ඔබතුමාට මම කියන්න කැමැතියි, CD පටි දෙකයි හදලා තිබෙන්නේ. ඒ ඉතුරු ටික කරන්න මේ අය වැයෙන් දීලා තිබෙන්නේ මොනවාද? අඩු තරමේ විෂයයන් 8කට CD පටි හැදෙන්න ඕනෑ ජාතික අධ්‍යාපන ආයතනයෙන්; NIE එකෙන්. නමුත් ඒකට මුදල් වෙන් කරලා නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හිටපු අධ්‍යාපන ඇමතිතුමා මෙතැන ඉන්නවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த )
(The Hon. A.D. Susil Premajayantha )
අධ්‍යාපන ඇමතිතුමා හැටියට මම හිටපු කාලයේ හැදුවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
වැඩි දවස් නොවෙයි- [බාධා කිරීමක්] මම කියන එකත් පොඩ්ඩක් අහන්න කෝ. ඔබතුමා හිටපු කාලයේ හැදුවා. දැන් ඒ කාලය ගියා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ, නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම කථා කළේ පසු ගිය සතියේ- [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මම කථා කළේ මේ පසු ගිය සතියේ. එතුමන්ටත් දෙන්න පුළුවන් කියලා කිව්වේ ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන්ට අදාළ CD පටි විතරයි. මම විමධ්‍යගත අය වැයෙන් රුපියල් ලක්ෂ 6ක් දීලා තිබෙනවා, ජා-ඇල මැතිවරණ කොට්ඨාසයේ දරුවන්ටත් TV එකක්, VCD player එකක් තිබෙනවා නම් ඒ දරුවන්ටත් ගෙදරදීත් ඉගෙන ගන්න පුළුවන් වෙන්න Ordinary Level, Advanced Level විෂයයන්ට අදාළ CD ටික අරගෙන දෙන්න කියලා. මම ඒක දෙන්න ගිය වෙලාවේ තමයි මේ ප්‍රශ්නය දැක්කේ. මම ඔබතුමාට ගරු කරනවා. නමුත් දැන් මම අභියෝගයක් කරනවා, තමුන්නාන්සේ NIE එකට කථා කරලා සියලුම විෂයයන්ට අදාළ CD පටි තිබෙනවාද කියලා මට හෙට ලිඛිතව දෙන්න, නැත්නම් ලිඛිතව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියා. එතකොට අපිට පිළිගන්න පුළුවන් නේ. මම මේ කරපු දෙයක් කිව්වේ. මම ඒ කිව්වේ අය වැය ගැන,- [බාධා කිරීම්] අධ්‍යාපනයට අලුත් තාක්ෂණයත් එක්ක සම්බන්ධ වෙලා ගමනක් යන්න පුළුවන්. ඔබතුමා පිළිගත්තා. අපි එකඟ වුණා. නමුත් NIE එකට මුදල් වෙන් වෙලා නැහැ, ඒ CDs හදන්න. දැනට හදලා තිබෙන්නේ දෙකයි. [බාධා කිරීමක්] නැහැ. මේ මුදල් වෙන් වීම

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

ගැනයි මා කියන්නේ. ඔබතුමාට වැරැද්දක් කියනවා නොවෙයි. මේ අය වැය ගැන නේ කථා කරන්නේ, අධ්‍යාපන අංශය කොතැනටද ගිහින් තිබෙන්නේ කියා. තවත් විශේෂ කාරණයක් තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඔබතුමාට කියන්න පුළුවන්ද, අධ්‍යාපන වැය ශීර්ෂයට කොච්චර මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවාද කියා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම පොත පෙරළලා කියන්නම්.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
කියන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක කියන්න මේ පොතේ පිටු පෙරළලා බලන්න වෙනවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේ පුදුම - [බාධා කිරීමක්] ප්‍රශ්නයක් අහන විට එක පාරට උත්තර දෙන්න පුළුවන්කමක් තිබෙනවා නම් හොඳයි. [බාධා කිරීමක්] එහෙම වෙන් වෙලා තිබෙනවා නම් මේ සතියේදී තමුන්නාන්සේ මා එක්ක එකට ඉඳගෙන NIE එකට කථා කරන්න. මා හිතන විධියට දැන් ඉන්නේ Professor Abeyratne වෙන්න ඕනෑ. මා එතුමා එක්ක කථා කළා. අපි දෙදෙනා එකට ඉඳලා කථා කරලා කියමු, මුදල් වෙන් වෙලා තිබෙනවා නම් ඒක කර දෙන්න කියා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
පෙර වරු 10.30ට කමිටුවට යන ගමන් කථා කරමු.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හොඳයි. මට ප්‍රශ්නයක් නැහැ. මා මේ ප්‍රශ්නය මතු කළා. ඒ වාගේම තාක්ෂණය පිළිබඳව අපි තීරණය කළා, e-government එක - [බාධා කිරීමක්] e-parliament එකත් අපි කළා නේ. දැන් මේ coordination එක කරන්න පුළුවන්ද? කරු ජයසූරිය අපේ නියෝජ්‍ය නායකතුමා යෝජනාවක් ගෙනාවා, තොරතුරු ලබා ගැනීමේ නිදහස සම්බන්ධව. මේක බොහොම ලෙහෙසියි. මේ රටේ සිදු වන හැම කරුණක් පිළිබඳවම අමාත්‍යාංශවලට ක්ෂණිකව තොරතුරක් ගන්න පුළුවන් නම් හොඳයි. අලුත් තාක්ෂණය පිළිබඳව වැඩ පිළිවෙළට කොච්චර මුදල් වෙන් වෙලා තිබෙනවාද? අපට කියලා දෙන්න. [බාධා කිරීමක්] කොච්චර මුදල් තිබෙනවාද කියා මේක කියවලා වෙනම පත්තියක් තියන්නම්, මේක දන්නේ නැති කෙනෙක් ඉන්නවා නම්. ඒක වෙනම ප්‍රශ්නයක්. මීට ඉහත හොඳ උත්තරයක් දුන්නා, විද්‍යා හා තාක්ෂණ කටයුතුවලට වෙන් වෙලා තිබෙන ප්‍රමාණය මදි කියා.

මේ අය වැය ගැන නේ අපි කථා කරන්නේ. මේ ජනතාවට මෙවර අය වැයෙන් මොනවාද ලැබෙන්නේ? මහා බරක් තමයි දීලා තිබෙන්නේ. ආදායමට වඩා සියයට 50ක් මුදල් අපි හොයා ගන්න ඕනෑ. ඒක විශාල ණයක්. ඒ විස්තරය හැන්සාඩ් වාර්තාවට දමන්න කියා මා කිව්වා. ගත්තු ණයට රුපියල්වලින් ගත්තාම සියයට 3ක් වැඩියෙන් ගෙවන්න සිදු වනවා. මේවා කොහොමද ගෙවන්නේ? බොරුවට හැංගි හොරා කථා කරලා වැඩක් නැහැ. මේක නොවෙයි, ඇත්ත කතන්දරය. අද වැඩිහිටි අයට මුදල් දුන්නත්, සමෘද්ධිලාභීන්ට මුදල් දුන්නත් ඒ අය ජීවත් වන්න ඕනෑ. ආහාර ටික ගන්න, විදුලි බිල ගෙවන්න, වතුර බිල ගෙවන්න බැහැ. අසනීපයක් හැදුණාම මැරෙන්නේ නැතුව බෙහෙත් ටික ගන්න පුළුවන්කමක් නැහැ. මෙන්න මෙතැනදී තමයි අය වැයේ අපි හිර වන්නේ.

අය වැයක් කියන්නේ සමස්ත වශයෙන් රටේ ජනතාව ජීවත් කරවීමක්. ඒ ජීවත් කරවීම තුළ අපට අද පෙනෙන්නේ මොකක්ද, ගරු විමල් වීරවංශ ඇමතිතුමනි? අද පෙනෙන්නේ මහා විශාල ධනපති පන්තියක්, පවුල් කිහිපයක් මේ රටේ ගොඩ නැඟිලා තිබෙන බවයි. ඒක ඔබතුමා පිළිගන්නවා ඇති නේ. රජයේ සේවකයාත් ඇතුළුව කොටසක් දුප්පත්කමින් පහළට යන විට අපේ ජාතික ආදායම කොහේටද ගිහින් හිර වෙලා තිබෙන්නේ?

එදා ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, Aston Martin කාර් සම්බන්ධව. දැන් එනවා කෙළවරක් නැතුව Formula One. මේ සල්ලි ටික කොහේටද ගිහින් හිර වෙලා තිබෙන්නේ? ඒක පුද්ගල ආදායම හරි සරුයි කියා ලෝකයට ගිහින් කියනවා. මේ මුදල් ටික කොහේටද හිර වෙලා තිබෙන්නේ? වාහනවල යන විට, ප්ලේන් පුරවලා පිට රට යන විට මේ සල්ලි කොහාටද යන්නේ කියා අපට පෙනෙනවා. මේ ජනතාව අතර තිබෙන ආදායම් පරතරය - [බාධා කිරීමක් ] Aston Martin ද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe )
මම කිව්ව එක ද? මෙතුමා ඉඩ දෙනවා නම් මම කියන්නම්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම ඉඩ දෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මම කිව්වේ අපි දැන් නානායක්කාර පතිරණ මාටින් කියන එක Aston Martinවලට ගිහින් කියලායි. එච්චරයි වෙලා තිබෙන්නේ. තේරෙන්නේ නැහැ. මේ ඇමතිතුමාට තේරෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු ජෝශප් මයිකල් මන්ත්‍රීතුමා, අය වැය ඇස්තමේන්තුවේ, II වන වෙළුමේ, 174 වන පිටුවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 4.2යි. උසස් අධ්‍යාපනය හැර සමස්ත අධ්‍යාපනය සඳහා මේ අය වැයෙන් අධ්‍යාපනය සඳහා රුපියල් මිලියන 92.5ක් වෙන් කරලා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගිය අවුරුද්දේ කොපමණද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මිලියන 86,231යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කියන්නේ අඩු වෙලා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
වැඩි වෙලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අඩු වෙලා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. මේ වැඩි වෙලා තිබෙන ජීවන තත්ත්වයත් එක්ක -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අවපාතයත් එක්ක.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
වැඩි වෙලා තිබෙන ජීවන තත්ත්වයත් එක්ක, රුපියල ශීඝ්‍රයෙන් බාල්දු වීමත් එක්ක, ඒ කාරණා දෙකම සලකලා NIE එකට කොපමණ වෙන් කරලා තිබෙනවාද කියලා මට කියන්න.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
දිවංගත ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා 1978 දී රුපියල සියයට 100කින් අවප්‍රමාණය කළා. 1978 ඩොලර් එකක් තිබුණේ රුපියල් 8කට. 1978 දී ඩොලර් එක රුපියල් 16ක් වුණා. මෙතුමන්ලාට පූර්වාදර්ශයක් වුණු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා 1978 දී ඩොලරය සියයට 100කින් අවප්‍රමාණය කළා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු ඇමතිතුමා දැන් මට අය වැය ඇස්තමේන්තු අරගෙන පෙන්වූවා අධ්‍යාපනයට මුදල් වෙන් කිරීම වැඩි වෙලා කියලා. ගරු ඇමතිතුමනි කියන්න, අලුත් තාක්ෂණය පාසල්වලට ගෙනි යන්න ජාතික අධ්‍යාපන ආයතනයට - NIE එකට - කොපමණ මුදලක් වෙන් කරලා තිබෙනවාද කියලා. එපමණයි මට ඕනෑ කරන්නේ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කතන්දරයක් නොවෙයි මම ඇහුවේ. ඔබතුමන්ලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ එකක් අරගෙන තිබෙනවා. මොකක්ද දන්නවාද? 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් එක්ක ආපු දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. නැති කොටස අරගෙන තිබෙනවා. ඒක අහෝසි කරලා. ආපසු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබුණු කොටස අරන් තිබෙනවා. අපට බැණ බැණ හිටපු එක; අපි අහෝසි කළ එක අරගෙන තිබෙනවා. මම තමුන්නාන්සේගෙන් අහන්නේ NIE එකට කොපමණ මුදලක් වෙන් කරලා තිබෙනවාද කියලා. තමුන්නාන්සේගේ කථාවේදීවත් අපට ඒකට උත්තරයක් දෙන්න.

අපි ඊ ළඟට තමුන්නාන්සේලාගෙන් විස්තර වශයෙන් දැන ගන්න කැමැති කාරණයක් තිබෙනවා. දරුවන්ට කිරි පිටිවලට දෙනවා කිව්ව දීමනාවට මොකක්ද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලා මේක පැහැදිලි කරලා කියන්න. දරුවන්ට කිරි පිටිවලට දීමනාවක් දෙනවා කිව්වා. මේක දුන්නාද? මේක අපට දැන ගන්න අවශ්‍ය කාරණයක්. දෙනවා කියලා කිව්වේ මන්ද පෝෂණය තිබෙනවා කියලායි. එහෙම නම් දැන් මන්ද පෝෂණය ඉවරද? ඒ වාගේම අපේ ජනතාවට තිබුණු ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් පිළිබඳව විස්තර ටික අපට හරියට ගන්න වෙනවා. මේ රටේ ජනතාව අපෙන් ඉල්ලන්නේ මොනවාද? ලෝකයේ දියුණු රටවල, සල්ලි තිබෙන රටවල, ඒකාධිපති රටවල මිනිසුන් විප්ලවවලට ගියේ ඇයි? කන්න නැති නිසා නොවෙයි. විප්ලවවලට ගියේ නීතියේ ආධිපත්‍ය කඩා ගෙන වැටිලා ඒකාධිපතිවාදය ආව නිසා. තමුන්නාන්සේ දන්නවා, නායකයෝ එහෙම ගිහිල්ලා, මිනිසුන්ව එළවලා, මරලා දාලා -

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)
කොහේද ඔය?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ලංකාවේ නොවෙයි. තමුන්නාන්සේටත් ඒක දැන ගන්න පුළුවන්. ලංකාවටත් ඒක එයි කියලා අපි මේ කාරණය අවධානයට යොමු කරන්නේ.

මම දැන් යන්නේ මේ රටේ මිනිසුන් අය වැයකින් බලාපොරොත්තු වන තවත් විශේෂ අංගයකටයි. ඒ තමයි නීතියේ රැකවරණය. ඒක දැන් තිබෙනවාද? අද නීතිඥයෝම උසාවිවල තීන්දුවලට විරුද්ධව තමුන්ගේ මතය ප්‍රකාශ කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා ජනතාව පොලිසිවලට ගිහිල්ලා, පොලිසි කඩන අලුත් වාතාවරණයක් මේ රටේ ඇති වෙලා තිබෙනවා. පොලීසිය, පොලීසිය ඇතුළේ මරා ගන්නා තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මොකක්ද මේකට හේතුව? මේකට හේතුව මේකයි. ආරක්ෂක අමාත්‍යාංශයට, ජනාධිපති අරමුදලට, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට අතිවිශාල මුදල් සම්භාරයක් වෙන් කරන කොට, අද සම්පූර්ණයෙන් පොලීසිය මෙහෙයවන්නේ, හමුදාව මෙහෙයවන්නේ තමුන්ට ඕනෑ විධියටයි. මේ ටික දවසට කී දෙනෙකුව සුදු වෑන්වලින් ගෙනිහින් මරලා දැම්මාද? හංගා ගෙන තියා ගෙන ඉන්නවාද? එකක්වත් හෙව්වේ නැහැ.

අද නීතියේ, පොලීසියේ සහ මේ රටේ ජනතාවගේ සැකයේ පළමුවන ස්ථානයට තිබෙන්නේ මොකක්ද? භාරත ලක්ෂ්මන් මහත්මයාගේ මරණය පිළිබඳවයි. ඒ සම්බන්ධයෙන් දැන් අපේ එක්තරා මන්ත්‍රීවරයකුව සොයනවා. මම නම කිව්වාට සමා වන්න. ඒ නම දැනටත් ප්‍රසිද්ධ වෙලා තිබෙනවා. එතුමා රට ගෙනිච්චා. මෙතැන පාර්ලිමේන්තුවේදී ජෝන් අමරතුංග අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ප්‍රශ්නයක් ඇහුවා, "මේ මන්ත්‍රීවරයා සැකකාරයකු විධියට උසාවියට ඉදිරිපත් නොකළේ ඇයි?" කියලා. කවුද, ඉදිරිපත් නොකළේ? පොලීසිය. "ඔහුට විරුද්ධව සැකයක් නැහැ" කිව්වා. එතුමාට විරුද්ධව මොකුත් ප්‍රශ්නයක් නැහැ කිව්වා. ඊළඟට ඒ අගතියට පත් වෙච්ච පාර්ශ්වය උසාවි ගියා. ගියාම මොකක්ද, උසාවියෙන් කියන්නේ? ඔහු සැකකාරයකු විධියට නම් කරලා වහාම අත් අඩංගුවට ගන්න කියනවා. ඒකයි මම ඇහැව්වේ, අපි මුදල් වෙන් කරන කොට, ඒ මුදල් එක එක අංශවලට බෙදිලා යන කොට, අධිකරණයට පොලීසියට බෙදිලා යන කොට, ඒවායින් රාජකාරිය කරන්න පුළුවන් තත්ත්වයකට ඒ අය පත් වෙනවාද කියලා. ඒ අය පත් වෙන්නේ නැහැ. මේ මම කිව්වේ උදාහරණ දෙකක්.

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
උදාහරණය වැරදියි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කොයි උදාහරණයද වැරදි?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
රටේ නීතිය ක්‍රියාත්මක වන්නේ නැහැ, කඩා වැටිලා කියලා ඔබතුමා කිව්වා. ඉතින් බලන්නකෝ. පොලීසියෙන් නීතිය හරියට ක්‍රියාත්මක නොවුණා නම් අධිකරණයෙන් ක්‍රියාත්මක කරලා දීලා තිබෙනවා. රටේ නීතිය ක්‍රියාත්මක වන්නේ ඔය අංශ සියල්ලෙන්ම.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක හරි. බොහොම පැහැදිලියි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
යම් වෙලාවක එක ආයතනයකින් අඩු පාඩුවක් වුණොත් අනෙක් ආයතනයෙන් ඒක නිවැරදි කරන්න ඕනෑ. ඒකෙන් පෙනෙනවා, රටේ නීතිය ක්‍රියාත්මක වනවායි කියලා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පොඩ්ඩක් ඉන්න. ස්තුතියි, ගරු ඇමතිතුමා. ඔබතුමාත් නීතිඥයෙක් නොවෙයි, මමත් නීතිඥයෙක් නොවෙයි. මම දන්නා තරමින් මේ රටේ නොයෙක් අපරාධ තිබෙනවා. ඒ අපරාධ ගැන පොලීසිය සොයලා බලලා, වාර්තා සකස් කරලා උසාවියට ඉදිරිපත් කළාම තමයි උසාවියට තීරණයක් ගන්න වෙන්නේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඔබතුමා ඒත් වැරදියි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හරි, හරි. වැරදි නම් හරි ගස්සන්න. එතෙක් උසාවියට තීන්දුවක් ගන්න බැහැ. ඒක තමයි කිව්වේ-[බාධා කිරීමක්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
පොලීසියට යුතුකමක් තිබෙනවා, පොලිස් ආඥාපනත යටතේ ඕනෑම අපරාධයක් නවත්වන්න. ඒක ඉෂ්ට කළේ නැහැ. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අධිකරණයට තිබෙන එක කටයුත්තක් තමයි පොලීසියෙන් වැරදි කෙනෙක් ගෙනිච්චොත් ඒ ගැන සොයලා බලලා එළියට දමන එක. මම අහන්නේ ඒක නොවෙයි. මේ භාරත ලක්ෂ්මන්ගේ case එක සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී උත්තර දුන්නා, ඒ මන්ත්‍රීවරයා සැකකාරයෙක් නොවෙයි කියලා. පරීක්ෂණය කරලා, සැකකාරයෙක් බවට හඳුනා ගෙන උසාවියට ඉදිරිපත් කරන්නේ කවුද? පොලීසිය. පොලීසිය රාජකාරිය කළාද? [බාධා කිරීම්] පොලීසිය නැත්නම් වෙන කවුද කරන්නේ?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
පොලීසිය විතරද? නීතිය ක්‍රියාත්මක කරන්නේ පොලීසිය විතරද? පොලීසියෙන් වැරැද්දක් කළොත් අධිකරණය ඒක නිවැරදි කරනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක නොවෙයි ප්‍රශ්නය. විශාල මුදලක් වියදම් කර ගෙන පොලීසිය ඒ රාජකාරි කරනවාද කියන එකයි. [බාධා කිරීම්]ගරු කථානායකතුමනි, ඊළඟට -

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
පැහැදිලි කරන්න. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පැහැදිලි කළා. පොලීසිය තමුන්ගේ රාජකාරිය කළා නම් පොලීසිය මේ රාජ්‍ය බලයට ඇහුම්කන් දෙන්නේ නැතුව ඒ රාජකාරියකට ඉඩ දුන්නා නම්, පොලීසිය විමර්ශනය කරපු ඒ ඒඑස්පී වරුන්ගේ එතැන රාජකාරිය නතර කරලා වෙන තැන්වලට මාරු නොකළා නම් ඒ ගොල්ලෝ ඒ කාර්යය හරියට කරනවා. පොලීසියට මේ රාජකාරිය හරියට කරන්න දුන්නේ නැහැ. ඒකයි වුණේ. වෙන මොකුත් නොවෙයි.

අපි කථා කරන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට වෙන් වෙච්ච මුදල් වියදම් කරන මේ පොලීසිය පිළිබඳවයි. පොලීසිය රාජකාරිය කරලා තමයි ඊළඟට උසාවියට යන්නේ. උසාවියට ගියාම උසාවිය ගැනත් විශ්වාසයක් නැහැයි කියලා කියනවා. ඒකත් දැන් කියා තිබෙනවා. මම හිතන හැටියට ඒ පළමුවන වතාවට. දීපු තීන්දුව පිළිබඳව තමුන් සෑහීමකට පත් වෙන්නේ නැහැයි කියලා නීතිඥයෝ කෝට් දාගෙන ඇවිල්ලා කියා තිබෙනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
පළමුවන වතාවට විනිශ්චයකාරවරුන්ට ගල් ගැහුවේ.[බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒ ඉතිහාස කථාවක් නේ. මේ කථා කරන්නේ 2012ට වෙන් කරපු අය වැයේ මුදල් ප්‍රතිපාදන කොයි ආකාරයෙන්ද වෙන් වෙන්නේ කියලායි. මේ, ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ කාලයේ එකක් නොවෙයි. මේ කථා කරන්නේ මහින්ද රාජපක්ෂ

මහත්තයාගේ ආණ්ඩුවේ, 2012 අය වැයේ පොලීසියට වෙන් කරපු මුදල් කොයි ආකාරයෙන්ද පාවිච්චි වෙන්නේ කියන එක ගැනයි. මම මේ කිව්වේ එක සිද්ධියක් දෙකක් විතරයි. මම තමුන්නාන්සේගේ අවධානයට යොමු කළේ ඒ කරුණුයි.

තවත් විශේෂ කාරණයක් කියන්න තිබෙනවා ගරු කථානායකතුමනි. මේ අය වැය ගැන අපි කථා කරන කොට ආණ්ඩුවේ සහ කැබිනට් මණ්ඩලයේ මහා බිඳ වැටීමක් ඇති වෙලා තිබෙනවා. පසු ගිය දා මේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනාවා.

පාඩු ලබන ව්‍යාපාර පවරා ගන්නවා යයි කියන, ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුට ඉදිරිපත් කළා. ඒක කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කරලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතක්. අපේ තිබෙනවා, සම්ප්‍රදායක්. කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීම කියලා එකක් තිබෙනවා. එදා එම පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ගෙනාපුවාම කැබිනට් මණ්ඩලයේ සිටින සමහර අය නැඟිටලා යන්න ගියා. කොහොමද සාමූහික වගකීම? මෙන්න මේ බිඳ වැටුණු තැන්. තමුන්නාන්සේලා මෙහි සිටින හොඳ ඇමතිවරුන් ටික ඉවත් කරලා Senior Ministersලා කියලා පත් කරලා, වෙනත් අයව කැබිනට් මණ්ඩලයට පත් කරලා තිබෙනවා. මෙන්න මේ ආණ්ඩුවේ නීති පැත්ත බිඳ වැටුණු තැන; සාමූහික වගකීම සම්පූර්ණයෙන් කැඩිලා, කැබිනට් මණ්ඩලයේ එකඟතාවක් නැති වෙලා. හරිද වැරදිද කියලා අපිට කියලා දෙන්න, විමල් වීරවංශ ගරු ඇමතිතුමනි. [බාධා කිරීමක්] ඔව්, අනාගත අගමැතිතුමා. අර අධිවේගී මාර්ගය - highway එක- ගැන තමුන්නාන්සේ කියලා තිබුණා. අර බල්ලන්ට ගහලා තිබෙන දැල් පිළිබඳව එහෙම කියා තිබුණා. ඒක වාර්තා වුණා. [බාධා කිරීමක්] ඉතින් මේක කථා කරන්නට තිබුණේ කැබිනට් මණ්ඩලයේ නේ. තමුන්නාන්සේ වෙනම ඇවිල්ලා කථා කරනකොට අපිට තේරෙන්නේ, මේ පාර පිළිබඳව මොකක් හෝ වරදක් -[බාධා කිරීමක්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම කියපු දේ ඕනෑ නම් කියන්නද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කැබිනට් එකේ කිව්වේ නැහැ නේ. පසුව නේ කිව්වේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම අධිවේගී මාර්ගය ගැන කථාව පටන් ගත්තේ, මේක එක්සත් ජාතික පක්ෂ රජය කාලයේයි සැලසුම් කරලා තිබෙන්නේ; ඒ කාලයේ කරපු සැලැස්ම වැරැදියි; මහක් දුර ඇවිල්ලා තිබුණා; පස් පුරවලා, පස් කණ්ඩියක් ගහලා, කුඹුරු දෙකට බෙදුවා; වතුර ගලා යන මාර්ග නතර කළා-

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හරි, මම ඒක දැක්කා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අන්තිමට බල්ලෝ පාරට එන එක වළක්වා ගන්න වැටක් ගහන්න වුණා; ඒ ඔක්කොම වුණේ අර කාලයේ කරපු වැරැදි සැලසුම් නිසා; මේක කොන්ක්‍රීට් කණු උඩ ගියා නම් වියදම වැඩි වුණත් මීට වඩා රටට හිතකරයි කියලායි කිව්වේ. ඔන්න ඕක තමයි කිව්වේ. නමුත් යූඑන්පී කාලය ගැන සම්බන්ධය නැතිව තමයි කථාව ගියේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
එතකොට ඒ වැරැදි -

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)
තවත් දෙයක් තිබෙනවා. [බාධා කිරීමක්] ඇමතිවරුන් දෙදෙනෙකුත් සිටියා අපේ ආණ්ඩුවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කවුද ඒ දෙන්නා?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
[බාධා කිරීම්] වජිර අබේවර්ධනයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වග කීමකින් කියනවාද? [බාධා කිරීම්] හරි අසාධාරණයි, මෙතුමන්ලා මේ නැති අය ගැන කියන කථාව. Katunayake Expressway එකට මිලියන 2,000ක් තිබෙන එක දැන් 47,000 වුණේ කොහොමද? [බාධා කිරීම්] ඒ කවුද? [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපි කනගාටු වනවා, එකට හිටපු මන්ත්‍රීවරයෙක් පිළිබඳව එවැනි ප්‍රකාශයක් කිරීම ගැන. ඒ මන්ත්‍රීවරයාත් සමඟ එකට හිටපු කෙනෙක් අනෙක් පැත්තට ගිහිල්ලා කරන මේ ප්‍රකාශය පිළිබඳව මේ අවස්ථාවේ දී මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. මා එච්චරයි ඒ ගැන කියන්නේ. දැන් ගරු විමල් වීරවංශ ඇමතිතුමා හරි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම කිව්වේ -

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ හරියට හරි. [බාධා කිරීමක්] හරි, හරි, තමුන්නාන්සේ හරි. විමල් වීරවංශ ගරු ඇමතිතුමා කියපු කථාව හරි. එක්සත් ජාතික පක්ෂය මේක වැරැදියට පටන් ගත්තා නම්, මේ ආණ්ඩුව -මහින්ද රාජපක්ෂ ආණ්ඩුව; විමල් වීරවංශ ඇමතිතුමා කැබිනට් මණ්ඩලයේ සිටින ආණ්ඩුව- ඒක ඒ ආකාරයෙන්ම ඉෂ්ට කරනකොට විමල් වීරවංශ මහත්මයා ඒකට විරුද්ධ නොවීමත්, එතුමාගේ විරුද්ධත්වය සහ දෝෂාරෝපණය කැබිනට් එකෙන් පිටට ඇවිල්ලා ඉදිරිපත් කිරීමත් පිළිබඳවයි මා මේ කිව්වේ. කැබිනට් එක දැන් දෙදරලා. කාටවත් එහෙම යුතුකමක් නැහැ, ආණ්ඩුවේ කැබිනට් එකේ ඉඳගෙන එක තැනකට ඇවිල්ලා එකක් කියන්නයි, තව තැනකට ඇවිල්ලා තව එකක් කියන්නයි. කැබිනට්

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

එකට ගියා නම් මොන පක්ෂය හරි ආණ්ඩුවේ. කැබිනට් එකේ ඉන්නේ ආණ්ඩුවේ අය. ඒ ගත්තු තීන්දු පිළිබඳව ඒ අය වග කියන්නට ඕනෑ. ඒ වග කීමෙන් බේරෙන්න කාටවත් පුළුවන්කමක් නැහැ. එහෙම නම් කැබිනට් එකෙන් ඉවත් වෙලා- [බාධා කිරීමක්] තමුන්නාන්සේ තර්ක කරන්න හොඳයි. මගේ මාතෘකාවෙන් පිටට යන්න එපා. මා අහන්නේ, "එහෙම කරන්න කැබිනට් එකට පුළුවන්ද?" කියලායි. ඒකයි මා මේ අහන්නේ. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මා කිව්වේ කැබිනට් මණ්ඩලය බිඳීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතුළේ තිබෙන දේවල් එළියට ඇවිල්ලා ප්‍රකාශ කරන එකයි. තව තිබෙනවා, එළියට එන්නේ නැතිව. විවිධ දේවල් කැබිනට් ඇමතිවරුන් ඇවිල්ලා අපට කියනවා. කට වහගෙන ඉන්නවා. අපි දැක්කා, ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත ගැන කථා කරනකොට බැසිල් රාජපක්ෂ ඇමතිතුමා සම්පූර්ණ වෙලාව ගත්තා. අනෙක් කිසි මන්ත්‍රීවරයෙකුට කථා කරන්න වෙලාවක් නැහැ. ආණ්ඩුව ඇතුළේ තිබෙන තත්ත්වය, එළියට එන දේවල් මේ.

අය වැය ගැන කථා කරනකොට මා කියන්නේ, අද මුළු රටටම බලපාන ව්‍යාපාර පවරා ගැනීමේ වැඩ පිළිවෙළ තුළ විදේශ විනිමය මේකට ගෙනෙන්නෙ නැති මහා ප්‍රවණතාවක් ඇති වෙලා තිබෙනවා කියලායි. ඒකයි මම මේ කියන්නේ.

අපි විදේශ ආයෝජන ගෙනෙන්න යනවා කියලා තමුන්නාන්සේලා කොච්චර කිව්වත්, එහෙම ගෙනෙන්න බැරි තත්ත්වයකට තමුන්නාන්සේලා කටයුතු කර තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, පසු ගිය අය වැයවලින් දීපු පොරොන්දු තිබෙනවා. මොනවාද ඒ? දුප්පත් ළමයින් සඳහා දෙනවා කිව්වා කිරි පිටි සහනාධාරයක්; මාසයකට රුපියල් 200ක්; මට මතක හැටියට රුපියල් 200ක්. ඒ රුපියල් 200 දුන්නාද? සෑම රාජ්‍ය සේවකයකුටම නිවසක් හදා ගන්න ණය මුදලක් සියයට හතරේ පොලියට දෙනවා කිව්වා. ඒක ලබා දුන්නාද? ගර්භිණී මව්වරුන්ට -මන්ද පෝෂණයෙන් පෙළෙන අයට කියමු කෝ- පෝෂණ මල්ලක් දෙනවා කිව්වා. ඒ ටික අපට ලබා දුන්නාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා ගර්භිණී මවක්ද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගර්භිණී මව්වරුන් කවුද කියලා සොයා බලන්න මට වඩා හොඳට විමල් වීරවංශ මැතිතුමා දන්නවා. එතුමාගෙන් ඇහුවොත් ඒ ගැන කියයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා සොයා බලලා ගර්භිණී මව්වරුන් -තමුන්නාන්සේ දන්නා අයයි, මන්ද පෝෂණයෙන් පෙළෙන අයයි- කවුද කියලා කියන්න. එතකොට අපට පුළුවන් අවශ්‍ය කටයුතු ටික කර ගන්න.

ගරු කථානායකතුමනි, මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මේ අය වැය හරහා මේ රටේ දුප්පත් ජනතාවට ඉදිරියේදී දරන්න තිබෙන්නේ මහා භයානක බරක්; ජීවත් වෙන්න බැරි, කුස්සියට බලපාන විශාල බරක්. කාන්තාවන් වෙනුවෙන් පොරොන්දු වෙච්ච කිසිම දෙයක් ඉෂ්ට කරලා නැහැ. අද වැඩ කරන ජනතාව ඉන්නවා රාජ්‍ය අංශයේ වාගේම පුද්ගලික අංශයේත්. පුද්ගලික අංශයේ අයට පඩි වැඩිපුර ගෙවන්න නම් පුද්ගලික අංශය ශක්තිමත් වෙන්න ඕනෑ. එවැනි යෝජනාවක් මෙතැන නැහැ. ඒ නිසා ඒ අය එතැනම වැටිලා ඉන්නවා. මෙන්න මේ විධියයි අපේ සෞඛ්‍ය පිළිබඳ තත්ත්වයත්. මේ රටේ ජනතාව අද ඉස්පිරිතාලවලට ගියාම ඒ අයගෙන් විශාල කොටසක් ඉන්නේ ඇඳන් යට. ඒ නිසා සෞඛ්‍යය සඳහා වෙන් කර තිබෙන මුදල ඇතිද කියලා මම අහනවා. ඔවුන්ට බෙහෙත් ටික ගන්න පුළුවන්කමක් නැහැ. ඉදිරියේදී බෙහෙත් මිල වැඩි වෙන කොට ඒකට හරි යන විධියට වැඩ පිළිවෙළක් නැහැ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අධ්‍යාපනය ලබන අපේ දරුවන්ට අලුත් තාක්ෂණය කරා යන්න ඇරලා තිබෙන දොර කොයි ආකාරයේද බලන්න. "ඉ-තාක්ෂණය" වෙනුවෙන් අපි විශාල මුදලක් වැය කළා. මට මතක හැටියට එය අපේ කාලයේ තමයි පටන් ගත්තේ. එදා පටන් ගත්තු ඒ වැඩ පිළිවෙළ අද මේ රටේ රාජ්‍ය පරිපාලනයට විහිදිලා ගිහින් තිබෙනවාද? ඒ වැඩ පිළිවෙළ මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවාද? ඒ විහිදී යෑම තුළ මේ රටේ අධ්‍යාපනය ලබන උසස් පෙළ දරුවන්ට, සාමාන්‍ය පෙළ දරුවන්ට තොරතුරු ලබා ගැනීමේ අයිතියක් තිබෙනවාද? තොරතුරු තිබෙනවාද? ඒ වාගේම පාර්ලිමේන්තුව තුළ සිද්ධ වන දේවල් අලුත් තාක්ෂණය හරහා ලබා ගන්නට පාසල් දරුවන්ට, මහ ජනතාවට අයිතියක් තිබෙනවාද? ගරු කථානායකතුමනි, මා මෙය අහන්න හේතුවක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙන්න මාස දෙකක් තුනක් කල් ඉල්ලනවා. අර වැඩ පිළිවෙළ -රාජ්‍ය පරිපාලනයේ ඉ-තාක්ෂණය කියන වැඩ පිළිවෙළ- අද ක්‍රියාත්මක වන්නේ නැහැ. සෑම අමාත්‍යාංශයකම ක්‍රියාත්මක වන්නේ තමුන්ගේ හිතුවක්කාරි වැඩ පිළිවෙළක්. ඒ නිසා අපි අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ. මේක තමයි ඇත්ත තත්ත්වය. මම මීට වඩා තමුන්නාන්සේගේ කාලය ගන්නේ නැහැ ගරු කථානායකතුමනි. ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[පූ. භා. 11.06]

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු කථානායකතුමනි, අපේ ගරු විපක්ෂ නායකතුමා බොහොම වේගයෙන් සභාවෙන් නික්ම යන වෙලාවේ, මේ අය වැය පිළිබඳව කරුණු කීපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන මා ඉතාම සතුටු වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා මේ අය වැය පිළිබඳව විශාල විවේචනයක් ඉදිරිපත් කළා. එතුමාගේ සම්පූර්ණ කථාව මම හොඳින් අසා ගෙන සිටියා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගෙන් කියැවුණේ නැහැ, මේ රටේ පොදු ජනතාවට මෙතෙක් ලැබී තිබෙන කිසියම් සහනයක් මේ අය වැය මඟින් කප්පාදු කළා කියලා. එවැනි විවේචනයක් එතුමාගේ කථාවේ ඇතුළත් වුණේ නැහැ. මේ රටේ පොදු ජනතාව වෙනුවෙන් විවිධ ආණ්ඩු යටතේ විවිධ කාලවල ආරම්භ වෙච්ච විශාල සුබසාධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වෙනවා.

විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී ජනතාව කෙරෙහි බලපාන, මෙතෙක් ක්‍රියාත්මක ඒ සුභසාධන ව්‍යාපෘති එකක්වත් මේ අය වැය මඟින් කපා දමා තිබෙනවාය, නතර කොට තිබෙනවාය කියන අන්දමේ විවේචනයක් ගොඩ නඟන්න ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමාට පුළුවන් වුණේ නැහැ. එතැනින්ම පේනවා ඉතා වැදගත් කරුණක්. ඒ තමයි මේ අය වැය යෝජනා මඟින් මේ රටේ දැනට ක්‍රියාත්මක රාජ්‍ය සුභසාධන ක්‍රියාපටිපාටිය, වැඩ පිළිවෙළ කවර අර්ථයකින්වත් අත් හිටුවීමක්, නතර කිරීමක් කප්පාදු කිරීමක් කරලා නැහැ කියන එක. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මවා ගත්තු යම් යම් විවේචන ඉදිරිපත් කරන්න අද ඒ අයට පුළුවන් වුණාට, මේ අය වැය ලේඛනයේ අන්තර්ගත කරුණු පදනම් කොට ගත්තු ප්‍රබල විවේචනයක් ගොඩ නඟන්න බැරි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කථා කළා ණය බර වැඩි වීම පිළිබඳව. එතුමා කථා කරන කොට අහගෙන ඉන්න අපට හිතෙන්නේ මේ ණය බර වැඩි වෙලා තිබෙන්නේ 2005න් පස්සේ කියලායි; එවකට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා 2005 ජනාධිපතිවරණයෙන් ජනාධිපති ධුරයට පත් වුණාට පස්සේ තමයි මේ රටේ මේ ණය බර වැඩි වීම සිදු වෙලා තිබෙන්නේ කියලායි. නමුත්, තමුන්නාන්සේලා දන්නවා එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව තමයි මේ රටේ ණය බර වැඩි වීමේ ක්‍රියාවලියේ වැඩිම පංගුකාරීත්වය දරා තිබෙන්නේ කියන කාරණය. අය වැය පරතරය පියවා ගන්න ණය ගන්න එක විතරක් නොවෙයි, එතුමන්ලා හඳුන්වා දුන්නා රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කිරීමත්; විදේශ සමාගම්වලට රාජ්‍ය ආයතන විකුණා දැමීමත්. ඒකෙන් කෙරෙන්නේ එක පැත්තකින් ණය ගන්න එකයි, අනෙක් පැත්තෙන් වටිනා රාජ්‍ය ආයතන සම්පූර්ණයෙන් විදේශ සමාගම්වලට පවරන එකයි. එතුමන්ලා අය වැය පරතරය පියවන්න පාවිච්චි කරපු ප්‍රධාන ක්‍රමවේද, ප්‍රධාන උපාය මාර්ග දෙක තමයි ඒ. මෙවර අය වැය පරතරය පියවන්න ණය ගැනීම තිබෙනවා තමයි. නමුත් එක වටිනා රාජ්‍ය ආයතනයක්වත් පෞද්ගලික අංශයට දීලා, විදේශ සමාගම්වලට දීලා ඒ මඟින් ලැබෙන ආදායම රටේ අය වැය පරතරය පියවා ගැනීමේ උපාය මාර්ගයක් හැටියට මේ අය වැයේ තිබෙනවාද කියලා අපි අහනවා. එහෙම ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වනවාද? ඉතින් එතුමන්ලාගේ කාලයේ අය වැය පරතරය තිබුණා. පියවා ගන්න ණය ගත්තා. ණය ගත්තා විතරක් නොවෙයි, ණය මදි හන්දා ඊට අමතරව රාජ්‍ය ආයතන විකුණන්නත් පටන් ගත්තා. දැන් මේ ආණ්ඩුව යටතේ මේ එක පියවරකින් අපි නිදහස් වෙලා තිබෙනවා. අය වැය පරතරය පියවා ගැනීම සඳහා අනුගමනය කරපු සුප්‍රකට ක්‍රමවේද දෙකෙන් එකක් අත් හැරලා තිබෙනවා. ඉතිරි එකෙනුත් අපි අත් මිදෙන්න ඕනෑ. ඒක අපට උවමනාව තිබුණු පළියට ක්ෂණිකව කළ හැක්කක් නොවෙයි. ඒක මේ රටේ ආර්ථිකයේ ක්‍රමානුකූලව සිදු කරන වර්ධනයක ප්‍රතිඵලයක් අනුව වෙන්න ඕනෑ. එදෙසට තමයි මේ ආර්ථික ගමන් මාර්ගය වැටිලා තිබෙන්නේ.

අය වැය පරතරය පියවා ගන්න පෞද්ගලීකරණයයි, ණය ගැනීමයි දෙකම අනුගමනය කරපු එක්සත් ජාතික පක්ෂය අද අපෙන් අහනවා, "අය වැය පරතරය පියවා ගන්න ණය ගන්න එක හරිද?" කියලා. අපි පෙරළා අහනවා, "අය වැය පරතරය පියවා ගන්න ණය ගන්න එකයි, රාජ්‍ය ආයතන විකුණපු එකයි දෙකම කරපු එක හරිද?" කියලා. අඩුම තරමින් ඒ දෙකෙන් එකකින් ගැලවිලා තිබෙනවා මේ ආණ්ඩුව. එතකොට තමුන්නාන්සේලා මේ රට වට්ටලා තිබුණු තත්ත්වයේ සිට, ඊට සාපේක්ෂව අද මේ ආර්ථිකය ගමන් කර තිබෙන තැන නරකයි කියලා අපි කොහොමද කියන්නේ?

ආර්ථිකයක් පිළිබඳ අපරිමිත සුබ බලාපොරොත්තු තිබෙනවා. ඒ සුබ බලාපොරොත්තුවලට සාපේක්ෂව කල්පනා කරලා බැලුවොත් අපට මේ ගමනේ අඩු පාඩු හොයා ගන්න පුළුවන්. හැබැයි එක්සත් ජාතික පක්ෂය මේ රටේ ආර්ථිකය අරගෙන ආපු තැනක් තිබෙනවා; ගෙනැල්ලා නතර කරපු තැනක් තියෙනවා; හිර කරපු උගුලක් තිබෙනවා. අපි බලන්න ඕනෑ, ඒකෙන් ගැලවීමේ දිසාවටද මේ අය වැය නිර්මාණය වෙලා තිබෙන්නේ, එහෙම නැත්නම් ආපස්සට යනවාද කියලා. අය වැය පරතරය පියවන්න පෞද්ගලීකරණයෙන් උපයන ආදායමක් අපි පෙන්වා දීලා තිබෙනවාද? නැහැ. ඒකෙන්ම පේනවා නේද තමුන්නාන්සේලා අනුගමනය කරපු ප්‍රතිපත්තිවලින් එළියට ඇවිල්ලායි මේ අය වැය සම්පාදනය වෙලා තිබෙන්නේ, නිර්මාණය වෙලා තිබෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂය අය වැය පරතරය පියවා ගන්න ණයක් ගත්තේ නැති, පෞද්ගලීකරණයක් කළේ නැති, අය වැය පරතරය වෙන ආකාරයකින් පියවා ගෙන ආණ්ඩුව පවත්වා ගෙන ගිය කට්ටියක් විධියටයි මේ අය වැය පරතරය පියවා ගැනීමේ අභියෝගය ගැන අද මෙතැන කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ එක්කම එතුමන්ලා බොහොම උනන්දුවෙන්, උවමනාවෙන් රාජ්‍ය සේවය පිළිබඳව සාකච්ඡා කළා. එදා වික්‍රමසිංහ මහත්තයාගේ පාලන කාලයේ රාජ්‍ය සේවයේ සේවක සංඛ්‍යාව අඩු කරලා, රාජ්‍ය සේවයේ ඇති වන පුරප්පාඩු අහෝසි කරලා, ඒ පුරප්පාඩු සඳහා සුදුසු අය බඳවා ගැනීමේ ක්‍රියාවලිය නතර කරලා, මේ රටේ රාජ්‍ය සේවය ක්‍රමානුකූලව දිය කර හැරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළා අපට මතකයි.

ආදායම් බදු දෙපාර්තමේන්තුව අහෝසි කරලා ආදායම් බදු ගෙවන හාම්පුතාලත් එකට එකතු කරපු ආදායම් බදු පරිපාලන අධිකාරියක් පිහිටුවන්න තමුන්නාන්සේලා සැලසුම් කළා. මේ රටේ වාසනාවට ඒ ආණ්ඩුව වැඩි කලක් තිබුණේ නැහැ. ඒ නිසා ඒවා කර ගන්න බැරි වුණා. තමුන්නාන්සේලා රාජ්‍ය සේවකයන් දිහා බැලුවේ එහෙමයි. රාජ්‍ය සේවකයන් දිහා බැලුවේ මහා වදකාරයින් හැටියටයි. මේ ඇති වන පුරප්පාඩු පුරවන්න ඕනෑ නැහැ, ඒ තනතුරු අහෝසි කරන්න ඕනෑය; ක්‍රමානුකූලව රාජ්‍ය සේවය දිය කර හරින්න ඕනෑය කියා බලය තිබෙන වෙලාවේ රාජ්‍ය සේවය දිහා එහෙම බලපු අය අද ඇවිල්ලා අපෙන් අහනවා, සියයට 10 පඩියද වැඩි වෙලා තිබෙන්නේ, දීමනාවද වැඩි වෙලා තිබෙන්නේ කියලා. ඒක වෙන කවුරු හරි ඇහුවට කමක් නැහැ. එක්සත් ජාතික පක්ෂයේ මහත්වරු අහනකොට අපට ඒක අහගෙන ඉන්න අමාරුයි. ඇයි? අද ලක්ෂ 12ක් දක්වා රාජ්‍ය සේවයේ රැකියාවන් වැඩිදියුණු කරලා තිබෙන ආණ්ඩුවක් මේක. අද ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා අහනවා- [බාධා කිරීමක්] අපේ බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා දැන් මෙතැනට ආවා. ඔබතුමා දීලා තිබෙන චෝදනා පත්‍රයත් මම කියෙව්වා. ඒක හරි අපූරු චෝදනා පත්‍රයක්. චෝදනා පත්‍රයට නිදහසට කරුණු නේද දීලා තිබුණේ? ඔබතුමා දීලා තිබෙන්නේ නිදහසට කරුණු නේද? මම හිතන්නේ නිදහස හම්බ වේවි, ඒ තිබෙන කරුණුවල හැටියට.

[ගරු විමල් වීරවංශ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමන්ලා රාජ්‍ය සේවයේ තනතුරු අහෝසි කරලා කප්පාදු කරපු අය රාජ්‍ය සේවය දිය කර හරින්න අන්තර්ජාතික බලවේගවල න්‍යාය පත්‍රවලට අනුව ක්‍රියා මාර්ග තෝරපු අයයි. එදා නාරිමාන් චොක්සි මැතිතුමා නේ අය වැය කතාව කළේ. එතුමා කරන කතාව අහගෙන තමුන්නාන්සේලා උඩ බලා ගෙන හිටියා නේ. අපට මතකයි, බන්දුල ගුණවර්ධන ඇමතිතුමා බොහොම අමාරුවෙන් ඒ අය වැයට එතුමා ඉගෙන ගෙන තිබෙන ආර්ථික විද්‍යා ශාස්ත්‍ර ඔක්කොම දමලා තමයි පිරිපහදු කරලා පෙන්වන්නේ ඒක හොඳයි කියලා. ඒ අමාරු වැඩේ එතුමා අමාරුවෙන්හරි කරන්න උත්සාහ කළා. එදා එහෙම ගෙනාපු අය වැයවල මොනවාද තිබුණේ? රාජ්‍ය සේවයේ පුරප්පාඩු අහෝසි කරන්න.

අද එතුමන්ලා ණය ගැන කතා කරනවා. වෙනමණය කළමනාකරණ ආයතනයක් පිහිටුවන්න සැලසුම් කළා. ඇයි? ඇති පදමට ණය ගන්න යන නිසා ණය කළමනාකරණය කරන්න වෙනම ආයතනයක් පිහිටුවන්න සැලසුම් කළා.[බාධා කිරීමක්] සංවර්ධන ණයයි. සංවර්ධන නොවන ණයයි කියා එහෙම දෙවර්ගයක් නැහැ. ණය නම් ණය. මොකට ගත්තා වුණත් ණය. එදා නාරිමාන් චොක්සි ඇමතිතුමා ණය කළමනාකරණ ආයතනයක් පිහිටුවන්න යෝජනා ගෙනාවේ මොකටද? ණය නොගෙන ඉන්නද? එහෙම යෝජනා ගෙනාවේ වෙන මොකකටවත් නොවෙයි. තව තවත් ණය අරගෙන ණය බරින් මේ රටේ ණය බර වැඩි කරන්න මිස වෙන මොකකටවත් නොවෙයි.

අද රාජ්‍ය සේවය ගැන කතා කරනවා. මේක ලක්ෂ 12කට වඩා රාජ්‍ය සේවයේ මිනිස් බලය වැඩි කරලා තිබෙන ආණ්ඩුවක්; රාජ්‍ය සේවයේ මිනිස් බලය ලක්ෂ 8 ඉඳලා 12 දක්වා වැඩි කරපු ආණ්ඩුවක්; රාජ්‍ය සේවය තවදුරටත් ශක්තිමත් කරන ආණ්ඩුවක්. එදා තනතුරු අහෝසි කරලා පුරප්පාඩු පුරවන්නේ නැති ප්‍රතිපත්තිය අනුගමනය කරපු තමුන්නාන්සේලා අද අපෙන් අහනවා, ලක්ෂ 8ක් ඉඳපු රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව ලක්ෂ 6ට බස්සන්න හදපු තමුන්නාන්සේලා අද අපෙන් අහනවා රාජ්‍ය සේවයට මොකද මේ කරන්නේ කියලා.

ඊළඟට මම දැක්කා ජෝශප් මයිකල් මන්ත්‍රීතුමා කියපු දෙයකට ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමාත් බොහොම උජාරුවෙන් සහභාගි වුණා. ආරක්ෂක හමුදාවල සාමාජිකයන් මේ පාර්ලිමේන්තු පිට්ටනියේ තණකොළ හිටවනවාය කිව්වා. තමුන්නාන්සේලාට හරි දුකයි ඒකට. [බාධා කිරීමක්] ඔබතුමා හොඳයි කිව්වත් දැන් ටික වෙලාවකට කලින් මෙතුමන්ලා කිව්වා බොහොම නරකයි කියලා. මෙතුමන්ලා ඒක අර්ථ කථනය කරන්නේ සමාජය මිලිටරීකරණය කරන්න යනවාය කියායි. අපේ ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා දැක්කත් අපට සතුටුයි. ඒ කියන්නේ පිට රට යන්නේ නැතුව මෙහාට වෙලා ඉන්න එක ගැන හරිම සතුටුයි. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන දෙය නොවෙයි මේ ගොල්ල කිව්වේ. හමුදාව දමලා මේවා කරවන්නේ ඇයි? නගර සභාවේ සේවකයන් දමා මේවා කරවන්න බැරිද කියායි. හමුදාව ලවා මේවා කළාම සමාජය මිලිටරීකරණය වෙනවාය කිව්වා. හමුදාකරණයක් වෙනවාය කියායි කිව්වේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුද්ධය ඉවර වුණාය කියා මේ රටේ ආරක්ෂක හමුදාවේ එක මිනිහෙක්වත් ගෙදර යැව්වේ නැහැ; රක්ෂාව නැති කළේ නැහැ. සිවිල් ආරක්ෂක බලකායේ එක මිනිහෙක්වත් ගෙදර යැව්වේ නැහැ. "යුද්ධය ඉවර වුණා. දැන් රකින්න තර්ජිත ගම්මාන නැහැ. දැන් පලයන් ගෙදර ." කියලා ගෙදර යැව්වේ නැහැ. යුද්ධය ඉවර වුණාය කියා ඒවා විසුරුවා හැරියේ නැහැ. ඒ ආරක්ෂක හමුදාව අද රටේ ජාතික සංවර්ධන ක්‍රියාදාමයේ ප්‍රබල කොටස්කාරයෙක් බවට පත් කරගෙන තිබෙනවා. මොකක්ද ඒකේ තිබෙන වැරැද්ද? ආරක්ෂක හමුදාව පාර්ලිමේන්තු පිට්ටනියේ තණකොළ හිටෙව්වාම ඇයි මොකක්ද තිබෙන ප්‍රශ්නය? මේ රට බේරා ගන්න සටන් කරපු ආරක්ෂක හමුදාවක් අද මේ රට හදන කාර්යයටත් දායක වෙනවා. මොකක්ද ඒකේ තිබෙන වැරැද්ද? තමුන්නාන්සේලා කියන්නේ මේක මිලිටරීකරණය, හමුදාකරණය කියායි. ජාත්‍යන්තර ප්‍රජාවට කියන්න යනවා හමුදාකරණයක් වෙනවාය කියා. "හමුදාකරණයක් සිදු වෙමින් තිබේ." කියනවා. මොකක්ද කියලා ඇහුවාම කියනවා, හමුදාව පාර්ලිමේන්තු පිට්ටනිය නවීකරණය කරනවා කියලා. ඒකයි හමුදාකරණය. හත්වලාමේ, හමුදාකරණය කියලා කියන්නේ ඕකටද? හමුදාකරණය කියලා කියන්නේ මොකක්ද කියලා තමුන්නාන්සේලා හොයලා බලන්න. හමුදාමය පිරිස් රාජ්‍ය පාලන තන්ත්‍රයට, දේශපාලන තන්ත්‍රයට ඇතුළු වෙනවාය කියන එකයි ප්‍රධාන වශයෙන්ම හමුදාකරණය කියලා කියන්නේ. අන්න, මියන්මාරයේ හමුදා පාලනය ගැන තමුන්නාන්සේලාට එහෙම විවේචනයක් කරන්න පුළුවන්. නමුත් මේ රටේ හමුදාව රටේ ජාතික සංවර්ධන ක්‍රියාදාමයේ කොටස්කාරයෙකු වී සිටීම කොහොමද හමුදාකරණයක් කියලා කියන්නේ. තමුන්නාන්සේලා හමුදාකරණය ගැන මෙහෙම කථා කරනවා.

සරත් ෆොන්සේකා මහත්මයාව ජනාධිපති කරන්න "left-right, left-right" කිය කියා march past එකේ ගියා. ඒක හොඳයි. කොහොමද, දිනුවා නම් හමුදාකරණය නොවෙයිද? දිනුවාට පස්සේ මරන්න ලයිස්තු හදලා තිබීම හමුදාකරණය නොවෙයිද? එතකොට හමුදාවේ හිටපු හමුදාපතිව ඉස්සරහින් තියා ගෙන "left-right, left-right" කිය කිය march past එකේ ජනාධිපතිවරණයේදී ගියා. ඒක හොඳයි! නමුත් හමුදාව පාර්ලිමේන්තු පිට්ටනිය හදන කොට ඒක නරකයි. ඒක හමුදාකරණය; මිලිටරීකරණය. අනේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලා මේ එකිනෙකට එරෙහි, එකිනෙකට ප්‍රතිවිරුද්ධ, පරස්පර විරෝධී, එකට එකක් ගැළපෙන්නේ නැති කථා ගොඩකින් තමයි අද මේ විවේචන ඉදිරිපත් කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට හිතෙන්නේ යූඑන්පීය බයෙන් ඉන්නවාය කියායි. හමුදාව පාර්ලිමේන්තු පිට්ටනියේ හිටවන තණකොළ උන්නැහේලාට අනුභව කරන්න සුදුසු නැති තණ කොළක් බවට පත් වෙයි කියලා බයෙන් ඉන්නවා කියලායි මට පේන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, මේ කාරණය ගැනත් කල්පනා කරලා බලන්න. මම අහගෙන හිටියා, ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා, සීමිත සුළු පිරිසක් - බොහොම සුළු පිරිසක්- අතට අසීමාන්තිකව ධනය එක් රැස් කෙරිලා තිබෙනවාය කියා. අර මොන මාටින්ද එකක් ගෙනැල්ලැයි කියලා තමුන්නාන්සේලා ගොඩ නඟපු තර්කය තමයි, ඉතා සුළු පිරිසක් අතට අසීමාන්තික ලෙස ධනය එනවාය කියන එක. තමුන්නාන්සේලා ඒ මඟින් කියන්නේ මේ ආණ්ඩුව ආර්ථික ප්‍රතිපත්ති හදලා තිබෙන්නේ සහ ගමන් කරන්නේ අන්න ඒ සුළු පිරිස තර කරන්නය කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක පැත්තකින් ඒ විවේචනය කරන ගමන් අනෙක් පැත්තෙන් කියනවා, ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත ගෙනැල්ලා ආයෝජකයාව අධෛර්යට පත් කළා; භය කළා; ආයෝජන නැති කර ගත්තා; මේ රටේ පෞද්ගලික අංශය නැති කර ගත්තා කියලා. මේ කථා දෙකම එකට හරි යනවද? මොකක් හරි එක විවේචනයක් කරන්න. එක පැත්තකින් තමුන්නාන්සේලා කියනවා, සුළු පිරිසක් අතට ධනය එකතු කරලා දෙන එක තමයි ආණ්ඩුව කරන්නේ කියා. මේකෙන් වෙලා තිබෙන්නේ ඒකයි කියලා. එහෙම නම් ඒ සුළු පිරිස පෞද්ගලික අංශය නේ. ඔය පිරිස පෞද්ගලික අංශයේ සුළු පිරිසක් නේ. ඒක කියන ගමන් අනෙක් අතට කියනවා, ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනතෙන්

පෞද්ගලික අංශය බිඳ වට්ටනවා; පෞද්ගලික අංශයට එරෙහිව පෞද්ගලික අංශය අධෛර්යට පත් කරනවා; පෞද්ගලික අංශයේ ආයෝජන නැති කර ගන්නවාය කියා. ඔය දෙකම කොහොමද එක පාර ඇත්ත වෙන්නේ? ඔය දෙකෙන් මොකක් හරි එකක් ඇත්ත වෙන්න පුළුවන්. හැබැයි ඔය දෙකම කොහොමද එක පාර ඇත්තයි කියලා කියන්නේ. ඒක නිසා තමයි මම කියන්නේ, විරුද්ධ පක්ෂය වැටිලා තිබෙන තැනේ හැටියට අඩු ගණනේ එකිනෙකට පරස්පර විරෝධී නොවන විවේචනයක්වත් කර ගන්න බැරි තරමට අද වැටිලාය කියා. එකිනෙකට ප්‍රතිවිරෝධී නොවන, එකිනෙකට ගැටුමක් ඇති නොකරන විවේචනයක්වත් කිරීමේ හැකියාව දැන් තමුන්නාන්සේලාට නැහැ. ඒක තමයි මේකෙන් පේන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කාරණය මෙයයි. එතුමා කථා කළා නීතියේ බිඳ වැටීම ගැන. අපි ඉතාම පැහැදිලිව දන්නවා එතුමා කියපු ප්‍රධාන කාරණය තමයි -මම ඒ තර්කය ඒ අවස්ථාවේදිත් මතු කළා.- භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මැතිතුමාගේ ඝාතනය සම්බන්ධයෙන් පොලීසිය ක්‍රියාත්මක වෙච්ච විධිය ගැන. මේක පෙන්නුවා නීතියේ කඩා වැටීමක්ය කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිය ක්‍රියාත්මක කරන්න අපේ රටේ ආයතන පද්ධති ගණනාවක් තිබෙනවා. අධිකරණය ගත්තත් අධිකරණ වර්ග රැසක් තිබෙනවා. එක අධිකරණයකින් යුක්තිය ඉටු නොවුණහොත් ඊට ඉහළ උසාවියට යන්න පුළුවන්. පහළ උසාවියෙන් දීපු තීන්දුව වැරදියි කියලා ඉහළ උසාවියෙන් තීන්දුවක් දෙන්න පුළුවන්. එතකොට පහළ උසාවියේ කළේ වැරැද්දක් කියලා අපි කියන්න යන්නේ නැහැ. ඒකේ වැරැද්දක් වෙලා තිබෙනවා නම් ඉහළ උසාවියෙන් ඒක නිවැරදි කරනවා. අගතියට පත් වෙච්ච පාර්ශ්වයට සාධාරණය ඉටු කරනවා. ඉහළ උසාවියෙන් බැරි වුණොත් ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා යන්න පුළුවන්.

නීතිය ක්‍රියාත්මක වෙන්න ආයතන ගොඩක් හදලා තිබෙනවා. කිසියම් ආයතනයක් පරමාදර්ශීව සියයට 100ක් නිරවද්‍ය විධියට නීතිය ක්‍රියාත්මක කරයි කියලා උපකල්පනයක් යටතේ නොවෙයි මේ ආයතන පිහිටුවලා තිබෙන්නේ. එම ආයතන පිහිටුවලා තිබෙන්නේ එක සිද්ධාන්තයක් පිළිඅරගෙන. ඒ තමයි මේ ආයතනවලින් වැරදි වෙන්න පුළුවන්; එකකින් වැරැද්දක් වුණොත් අනිත් එකෙන් ඒක නිවැරදි කරන්න පුළුවන්; ඒකෙන් වැරැද්දක් වුණොත්, ඒකෙන් සාධාරණය ඉටු නොවුණොත් ඊට ඉහළ උසාවියෙන් නිවැරදි කර ගන්න පුළුවන්. ඒ ක්‍රමවේද හදලා තිබෙනවා. නීතිය කියන්නේ එහෙම එකක්. කොයි රටේවත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන පිහිටුවලා නැහැ, ඒ හැම ආයතනයක්ම සියයට 100ක් නිරවුල්ව, නිරවද්‍ය විධියට වැඩ කරයි කියන උපකල්පනයක් මත. එහෙම වෙන්න බැහැ. දැන් නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ, කඩා වැටිලා කියලා යම් කෙනෙක් කියනවා නම්, මේ ආයතන පද්ධති සියල්ලම බිඳ වැටෙන්න ඕනෑ. පොලීසිය වැරදි කරන්න ඕනෑ, පොලීසිය කරන වැරැද්ද උසාවියෙන් පිළිගන්න ඕනෑ, ඒක හරියි කියලා කියන්න ඕනෑ, ඒ උසාවිය ඒක හරියි කියලා කිව්වාම ඒක වැරදියි කියලා අපි ඉහළ උසාවියට ගියාම එතැනිනුත් කියන්න ඕනෑ "නැහැ, නැහැ, ඒක හරි" කියලා. මේ සමස්ත ආයතන පද්ධතියම ක්‍රියාත්මක වෙන්නේ විකෘති ස්වභාවයකින් නම් එතැන නීතිය කඩා වැටිලා කියන්න පුළුවන්. නමුත්, තමුන්නාන්සේලා ගත්ත උදාහරණයම බලන්න. මොකක් හෝ හේතු මත පොලීසිය සැකකාරයෙක් කියලා හඳුනා ගත්තේ නැහැ. හැබැයි උසාවිය කිව්වා, එයා සැකකාරයෙක්, ගිහිල්ලා අත් අඩංගුවට ගන්න කියලා. අන්න බලන්න. එක ආයතනයකින් කිසියම් පාර්ශ්වයකට අගතියක් වෙනවා නම් වෙනත් ආයතනයකින් ඒක නිවැරදි වෙන ආකාරය. ඒක තමයි නීතිය ක්‍රියාත්මක වීම කියන්නේ. ඔක්කෝම හරියට කරන්න පොලීසියට පුළුවන් නම්, උසාවියක් මොන කෙංගෙඩියකටද? පොලීසිය කියන දේ ඔක්කෝම හරි නම් උසාවි මොන එකකටද? උසාවි කියන ඒවා තිබෙන්නේම පොලීසියත් ඇතුළුව නීතිය ක්‍රියාත්මක කරන පහළ ආයතනවලින් කිසියම් පාර්ශ්වයකට වැරැද්දක්, අඩු පාඩුවක්, අගතියක් සිද්ධ වෙනවා නම් ඒක නිවැරදි කරන්න. ඒක සිද්ධ වෙලා තිබෙනවා නේ. මොකද, නීතිය කඩා වැටිලාද? නැහැ, නීතිය ක්‍රියාත්මකයි. ඒ උදාහරණයෙන්ම පේන්නේ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක වන බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකවත් නොතේරෙන විරුද්ධ පක්ෂයක් එක්ක කොහොමද අය වැය විවාදයක් කරන්නේ? මේක ඉතාම සරල කාරණයක්. මොකද, නීතිය කියලා කියන්නේ පොලීසිය පමණක්ද? බොහොම සරල ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අද මෙතුමන්ලාට අවශ්‍ය වෙලා තිබෙන්නේ අන්තර්ජාතික ප්‍රජාවට, අන්තර්ජාතික බලවේගවලට ඕනෑ කරන දේශපාලන සටන් පාඨ ටික කොහොමින් කොහොමින් හරි ආරලු බුරුලු දාලා උඩට ගන්න විතරයි. වෙන මොකක්වත් වුවමනා නැහැ. නීතිය කඩා වැටිලා කියලා ලෝකයට ඇහෙන්න කෑ ගහන්න ඕනෑ. අපේ විපක්ෂ නායකතුමා ඊයේ පෙරේදා රට ගිහිල්ලා ආවා. ඌන ක්‍රියාකාරි ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත ගැන විවාදය කළාට පස්සේ තමයි එතුමා ආවේ. එතුමා ආපු ගමන් කිව්වේ, මම මේ ගැන ලෝක ප්‍රජාතාන්ත්‍රිකයන්ගේ සම්මේලනයට; ජිනීවාවලට, අරෙහෙට, මෙහෙට -කොහාටද මම දන්නේ නැහැ- පැමිණිලි කළාය කියායි. එතුමාව අනුගමනය කරලා බස් සංගමයේ සභාපතිතුමාත් කියනවා, "තෙල් මිල බස්සන්නේ නැහැ, ඒ නිසා මම යනවා ජිනීවාවලට" කියලා. ජිනීවා මානව හිමිකම් කොමිසමට පැමිණිලි කරලා තෙල් මිල බස්සගන්න පුළුවන්ද කියලා මිනිහා බලනවා. මේවා විපක්ෂ නායකතුමා ඇති කරපු නරක පුරුදු. මේ විධියට ගියොත් ගමේ ගොඩේ ප්‍රශ්නයක් වුණත් ජිනීවා ගිහින් කියන්න පුළුවන් කියලා එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයන් හිතන්න පුළුවන්. ඒ තරමටම තමුන්නාන්සේලා මේ රෝගය ව්‍යාප්ත කරලා.

**ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)
ඇමතිතුමා, ජිනීවාවලට private bus එකක් දෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මේ ගොල්ලන්ට ජිනීවාවලට යන්න අධිවේගී මාර්ගයක් හදලා දෙන්න ඕනෑ. මේ තමයි තමුන්නාන්සේලා කල්පනා කරන රටාව. ඒ නිසා තමයි තමුන්නාන්සේලාට පෙන්වන්න ඕනෑකම තිබෙන්නේ නීතිය කඩා වැටිලා කියලා. අන්න ඒක පෙන්වන්න මොකක් හරි කියන්න ඕනෑ. මොකද, තමුන්නාන්සේලා එක්ක ඉන්න අන්තර්ජාතික ප්‍රජාව, අන්තර්ජාතික බලවේගය බලාපොරොත්තුවෙන් ඉන්නවා “නීතිය කඩා වැටිලා, කඩා වැටිලා, කඩා වැටිලා, කඩා වැටිලා” කියලා එක වතාවක් නොවෙයි සිය දහස් වතාවක් තමුන්නාන්සේලාගේ කටවල්වලින් කියැවෙන්න ඕනෑ කියලා.

දැන් බලන්න, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, එතුමා හිටපු මාධ්‍යවේදියෙක්. ඒ දවස්වල අපෙන් ප්‍රශ්න ඇහුවා. දැන් එතුමාගෙන් අපි අහන ප්‍රශ්නවලට එතුමාට උත්තර දෙන්න බැහැ. දැන් රනිල් වික්‍රමසිංහ මහත්මයා එතුමාගෙන් ප්‍රශ්න අහනවා. එතුමා හොඳ උත්තරයක් දීලා තිබුණා. ඒ උත්තරය ප්‍රසිද්ධ කරන්න අමාරු උත්තරයක්. ඒකයි තිබෙන වැරැද්ද. දැන් එතුමාටත් පුළුවන් ජිනීවාවලට යන්න. බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, ඔබතුමාටත් පුළුවන් විපක්ෂ නායකතුමාගෙන් සිදු වන අගතිය ගැන ජිනීවාවල තිබෙන මානව හිමිකම් කොමිසමට පැමිණිලි කරන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අපචාර, ළමා අපචාරය.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මානව හිමිකම් කොමිසමට පැමිණිලි කරන්න පුළුවන්. මේක තමයි කරන්නේ. අපේ මොනවා හරි ප්‍රශ්න තිබෙනවා නම් යන්න මානව හිමිකම් කොමිසමට. යන්න දන්නේ නැත්නම් අපේ ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමාගෙන් අහන්න. කරන්න ඕනෑ විධිය එතුමා කියලා දෙයි. මොකක්ද මේ ක්‍රමය? අන්තර්ජාතික බලවේගවලට ඕනෑ කරන දේශපාලන රස මසවුළු නිර්මාණය කරලා ඒවා බෙදන එකද තමුන්නාන්සේලාගේ job එක.

ඔය වැඩේ කර කර හිටියොත් මහත්තයෝ තව අවුරුදු 100ක් ඔහොමම, ඔය පුටුවලටම දිය වෙලා යන තෙක් ඉන්න වනවා. අඩු ගණනේ මේ රටේ ජන මනස හඳුනා ගන්න පුළුවන්කමක් තමුන්නාන්සේලාට තියෙන්න ඕනෑ. ඔය ගිහිල්ලා අන්තර් ජාතික ප්‍රජාවට පැමිණිලි කරනවාය කිව්වාට මේ රටේ කිසි මිනිහෙක් ඒක ගණන් ගන්නේ නැහැ. තමුන්නාන්සේලා හැරෙන්න මේ රටේ කිසි මිනිහෙක් ඒවාට බය වන්නේත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අද මෙතැන මේ අයවැය දිහා බලන්නේත් ඒ න්‍යාය පත්‍රයට සාපේක්ෂවයි. එක්සත් ජාතික පක්ෂය එක පැත්තකින් මේ තර්ක ගෙනාවා.

අනෙක් පැත්තෙන්, අද මේ සභාවේ නැති වුණත් ජනතා විමුක්ති පෙරමුණේ ඉන්න මන්ත්‍රීවරු දෙතුන් දෙනා මේ අය වැය ගැන එක ප්‍රධාන තර්කයක් ඉදිරිපත් කරලා තිබුණා. ඒක තමයි මේක නව ලිබරල්වාදී ප්‍රතිපත්ති මත නිර්මාණය වෙච්ච අය වැයක් කියන එක. මම ඉතාම සරල කාරණයක් අහන්නම්. මේ ආණ්ඩුව නව ලිබරල්වාදී ප්‍රතිපත්තිය පිළිගත් ආණ්ඩුවක් නම්, රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ අවුරුදු දෙකක, තුනක පාලනය නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය පිළිගත්ත පාලනයක් කියලා මම කියනවා. ඒ නිසා තමයි එතුමා බොලිවුඩ්වල, හොලිවුඩ්වල හැදෙන චිත්‍රපට රූගත කිරීම් පාලක මණ්ඩලයට දමන්නේ නැතිව ඒ වෙලාවේම කෙළින්ම මේ රටේ සිනමා ශාලාවල පෙන්වන්න පුළුවන් කියන සංස්කෘතික ප්‍රතිපත්තිය හැදුවේ. ඒ නිසා තමයි එතුමා රාජ්‍ය සේවය දිය කර හැරීමේ ප්‍රතිපත්තිය හැදුවේ. ඇයි, නව ලිබරල්වාදී ප්‍රතිපත්තිය ඇතුළේ අනිවාර්යයෙන් සිදු විය යුතු ප්‍රධාන කොන්දේසියක් තමයි රාජ්‍ය සේවය හැකිළෙන්න ඕනෑ බව. රටේ ආර්ථිකය හැසිරවීමේ සමස්ත බලය මුළුමනින්ම පෞද්ගලික අංශයට යන්න ඕනෑ, ඒක පෞද්ගලික අංශයෙනුත් විදේශීය පෞද්ගලික අංශය බවට පත් වන්න ඕනෑ. රාජ්‍යයේ භූමිකාව - රාජ්‍යය- දිය කර හරිනවා; රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව අඩු කරනවා; රාජ්‍ය සේවයේ භූමිකාව දුර්වල කරනවා, දිය කරනවා. ඒක තමයි නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වෙන කොට දකින්න තිබෙන ප්‍රධානතම ලක්ෂණය.

දැන් මේ ආණ්ඩුව යටතේ ඒක සිදු වෙලාද? අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ ලක්ෂ අටේ තිබුණ රාජ්‍ය සේවය ලක්ෂ දොළහට ගෙනාවේ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිවලට අනුකූලවද? එතකොට නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්ති කියන්නේ රාජ්‍ය සේවය ශක්තිමත් කරන එකක්ද? එක්කෝ නව ලිබරල්වාදය ගැන දන්නේ නැහැ. එහෙම නැත්නම් මේ ආණ්ඩුවේ ආර්ථික වැඩසටහන ගැන දන්නේ නැහැ. නැත්නම් රාජ්‍ය සේවකයෝ කී දෙනෙක් ඉන්නවාද කියලා දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නව ලිබරල් වාදයේ ප්‍රධානතම ලක්ෂණයක් තමයි කුමන හෝ රටක ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වනවා නම් රාජ්‍ය සේවය හැකිළෙන එක. රාජ්‍ය අංශයේ භූමිකාව දුර්වල වනවා. එදා රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ පාලන කාලයේ අනුගමනය කළේ ඒ ප්‍රතිපත්තියයි. ප්‍රධාන වශයෙන් බදු ගෙවන මිනිස්සුත් දමලා, දෙපාර්තමේන්තුව බෙලහීන කරලා වෙනම ආදායම් බදු අධිකාරියක් - ආයතනයක්- පිහිටුවන්න ගියේ ඒ නව ලිබරල්වාදී ප්‍රතිපත්තිය අනුවයි. දැන් මේ ආණ්ඩුව එහෙම එකක් හදනවාද? හරි, මේ ආණ්ඩුව නව ලිබරල්වාදී නම්, වික්‍රමසිංහ මහත්තයාගේ එක මොන ලිබරල්වාදීද? මොකක්ද මේ දෙන තර්කය? දැන් අර කැරලිකාරයෝ නව ලිබරල්වාදය ගැන කථා කරන නිසා මේ ගොල්ලොත් කථා කරනවා. මේක මොකක්ද, මෙතැනට ගැලපෙනවාද, මෙහෙම කිව්වාම හරියනවාද, නැද්ද කියලා බලන්නේ නැහැ. නව ලිබරල්වාදී කියලා ලේබලයක් අලවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ, යුද්ධයෙන් පස්සේ අපේ රටේ ආර්ථික සංවර්ධනය සඳහා ලැබිලා තිබෙන අවස්ථාව අපි ඉතා වග කීමකින් යොදා ගත යුතු යුගයකයි අපි ඉන්නේ කියන එක. අපට නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිවලින්වත්, ලෝකයේ ප්‍රායෝගිකව අසමත් වෙච්ච කිසිම ආර්ථික ප්‍රතිපත්තියකින්වත් ගන්න දෙයක් ඉතිරි වෙලා නැහැ. අද මේ රට යන්නේ එක්තරා ආකාරයක ජාතිකවාදී ආර්ථික දැක්මක් මතයි. රාජ්‍ය සේවය ශක්තිමත් වන්නේ ඒ උපාය මාර්ගික දැක්මක් නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ශුභසාධන වැඩසටහන් කප්පාදු කිරීමක් ද කරන්නේ නැහැ. දැන් අය වැය පරතරය පියවන්න තවත් ක්‍රම තිබෙනවා නේ. ඕනෑ නම් ජනාධිපතිතුමාට මුදල් ඇමතිතුමා හැටියට මෙතැනට ඇවිල්ලා කියන්න තිබුණා, සමෘද්ධිය කපනවා කියලා. එතකොට අය වැය පරතරය අඩු වනවා. සෞඛ්‍ය සේවයට දෙන රුපියල් බිලියන ගණනක මුදලින් භාගයක් කපනවා කියන්න තිබුණා. එතකොට අය වැය පරතරය අඩු වනවා. අධ්‍යාපනයට දෙන රුපියල් බිලියන ගණනක මුදලින් භාගයක් කපන්න තිබුණා. එතකොට අය වැය පරතරය අඩු වනවා. තමුන්නාන්සේලා කථා කරන්නේ එහෙම අය වැය පරතරය පියවා ගැනීමක් ගැනද? මොන ක්ෂේත්‍රයට වෙන් කරන මොන මුදල කප්පාදු කරලා හරි මේ අය වැය පරතරය පියවන්න යෝජනා කරලා තිබෙනවාද?

නැහැ. දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් තිබුණා නම් අද අපට එන්නේ එහෙම අය වැයක්. සමෘද්ධිය අහෝසි කරලා වෙන මොකක් හරි බොරු නමක් දමලා, සමෘද්ධියට හිටපු පිරිසෙන් තුනෙන් එකක් විතර ඒකට අරගෙන ඉතුරු තුනෙන් දෙකම එළියට විසි කරලා, රාජ්‍ය වියදම් අවම කිරීම කියන තේමා පාඨයට අනුව රාජ්‍යයේ භූමිකාව දුර්වල කරලා, සුබසාධන ප්‍රතිපත්ති කප්පාදු කරන එකයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් තිබුණා නම් වන්නේ. අද මේ අය වැයෙන් කියන්නේ සුබසාධනය කපන්න නොවෙයි. මෙකෙන් කියන්නේ සමෘද්ධිලාභියාට දෙන ගණන තව ටිකක් වැඩි කරලා දෙන්න; රුපියල් දෙසිය ගණනක් දුන්න මිනිහාට හයසිය ගණනක් දෙන්න; ආබාධිතයෙක් ඉන්න පවුලකට රුපියල් 3,000ක් ගෙවන්න. මෙය සුබසාධනවාදී නැඹුරුව තවදුරටත් පවත්වා ගෙන යන අය වැයක් මිසක්, විශේෂයෙන්ම සමාජයේ පහළ සමාජ ස්තරවල ජීවත් වන අසරණ ජනතාව වෙනුවෙන් රජයෙන් ඉටු විය යුතු සුබසාධනවාදී පිළිවෙත් එකක්වත් අත් හරින්න යෝජනා කරපු අය වැයක් නොවෙයි. තව පුළුවන් හැටියට ඒවා වැඩිදියුණු කරන්න යෝජනා කරපු අය වැයක් මේක. පුළුවන් හැටියට තවත් කීයක් හරි දෙන්න කල්පනා කරපු අය වැයක් මේක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය කියන්නේ නත්තල් කාලයට නත්තල් සීයා ඇවිත් අඩන පොඩි ළමයි ඔක්කොටම කැමැති කැමැති දේවල් බෙදලා දෙන, ඒවා අරගෙන ඒවායින් සතුටු වෙන තාලයේ වැඩක් කියලා හිතනවා නම් ඒක වැරැදියි. අය වැයක අප බලන්න ඕනෑ වැදගත්ම දෙය රටට

අගතියක් වන ප්‍රතිපත්ති ගෙනැල්ලාද, රටට හානිකර යෝජනා ගෙනැල්ලාද, රට අනාරක්ෂාවට ඇද වට්ටන ආර්ථික ප්‍රතිපත්ති ගෙනැල්ලාද, දීර්ඝ කාලීන වශයෙන් රටේ ආර්ථිකය දුර්වල කරන ආර්ථික ප්‍රතිපත්ති, යෝජනා ගෙනැල්ලාද කියන එකයි. එහෙම තිබෙනවා නම් තමුන්නාන්සේලා කියන්න. අප කියන්නේ එහෙම නැහැ කියලායි. රටේ අනාරක්ෂාවට, ආර්ථික වශයෙන් අන්තරායකට ඇද දැමීම අරමුණු කොට ගත්තු කිසිම අය වැය යෝජනාවක් මේ අය වැය ලේඛනය ඇතුළේ නැහැ. අය වැයක බැලිය යුතු පළමුවෙනි වැදගත් දෙය තමයි අන්න ඒ අගතිය වෙනවාද කියන එක. එහෙම දෙයක් මේකේ නැහැ.

දෙවැනි කාරණය තමයි ඉන්න තත්ත්වයේ ඉඳලා ආර්ථිකය උඩට ගෙන යන්න උපාය මාර්ගිකව වැදගත් යෝජනා, තීරණ මේ අය වැය තුළ අන්තර්ගත වෙලා තිබෙනවාද කියන කාරණය. තමුන්නාන්සේලා පිළිගත්තත්, නොපිළිගත්තත් මේ අය වැය තුළ එබඳු උපාය මාර්ගික වැදගත්කමකින් යුක්ත යෝජනා අන්තර්ගත වෙලා තිබෙනවා කියලා අප විශ්වාස කරනවා.

තමුන්නාන්සේලා කියනවා ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත වැනි පනත්වලින් පෞද්ගලික අංශය නැති කරනවා කියලා. හැබැයි මේ අය වැය අරගෙන තිබෙන සමහර තීරණවලට අද පෞද්ගලික අංශය ප්‍රසාදය පළ කර තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා දී තිබෙන ඇතැම් බදු සහන දෙස බලන්න. මේ ක්ෂේත්‍රයේ ඉතා විශාල ප්‍රසාරණයක් වන කාලයක් මේ. දැවැන්ත සංවර්ධනයක් ඒ ක්ෂේත්‍රය තුළ ඇති වෙමින් තිබෙන කාලයක් මේ. ඒ ක්ෂේත්‍රයට නැඟිටින්න අවශ්‍ය කරන ධෛර්යය මේ අය වැයෙන් දීලා තිබෙනවා. මේක තමුන්නාන්සේලා අර කියන ඊනියා සුළු පිරිස තර කරන අය වැයක් නොවෙයි. අප විශ්වාස කරන්නේ නැහැ සංචාරක ව්‍යාපාරය කෙරෙහි අනවශ්‍ය තරම් අපි බලාපොරොත්තු තබා ගත යුතුය කියලා. ඒක මත අපිට යැපෙන්න බැහැ. නමුත් ආර්ථික සංවර්ධනයේ එක කොටසක් හැටියට පමණක් අපට ඒක පවත්වා ගෙන යන්න පුළුවන්. අප තිස් අවුරුදු යුද්ධයකින් බැට කාලා සංචාරක ව්‍යාපාරයට යන්න පුළුවන් ප්‍රසාරණය යන්න බැරිව අසරණ වෙලා තිබිච්ච රටක්. අද ඒ ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ආරම්භක පියවර තියලා තිබෙනවා; ඒ සඳහා අවශ්‍ය කරන තීරණ මේ අය වැයෙන් ගෙනැල්ලා තිබෙනවා. මොකක්ද ඒකේ වැරැද්ද? සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ වන පහළම මනුෂ්‍යයා දක්වා ඒ සහන බලපාන්නේ නැද්ද? එයාගේ ආදායම් තත්ත්වය වැඩිදියුණු වීම කෙරෙහි ඒවා බලපාන්නේ නැද්ද? ඒ සහන ප්‍රතිලාභ බවට පත් වන්නේ නැද්ද? කල්පනා කරලා බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම උදාහරණයකට කිව්වේ සංචාරක ක්ෂේත්‍රය ගැන විතරයි. නමුත් තවත් ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. කෘෂිකාර්මික පැත්ත ගත්තත්, අපනයන බෝග වගාව ගත්තත් සහන ලබා දීලා තිබෙනවා. කාර්මික වර්ධනයක් වෙනුවෙන්, නිෂ්පාදන වර්ධනයක් වෙනුවෙන්, ඒ ආර්ථික ක්ෂේත්‍රයේ වැඩිදියුණු වීමක් වෙනුවෙන් ඒ දිය යුතු බදු සහන සහ වෙනත් සහන ලබා දීලා තිබෙනවා. මේ මඟින් තමයි ආර්ථිකයක් ක්‍රමානුකූලව නැඟිටින්නේ. අය වැයක් වනාහී හැමෝටම තෑගි මලු තොග පිටින් බෙද බෙදා යාමක් කියලා අප හිතනවා නම් එහෙම අය වැයකින් රටක දීර්ඝ කාලීන ආර්ථික සංවර්ධනයක් අපට බලාපොරොත්තු වෙන්න බැහැ. අප මෙන්න මේ කාරණය අමතක කරන්න නරකයි. අප දරුණු යුද්ධ අභියෝගයකට මුහුණ දීලා, තිස් අවුරුද්දක සටනක් ඉවර කරලා, ආර්ථිකයට එල්ල වෙලා තිබිච්ච දැවැන්ත තර්ජන, අන්තරායන් මැඩ පවත්වා ගෙන, ගෙවිච්ච වසර දෙක තුනක කාලය ඇතුළත මේ රටේ ආර්ථිකය නිරෝගීව, ක්‍රමානුකූලව හුස්ම ගන්නා තැනකට අද ගෙනැල්ලා තිබෙනවා.

අපට තිබෙනවා, අභියෝග. අපි කියන්නේ නැහැ අභියෝග නැහැයි කියලා. තමුන්නාන්සේලා නොවෙයි, අපි ඉතාම පැහැදිලිව දන්නවා, මේ ණය වහල්භාවයෙන් අපි හැකි ඉක්මනින් ගැලවෙන්න ඕනෑය කියලා. මේ ණය මත පමණක් යැපෙන ප්‍රතිපත්තියකින් මේ රටට ඉදිරියට යන්න බැහැ. මේ ණය කළමනාකරණය කර ගැනීම අසීරු වන වෙලාවක් කවදා හෝ එනවා. ඒක නොදන්නා ආණ්ඩුවක් නොවෙයි, මේ ආණ්ඩුව. ණය මතම දීර්ඝ කාලීන වශයෙන් මේ රටේ ආර්ථික සංවර්ධනය තීරණය වන්න ඕනෑය කියලා හිතන ආණ්ඩුවක් නොවෙයි, මේ ආණ්ඩුව. අපි ඒ ණය වහල්භාවයෙන් ක්‍රමානුකූලව අත් මිදෙන්න ඕනෑ. ඒකට තිබෙන එකම ක්‍රමය රටේ ජාතික ආදායම වැඩිදියුණු කරන එකයි. සංචාරක ව්‍යාපාරය වර්ධනය වන කොට ජාතික ආදායම අතින් වැඩිදියුණු වීමක් වනවා. එතකොට රජයට ලැබෙන බදු ආදායම වැඩි වනවා.

හම්බන්තොට වරාය වැනි උපාය මාර්ගිකව වැදගත් ආර්ථික ව්‍යාපෘති ක්‍රියාත්මක තත්ත්වයට පත් වන කොට රටේ ආදායම වැඩි වනවා. ඒ මඟින් මහා භාණ්ඩාගාරයේ ආදායම වැඩි වනවා. මෙබඳු තවත් විවිධ ආර්ථික උපාය මාර්ග ඔස්සේ තමයි ජාතික ධනය වැඩි කිරීමේ ක්‍රියාදාමයකට යන්න පුළුවන් වන්නේ. ඒ මාර්ගය ඔස්සේ තමයි ණය මත යැපෙන එක ක්‍රමානුකූලව අඩු කර ගනිමින් අපට ඉදිරියට යන්න පුළුවන්කම ලැබෙන්නේ. එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයත් හදලා තිබෙන්නේ දීර්ඝ කාලීනව, අඛණ්ඩව ණය මත යැපීමේ බලාපොරොත්තුවෙන් නොවෙයි. අද නොවැළැක්විය හැකි ලෙස ණය මත හිර වුණු තත්ත්වයකට මුහුණ දෙන්න වුණත්, අනාගතයේ ලැබෙන පළමුවන අවස්ථාවෙන්ම ඒ ණය වහල්භාවයෙන් ගැලවෙන්න පුළුවන් වුවමනාව ඇතුව තමයි මේ අය වැය හදලා තිබෙන්නේ. එම නිසා තමයි අපේ නිෂ්පාදකයාට, අපේ ආදායම් උපදවන්නාට දිය යුතු සහන, බදු සහන සහ දිරි ගැන්වීම් ලබා දී තිබෙන්නේ. එහෙම නැතුව දීර්ඝ කාලීන ණය අරගෙන ජීවත් වන්න කල්පනා කරන ජාතියක් හැටියට නම් ඉදිරියට යන්න බලාපොරොත්තු වන්නේ, මේ රටේ ස්වදේශීය ආදායම් මාර්ග වැඩිදියුණු කිරීමේ, උත්පාදනය කිරීමේ වැඩසටහන්වලට මෙබඳු ප්‍රතිලාභ, එහෙම නැත්නම් සහන ලබා දීමේ අවශ්‍යතාවක් පැන නඟින්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මට නියමිතව තිබෙන කාලය අවසානද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කාලය අවසන් වෙලා තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මා අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ලෝකයේ තිබෙන හොඳම අය වැය ගෙනාවත්, ඕනෑම විරුද්ධ පක්ෂයක් -තමුන්නාන්සේලා- ඒකේ වැරැදි කියන්න එපා යැ. වෙන මොකක් කරන්නද? වෙන රක්ෂාවක් තිබෙන එකක් යැ. ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා නම් හෙදකම ගැන පත්‍රයට ලිපියක් ලියනවා, ටීඑන්එල් එකේ වැඩසටහනක් කරනවා. ඒක කරන්නේත් ආදායම් සොයන්න නොවෙයි නේ; සේවාවක් හැටියටයි. එතුමා එහෙම මොනවා හෝ කරකර ඉන්නවා. හැබැයි ඉතින් වැඩි දෙනකුට එහෙමවත් වැඩක් නැහැ නේ.

ඒ මන්ත්‍රීවරු මේ ගරු සභාවට ඇවිත් අය වැයට පහර ගහන එක හැරෙන්න වෙන මොනවා කරන්නද? මේ අය වැය ලෝකයේ තිබෙන හොඳම අය වැය වුණත් මේ අය වැයට බණින්න ඕනෑ. මේ අය වැය මහා අනතුරක් ගෙනෙන, රට විපතට ඇද දමපු, ජාති භ්‍රෂ්ටක අය වැයක් කියලා කියන්න ඕනෑ. අපි මේ අය වැය ගැන

[ගරු විමල් වීරවංශ මහතා]

මානව හිමිකම් කවුන්සිලයට පැමිණිලි කරනවාය කියලාත් කියන්න ඕනෑ. මා බලාපොරොත්තු වනවා, ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමාගේ කථාවේදී එතුමා ඒ වාක්‍යය කියයි කියලා. [බාධා කිරීමක්] ඒක තමයි. එහෙමත් කියන්න ඕනෑ. එහෙම එකක් කියන්නේ නැතුව ඔබතුමන්ලා මොනවා කරන්නද? එම නිසා කමක් නැහැ. ඒක කර ගෙන දෙයියනේ කියලා යහතින් ජීවත් වන්නය කියා ඉල්ලා සිටිමින් මා මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ. භා. 11.41]

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මිත්‍ර අනාගත අග්‍රාමාත්‍ය විමල් වීරවංශ මැතිතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න ලැබීම ගැන මා සතුටු වනවා. එතුමා එක්සත් ජාතික පක්ෂයේ අයට අවවාද රාශියක් දුන්නා. විපක්ෂ නායකතුමාටත් අවවාද රාශියක් දුන්නා. ජිනීවා මානව හිමිකම් කමිටුව ඉදිරියේදී ක්‍රියා කරන්න ඕනෑ කොහොමද කියන ආකාරය පිළිබඳව එතුමා කථා කළා. මා එතුමාට පොඩ්ඩක් මතක් කරන්න ඕනෑ, මේක කවුද පටන් ගත්තේ කියලා. එතුමා ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව, රටේ පරමාධිපත්‍යයට එරෙහිව, රටේ ස්වාධීනත්වයට එරෙහිව කැරලි නිර්මාණය කළ 1988-1989 කාල සීමාව තුළ, මා වාගේ විපක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් එදා කටයුතු කරපු, අද විධායක ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ කරපු කථාවක් ඇතුළත් හැන්සාඩ් වාර්තාවක් මා ළඟ තිබෙනවා. ඒ හැන්සාඩ් වාර්තාව කියවන ලෙස මා විමල් වීරවංශ -

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මා ඔබතුමාගේ කථාව හොඳින් අහගෙන සිටියා. කරුණාකරලා බාධා කරන්න එපා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

උත්තරයක් දෙන්නද?

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

නැහැ. එපා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

උත්තර එපාද?

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

නැහැ, නැහැ. එපා. කරුණාකරලා අහගෙන ඉන්න. මා ඔබතුමාගේ කථාවට බාධා කළේ නැහැ. [බාධා කිරීමක්] "ශ්‍රී ලංකාවේ ජනතාවගේ මානව හිමිකම් උල්ලංඝනය වනවා නම් මම ජිනීවාහි මානව හිමිකම් කමිටුව ඉදිරියට පමණක් නොව අපායට යන්නත් සූදානම්" කියලා ජනාධිපතිතුමා එදා විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට ආරම්භ කරපු ක්‍රියා මාර්ගය තමයි අද තවමත් ක්‍රියාත්මක වන්නේ කියන එක එතුමාට අමතක වීම ගැන මා කනගාටු වනවා. එම නිසා ජිනීවා මානව හිමිකම් කමිටුව ඉදිරියට යන්නට ඒ පරමාදර්ශය දුන්නේ -ඒ පෙරගමන පෙන්වූයේ - රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමාවත්, ජයලත් ජයවර්ධනවත් නොවෙයි එදා විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට සිටි වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමායි කියන එක මම විමල් වීරවංශ ඇමතිවරයාට - අනාගත ඇගමතිවරයාට - පැහැදිලි කර දෙන්නට කැමතියි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේවා අමතක වීම ගැන මා කනගාටු වෙනවා. එතුමා කියනවා, ලෝකයේ තිබෙන හොඳම අය වැය ගෙනාවත් විපක්ෂයට ඒක නරක අය වැයක්ය කියන්න ඕනෑය කියා. අපි කියමුකෝ ඒක හරියි කියා. එතකොට ඒකේ අනෙක් පැත්තත් බලන්න ගරු ඇමතිතුමනි. ලෝකයේ තිබෙන නරකම අය වැය ගෙනාවත් තමුන්නාන්සේගේ ඇමතිකම ආරක්ෂා කරන්නට ඒක හොඳම අය වැයක්ය කියා තමුන්නාන්සේට කියන්නට සිද්ධ වෙනවා. ඒක තමයි ඒක පාරාවළල්ලක් වාගේ වෙනවා. විපක්ෂයට ඇඟිල්ල දික් කරනකොට, වීදුරු ගෙවල්වල ඉඳලා ගල් ගහන්න එපාය කියා මේ ඇමතිවරු දැන ගන්නට ඕනෑය කියන එක මම කියනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් එතුමා කථා කළා, පෞද්ගලීකරණය -දේපළ විකිණීම- ගැන. ව්‍යාපාර විකිණීම ගැන කථා කළා. අද රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අයිති ඉඩම විකුණලා නැද්ද? රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අයිති ඉඩම විදේශිකයන්ට කෝටි ගණනකට විකුණලා නැද්ද? මේවා පෞද්ගලීකරණයට වඩා එහා ගිය විකිණීම් නොවෙයිද? මේවා ගැන කථා කරන්නේ නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක තමයි බරපතළ ප්‍රශ්නය. එතුමා රටේ වීරෝදාර රණවිරුවන් ගැන කථා කළා. බොහොම හොඳයි. යුද්ධය ගැන කථා කළා. බොහොම හොඳයි. මේ යුද්ධ ජයග්‍රහණය ලබා දෙන්නට කටයුතු කළ මේ රටේ වීරෝදාරම රණවිරුවා වන - එදා හමුදාපතිවරයා හැටියට ප්‍රශංසා ලබා ගත්, රටේ ජනාධිපතිවරයාගෙන් ප්‍රශංසා ලබා ගත්, රටේ ත්‍රෛනිකායික මහා සංඝයා වහන්සේලාගෙන්, ආගමික උතුමන්ගෙන් ප්‍රශංසා ලබා ගත්, ගෞරවයට ලක් වෙච්ච-ජනරාල් සරත් ෆොන්සේකා මහතා අද දේශපාලන හිරකාරයකු බවට පත් වීම අමතක වීම ගැන මා කනගාටු වෙනවා. අද වීරෝදාර රණවිරුවන් ගැන කථා කරනකොට ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා ගැන කථා නොකිරීම හෙණ ගහන අපරාධයක් කියා මා මතක් කරන්නට ඕනෑ. [බාධා කිරීමක්]

එතුමා කථා කළා, රාජ්‍ය සේවය ගැන. එක්සත් ජාතික පක්ෂ රජය රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවූයේ නැහැයිලු; රාජ්‍ය සේවය අහෝසි කළාලු. හරි. එක්සත් ජාතික පක්ෂය කළ වැරදි කරන්නට ද මේ ආණ්ඩුව ඇවිල්ලා තිබෙන්නේ? [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් 2,500ක වැටුප් වර්ධනයක් මූලික වැටුපට ලබා දෙනවාය කියා දළදා හාමුදුරුවෝ ඉදිරිපිට වෙච්ච ඒ පොරොන්දුව අපට මතක් කර දෙන්නට බැරිද? මේ ප්‍රශ්නයට මූලිකම දෙය මෙයයි. රාජ්‍ය සේවකයන්ට අද දීමනාවක් පමණයි ලැබී තිබෙන්නේ. අප ඒ ගැන කථා කිරීම වැරදිද? ඒ ගැන පෙන්වා දීම වැරදිද? අද අතිකාල දීමනාවට, විශ්‍රාම වැටුපට, සේවක අර්ථසාධක අරමුදලට මේ වැටුප් වර්ධනය ලැබෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආණ්ඩුව කාලයේ සේවකයින් සඳහා බදු සහන පනතක් ගෙනාවා. අද පෞද්ගලික අංශයට, සංස්ථාවලට, අධිකාරිවලට, මණ්ඩලවලට අඩු තරමේ මේ සොච්චමක වැටුප් වැඩි වීම -වැටුප් වර්ධනය- ලැබෙන්නේ නැහැ. ගරු විමල් වීරවංශ ඇමතිතුමා පෞද්ගලික අංශය ගැන කථා කළා. පෞද්ගලික අංශයේ තමයි ලක්ෂ හැත්තෑවකට වඩා සේවක සේවිකාවන් ඉන්නේ. රාජ්‍ය අංශයට වඩා කිහිප ගුණයක් වැඩියි, පෞද්ගලික අංශයේ සේවක පිරිස.

සේවක බදු සහන පනත 2005 දී මේ ආණ්ඩුව ගෙනාවා. අද මොකද වෙලා තිබෙන්නේ? ඒ පනත ක්‍රියාත්මක කරවන්නට බැහැ. හේතුව ඇයි? ඒ පනතේ සිංහල අර්ථ කථනයත්, ඉංග්‍රීසි අර්ථ කථනයත් අතර බරපතළ පරස්පර විරෝධයක් තිබෙනවා. සිංහල අර්ථ කථනයේ තිබෙනවා, වැටුප් වර්ධනයක් ගැන. ඉංග්‍රීසි අර්ථ කථනයේ තිබෙන්නේ salary increment එකක් ගැන. මේ පිළිබඳව ජාතික සේවක සංගමයේ සභාපතිවරයා ලෙසත් එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය මහ ලේකම්වරයා ලෙසත් මම කරුණු ඉදිරිපත් කර තිබෙනවා. පෞද්ගලික අංශයට මෙම වැටුප් වර්ධනය ලබා දෙන්නටය කියා අද කම්කරු විනිශ්චය සභාවට කිසිම නියෝගයක්, තීන්දුවක් දෙන්නට බැහැ. වැටුප් වර්ධනය ලබා දෙන්නටය කියා කියන්නට බැහැ. අද පෞද්ගලික අංශයට මේ අය වැයෙන් ලැබී තිබෙන සෙත මොකක්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මෙතැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

රුපියලේ අගය අඩු කිරීම නිසා අද කිරිපිටි ටිකට මොකද වෙන්නේ? අපි ආඩම්බරකාර තාත්තා ගැන කථා කළා.

කිරි පිටි ටිකට මොකද වෙන්නේ? බෙහෙත් ටිකට මොකද වෙන්නේ? ලංකාවේ තිබෙන සියලුම බඩුභාණ්ඩවල, බෙහෙත් ඇතුළුව අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සියල්ලගේම මිල අහස උසට නඟින තත්ත්වයකට පත් වෙනවා. විදේශ ණය මත අපි යැපෙන එක ඇත්ත. අය වැය පරතරය පියවා ගන්න නම් අපිට විදේශ ණය ගන්නට වෙනවා. අපි විදේශ ණය ගැනීමේදී විශේෂයෙන්ම රුපියලේ අගය අඩු වීම බරපතළ ප්‍රශ්නයක් බවට අද පත් වෙමින් තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකට හේතුව මොකක්ද? රුපියල අවප්‍රමාණය කිරීම ඇමෙරිකාව, චීනය වාගේ රටකට සුදුසුයි. නමුත් ලංකාව වාගේ රටකට සුදුසුද කියා කල්පනා කර බලන්න වෙනවා. අපි අපනයනය ගැන, ආනයනය ගැන කථා කළොත් අපි ආනයනය වැඩියෙන් කරන රටක්. අපනයනය ඉතා සුළුවෙන් කරන රටක්. අන්න ඒ තත්ත්වය යටතේ මෙය බරපතළ ලෙස ජනතා විරෝධී අය වැයක් බවට අද පත් වෙලා තිබෙනවා. මෙන්න මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ වංචාව, මේ බොරුව, මේ ප්‍රෝඩාව පෙන්වා දීම වග කිවයුතු විපක්ෂයක වග කීමක් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කළා නීතිය කඩා වැටීම පිළිබඳව. නීතිය ආරක්ෂා කරන්න පොලීසිය සහ අපේ අධිකරණ පද්ධතිය තිබෙන එක ඇත්ත. ඒ පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ. හැබැයි මූලික වශයෙන් අපේ රටේ නීතිය, යුක්තිය පසිඳලීමේ ප්‍රධානම පුරුක තමයි පොලීසිය. අද අපි මේ ගැන කථා කරන්නේ ඇයි? පොලීසිය පිළිබඳව අද ජනතාවගේ විශ්වාසය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ පොලීසියට මොකක්ද සිද්ධ වුණේ? නීතිය හරියට ක්‍රියාත්මක නොවන කොට රටේ ජනතාව නීතිය අතට ගන්න පටන් අරගෙන තිබෙනවා. කොළොන්නාවේ ප්‍රශ්නය පිළිබඳව, කොළොන්නාවේ තත්ත්වය පිළිබඳව අති පූජ්‍ය මාදුළුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේ මොකක්ද ප්‍රකාශ කරලා තිබෙන්නේ? කුඩු මධ්‍යස්ථාන, ගණිකා මඩම් ඇයි පොලීසිය අල්ලන්නේ නැත්තේ? මොකද අධිකරණයෙන් ගිහිල්ලා මේවා අල්ලනවාද? අධිකරණයට පුළුවන්ද? විනිශ්චයකාරවරුන් ගිහිල්ලා ගණිකා මඩම් අත් අඩංගුවට ගන්නවාද? ඒවා අල්ලනවාද? කුඩුකාරයෝ අල්ලන්න ඕනෑ කවුද? විනිශ්චයකාරවරුද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේත් නීතිඥවරයෙක්. අන්න ඒ නිසා මම තමුන්නාන්සේගෙන් අහනවා මේක කරන්න ඕනෑ කවුද? අද පොලීසිය අක්‍රීයයි. පොලීසිය අකර්මණ්‍ය වෙලා. අද ස්වාධීන පොලිස් කොමිසමක් නැහැ. මෙන්න මේකයි තත්ත්වය. මෙන්න මේකයි හේතුව. මෙන්න මේක තමයි ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා මතු කරන්න උත්සාහ කරපු තර්කය. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එකඟ වුණා. ආණ්ඩුවේ සියලුම මැති ඇමතිවරු දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එකඟ වුණා කාලීන අවශ්‍යතාවක් හැටියට. ස්වාධීන මැතිවරණ කොමිසම, ස්වාධීන පොලිස් කොමිසම, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම, ස්වාධීන අධිකරණ සේවා කොමිසම කියන මේ ආයතන රටේ නිර්දේශපාලනීකරණය කරන්න ඕනෑ කියලා එදා ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලුම දෙනා එකඟ වුණා.

අවසානයේ අද මොකක්ද වෙලා තිබෙන්නේ? දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අද අහෝසියි. පොලීසිය, රාජ්‍ය සේවය ඇතුළු එදා නිර්දේශපාලනීකරණයට ලක් වෙච්ච මේ සියලුම ආයතන අද සම්පූර්ණයෙන්ම දේශපාලන ආධිපත්‍යයට යටත් වෙලා. මේවා ජාත්‍යන්තරයට අපි කියන්න ඕනෑ නැහැ. මේ රට අපකීර්තියට පත් කරන්නේ කවුද? මේ රට අපකීර්තියට පත් කර ගන්නේ කවුද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය නොවෙයි. ලංකාවේ ගෞරවය, අභිමානය, කීර්තිය විනාශ කරලා මේ රට අපකීර්තියට පත් කරන්නේ, විනාශ කර ගන්නේ ආණ්ඩු පක්ෂයයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. අන්න ඒකයි වෙලා තිබෙන්නේ. ඇයි, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ ආකාරයට අහෝසි කළේ? මේ ආණ්ඩුවට තිබෙන තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීම නිසා තමයි අද යුක්තිය, නීතිය පසිඳලීම පිළිබඳව බරපතළ තර්ජනයක් බවට පත්ව තිබෙන්නේ. පොලීසිය අකර්මණ්‍ය වෙලා තිබෙන්නේ ඒ නිසායි. මෙන්න මේක තමයි ප්‍රධානම ගැටලුව.

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු මන්ත්‍රීතුමා, අවුරුදු 8ක් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නීතිය පිළිගෙන ක්‍රියාත්මක වුණේ නැහැ. අන්න ඒ ගැනත් ඔබතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

ගරු අගමැතිතුමනි, තමුන්නාන්සේ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙක්. මේ ක්‍රියාදාමය තුළ විපක්ෂයේ හෝ ආණ්ඩු පක්ෂයේ තමුන්නාන්සේත් හිටියා. ඒ කාල සීමාව තුළ තමුන්නාන්සේට ඒ හඬ නඟන්න ඉඩ තිබුණා. ඔබතුමා හඬ නැඟුවා. නමුත් තමුන්නාන්සේට හඬ නඟන්න ඉඩ දුන්නේ නැහැ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

ව්‍යවස්ථානුකූලව විපක්ෂයත් ආණ්ඩු පක්ෂයත් එකතු වෙලා තමයි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සකස් කළේ. නමුත් විපක්ෂය ඒක කිසිසේත්ම ක්‍රියාත්මක කළේ නැහැ. ඒක විපක්ෂයේ වැරැද්දක්. ඒකයි මා කියන්නේ. වෙන මොකුත් නොවෙයි.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

ගරු අගමැතිතුමනි, එදා ඒ වරද සිදු වුණත් අද ඔබතුමා අගමැති. අපි ඔබතුමා ගැන සතුටු වනවා; ආඩම්බර වනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යටතේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන්න තමුන්නාන්සේ දායක වුණේ ඇයි කියන එකයි මට තමුන්නාන්සේගෙන් අහන්න තිබෙන්නේ. වරද අපි කළා නම්, තමුන්නාන්සේ ඇයි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන්න එකඟ වුණේ කියන එක තමුන්නාන්සේගෙන් අහන්න කැමැතියි. ඒ වරද අපි පිළිගන්නවා නම්, තමුන්නාන්සේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන්න එකඟ වුණේ ඇයි කියන එක තමුන්නාන්සේගෙන් අහන්න කැමැතියි.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
හේතුව විපක්ෂය.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

ගරු අගමැතිතුමනි, අද බලයේ ඉන්නේ විපක්ෂය නොවෙයි. අද බලයේ ඉන්නේ තමුන්නාන්සේ ඇතුළු එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය. තමුන්නාන්සේ අගමැතිවරයා. අද තමුන්නාන්සේට වග කීමක් තිබෙනවා. රජයේ නායකයා හැටියට, පාර්ලිමේන්තුවේ නායකයා හැටියට දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආරක්ෂා කරන්න තමුන්නාන්සේට වග කීමක් තිබුණා. ඒ වගකීම තමුන්නාන්සේ අතින් ඉටු නොවීම ගැන මා කනගාටු වනවාය කියන එක මේ අවස්ථාවේ කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ අය වැයට සම්බන්ධ නොවුණත් තවත් බරපතළ ප්‍රශ්නයක් මේ පාර්ලිමේන්තුවේ අවධානයට, විශේෂයෙන් අගමැතිතුමාගේ යොමු කරන්න කැමැතියි. බොහෝ අවස්ථාවල විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට හදිසි තත්ත්වයන් පිළිබඳව ස්ථාවර නියෝග යටතේ මේ පාර්ලිමේන්තුවේ කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

මොරටුවේ රාවතාවත්තේ ශුද්ධ වූ තෙරේසා මව්තුමියගේ නිකායෙන් පවත්වාගෙන යන අනාථ නිවාසයකට අද බරපතළ අවාසනාවන්ත තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ නිවාසයේ ශුද්ධ වූ තෙරේසා මව්තුමියගේ නිකායේ පාලක සොහොයුරිය අද බන්ධනාගාරගත කර - remand කර -තිබෙනවා. ඒ ආයතනයේ -

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ඒක වැරදි විධියට අර්ථ කථනය කරනවා. අධිකරණය විවේචනය කරන්න මෙතුමාට ඉඩ දෙන්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Whatever that is stated contrary to the Standing Orders will be expunged. ස්ථාවර නියෝගවලට පටහැනි ප්‍රකාශ සියල්ල හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස නියෝග කරනවා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මා කියන්න උත්සාහ කරන්නේ මෙයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කන්‍යා සොහොයුරිය වරදක් කර තිබෙනවා නම්, නීතිය ඉදිරියට පමුණුවා අධිකරණයේ තීන්දුවක් ලැබෙන තුරු, ඒ කන්‍යා සොහොයුරිය වැරදිකාරියක් ලෙස හංවඩු ගැසීම සදාචාරාත්මක නොවන බවයි මම මේ අවස්ථාවේදී මතු කරන ප්‍රශ්නය. අධිකරණය ඉදිරියේ, එතුමිය වරදක් කර තිබෙනවා නම්, එතුමියට දඬුවම් ලැබෙනවා නම්, ඒ පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ. නමුත් අධිකරණයේ තීන්දුවක් දෙන්න ඉස්සෙල්ලා කවුරු හෝ වේවා යමෙක් එතුමිය වැරදිකාරියක් කරන්න උත්සාහ කරනවා නම්, ඒක බරපතළ ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොන ආගමකට අයිති වුණත් ඒක වැරදියි.

එදා මාත් ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාත් ළමා අයිතිවාසිකම් සුරැකීමේ පාර්ලිමේන්තු මන්ත්‍රී සන්ධානයේ සභාපතිවරයාත් ලේකම්වරයාත් හැටියට තමයි අපි මේ පාර්ලිමේන්තුවට ළමා ආරක්ෂණ අධිකාරී පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. මේ දෙපැත්තේම සහයෝගයෙන් එදා ළමා ආරක්ෂණ අධිකාරී පනත් කෙටුම්පත අනුමත වුණේ, මාත් ඩලස් අලහප්පෙරුම ඇමතිවරයාත් එදා ළමා අයිතිවාසිකම් සුරැකීමේ පාර්ලිමේන්තු මන්ත්‍රී සන්ධානයේ ක්‍රියා කළ නිසායි. ළමා අපචාරවලට අප විරුද්ධයි. ඒක ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා ඉතා හොඳින් දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නඟන්න උත්සාහ කරපු තර්කය මෙකයි. කවුරු හෝ නීතිය ඉදිරියේ සැකකරුවකු පමණක් නම්, ඇය හෝ ඔහු වැරදිකරුවකු ලෙස අර්ථ කථනය කිරීමට උත්සාහ කරන එක සදාචාරාත්මක නොවන බවයි. මෙයින් සිදු වන්නේ මොකක්ද? තෙරේසා මව්තුමියගේ නිකායට අයත් මෙවැනි ආයතන මුළු ලෝකයේම ක්‍රියාත්මක වෙනවා. මේ පාලක සොහොයුරිය ඉන්දියානු කාන්තාවක්. අද ඉන්දියාව ඇතුළු රටවල් රාශියක් මේ සිද්ධිය පිළිබඳව දැඩි අවධානය යොමු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අනුරාධපුරයේ බන්ධනාගාරයේ ද්‍රවිඩ සැකකාර රිමාන්ඩ් සිරකරුවන් අද උපවාසයක යෙදී සිටිනවා. මොකක්ද හේතුව? [බාධා කිරීම්] ඒ ද්‍රවිඩ සැකකාර සිරකරුවන්ගේ කෝවිල කඩා දාලා. මේ පිළිබඳව රජයේ බලධාරීන්ගේ අවධානය යොමු කරන්නට ඕනෑ. කවුරු හෝ වේවා සැකයක් නිසා, -දෙමළද, සිංහලද, මුස්ලිම්ද කියන එක නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ- සැක කටයුතු කරුණක් නිසා සිරගත කරලා තිබෙනවා නම් ඔවුන් වැරදිකරුවන් නොවෙයි. ඔවුන් වැරදිකරුවන් බවට පත් වෙලා නැහැ. ඔවුන් remand prisonersලා; සැකකරුවන්. අනුරාධපුර බන්ධනාගාරයේ තිබෙන කෝවිල කවුරු හෝ කඩා දානවා නම් ඒක වැරදියි. මොන ආගමේ දෙයකට වුණත්, මුස්ලිම්, කතෝලික, හින්දු, බෞද්ධ කියන කොයි ආගමේ වුණත් ඒක වැරදියි. සිංහල, දෙමළ, මුස්ලිම් කියන සැකකරුවන් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි මෙතැන තිබෙන්නේ. ආගම පිළිබඳ ප්‍රශ්නයක්, මානුෂිකත්වය පිළිබඳ ප්‍රශ්නයක් මෙතැන තිබෙන්නේ. ඒ නිසා තමයි මොරටුවේ, රාවතාවත්තේ "ප්‍රේම නිවස" ගැන මම කථා කළේ; අනුරාධපුරයේ සිර කඳවුර ගැන මම කථා කළේ; සැකකාර සිරකරුවන් ගැන මම කථා කළේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
කවුද, මොනවාද චෝදනා?

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන හැටියට මේ ප්‍රශ්නය දෙස මානුෂිකත්වයෙන් බැලීම අපි සියලු දෙනාගේම වග කීමක් වෙනවා. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බාධා කිරීම් ගැන මම කලබල වන්නේ නැහැ. ජනාධිපතිවරයා ඉදිරියේදීත් ලලිත් දිසානායක ඇමතිවරයා ආණ්ඩු පක්ෂයේ ඉඳලා සභාව මැදින් විපක්ෂය පැත්තට ඇවිල්ලා අපට ගහන්න කටයුතු කළා. ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ ඉන්න කොට! මම ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙනවා එතුමා ඒ පිළිබඳව අපක්ෂපාත පරීක්ෂණයක් කරන්න එකඟ වීම ගැන. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය පැත්තේ ඉඳලා සභා ගර්භය හරහා විපක්ෂය පැත්තට කවුරු හෝ ඇමතිවරයෙක් ආවා නම් ඒක දඬුවම් ලැබිය යුතු, සදාචාරාත්මක නොවන, පාර්ලිමේන්තු සම්ප්‍රදායයට සම්පූර්ණයෙන්ම පටහැනි දෙයක්. ගරු ඇගමැතිතුමා, මම හිතන හැටියට තමුන්නාන්සේ මාව අනුමත කරනවා. තමුන්නාන්සේ නිහඬව ඉන්නේ අන්න ඒ නිසායි. කරුණාකරලා ලලිත් දිසානායක ඇමතිවරයාට කියලා දෙන්න. [බාධා කිරීම්] මේ විධියටද පාර්ලිමේන්තුවේ හැසිරෙන්නේ? පාර්ලිමේන්තු සම්ප්‍රදායයක් නැත්නම්, විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කරන විට ඒක අහ ගෙන ඉන්න සදාචාරයක් නැත්නම්, ඒක අහ ගෙන ඉන්න මනුස්සකමක් නැත්නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි මේකද පාර්ලිමේන්තු සම්ප්‍රදායය?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! There is a point of Order being raised. What is your point of Order, Hon. Dissanayake?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු මන්ත්‍රීතුමා කියනවා වරප්‍රසාද කඩ කරලා අපි එහා පැත්තට ගියා කියලා. පළමුවෙන්ම වරප්‍රසාද කඩ කළේ එතුමන්ලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට පෝස්ටර් ගේන්න බැහැ. පෝස්ටර් ගෙනාවා නම් ගරු කථානායකතුමාගේ අණට කීකරු වෙන්න ඕනෑ. [බාධා කිරීම්] කවුද පෝස්ටර් ගෙනාවේ? ඉස්සෙල්ලා දඬුවම් දෙන්න ඕනෑ ඒකට. හෙට බෝම්බ ගේන්න පුළුවන්. මේවා check කරලා නොවෙයි එන්නේ. ඒ නිසා මේක වැරදියි. ඉස්සෙල්ලාම දඬුවම් දෙන්න ඕනෑ තමුන්නාන්සේට, පෝස්ටර් ගෙනාවාට.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ පිළිබඳව ගරු කථානායකතුමා මේ මොහොත වන විට පරීක්ෂණයක් පවත්වනවා. ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න. ඒ කාරණාව පිළිබඳව පරීක්ෂණයක් සිදු කරමින් පවතිනවා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
පරීක්ෂණයක් පවත්වන්න කියලා ප්‍රකාශ කිරීම ගැන මම ගරු කථානායකතුමාට ස්තුති වන්ත වනවා. ගරු කථානායකතුමා ඉතාම වැදගත් දේශපාලනඥයකු විධියට අපක්ෂපාත පරීක්ෂණයක් කරයි කියලා අපේ විශ්වාසයක් තිබෙනවා. ඒ නිසායි මම එතුමාට ස්තුතිවන්ත වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයෙන් අභිංසක විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් විෂමතාව,-[බාධා කිරීම්]

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Yogarajan, what is your point of Order?

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
Sir, we have a right to speak in this House. They should not disturb us like this.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. Hon. Member, you continue with your speech. - [*Interruption.*]

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
We are not disturbing.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -[බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභිංසක විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් විෂමතාව සමථයකට පත් කරනවායි කියලා ජනාධිපතිතුමා ප්‍රතිඥාවක් දීලා තිබුණා. ලංකාවේ ලක්ෂ ගණනක් අභිංසක විශ්‍රාමිකයෝ ජනාධිපතිතුමා කෙරෙහි දැඩි විශ්වාසයකින් බලා සිටියා, මේ විශ්‍රාම වැටුප් විෂමතාව මේ අය වැයෙන් විසඳලා දෙයි කියලා. අවාසනාවකට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයෙන් විශ්‍රාම වැටුප් විෂමතාව පිළිබඳව, මේ අභිංසක විශ්‍රාමිකයන්ට මේ රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට අබමල් රේණුවකවත් කිසිම සෙතක් සිදු වෙලා නැහැ. විශ්‍රාමිකයන්ට ලබා

[ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා]

දී තිබෙන්නේ කේජු කැල්ලක්. රජයේ සේවකයන්ට ලබා දුන් කේජු කැල්ලට හා සමානව කේජු කැල්ලක් තමයි මේ විශ්‍රාමිකයන්ටත් ලබා දී තිබෙන්නේ. පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්ට අද කිසිම සහනයක් නැහැ. විපක්ෂය වෙනුවෙන් මම යෝජනා කරන්න කැමැතියි, කරුණාකරලා 2005 මේ ආණ්ඩුව ඉදිරිපත් කරපු සේවකයන් සඳහා වූ සේවකයන්ගේ අය වැය සහන දීමනාව මේ සංශෝධනත් එක්ක මේ පාර්ලිමේන්තුවට වහාම ඉදිරිපත් කරලා අහිංසක පුද්ගලික අංශයේ ලක්ෂ 70කට මේ වැටුප්, අඩු තරමේ මේ දීමනා වර්ධනයවත්

ලබා ගැනීමේ අයිතිය ලබා දෙන්න කියලා මම මේ ආණ්ඩුවෙන් කරුණාකරලා ඉල්ලීමක් කරනවා. මේ බොරුව කරන්න එපා. රවට්ටන්න එපා. අද රවට්ටලා, හරියට නව කථාවක් වාගේ මේ පාර්ලිමේන්තුවේ අය වැය කියෙව්වා.

අද ළමා මන්ද පෝෂණය වැඩි වේගෙන යනවා. ගැබිනි මව්වරුන්ගේ මන්ද පෝෂණය වැඩි වේගෙන යනවා. අපේ අහිංසක රෝගීන්ට අවශ්‍ය කරන බෙහෙත් හේත්, අත්‍යවශ්‍ය බෙහෙත් හේත් රජයේ රෝහල්වල නැහැ. ඒවා පිටින් ගෙනෙන්න කියලා වෛද්‍යවරුන්ට නියම කරන්නට සිද්ධ වෙලා. බෙහෙත් හේත් පමණක් නොවෙයි, අඩු තරමින් පුළුන් ටික, ගෝස් ටික -මේ සියල්ලම- අද එහා පැත්තේ තිබෙන ෆාමසියෙන් ගෙනෙන්න කියන තත්ත්වයට පත් වෙලා ඉවරයි. එහෙම නම් අද නිදහස් සෞඛ්‍ය සේවයක් කෝ? නිදහස් සෞඛ්‍ය සේවය අද විනාශ වෙමින් පවතිනවා. අද එක්සත් ජාතික පක්ෂයට ඇඟිල්ල දික් කරන්න මේ ඇමතිවරුන්ට පුළුවන්කමක් නැහැ. එක්සත් ජාතික පක්ෂයට ඇඟිල්ල දික් කරන්න මේ ඇමතිවරුන්ට පුළුවන් වන්නේ, තමන් හරි දේ කරලායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එය හරියට කකුළුවා ඇඳයට ගිහිල්ලා පැටවුන්ට කෙළින් යන්න කියනවා වාගේයි. අද මේ ආණ්ඩුව වීදුරු ගෙවල්වල ඉඳලා ගල් ගහන්න පටන් අරගෙන.

අද, සංස්ථා, මණ්ඩල, අධිකාරී යන මේ ආයතනවල සේවක සේවිකාවන්ට කිසිම වැටුප් වර්ධනයක්, කිසිම දීමනාවක් මේ අය වැය තුළින් ලබා දීලා නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් නැති කළේ තමුන්නාන්සේලා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
පෞද්ගලික අංශය ගැන කථා කළා. තමුන්නාන්සේට මම දැන් කියන්නම්, පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා වූ, "සේවකයන්ගේ අය වැය සහන දීමනාව" 2005 පනත අද අකර්මණ්‍ය වෙලා තිබෙන්නේ. ඒ කාර්මික හේතුවක් නිසා; සිංහල හා ඉංග්‍රීසි අර්ථ කථනයේ වෙනස් වීමක් නිසා. තමුන්නාන්සේලා කිඹුල් කඳුළු හළන්නේ නැතුව, මේ පනත සංශෝධනය කරන්න. අද තමුන්නාන්සේලාට තුනෙන් දෙකේ බලය තිබෙනවා. ඒ පනතට සංශෝධන මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, ලක්ෂ 70ක් වන පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්ට ඒ වැටුප් වර්ධනය ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

මේ ජනතාවගේ අය වැයක්ද? සුඛෝපභෝගී වාහනවල ලියා පදිංචිය වැඩි කිරීම ගැන අපි පැත්තකින් තියමුකෝ. ඇස්ටන් මාටින් ගෙන්වන අයට ඒ ලියා පදිංචි ගාස්තුව ගෙවන්න පුළුවන්කම තිබෙනවායි කියලා කියමුකෝ. නමුත් අහිංසක ත්‍රී වීලර්ස් හිමියන්ට, අහිංසක මෝටර් බයිසිකල් වැනි පුංචි වාහන හිමියන්ට- [බාධා කිරීමක්] ඔව්, රුපියල් පන්සියය. අනේ! මේ ඇමතිවරුන්ට රුපියල් 500 පොඩි සොච්චමක්. ඒ අහිංසක ත්‍රී වීලර්ස් හිමියන්ට, ඒ අහිංසක මෝටර් බයිසිකල් රථ හිමියන්ට රුපියල් පන්සියය කියන්නෙත්, රුපියල අවම කරපු මේ ප්‍රෝඩාකාරී වංචාකාරී අය වැය යටතේ ඉතා විශාල මුදලක් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද පුංචි මිනිහාගේ ඒ වාහනයටත් ගහලා ඉවරයි. ඒ විතරක්ද? අනේ! අපේ රටේ ඉන්නවා; මැද පෙරදිග ගිහිල්ලා ඒ වාගේම යුරෝපාකරයේ ගිහිල්ලා අපේ ශ්‍රමිකයෝ ලක්ෂ ගණනක් ඉන්නවා. මේ ශ්‍රමිකයෝ තමයි අපේ රටට විදේශ විනිමය ගෙනෙන්නේ. මේ ශ්‍රමිකයන්ගේ වයෝවෘද්ධ අම්මලා තාත්තලාට, තමන්ගේ අඹු දරුවනට කථා කරන්න තමයි ජාත්‍යන්තර දුරකථන සේවයක් තිබෙන්නේ.

මේ ජාත්‍යන්තර දුරකථන ජාලය, ඒ තාක්ෂණය, එදා එක්සත් ජාතික පක්ෂ රජය කාල සීමාව තුළ අපේ රටට හඳුන්වා දුන්නා. එදා රූපවාහිනිය ලංකාවට හඳුන්වා දුන්නා වාගේ මේ ජාත්‍යන්තර දුරකථන ජාලය, ජංගම දුරකථන ජාලය, එක්සත් ජාතික පක්ෂ රජය කාල සීමාව තුළ මේ රටේ පොදු ජනතාවට හඳුන්වා දුන්නා. සුඛෝපභෝගී ජීවිත ගත කරන ජනතාවට පමණක් නොවෙයි, සම්පත් තිබෙන බලසම්පන්න අයට පමණක් නොවෙයි, මැති ඇමතිවරුන්ට පමණක් නොවෙයි, අද මේ රටේ ඕනෑම කෙනෙකුට, අහිංසක දුප්පත් මනුෂ්‍යයාගේ පටන් එළවලු විකුණන මනුෂ්‍යයාටත්, ත්‍රී වීල් රථ රියදුරාටත්, පාරේ ස්වයං රැකියාවක් කරන මනුෂ්‍යයාටත් අද ජංගම දුරකථනයක් පාවිච්චි කිරීමේ අයිතිය එක්සත් ජාතික පක්ෂ රජය කාලය තුළ ලබා දුන්නා. අද මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? අනේ! අර මැද පෙරදිග සිටින අහිංසක ශ්‍රමිකයා, තමන්ගේ අම්මාගේ තාත්තාගේ දුක සැප සොයන්න, තමන්ගේ අඹුවගේ, තමන්ගේ දරුවන්ගේ තොරතුරු සොයන්න පිට රට ඉඳලා දුරකථනයෙන් කථා කරනවා. ඒ ජාත්‍යන්තර දුර කථන ගාස්තුවත් අද මේ ආණ්ඩුව වැඩි කිරීම නිසා විදේශ රටවල සිටින අපේ ශ්‍රමිකයන්ට බරපතළ අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා. මැති ඇමතිවරුන්ට, කෝටිපතියන්ට මේක බරපතළ ප්‍රශ්නයක් නොවෙයි. ඒ අයට කොමිස් තිබෙනවා; අරවා තිබෙනවා; මේවා තිබෙනවා; කුට්ටි ගණන් ලැබෙනවා. නමුත් අර සොච්චමක් හම්බකරන මැද පෙරදිග සිටින අපේ අහිංසක ශ්‍රමිකයාට තමන්ගේ ගෙදරට කථා කරන්නට බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අද විමල් වීරවංශ ඇමතිවරයා කථා කළා, දේශීය ව්‍යාපාරිකයන් ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)
හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ දේශීය ව්‍යාපාරිකයා සහමුලින්ම විනාශ කිරීමේ, විශේෂයෙන්ම විපක්ෂයට හිතවත් දේශීය ව්‍යාරිකයන් විනාශ කිරීමේ මහා කුමන්ත්‍රණයක් මේ ආණ්ඩුව ඇති කර තිබෙනවා. දයා ගමගේ මහත්මයා එදා කොළඹ ඉඳලා අම්පාරට ගියේ රුපියල් 70ක් අරගෙන. අද ඔහු විශාල දේශීය ව්‍යාපාරිකයකු බවට පත් වෙලා තිබෙනවා. හැරී ජයවර්ධන මහත්මයාත් අන්න එහෙමයි ව්‍යාපාර පටන් ගත්තේ. දයා වෙත්තසිංහ මහත්මයා වැනි මේ දේශීය ව්‍යාපාරිකයෝ තමන්ගේ දහඩිය මහන්සියෙන් කාලය, ධනය, ශ්‍රමය, පාවිච්චි කරලා මහා විශාල දේශීය ව්‍යාපාරිකයන් බවට පත් වෙලා තිබෙනවා. අද මේ දේශීය ව්‍යාපාරිකයන් විනාශ කිරීමේ වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කිරීම ගැන

දේශීය ආර්ථිකය ගැන කථා කරන, දේශීයත්වය ගැන කථා කරන මේ ආණ්ඩුවට ලජ්ජයි, ලජ්ජයි, කියලා කියනවා මිස වෙන මොකක්ද කියන්නේ කියන එක මා මේ අවස්ථාවේ දී අහන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එදා දයා ගමගේ මහත්මයා රුපියල් 70ක් අරගෙන අම්පාරට නොගියා නම් අද අම්පාරේ සිටින අහිංසක මිනිසුන්ට මොකක්ද සිදු වන්නේ? රැකියා බිහි වනවාද? ඒ පළාත් දියුණු වනවාද? ඒ පළාතේ පල්ලිවලට, පන්සල්වලට, කෝවිල්වලට, මුස්ලිම් දේවස්ථානවලට -ඒ සියල්ලටම- අවශ්‍ය කරන පහසුකම් ලබා දෙන්නට මේ දේශීය ව්‍යාපාරිකයා, දයා ගමගේ මැතිතුමා කටයුතු කර නැද්ද? ඒ වාගේම තමයි හැරී ජයවර්ධන මහත්මයාත්. ඒ වාගේම තමයි දයා වෙත්තසිංහ මහත්මයා වැනි දේශීය ව්‍යාපාරිකයනුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දේශීය ආර්ථිකය ගැන කථා කරන, දේශීයත්වය ගැන කථා කරන, මේ ආණ්ඩුව මේ දේශීය ව්‍යාපාරිකයන් දේශපාලන වශයෙන් පළි ගැනීමට ලක් කිරීම ඉතාමත්ම ලජ්ජා සහගත, ලජ්ජා සහගත, ලජ්ජා සහගත ක්‍රියාවක් බවට ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා, බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා.

[අ. භා. 12.11]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා (විද්‍යාත්මක කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண - விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) Tissa Vitarana - Minister of Scientific Affairs)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම වැයම් කරන්නම්, මට ලැබී තිබෙන විනාඩි 25ක කාලය තුළම අය වැය සම්බන්ධව කථා කරන්න.

ලංකා සම සමාජ පක්ෂය වෙනුවෙන් මා මුලින්ම අතිගරු ජනාධිපතිතුමාටත්, භාණ්ඩාගාරයට සම්බන්ධ අපේ රටේ ආර්ථික තත්ත්වය මෙහෙයවන සියලු දෙනාටමත් අපේ ප්‍රශංසාව පළ කරන්නට කැමැතියි. පසු ගිය වසරේ ඉදිරිපත් කරන ලද අය වැයෙන් පසුව ලෝකයේ දරුණු ආර්ථික අර්බුදයක් නැවත ඇති වෙමින් පවතින මේ යුගයේ අප රටේ ආර්ථිකය ස්ථාවර තත්ත්වයකට ගෙන එන්නට පමණක් නොවෙයි, සංවර්ධනය ඉදිරියට ගෙන යන වාතාවරණයක් ගොඩනහන්නත් මේ රජය කටයුතු කරලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය ලේඛනයේ මේ පිළිබඳව විස්තර කරලා තිබෙනවා. ඒ නිසා ඒ ගැන මා නැවතත් කරුණු ඉදිරිපත් කරන්නට යන්නේ නැහැ, ඒ සාධක මොනවාද කියලා. නමුත් අපි සන්තෝෂ වන්නට ඕනෑ, මේ අයහපත් ලෝක ආර්ථික තත්ත්වයක් තිබෙද්දීත් පසු ගිය අය වැයෙන් පටන් ගත් සංවර්ධන වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යාම ගැන; නව ලිබරල්වාදී ගමන නතර කරලා, ඒ බලපෑම්වලට යට නොවී අප රටට ඔබින ජාතික ආර්ථික සැලැස්මක් දියුණු කිරීමට කටයුතු කිරීම ගැන. ඒ එක්කම සමාජ සුභසාධනය රැක ගෙන ආර්ථිකය ඉදිරියට ගෙන යෑම ගැන අපේ සතුට ප්‍රකාශ කරන්න මා මුලින්ම කැමැතියි.

දෙවනුව අපි තේරුම් ගන්න ඕනෑ, අද ලෝකය ඉතාම භයානක තත්ත්වයකටයි මුහුණ දෙන්නේ කියන කාරණය. ධනපති ආර්ථිකය 2008 අර්බුදයෙන් ගොඩ එනවා කියා හිතා ගෙන නොයෙකුත් වාර්තා පිට වුණාට එන්න එන්නම ඒ ආර්ථික තත්ත්වය තවත් දරුණු අතකටයි යන්නේ. බ්‍රිතාන්‍යයේ, යුරෝපයේ, ඇමෙරිකාවේ විරැකියාභාවය වැඩි වෙලා පමණක් නොවෙයි, ඒ රටවල ණය බරත් වැඩි වෙලා. ඒ තත්ත්වයන්ගෙන් මිදෙන්න ආර්ථික විසඳුමක් නැතිවයි ඒ සංවර්ධිත පොහොසත් අධිරාජ්‍යවාදී රටවල් පෙළෙන්නේ. මෙවැනි තත්ත්වයන් තුළින් අප රටවලට අනතුරක් තිබෙනවා. ඇයි? ඒ රටවලට ඒ ආර්ථික අපහසුතාවෙන් ගොඩ එන්න තිබෙන එකම මාර්ගය අවි ආයුධ අළෙවිය වැඩි කිරීමයි. කනගාටුයි කියන්න, ඒ රටවල් ඒ මාර්ගයට දැන් පිවිසිලායි තිබෙන්නේ. ලෝකයේ මැද පෙරදිග වෙන දේවල්, පාකිස්තානයේ වෙන දේවල් දිහා බැලුවාම හොඳටම පැහැදිලියි, අවි ආයුධ අළෙවිය ඉදිරියට ගෙන යන ආකාරයක් දකින්න තිබෙන බව.

වසර 2029-2033 ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න තියලා තමයි එතැනින් එහා post-war boom එක අවුරුදු 25ක් ලෝක ආර්ථිකය නැග්ගුවේ. නමුත් අද තිබෙන න්‍යෂ්ටික තත්ත්වයන් සලකලා එවැනි දෙයක් ක්‍රියාත්මක කරන්න බැහැ. රටවල් තුළ අභ්‍යන්තර ගැටුම් පදනම් කර ගෙන භේද භින්නතා ඇති කර ගෙන තමයි කටයුතු කරන්නේ. ඒ තත්ත්වයට දැන් ලංකාවත් ගොදුරු වන්න ඉඩ තිබෙනවා කියන එක තේරුම් අර ගෙන අපි කටයුතු කරන්න ඕනෑ. ඒ අය බලන්නේ ඒ අයගේ ගැත්තන් අප රට තුළ පාවිච්චි කරමින් අපේ රටේ අර්බුදකාරී තත්ත්වය මතු කර ගෙන එතැනින් එහා මේ ආණ්ඩුව පෙරළන තැනටත් යන්නයි. ඇයි? ඒ අය දන්නවා, ජනතාවගෙන් ප්‍රජාතන්ත්‍රවාදීව සැහෙන කාලයක වරමක් ලැබිලා තිබෙනවා කියා. ලංකා සම සමාජ පක්ෂය වෙනුවෙන් මේ අය වැය සම්බන්ධව අද මා මේ කථා කරන්නේ ඒ තත්ත්වය හොඳින් හිතේ තියා ගෙනයි. අපි මේ අය වැය ශක්තිමත් කරන්න ඕනෑ, දියුණු කරන්න ඕනෑ, ජනතාව අප එක්ක තියා ගන්න ඕනෑ මෙවැනි අභියෝගයකට මුහුණ දෙන්න කියා මතක් කරමින් තමයි මගේ මේ කථාව ඉදිරියට ගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මුලින්ම පිළිගන්නවා, මිශ්‍ර ආර්ථික ක්‍රමයක් තුළින් තමයි අපේ රට දියුණු කරන්න පුළුවන් වන්නේ කියන එක. සමාජවාදී ගමන ගිය රටවල්ද එය තේරුම් ගෙන දැන් ඒ පැත්තට නැඹුරු වෙලා තිබෙනවා. එවැනි ගමනක් යන කොට එක පැත්තකින් වෙළඳ පොළ කටයුතු කරද්දී අනෙක් පැත්තෙන් රජයේ පාලනයත් සම්බන්ධ කර ගෙන තමයි ඉදිරියට ගමන් කරන්න තිබෙන්නේ. නමුත් මේක කරන කොට රජයේ යන්ත්‍රණයත් හරියාකාරව ක්‍රියා කළ යුතුයි. යහ පාලනයක් රටක් තුළ ඇති කළොත් තමයි නියම සංවර්ධනයක් ඇති කරන්න පුළුවන් වන්නේ.

අපි දන්නවා, දැන් COPE වාර්තා පිට වෙලා තිබෙන බව. ඒ වාර්තා අනුව රජයේ ආයතන තුළ මොන වාගේ පාඩු සිද්ධ වෙලා තිබෙනවාද කියලාත් හෙළිදරව් වෙලා තිබෙනවා. ඉතින් අපට දැන් අවශ්‍ය වෙනවා අපේ සංවර්ධන ගමන හරියාකාරව ඉදිරියට ගෙන යන්න නම් මේවා ගැනත් සොයා බලලා නිසි පියවර ගන්න. අප ඒ යහ පාලනය දේශපාලන අංශයේත් පරිපාලන අංශයේත් ඉහළ සිට පහළට හැම මට්ටමින්ම ඇති කරන්න ඕනෑ කියා මම මතක් කරනවා. මේ එක්කම අප ව්‍යවස්ථානුකූල වෙනස්කම් ඇති කරන්න ඕනෑ. මැතිවරණ ක්‍රමයේ වෙනස්කම් ඇති කරන්න ඕනෑ. මම ප්‍රාර්ථනා කරනවා, වැඩි කාලයක් යන්නට පෙර ඒ අවශ්‍ය දේ සිද්ධ වේවා යි කියලා. අපි ජනතාවට බලය දුන්නු තරමට තමයි මේ වැරදි සිද්ධ වීම් අඩු කරමින් යහ පාලන ගමන ශක්තිමත් කරන්න පුළුවන් වන්නේ කියා මා මතක් කරනවා.

ඒ එක්කම සමුපකාර ක්‍රමය දියුණු කරන්න පුළුවන් වුණොත් රටේ ආර්ථිකය දියුණු කිරීමට විශාල ගැම්මක් ලැබෙනවා කියලා මා මතක් කරනවා. ඒ ආකාරයට අපි අපේ ගමන ඉදිරියට ගෙන යමු. තුන්වනුව බැලුවාම, අපි රටක් හැටියට, ජාතියක් හැටියට, ජනතාවක් හැටියට එක් වීමෙනුයි සංවර්ධන ගමන ඉදිරියට ගෙන

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

යන්න පුළුවන් වන්නේ. මේ අය වැයෙන් අපි සන්තෝෂ වනවා, ත්‍රිභාෂා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට මුදල් වෙන් කරලා ඒ දිරිගැන්වීම දීලා තිබීම ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, මේ පසු ගිය කාලයේදී රටේ ආර්ථික සංවර්ධන වේගය සියයට අටක්ව තිබෙන කොට උතුරේ සංවර්ධන වේගය සියයට 23ක් වෙලා තිබෙන බව. මම සන්තෝෂ වනවා, උතුරේ ඒ සංවර්ධනය තවත් ඉදිරියට ගෙන යෑමට මේ අය වැයෙනුත් මුදල් වෙන් කිරීම ගැන. නමුත් මේවා ගැන සතුටු වනවාත් එක්කම අපේ ලොකු විශ්වාසයක් තියෙනවා ත්‍රේරීම් කාරක සභාව පත් කර ගෙන දෙමළ ජනතාව දිනා ගැනීමට අවශ්‍ය වන බලය බෙදා හැරීමේ කටයුත්ත ඉදිරියට ගෙන යාමට පුළුවන් ඉක්මනට පියවර ගනීවි කියලා. එසේ කිරීමෙනුයි නැවත වරක් දේශීය පමණක් නොවෙයි, විදේශීය බෙදුම්වාදී බලවේගවලට ඒ ජනතාව යට වෙන්න ඉඩ නොදී අපේ රට ඒකීය ලංකාවක් හැටියට එක්සත් ජනතාවක් හැටියට එකට ක්‍රියා කරගෙන අපේ මේ සංවර්ධන ගමන ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැයක් දිහා බලන කොට ප්‍රශ්න තුනක් අහන්න ඕනෑ. එකක් තමයි ඒ අය වැය අපේ රටේ ආර්ථිකයේ ස්ථාවර භාවය ශක්තිමත් කිරීමට උදව් වෙනවාද, නැද්ද කියන එක. දෙවනුව, ඒ අය වැය අපේ සංවර්ධන ගමනට ඔබින ආකාරයට සකස් කරලා තිබෙනවාද කියන එක. අපි දන්න ආකාරයට අරමුණු කර ගෙන තිබෙන්නේ 2015 වන කොට ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4000 ඉක්මවා යන්නයි. ඉතින් ඒකට සෑහෙන පියවර මේ අය වැය තුළ ඉදිරිපත් කරලා තිබෙනවාද කියලාත් අපි බලන්න ඕනෑ. ඒ එක්කම අපි බලන්න ඕනෑ, සංවර්ධන ගමන ඉදිරියට යන කොට කාටද බර දමන්නේ කියන එක. යමක් තිබෙන, පොහොසත්, ධනපති පන්තියටද, සාමාන්‍ය දුප්පත් ජනතාවටද ඒ බර දමා තිබෙන්නේ කියන එක අපි බලන්න ඕනෑ. අපි සමාජවාදී පක්ෂයක් හැටියට දරන මතය නම් මේ ගමන යන්න ඕනෑ, අසරණ දුප්පත් ජනතාවට බර නොදා ඒ අයට පුළුවන් සහන ලබා දීලාය කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්න පදනම් කර ගෙන අය වැය දිහා බලන කොට පළමු වන ප්‍රශ්නය වන "ස්ථාවර ආර්ථිකයක්" කියන කාරණය ගැන අපට සතුටු වෙන්න පුළුවන්. අපේ තිබෙන විදේශ විනිමය සංචිතය රැක ගෙන, දැන් පවතින සියයට 8ක සංවර්ධන වේගය ඉක්මවා යෑමට කටයුතු කරන්න අපට හැකියාව තිබෙනවා. ඒ වාගේම අය වැය පරතරය දළ දේශීය ආදායමෙන් සියයට 05කට පමණ සීමා කරලා තියා ගෙන, අපේ උද්ධමන වේගය වැඩි නොවෙන විධියට සියයට 06ක, සියයට 08ක පරතරය තුළ තියා ගන්නත් සමත් වන අය වැයක් විධියට අපට මේ අය වැය පිළිගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපිට ප්‍රශ්නයක්ව තිබෙන්නේ ණය බර. සාමාන්‍යයෙන් දළ දේශීය ආදායමෙන් සියයට 80ක් පමණ ණය බර තිබෙනවා. යූඑන්පී ආණ්ඩුව කාලයේදී සියයට 120ක්ව තිබුණු එක ක්‍රමානුකූලව අඩු කර ගෙන ඇවිල්ලා තිබෙනවා. ඒක හොඳයි. ඒ තත්ත්වය රැක ගන්න පුළුවන් වේවිය කියන අරමුණෙන් තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

අපේ විදේශ විනිමය ඒකට අදාළ ණය කොටසින් සියයට 45යි. ලෝකයේ අනිකුත් රටවල් ණය බර වැඩි වීමෙන් ආර්ථික අමාරුකම්වලට ගොදුරු වෙලා තිබෙන ආකාරය බැලුවාම අපේ මේ සංඛ්‍යාව සියයට 65 දක්වා අඩු කරන්න පුළුවන් නම් වැදගත් වේවිය කියා මා හිතනවා. මා ප්‍රාර්ථනා කරනවා ඉදිරි කාලයේදී ඒ ආකාරයට අපේ ආර්ථිකය හැඩගස්වන්න, පාලනය කරන්න පුළුවන් වෙන්නය කියා. නියම ප්‍රශ්නය තිබෙන්නේ වෙළෙඳ අවාසිය තුළයි. අපේ ආනයන වෙනුවෙන් වැය කරන මුදල එන්න එන්නම වැඩි වෙනවා. අපනයනවලින් ලැබෙන මුදලට වඩා වැඩි මුදලක් ආනයන වෙනුවෙන් අපි වැය කරනවා. මේ පරතරය වැඩි වීම තමයි ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. අපි මේක වෙනස් කරන්න ඕනෑ. අපේ අපනයන වැඩි කරන්න ඕනෑය කියා මේ අය වැයෙන් පිළිගෙන තිබෙනවා. ඒකට තමයි සෑහෙන බරක් දමා තිබෙන්නේ; විශේෂයෙන්ම බදු සහන වැනි දේවල් දීමට කටයුතු කර තිබෙන්නේ. අපනයන වෙළෙඳාමේ යෙදෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 4,700ක් පමණ අපේ රටේ ඉන්නවා. ඒ අයගෙන් සියයට 80ක්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්. මේ අය වැයෙන් ඒ අයට ලොකු සහන දී තිබෙනවා. ඒක හොඳ දෙයක්. ඒ පැත්තෙන් අපනයන ශක්තිමත් කිරීමටත් උදවු වෙලා තිබෙනවා.

සමසමාජ පක්ෂය හැටියට අපි කනගාටු වෙනවා, රුපියලේ අගය සියයට 3කින් බාල්දු කිරීම ගැන. ඒක නොකර අපනයනයන් වැඩි කරන්න පුළුවන්කමක් තිබෙනවාය කියා අපි හිතනවා. මොකද, මේ ආකාරයට කටයුතු කළාම අනිවාර්යයෙන්ම බඩු මිල වැඩි වෙනවා. එයින් නොයෙකුත් අනිටු විපාක ඇති වෙනවා. ඒවා විස්තර කරන්න කාලයක් නැහැ. ඒ තත්ත්වයන් සලකා බලා රුපියල බාල්දු කිරීම වැනි මාර්ගවලට යොමු වන්නේ නැතිව අපේ අපනයන නිසි ලෙස වැඩි කරන්න අපි කටයුතු කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නියම සංවර්ධනයක් ඇති කිරීමේදී අපට මුහුණ දෙන්න වෙලා තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි ඒ සඳහා අවශ්‍ය මුදල් -මූල්‍ය සහාය- ලබා ගැනීම. ඒ අංශයෙන් බැලුවාම, අය වැය තුළින් ලොකු බරක් දමා තිබෙනවා, විදේශ ආයෝජන - Foreign Direct Investment - හරහා අපේ ආර්ථිකය සංවර්ධනය කිරීමට. නමුත් අපට පෙනී ගොස් තිබෙනවා බදු සහන දීමෙන් පමණක් මෙතෙක් ඒක හරියාකාරව ඉෂ්ට වෙලා නැති බව. ඉදිරියේදීත් ඒක එහෙම ඉෂ්ට වේවිය කියා අපට සැක සහිතයි, ලෝකයේ ආර්ථික තත්ත්වයත් සලකා බලන කොට. නමුත් අපි ඒක කරනවාත් එක්කම ආයෝජකයන්ට සුදුසු පහසු වාතාවරණයක් -investor-friendly එකක්- ගොඩ නඟන්න ඕනෑ. නිලධාරිවාදයෙන් තොරව, විදුලිය මිල අඩු කිරීම වැනි කටයුතු හරහා තමයි ඊට සුදුසු වාතාවරණයක් ගොඩ නැඟිය යුතු වන්නේ. නමුත් සමසමාජ පක්ෂය හැටියට අපි හිතනවා, වැඩි බරක් දැමිය යුත්තේ අපේ රට තුළම ඉතිරි කිරීම වැඩි කරන්නය කියා. චීනය වැනි රටවල් පවා ඒක තමයි කරලා තිබෙන්නේ. අපිත් ඒ ගමන යන්න ඕනෑ. ඉතිරි කිරීම වැඩි කරනවාත් එක්කම අපේ බදු ක්‍රමය නිසි තැනකට ගෙනෙන්න අපි බලන්න ඕනෑ. අපි දන්නවා, බදු ගෙවිය යුතු විශාල පිරිසක් බදු නොගෙවා ඉන්න බව. අතිගරු ජනාධිපතිතුමා, මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතාගේ ප්‍රධානත්වයෙන් විශේෂ කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ වාර්තාව සම්පූර්ණ කර තිබෙනවා. නමුත් තවම එය පිට වෙලා නැහැ. ඒ වාර්තාවේ හොඳ යෝජනාත් තිබෙනවා. මම ඉල්ලීමක් කරනවා, පුළුවන් ඉක්මනින් ඒ යෝජනා ක්‍රියාත්මක කරන්නය කියා.

සමසමාජ පක්ෂය හැටියට අපට ඉල්ලීමක් කරන්න තිබෙනවා. පසු ගිය අය වැයේදීත් අපි ඒ ඉල්ලීම කළා. සෘජු බදු උපරිමය සියයට 24කට බස්සලා තිබෙනවා. කලින් සියයට 35ට තිබුණා. අපේ ඉල්ලීම එය සියයට 45 කරන්න කියලායි. ඒ කියන්නේ බ්‍රිතාන්‍ය වැනි රටවල් -ධනපති ක්‍රමය මුල් බැහැලා තිබෙන රටවල් - ඒ මට්ටමේ තිබෙනවා නම් ඇයි අපි ඊට පල්ලෙහාට යන්න අවශ්‍ය වන්නේ? එහෙම වැඩි නොකළොත් ධනපතීන්ගේ - පොහොසතුන්ගේ- සුඛෝපභෝගී ජීවන රටාව තුළින් නාස්තියක් ඇති වනවා පමණක් නොවෙයි සමාජයේ නොසන්සුන්භාවයන් පවා ඇති කිරීමට ඒක තුඩු දෙනවා. ඒවා නැති කරන්න කටයුතු කළොතින් අපේ සංවර්ධන ගමන ඉදිරියට හරියාකාරව ගෙන යන්නත්, අපේ ශුභසාධනය රැක ගන්නත් අවශ්‍ය විශාල මුදලක් අපට ලබා ගන්න පුළුවන් වෙයි.

මේ එක්කම අපේ රටේ තත්ත්වය දිහා බලපුවාම අපේ තව ලොකු දුර්වලකමක් තිබෙන බව පෙන්වා දෙන්නට ඕනෑ. ඒ තමයි සංවර්ධන බැංකු ක්ෂේත්‍රය හරියාකාරව දියුණු වෙලා නැහැ කියන එක. Venture capital ක්‍රමයක් අප රට තුළ ඇති කරලා නැහැ. මේවා ඇති කිරීම අත්‍යවශ්‍යයි. අර ධනපති පන්තියේ මුදල් එකතු කර ගෙන හරියාකාරව මේ සංවර්ධනය වෙනුවෙන් යොදවන්න. මේක වහාම කළ යුතුයි කියන එක තමයි මගේ මතය.

මේ එක්කම අප සතුටු වෙනවා, මේ රජයේ යටිතල පහසුකම් දියුණු කිරීමේ වැඩ පිළිවෙළ තවත් ශක්තිමත්ව මේ අය වැය හරහා ඉදිරියට ගෙන යෑම පිළිබඳව. ඒක එහෙම ගෙන යන කොට හොර බොරුවලින් තොරව හරියාකාරව ක්‍රියා කරපු තරමට හොඳයි කියලායි මම හිතන්නේ.

දිවි නැඟුම වැඩ පිළිවෙළ ලොකු ඉදිරි පියවරක්. ඒක තුළින් එළවලු වගාව දියුණු වෙලා තිබෙනවා. මිල බැහැලා තිබෙනවා. නමුත් දිවි නැඟුම වැඩ පිළිවෙළ වැඩිය යොදවන්න ඕනෑ ගම්බද සුළු හා මධ්‍යම ව්‍යවසායකයන්ගේ විශේෂයෙන්ම කර්මාන්ත දියුණු කිරීමේ වැඩ පිළිවෙළටයි. එය කරන්න පුළුවන් වන්නේ විදාතා වැඩ පිළිවෙළ එක්ක සම්බන්ධ වීමෙනුයි. මම සන්තෝෂ වෙනවා, විරුද්ධ පක්ෂයත් ඒ පිළිබඳව මතක් කරපු එක ගැන. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට එක බැගින් මේ විදාතා මධ්‍යස්ථාන 263ක් තිබෙනවා. ඒවා රට වටේම තිබෙනවා. එක් මධ්‍යස්ථානයකට උපාධිධාරියෙකු බැගින් ඉන්නවා. ඒ උපාධිධාරියා හරහා ඒ ව්‍යවසායකයන්ට උපදෙස් දෙන්න, තාක්ෂණය ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒක තුළින් දැනටම ව්‍යවසායකයන් 8,000කට වඩා අත දීලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ඇමතිතුමා, දිවා ආහාරය සඳහා පස් වරු 1.00 දක්වා සභාවේ කටයුතු අත් හිටුවනවා. නැවත කැඳවන අවස්ථාවේදී ඔබතුමාගේ ඉතිරි විනාඩි 5ක කාලය ලබා ගන්න පුළුවන්.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

බොහොම ස්තුතියි.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා ] ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி. ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *in the Chair.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. (Prof.) Tissa Vitarana, you have five more minutes to speak.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

Thank you, Mr. Deputy Chairman of Committees. I will have to rush through with my speech during the remaining five minutes and may table the rest of my speech because of the time constraint.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංවර්ධනය ගැන කල්පනා කරන කොට නියම සංවර්ධනයක් ඇති කරන්න පුළුවන් වන්නේ අපේ රටේ දැනුම කේන්ද්‍රය ශක්තිමත් කිරීමෙනුයි. දැනට වැඩි බරක් දමලා තිබෙන්නේ තොරතුරු තාක්ෂණ අංශයටයි. ඒක හොඳයි. නමුත් දැනුම කේන්ද්‍රය දියුණු කරන්නට යනවා නම් අපි බලන්න ඕනෑ අධ්‍යාපනය පදනම් කර ගෙන ඉහළ දැනුම, උසස් තාක්ෂණය දියුණු කරන්නටයි. ඒ හරහා පර්යේෂණ කරමින් ඒ අලුත් දැනුම අපේ ආර්ථිකය දියුණු කිරීමට උපයෝගී කර ගන්න ඕනෑ. කර්මාන්තකරණයක් ඇති කරන්න ඕනෑ. ඒ තුළින් තමයි අපේ අමු ද්‍රව්‍යවලට වැඩි වටිනාකමක් ඇති කරමින් අපේ ආර්ථිකය නංවන්න පුළුවන් වන්නේ. ලංකාවේ අපනයනවලට උසස් තාක්ෂණය සම්බන්ධ කර තිබෙන්නේ සියයට 1.5ක් පමණයි. ඒ ගැන අපි කනගාටු වනවා. සිංගප්පූරුවේ සියයට 50 පැනලා තිබෙනවා. කොරියාව සියයට 70 පැනලා තිබෙනවා. ඒ නිසා තමයි ඒ රටවල් පොහොසත්වෙලා තිබෙන්නේ. අපටත් ඒ ගමන යන්න තිබෙනවා. දැන් වුණත් මේ වෙනුවෙන් වැඩි මුදලක් යොදවන්නය කියලා මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම අංශ දෙකකට. එනම් අධ්‍යාපනය වෙනුවෙන් කරන ආයෝජනය දෙගුණයක් කරන්න ඕනෑ කියන එකයි අපේ මතය. ඒ එක්කම විද්‍යා හා තාක්ෂණය වෙනුවෙන් අපි යොදවන්නේ දළ දේශීය ආදායමේ ප්‍රතිශතයක් හැටියට දශම එකයි පහක් පමණයි. ඒ අනුව අපි ඒ රටවල් අතර පහළම මට්ටමකයි ඉන්නේ. අඩු වශයෙන් ඒ ප්‍රතිශතය දශම හතරකටවත් නංවන්න ඕනෑ. එය කළොත් තමයි නියම දැනුම කේන්ද්‍රයක් ඇති කරමින් නව නිෂ්පාදන ඇති කරමින්, අපේ රටේ ආර්ථිකය දියුණු කරන්න අපට පුළුවන් වන්නේ.

අපි සමාජ සුබසාධන පැත්ත දිහා බැලුවාම ඒ සඳහා කිසිම කැපිල්ලක් කරලා නැහැ. ඒ ගැන අපි සන්තෝෂ වනවා. ඇත්ත වශයෙන් ඒක තවත් ශක්තිමත් කරලා තිබෙනවා. සමෘද්ධි ව්‍යාපාරය ගැන කථා කරන කොට, එක පැත්තකින් සමෘද්ධිය හරහා සංවර්ධනය වෙනුවෙන් තාක්ෂණයත් සම්බන්ධ කර ගෙන දියුණු කරන ආකාරයේ ආදායම් මාර්ග සමෘද්ධිලාභීන් වෙනුවෙන් ඇති කරන්නය කියලා මා ඉල්ලා සිටිනවා. අනෙක් පැත්තෙන් සමෘද්ධිය ලැබිය යුතු අය පැත්තකට දමලා, නොලැබිය යුතු අය ලබා ගන්නවා. ඒ තත්ත්වයත් වෙනස් කළ යුතුයි. විශේෂයෙන් වතුකරයේ දෙමළ ජනතාව දිහා බැලුවාම ඒ අයට සමෘද්ධි දීමනාව ලබා දීලා නැහැ. ඒක ක්‍රියාත්මක කරන්නත් නිසි පියවර ගත යුතුයි.

සෞඛ්‍ය පැත්තෙන් රෝග නිවාරණ පැත්තට වැඩි බරක් දමලා සෞඛ්‍ය වෙනුවෙන් කරන ආයෝජනය දෙගුණයක් කරන්නත් ඕනෑ කියන එකයි අපේ මතය. ලෝකයේ බඩු මිල වැඩි වනවා, ඉන්ධන මිල වැඩි වනවා, ආහාර මිල වැඩි වනවා. අපට මේවා පාලනය කරන්න බැහැ. ඒ අනුව අපට තිබෙන නියම විසඳුම වන්නේ රට ස්වයංපෝෂිත කිරීමයි. ස්වයංපෝෂිත කිරීම ප්‍රතිපත්තියක් හැටියට අය වැයෙන් පිළිගෙන ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් දියත් කරනවා. ඒකට මගේ ප්‍රශංසාව පළ කරනවා. ඒ වාගේම අත්‍යවශ්‍ය භාණ්ඩ මිල දුප්පත් ජනතාවට බලපානවා. එහෙන් මෙහෙන් යම් ප්‍රමාණයකින් බදු ඉවත් කළාට මදි. ඒ නිසා සියලු බදු ඉවත් කරලා දුප්පත් ජනතාවට උපරිම සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

රටක හරියාකාරව සංවර්ධන ගමනක් ගෙන යන්න නම් රාජ්‍ය අංශයත්, ඒ වාගේම කම්කරු පන්තියත්, වැඩ කරන ජනතාවත් සම්පූර්ණයෙන්ම උද්යෝගයෙන් සහාය දීලා කටයුතු කළ යුතුයි. රජයේ සේවකයන්ට රුපියල් 2,500ක පඩි වැඩි කිරීමක් දෙන්න කියලා අපි සමසමාජ පක්ෂය හැටියටත්, සන්ධානයට සම්බන්ධ වෙලා ඉන්න අනෙකුත් සමාජවාදී පක්ෂත් ඉල්ලීමක් කළා. ඒ වාගේම පෞද්ගලික අංශයේ අවම පඩිය හැටියට මාසිකව රුපියල් 12,500ක් ලබා දෙන්න පියවර ගන්න කියලා අපි ඉල්ලීමක් කළා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
අප කනගාටු වෙනවා ඒ දෙවැනි කාරණය තවම ක්‍රියාත්මක කරලා නැති එක ගැන. පළමුවෙනි කාරණය යම් ප්‍රමාණයකින් ඉෂ්ට කළාට, සියයට දහයක් හැටියට එය කිරීමෙන් අර 2,500 ගණන ලැබෙන්නේ වැඩි පඩි ලැබෙන අයටයි. අඩු පඩි ලැබෙන දුප්පත් වැඩි දෙනාට නොවෙයි. ඒකත් නිවැරැදි කරන්න කියන ඉල්ලීම අප කරනවා.

Sir, just give me a little more time to make my last point.
අප සන්තෝෂ වෙනවා පොදු ප්‍රවාහන සේවය දියුණු කිරීමට කටයුතු කිරීම පිළිබඳව. විශේෂයෙන්ම දුම්රිය අංශය ශක්තිමත් කිරීමට මේ අය වැයෙන් පියවර අරගෙන තිබෙනවා. ඒ වාගේම යම් මුදලක් ලංගමට දීලා තිබුණාට, එන්ජින් සහ වෙනත් අමතර කොටස් ලබා ගැනීමට මුදල් වෙන් කරලා දුන්නොත් ලංගම සේවයට වැඩි ප්‍රයෝජනයක් ලබා දෙන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. ඒ වාගේම පෞද්ගලික බස්වලත්, ලොරි රථවලත් අමතර කොටස්, ටයර් එහෙම ලබා ගැනීමේදී සහනයක් ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දුප්පත් මනුස්සයාගේ වාහනය තමයි ත්‍රි රෝද රථය. ඒ අංශයටත් මේක දියත් කරන්න කියන ඉල්ලීම අප කරනවා. මේ අය වැය ජාතික ව්‍යවමනාවන් පදනම් කර ගෙන රට ඉදිරියට ගෙන යන, මේ ආර්ථිකයත් සුබසාධනයත් රැකගෙන නියම සංවර්ධනයක් ඉදිරියට ගෙන යන අය වැයක්. නමුත් අප දැන් යෝජනා කරපු ආකාරයට ඒක තවත් ශක්තිමත් කළොත් මා හිතන හැටියට අපට අපේ රට නියම සංවර්ධනයක් කරා ගමන් කරවීමට පුළුවන් වෙයි. සමසමාජ පක්ෂය හැටියට ඒ වෙනුවෙන් අපේ සම්පූර්ණ සහාය දෙනවා කියලා මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 1.09]

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැය දෙවන වර කියවීමේ විවාදයේදී විපක්ෂය වෙනුවෙන් අදහස් ස්වල්පයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. ඒ පිළිබඳව මගේ අදහස් දැක්වීමට ප්‍රථම, මම මෙන්න මේ කාරණය කෙරෙහි මේ ගරු සභාවේත්, සභාව මාර්ගයෙන් රටේත් අවධානය යොමු කරවන්න කැමැතියි. සිකුරාදා දිනයේ මාතර දිස්ත්‍රික්කය මුල් කර ගනිමින් අයහපත් කාලගුණ තත්ත්වයක් මතු වුණා. මේ මොහොත වෙන කොටත් ඒ උපද්‍රවයෙන් ගැලවෙන්න මාතර දිස්ත්‍රික්යේ ජනතාවට, දකුණු පළාතේ ජනතාවට නොහැකි වෙලා තිබෙනවා. මේ කථා කරන මොහොත වන විටත් විදුලි බලය නොලැබුණු ප්‍රදේශ තිබෙනවා. කඩා වැටුණු ගස් ඉවත් කරපු නැති ප්‍රදේශ තිබෙනවා. පාසල් පද්ධතියට, මාර්ග පද්ධතියට විශාල හානි සිදු වෙලා තිබෙනවා. වෙරළ තීරයේ ජනතාව පමණක් නොවෙයි, රට අභ්‍යන්තරයේ ඇති පස්ගොඩ, හක්මණ, තිහගොඩ, මාලිම්බඩ වාගේ මාතර දිස්තික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉන්න ජනතාවත් බරපතළ හානිදායක තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා. විශේෂයෙන්ම පස්ගොඩ සහ හක්මණ කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ගස් කඩා වැටීමෙන් මිය ගිය සැලකිය යුතු පිරිසක් ඉන්නවා. මාතර දිස්ත්‍රික්කයේ 5,000කට වැඩි පිරිසක් සෘජු සහ වක්‍ර බලපෑමකට මේ හරහා ලක් වෙලා තිබෙනවා. මේ ජනතාවට සහන ලබා දීමේ කටයුත්ත කඩිනම් කිරීම කෙරෙහි මේ අවස්ථාවේදී මම රජයේ අවධානය යොමු කරවන්න කැමැතියි.

දේශපාලන අධිකාරිය විසින් යම් යම් ආකාරයෙන් දැනුවත් කිරීම් කරලා ඒ පිළිබඳව රැස්වීම් කොපමණ තිබ්බත් පහළට ක්‍රියාත්මක වීමේදී දකින්න තිබෙන දෝෂ නිවැරැදි කරන්න පසු විපරම් ක්‍රියාවලියක් සහ අධීක්ෂණ ක්‍රියාවලියකට කඩිනමින් යොමු වීමේ අවශ්‍යතාව මේ අවස්ථාවේ මම මතු කරන්න කැමැතියි. මක් නිසාද යත්, අපොස සාමාන්‍ය පෙළ විභාගයට තව සති කීපයක් පමණයි තිබෙන්නේ. මේ දවස්වල පාසල්වල වාර විභාග පැවැත්වෙනවා. ගෙදරක පුටුවක් කැඩුණොත් ඒ පුටුව කඩෙන් ගේන්න පුළුවන්. ඒත් ගේ කඩා වැඩීම නිසා දරුවෝ ලියපු අභ්‍යාස පොත් ටික විනාශ වුණා නම් ඒ දරුවන්ට ඒ අභ්‍යාස පොත් නැවත ගන්න බැහැ. ඒ අභ්‍යාස පොතේ ලියපු සටහන් ආපහු ප්‍රයෝජනයට ගන්න බැහැ. ඒ නිසා මේ ඇති වුණු අයහපත් කාලගුණ තත්ත්වය වාර විභාගයට පෙනී හිටින දරුවන්ට අවම වශයෙනුත්, සාමාන්‍ය පෙළ විභාගයට පෙනී ඉන්න දරුවන්ට වැඩි වශයෙනුත් බලපාලා තිබෙනවා. මෙය සිද්ධ වෙනකල් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට එය දැන ගන්නට නොලැබුණු කාරණය බරපතළ විමතිය දනවන දෙයක්. සුනාමිය ආපු අවස්ථාවේත් අප දැක්කා සුනාමිය එනකම් සුනාමිය පිළිබඳව හැඟවුම් අපට හරියට ලබා ගන්න බැරි වුණු බව. මේ ව්‍යසනය සිද්ධ වෙනකම් මේ කුණාටුව පිළිබඳවත්, අධික වර්ෂාව පිළිබඳවත් මේ වග කිව යුතු කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට දැන ගන්න බැරි වුණේ ඇයි කියන කාරණය අප සියලු දෙනා බරපතළව කල්පනා කළ යුතු දෙයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තත්ත්වය නිසා රාජ්‍ය ආයතන විනාශ වෙලා තිබෙනවා. මාතර ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලය ඇතුළු පාසල් සහ වෙනත් රජයේ ආයතන විනාශ වෙලා තිබෙනවා. ඒ නිසා එක පැත්තකින් මිය ගිය අයට සහන දෙන්න, අනිත් පැත්තෙන් එසේ මිය ගිය අයගේ පවුල්වල අයට ජීවත් වෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදන්න, ඒ වාගේම පූර්ණ හා අර්ධ හානිවලට ලක් වූ නිවාස නැවත නිවාස ගොඩනඟා ගන්න සාධාරණ මුදලක් ලබා දෙන්න කටයුතු කළ යුතු වෙනවා. ඒ වාගේම ව්‍යාපාරික ආයතන තිබෙනවා. ව්‍යාපාරික ආයතන කිව්වාම යමක් කමක් තිබෙන ව්‍යාපාරිකයෝ නොවෙයි. කොහොම හරි එදා වේල සරි කර ගන්න කඩයක් දමා ගෙන සිටින ව්‍යාපාරිකයෝ ඉන්නවා. ඒ වාගේ පොඩි කඩයක් තිබිලා, ඒ කඩය වැස්සට අහු වෙලා, අධික හුළඟත් එක්ක කුඩු පට්ටම් වෙලා ගියා නම් ඒ ව්‍යාපාරිකයන්ට සාධාරණ වන්දියක් දෙන්නේ නැහැ, පෞද්ගලික නිවාස අහිමි වූ අයට විතරයි වන්දි දෙන්නේ කියලා දැන් වේගයෙන් ආරංචියක් පැතිරෙමින් යනවා. එහි සත්‍ය අසත්‍යතාව රජය නිවැරදි කළ යුතුයි. ඒක ඇත්තද, නැත්තද, ඒ සම්බන්ධ තත්ත්වය මොකක්ද කියන කාරණය පිළිබඳව අපට පැහැදිලි පිළිතුරක් අවශ්‍ය වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට සහ වාර විභාගයට පෙනී සිටින දරුවන් මුහුණ දීලා තිබෙන කනගාටුදායක තත්ත්වය පිළිබඳව, මේ ගරු සභාවේත්, රටේත්, දේශපාලන අධිකාරියේත්, පරිපාලන තන්ත්‍රයේ සහ සෑම සියලු වගකිව යුතු පාර්ශ්වයන්ගේත් අවධානය යොමු වෙන්න ඕනෑය කියන කාරණය මතක් කරනවා. සුනාමියෙන් පස්සේ පසු විපරම හරියට සිදු නොවීමේ ප්‍රතිවිපාක අපි වින්දා. ඒ නිසා මෙහිදී පසු විපරම් ක්‍රියාවලිය විධිමත්ව සිදු විය යුතුයි කියන කාරණයත් මම මේ අවස්ථාවේ අවධාරණයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැය විවාදයට මේ මොහොතේදී මම කරුණු ස්වල්පයක් එකතු කරන්න බලාපොරොත්තු වන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ හිටපු

කීර්තිමත් ජනාධිපතිවරයකු වූ ජෝන් එෆ්. කෙනඩි මැතිතුමා සඳහන් කරපු කාරණයකින්. එතුමා සඳහන් කළා, "අපි කළ යුත්තේ අතීතයට දොස් පවරමින් සිටීම නොව අනාගතය සඳහා කටයුතු සම්පාදනය කිරීමයි" යනුවෙන්. අනාගතය සඳහා අපට අවංකවම කටයුතු සම්පාදනය කරන්න පුළුවන් වුණාද, බැරි වුණාද කියන කාරණය පිළිබඳ ස්වයං තක්සේරුවකට පැමිණෙන්න මේ අය වැය තුළිනුත් අපි උත්සාහ ගන්නට ඕනෑ. ඇමෙරිකාව එහෙම කියන කොට ඇමරිකාවේ ආර්ථික, සමාජ, දේශපාලන තත්ත්වයට අංශක 180ක් ප්‍රතිවිරුද්ධ මතයක් දරන චීනය සඳහන් කරන්නේ, "අඳුරට සාප කර කර සිටිනවාට වඩා එක පහනක් හරි දැල්වීම වටී" කියන කරුණයයි. එහෙම නම්, ආර්ථික, දේශපාලන, සමාජ තත්ත්වයෙන් සම්පූර්ණයෙන් වෙනස් රටවල් දෙකක් එක කාරණයක් සම්බන්ධයෙන් ආසන්න සමාන මතයක් එම කරුණු දෙක හරහා ප්‍රකාශ කරනවා. දැන් අපි මේ අය වැය ලේඛනයට ඒක කොයි විධියටද ගළපන්නේ. මේ රටේ අනාගත දිශානතිය තීන්දු කරන, උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන වසරේ උත්තරීතරම ලියවිල්ල විධියටයි අපට අය වැය ලේඛනය දකින්නට ලැබෙන්නේ සහ හඳුනා ගන්න ලැබෙන්නේ.

මෙම අය වැය ලේඛනයෙන් අපි ගන්නා තීන්දු, ඒ සඳහා අපි උස්සන අත, ඒ වෙනුවෙන් අපි දක්වන දායකත්වය උඩ තමයි මේ මොහොතේ උපදින දරුවාගේ පමණක් නොවෙයි, මීට විනාඩියකට කලින් ඉපදුණු දරුවාගේ, ඊ ළඟ තත්පරයේ උපදින දරුවාගේ ඉරණම, අනාගතය, වාගේම රටේ අනාගතය, රටේ ඉරණම තීරණය වෙන්නේ. අන්න ඒ අර්ථයෙනුයි මේ අය වැය ලේඛනයේ වැදගත්කම අපට සාකච්ඡා කරන්නට වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලා, ඇමතිතුමන්ලා මේ අය වැය ලේඛනය හැඳින්වූයේ "ස්වර්ග රාජ්‍යයට එළන ලද රතු පලසක්" විධියටයි. ඒ වාගේම විපක්ෂයේ අපේ සමහර මන්ත්‍රීතුමන්ලා, විශේෂයෙන්ම අපේ මහ ලේකම්තුමා පවා හැඳින්වූයේ මෙය, "සීනි තැවරූ තිත්ත කසායක්" විධියට. මේ අය වැය ලේඛනයෙන් යෝජනා ඉදිරිපත් වුණා. පසු ගිය වසර තුළ මේ පාර්ලිමේන්තුවට එක අය වැය ලේඛනයක් සහ mini-Budget එකක් ඉදිරිපත් වුණා. දැන් යෝජනා ඉදිරිපත් වෙනවා, මුදල් වෙන් කරනවා. හැබැයි, මුලින් ඉදිරිපත් කළ mini-Budget එකෙනුත්, ඒ වාගේම 2011 අවුරුද්ද සඳහා ඉදිරිපත් කළ අය වැය ලේඛනයෙනුත් යෝජනා කීයක් ඉදිරිපත් වුණාද, අවුරුද්දක් ගත වෙන කොට ඒ යෝජනාවලින් කීයක් සම්පූර්ණයෙන් ගිලිහිලා ගිහින් තිබෙනවාද, කීයක් ක්‍රියාත්මක කරන්නට සූදානමින් තිබෙනවාද, කීයක් ආරම්භ වෙලා ක්‍රියාත්මක වෙනවාද, කීයක් ආරම්භ කරලා අවසන් කරලා තිබෙනවාද කියලා අපි පසු විපරමක් කළාද? ඒ විධියේ පසු විපරම් වාර්තාවකුත් මේ සභාවට ලැබුණා නම්, පසු ගිය වසරේ ඉදිරිපත් කළ අය වැය ලේඛනය වාගේම, ඊට කලින්, මේ පාර්ලිමේන්තුව ආරම්භ කරලා මාසයකින් දෙකකින් ආපු mini-Budget එක පිළිබඳවත් අපට තක්සේරුවක් කරන්නට පුළුවන්කම තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම වුණා නම් මේ අය වැය ලේඛනය පිළිබඳව වාගේම පසු ගිය වසරේ ඉදිරිපත් කළ අය වැය ලේඛනය පිළිබඳවත් අපට සාධනීය තක්සේරුවක් කරන්න පුළුවන් කියන එකයි මගේ විශ්වාසය.

ඒ විතරක් නොවෙයි. මෙවර ඉදිරිපත් කරපු අය වැය යෝජනා 100ක් සම්බන්ධව ලබන වසරේ 2013 අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට අර මා කලින් සඳහන් කරපු ක්‍රමවේදය අනුව පසු විපරම් සටහනක් ඉදිරිපත් කරන්න පුළුවන්කමක් ලැබුණේ නැත්නම්, මේ රටේ ජනතාව තීන්දු කරයි, මේ අය වැය ලේඛනය ඇත්තටම ස්වර්ග රාජ්‍යයට යන රතු පලසක්වත්, එහෙම නැත්නම් සීනි තැවරූ තිත්ත කසායක්වත් නොවෙයි, ඉතා අලංකාරව අයිසිං කරලා, සරසලා, මිහිරි ගී තනු වාදනය කරන, එහෙත් දරුණු නයි විෂ කවපු කේක් ගෙඩියක් කියලා. එහෙම නොවෙන්නට නම් කළ යුතු වැදගත්ම කාරණය තමයි, 2012 වසර අවසන් වන්න කලින් 2013 අය වැය ලේඛනය ඉදිරිපත් කරද්දී, 2011 අය වැයෙන්, 2012 අය වැයෙන් සහ කලින් ඉදිරිපත් කරපු mini-Budget එකෙන් කරපු යෝජනා කුමන ආකාරයෙන්ද ක්‍රියාත්මක කෙරිලා තිබෙන්නේ,නොකෙරිලා තිබෙන්නේ කියා පසු විපරමක් ඉදිරිපත් කිරීමයි. ආණ්ඩු පක්ෂයේ අත් පොළසන් නාදය මධ්‍යයේ සිදු වූ ඒ සල්ලි වෙන් කිරීම, විශ්‍රාමිකයන්ට සහන, මේ අයට මේ සහන, මේ අයට මේ සහන කියලා පුවත් පත් පිටු පුරා පළ වුණු කාරණා කොයි තරම් දුරකට ඉෂ්ට වුණාද කියන කාරණය කෙරෙහි අවධාරණයෙන්ම අවධානය යොමු කළ යුතු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් උදාහරණයක් කියන්නම්. විශ්‍රාමිකයන්ට සහන කියලා පුවත් පත් පිටු පුරා පළ වුණා. විද්‍යුත් මාධ්‍යවල -රූපවාහිනියේ, ගුවන් විදුලියේ- ප්‍රචාරය වුණා. ඒක කියනකොට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා අත් පොළසන් දුන්නා. 2004ට ප්‍රථම විශ්‍රාම ගිය අයට එක ආකාරයකටත්, 2004 සිට 2006 කාලය තුළ විශ්‍රාම ගිය අයට තවත් ආකාරයකටත් සහන ලබා දෙන ආකාරයක් සඳහන් වුණා. හැබැයි 2006න් පස්සේ විශ්‍රාම ගිය කොටසකුත් ඉන්නවා. 2006න් පස්සේ විශ්‍රාම ගිය විශ්‍රාමිකයා පිළිබඳව වචනයක්වත් මේ අය වැය ලේඛනයෙන් සඳහන් වන්නේ නැහැ. එම නිසා දැන් 2004 හා 2006 අතර විශ්‍රාම ගිය අයට රුපියල් 500ක් ලැබෙද්දී, 2004ට කලින් විශ්‍රාම ගිය අයට රුපියල් 1,000ක් ලැබෙද්දී, 2006න් පස්සේ විශ්‍රාම ගිය විශ්‍රාමිකයාගේ අනාගතය කුමන තත්ත්වයකට පත් වනවාද? ඔවුන්ට මේ ආකාරයෙන් සලකනවා නම්, රජය පිළිබඳව ඔවුන්ට ඇති වන හැඟීම මොකක්ද කියන කාරණයයි මා මේ අවස්ථාවේදී ප්‍රශ්න කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සියලු කරුණු සලකා බලමින් වර්තමාන ආණ්ඩුව තීන්දුවක් ගත යුතුව තිබෙනවා. අදටත් ලියැවෙන, ලෝකයේ පරණම ලිඛිත ඉතිහාසය සඳහන් වන මහා වංශයේ ලියැවෙන විධියට, මේ අමාත්‍ය මණ්ඩලය, එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව, මේ ආණ්ඩුවේ වග කිව යුත්තන් පසු ගිය වර්ෂයේ ඉදිරිපත් කරපු යෝජනාවලින් කීයක් 2012 අවුරුද්ද තුළ අවසන් කළාද කියන කාරණය ලබන අවුරුද්දේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්න කලින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙයි කියලා මා අපේක්ෂා කරනවා. එහි පසු විපරම, රජයේ පසු විපරම් හා ඒ පිළිබඳව සමාලෝචනය විධිමත් ඒකක හරහා සිදු කිරීමට පරිබාහිරව, මේ රටේ ජනතාවට, ඒ වාගේම විපක්ෂයේ දේශපාලන පක්ෂවලට, මාධ්‍ය සංවිධානවලට වග කීමක් තිබෙනවා, මේ පසු විපරම පිළිබඳව අවධානය යොමු කරන්න. 2012 අවුරුද්දේ නොවැම්බර් මාසයේ 2013 අය වැය ලේඛනය මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරන අවස්ථාවේදී, 2012 අය වැය සම්බන්ධයෙන් සහ 2011 අය වැය සම්බන්ධයෙන් පසු විපරමක් රජයෙන් ඉදිරිපත් කරන්නේ නැත්නම්, මා කලින් සඳහන් කළ මේ රටේ සෑම ක්ෂේත්‍රයකම අයට මා ආරාධනා කරනවා, පසු විපරම් වාර්තාවක් මේ රටේ ජනතාවට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයේ ඉලක්කය පැහැදිලියි. ඒ 2016 දී ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමයි. වර්තමාන රජය ඒ සඳහා සියලු වැඩසටහන්, සියලු ව්‍යාපෘති, සියලු ක්‍රමවේදයන් දිශානති කරන බව අපට ඉතා පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. 2016 දී ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කරන්න යන ගමනට තව තිබෙන්නේ අවුරුදු 4යි. 2012 වසරටයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නේ. එහෙම නම් 2012 වසරේ සිට ගත්තොත් අවුරුදු 4ක කාලයක් -2012, 2013, 2014, 2015- තමයි තිබෙන්නේ. එතකොට අවුරුදු 4යි, මාස කිහිපයකින් ඔය කියන ආශ්චර්යය අපට ලබා ගන්න පුළුවන්ද? ඒක තමයි මේ මොහොතේ ලාංකීය සමාජය තුළ ඇති කරන්න අවශ්‍ය වෙලා තිබෙන කතිකාව.

කාරණා පහක් උඩයි, මේ ආශ්චර්යය ඇති කරන්න ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ. පළමුවන කාරණය නාවික කේන්ද්‍රස්ථානයයි. ආසියාවේ ආශ්චර්යය බවට අපට නාවික

[ගරු බුද්ධික පතිරණ මහතා]

කේන්ද්‍රස්ථානය පත් කරන්න පුළුවන්ද? අපට අවුරුදු හතරක කාලයක් තමයි තිබෙන්නේ. අපි දන්නවා, ලංකාවේ හම්බන්තොට වරාය තවමත් ඉදි වෙමින් තිබෙන වරායක් බව. ඒක අදියර ගණනාවක් ඔස්සේ තමයි ක්‍රියාත්මක වන්නේ. එයට සමගාමීව අනිකුත් වරායන් ගොඩ නැඟීම්, සංවර්ධනය කිරීම් තවමත් සිදු වනවා. එතකොට අපට බලාපොරොත්තු වන්න පුළුවන්ද, අවුරුදු හතරකින් අපට mega size වරාය පද්ධතියක් ලංකාව තුළ ස්ථානගත වීමක්? එපමණක් නොවෙයි. ආසියාවේ අපට වඩා ඉදිරියෙන් සිටින සහ අපිත් එක්ක කරටකර තරග කරන අංශ දෙකම වැදගත් වනවා.එක පැත්තකින් අපට වඩා ඉදිරියට ගිහින් තිබෙන රටවල්; අනෙක් පැත්තෙන් අපත් එක්ක තරග කරන රටවල්. ඒවා අභිභවා යමින් නාවික කේන්ද්‍රස්ථානය බවට මේ ශ්‍රී ලංකාව පත් කරන්නට අවුරුදු හතරක කාලයක් තිබෙන්නේ. අවුරුදු හතරකින් ඒ කාර්යය කරන්නට හැකියාව තිබෙනවාද කියන කාරණය පිළිබඳව අපේ හෘද සාක්ෂියෙන් ප්‍රශ්න කළ යුතුව තිබෙනවාය කියන එකයි මගේ විශ්වාසය.

ඊළඟට, ගුවන් කේන්ද්‍රස්ථානය. දැන් මත්තල ගුවන් තොටුපළේ ඉදිකිරීම් කටයුතු සිද්ධ වෙනවා. ඒ හැරෙන්නට අපට තවමත් ජාත්‍යන්තර මට්ටමේ ගුවන් තොටුපළකට තිබෙන්නේ, කටුනායක, බණ්ඩාරනායක ගුවන් තොටුපළ පමණයි. ඒ වාගේම රජය මෙදා අය වැය යෝජනා තුළ තවත් ගුවන් තොටුපළවල් කිහිපයක් පිළිබඳව සඳහන් කළා. ඒ වාගේම අප දන්නවා, පසු ගිය වකවානුවේ විවිධ ස්ථානවල ගුවන් තොටුපළවල් ඉදි කිරීම සඳහා මුල් ගල් තැබීමේ ඉතිහාසයකුත් තිබෙනවාය කියලා. එම නිසා ආසියාවේ අපත් එක්ක තරග කරන රටවල් සහ අපට ඉදිරියෙන් සිටින රටවල් එක්ක සංසන්දනාත්මකව බලන කොට ගුවන් කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙමින් ගුවන් ක්ෂේත්‍රය තුළ ආශ්චර්යවත් ලංකාවක් බවට ස්ථාපනය වන්නට අවුරුදු හතරක පමණ කෙටි කාලයක් තුළ පුළුවන්කමක් තිබෙනවාද? එහෙම නැත්නම් ගුවන් ක්ෂේත්‍රය තුළ අපට සුපර්මැන්ලා බවට පත් වන්නට පුළුවන් කමක් තිබෙනවාද? ඒකයි දෙවන කාරණය.

තුන්වන කාරණය බලශක්ති කේන්ද්‍රස්ථානයක් බවට පත් වීම. ඉදිරි වසර හතර තුළ අපට බල ශක්තිය තුළින් ආසියාවේ ආශ්චර්යය බවට පත් වන්නට පුළුවන්කමක් තිබෙනවාද? නොරොච්චෝලේ බලාගාරය, ඉහළ කොත්මලේ බලාගාරය සහ කෙරවලපිටිය බලාගාරය ඉදිවුණු වර්තමානයේ ඉදිවන, ඉදිවෙමින් පවතින බලාගාර අතර ප්‍රමුඛස්ථානයක් ගන්නවා. නමුත් පසු ගිය කාලය තුළ මේ ඇතැම් බලාගාරවල වැඩ කටයුතු ඇණ හිටීම් අප දැක්කා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම පාඩු ලබන විදුලිබල මණ්ඩලය ගැන බලන්න. මේ සියල්ලත් එක්ක ආසියාවේ බලශක්ති කේන්ද්‍රයේ ආශ්චර්යය බවට පත් වන්නට නැත්නම් බලශක්ති කේන්ද්‍රය තුළ ආසියාවේ සුපර් මැන් කෙනෙක් වෙන්න මේ කියන අවුරුදු හතරක කාලය තුළ මේ ඉදිරිපත් කළ අය වැය ලේඛනය හරහා ශ්‍රී ලංකාවට හැකියාව තිබෙනවා ද කියන කාරණය තමයි ඊළඟට අපට මතුවන කාරණය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම හතරවන කාරණය වන්නේ දැනුමේ කේන්ද්‍රස්ථානයයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකය තුළ ගත්තත්, ආසියාව තුළ ගත්තත්, අප ලෝකයට යන්න කලින් ආසියාව ගැන සැලකුවොත් ආසියාවේ හොඳම විශ්වවිද්‍යාල විසිපහට අපේ විශ්වවිද්‍යාලය අයත් වෙනවාද? නැහැ. හොඳම විශ්වවිද්‍යාල පණහට අපේ විශ්වවිද්‍යාල අයත් වෙනවාද? නැහැ. ලෝකය තුළ තිබෙන හොඳම විශ්වවිද්‍යාල පන්සියයට ඇතුළත් වන්නේත් තවම කොළඹ විශ්වවිද්‍යාලය පමණයි. රට තුළ ජාතික මට්ටමේ විශ්වවිද්‍යාල මෙපමණ ක්‍රියාත්මක වෙද්දී ශ්‍රී ලංකාව ආසියාවේ දැනුමේ කේන්ද්‍රස්ථානය බවට අවුරුදු හතරකින් පත් වන්නට යනවා. නමුත් ලෝකයේ හොඳම විශ්වවිද්‍යාල පන්සියය අතරේත් අපේ කොළඹ විශවවිද්‍යාලය පමණයි ස්ථාන ගත වෙලා තිබෙන්නේ. මේ යථාර්ථය තුළ දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට පත් වීමේ ලංකාවේ ක්‍රමෝපාය අපට අවුරුදු හතරක් තුළ සම්පූර්ණ කර ගන්නට පුළුවන්ද? මා හිතන්නේ ඒ කාරණයේ දීත් අපට සතුටු වන්නට පුළුවන් ප්‍රශස්ත මට්ටමක අප මේ මොහොතේත් නැහැ කියායි.

පෞද්ගලික විශ්වවිද්‍යාල හා පෞද්ගලික වෛද්‍ය විද්‍යාල සම්බන්ධයෙන් තවමත් සමාජය තුළ ඇති වෙලා තිබෙන කතිකාව අප වෙනම සාකච්ඡාවට ගත යුතුයි. එය මේ දෙවන වර කියැවීමේ විවාදය තුළ දී එය සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මා ඉතා පැහැදිලිව කියන්නේ, මේ යන ක්‍රමවේදය තුළ නම් ආසියාවේ ආශ්චර්යයේ දැනුමේ කේන්ද්‍රස්ථානයේ ආශ්චර්යය බවට අවුරුදු හතරකින් පත් වන්නට සිතීම විහිළුවක් නැත්නම් සම්පප්‍රලාපයක් බවට පත් වෙන බවයි. එයයි මට දකින්නට තිබෙන්නේ.

ඊළඟට මේ අය වැය ලේඛනයේ අප සාකච්ඡා කරන පස්වන කාරණය මෙයයි. වාණිජ කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කරන්නට පුළුවන්ද අවුරුදු හතරකින්? ඒ පිළිබඳව අප කල්පනා කරන්නට ඕනෑ. අප පටන් ගනිමු, වැඩි ඈතකින් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ විවෘත කරන්නට යෙදුණා, ලංකාවේ පළමුවන දක්ෂිණ අධිවේගී මාර්ගය නැත්නම් පළමුවන අධිවේගී මාර්ගය. ඒක මාතර දිස්ත්‍රික්කයේ මා පදිංචි ප්‍රදේශය දක්වා කොළඹ සිට දිවෙන මාර්ගයක්. මට මතකයි, මා සාමාන්‍ය පෙළ විභාය ලියලා, උසස් පෙළ විභාගය ලියලා, විශ්වවිද්‍යාල ප්‍රවේශය බලාපොරොත්තුවෙන් ගෙදර ඉන්න වකවානුවේ තමයි, 1995 වර්ෂයේදී හිටපු ජනාධිපතිනිය වන චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය මේ සඳහා මුලින්ම මුල් ගල තිබ්බේ කියලා. 1995 වර්ෂයේදීයි මුල් ගල තිබ්බේ. මේක විවෘත කළේ 2011 වර්ෂයේදීයි. අවුරුදු 16ක් ගත වුණා, කිලෝමීටර් 95.275 හදන්න. මේ අවුරුදු 16ක කාලය තුළ නිල්පාට, කොළපාට රජයන් වාගේම නිල්පාට-රතුපාට මිශ්‍ර රජයන් තුළත් මේ අධිවේගී මාර්ගය දකුණ දක්වා එල්ලී ගෙන ගියා. හැබැයි අවුරුදු 16ක් ගියා කිලෝමීටර් 95.275 හදන්න. කොළඹ කටුනායක අධිවේගී මාර්ගය කිලෝ මීටර් 28යි. ඒ වාගේම කොළඹ මහනුවර අධිවේගී මාර්ගය හදන්න බලාපොරොත්තුවන දුර කිලෝමීටර් 98.9යි.

කොළඹ පිටත වටරවුම් මාර්ගය කිලෝමීටර් 29යි. යාපනය අධිවේගී මාර්ගය දළ වශයෙන් කිලෝමීටර් 250කට වැඩි වෙනවා මිස අඩු වෙන්නේ නැහැ. මේ අධිවේගී මාර්ග අවුරුදු 4ක් ඇතුළත තනා නිම කිරීමේ හැකියාව තිබෙනවාද? ඒකයි අද අපිට තිබෙන ගැටලුව. අපි දන්නවා, දක්ෂිණ අධිවේගී මාර්ගය කිලෝමීටර් 95.275ක් හදන්න, කිලෝමීටර් 95ට අවුරුදු 16ක් ගියා. මම බැහැර කරන්නේ නැහැ මම කියපු ඒ පසු ගිය අවුරුදු 16 තුළ වරින් වර පත් වෙච්ච ඇතැම් ආණ්ඩුවල දේශපාලන නායකයෝ මේ හරහා කොමිස් කුට්ටි කාපු හැටි. ඒ ඉතිහාසය මම බැහැර කරන්නේ නැහැ. එහෙම බැහැර කරන්න තරම් මම දේශපාලන කුහකත්වයකින් කථා කරන්නෙත් නැහැ. හැබැයි මම ඉතා වග කීමක් ඇතුව කියන්නේ කිලෝමීටර් 95ක් හදන්න අපිට අවුරුදු 16ක් ගියා නම් ඇත්තටම ඒකත් එක පැත්තකින් ආශ්චර්යයක්. කොහොම නමුත් මේ අධිවේගී මාර්ගය මාතර දක්වා අවසන් කරලාත් නොවෙයි අපට මේ කටයුත්තට මුල පුරන්න වුණේ. ඉතින් ඒ නිසා මේ ආශ්චර්යයට යන ගමනේ අපිට 2016 ඉලක්කය සපුරා ගැනීම පිළිබඳ බරපතළ ප්‍රශ්නාර්ථයක් මේ සමාජය තුළ මතු වෙලා තිබෙනවාය කියන කාරණය මම ඉතා වග කීමක් ඇතිව මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

අනෙක් පැත්තෙන් දැන් රුපියල අවප්‍රමාණය වීම තුළ අපිට ණය වාරික ගෙවීම සඳහා අතිරේකව යොදන්න තිබෙන මුදල් ප්‍රමාණයත් එක්ක ආපහු සැරයක් ඇති වෙන්න පුළුවන් උද්ධමන තත්ත්වය අපිට බැහැර කරන්න පුළුවන්කමක් නැහැ. පෞද්ගලික අංශයට පඩි වැඩි වීමක් නැති වීම තුළ, අඩුම ගණනේ පෞද්ගලික අංශයෙන් මේ අය වැය කථාව හරහා ඉල්ලීමක්වත් ඉදිරිපත් නොවන සන්දර්භය තුළ, පෞද්ගලික අංශයේ විතරක් නොවෙයි ස්වයං රැකියා සහ ගෘහාශ්‍රිත රැකියාවල නිරත වෙලා ඉන්න අයගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ වාගේම පෞද්ගලික අංශයට වැඩි වැටුප් ලැබෙන්නේ නැහැ. සේවක අර්ථසාධක අරමුදල්වල ඇති ඔවුන්ගේ ඉතුරුම්වල වටිනාකම උද්ධමනය වැඩි වීමත් එක්ක දවසින් දවස බාල්දු වෙනවා; අඩු වෙනවා. ඒ වාගේම ඩොලරය අවප්‍රමාණය වීම නිසා ඉහළ යන උද්ධමනයටත් මේ පෞද්ගලික අංශයේ රැකියාවල නිරත වන අයට අනිවාර්යයෙන් මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

දැන් රජයේ සේවකයා වැටුප් වැඩි වීමකින් තෘප්ත වෙද්දී පෞද්ගලික අංශයේ සේවකයා, එකක් ඔවුන්ට වැඩි වැටුප් නොලැබීම කියන කාරණය, දෙවැනි එක උද්ධමනය නිසා ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදලේ වටිනාකම පහත වැටීම කියන කාරණය, තුන්වැනි කාරණය ඩොලරය අවප්‍රමාණය වීම නිසා බලපාන අනිවාර්යය උද්ධමනයට මුහුණ දීම කියන ආකාර තුනකින් බැට කනවා කියන කාරණය මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ වාගේම රජයේ සේවකයාටත් මේ කාරණා අඩු වැඩි වශයෙන් බලපානවා කියන එකයි මගේ විශ්වාසය.

විශේෂයෙන්ම මේ රජය ඉදිරිපත් කරලා තිබෙන තවත් යෝජනාවක් තමයි, "වතු අක්කර 37,000ක් අක්කර 2 බැගින් තිස් අවුරුදු බදු පදනමකින් බෙදා දීම." අක්කර 2 බැගින් මේ විධියට බෙදෙන කොට මට හිතෙන්නේ අර ඒකකයක් කුඩා වීම, අනාගතයේ ඒ අක්කර 2ක තවත් කුඩා කොටස් බවට පත් වීමේ අවදානමක් තිබෙන බවයි. අවසානයේ මේ අක්කර 2ක වගා කරන තත්ත්වයකට නොවෙයි පරිභෝජනය කරන, තමුන්ගේ ගෙයක් දොරක් හදා ගන්නා තත්ත්වය දක්වා ගමන් කිරීමේ අවදානමක් තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ පුද්ගලිකව එක පුද්ගලයකුට අක්කර දෙකක් දෙනවාට වඩා ජනතාව මුල් කර ගෙන ජනතා සමාගම් ගොඩ නඟන්න පුළුවන්කමක් තිබෙනවා නම්, -ජනතාවගෙන් සකස් කරන ජනතා සමාගමක් ගොඩ නඟලා අක්කර 2කට වඩා වැඩි වපසරියක් ඒ සමාගම්වලට දෙන්න පුළුවන් නම්- ඒ ජනතා සමාගම්වලින් සිදු කරන ක්‍රියාවලිය, ඔවුන් ඒ ලබා දෙන වතු කළමනාකාරයෙන්ද කළමනාකරණය කරන්නේ, කළමනාකාරයෙන්ද වැවිලි කටයුතු සඳහා යොදා ගන්නේ කියන පසු විපරම් ක්‍රියාවලියක් ශක්තිමත්ව යොදවන්න පුළුවන් නම් අක්කර 2 ගණනේ තනි පුද්ගලයන්ට ලබා දෙනවාට වඩා වැඩි කාර්යක්ෂමතාවකින්, වැඩි ඵලදායීතාවකින් මේ වතුවල ප්‍රයෝජනය ගන්න පුළුවන්; මේ අක්කර 37,000 ප්‍රයෝජනය ගන්න පුළුවන් කියන එකයි මම තරයේම විශ්වාස කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වරක් ආචාර්ය සරත් අමුණුගම මැතිතුමා සඳහන් කළා, මේ රටේ රාජ්‍ය මුදල් ගිලින යක්ෂයන් කිහිප දෙනෙක් පිළිබඳව. එතුමා එදා සඳහන් කරපු ආයතන අතරට ලංගම, දුම්රිය, සතොස වැනි ආයතන අයිති වුණා. මම හිතන්නේ අද වන කොට මිහින් ලංකා ගුවන් සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය, තැපැල් දෙපාර්තමේන්තුව, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ආදී ආයතන ඇතුළු තවත් ආයතන ගණනාවක් ඇතුළු වෙලා තිබෙනවා. මේ ආයතන යළි ශක්තිමත්ව නඟා සිටුවීම සඳහා මීට වඩා පැහැදිලි ක්‍රමවේදයක් මේ අය වැය තුළ යෝජනා වුණා නම් ඒක මහ භාණ්ඩාගාරයට වාගේම ඒ භාණ්ඩාගාරයට මුදල් ලබා දෙන්න බදු ගෙවන මේ රටේ ජනතාවටත් රජය දක්වන උපරිම සාධාරණයක් විධියටයි මම දකින්නේ.

හැබැයි, එහෙම සාධාරණයක් මේ බදු ගෙවන්නන්ට ඉටු වෙලා නැහැ කියන එක මා මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, ජනතාව ශක්තිමත් කිරීම, මානව සම්පත සංවර්ධනය කිරීම සම්බන්ධව.

රණසිංහ ප්‍රේමදාස මැතිතුමා වරක් කිව්වා, "දහදිය බිඳුවක ජීවන කඳුළක මතු දා රන් මිණි මුතු උපදී - සිරිකත සරසවි අතින්'ත බැඳගෙන විසුරති ආසිරි කුසුම් පෙති" කියා. ජනතාවගේ ශ්‍රම ශක්තියට වටිනාකමක් දෙන්න, තාරුණ්‍යයේ හැකියාවට තාරුණ්‍යයේ ශ්‍රම සම්පතට අවස්ථා ඉඩ ප්‍රස්තා නිර්මාණය කරන්න මේ අයවැය ලේඛනය තුළින් වෙන් කරපු මුදල් ප්‍රමාණය පිළිබඳව සතුටු වන්න පුළුවන් තත්ත්වයක් නැහැ කියන කාරණය මා මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම වසර දෙකක් අපේ සියයට 8ක ආර්ථික වර්ධන වේගය එක තැන කැරකැවෙනවා නම්, උද්ධමනය සියයට 5ට පහළට ගෙනෙන්න බැරි නම් මේ කියන ආසියාවේ ආශ්චර්ය අපිට අවුරුදු හතරකින් ළඟා කර ගැනීමේ බරපතළ ගැටලුවක් ඇති වනවාය කියන කාරණය මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. රජයට පාලනය කරන්න බැරි ගෝලීය අභියෝග තිබෙනවා. ආර්ථිකමය ගෝලීය අභියෝග හා ආර්ථිකමය නොවන ගෝලීය අභියෝග තිබෙනවා. මේ අභියෝග සමහර විට රටක් විධියට අපට පාලනය කරන්න බැරි කාරණා. මෙයත් ආසියාවේ ආශ්චර්ය කරා යන ගමනේදී අපට බාධාවක් වෙනවාය කියන කාරණය මා මේ අවස්ථාවේදී සඳහන් කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපීය සංගමයේ සමහර ක්‍රියාදාමයන්, තේ වෙළෙඳ පොළ තුළ ඇති වන විචලායන්, මැද පෙරදිග ඇති වෙමින් තිබෙන සහ කාලයක් තිස්සේ ඇති වෙමින් ඉදිරියට යන අර්බුදයන්, පාරිසරික හා කාලගුණික විපර්යාසයන් වාගේම කෘෂි හා කාර්මික අපනයන සඳහා අපට ජාත්‍යන්තර තත්ත්වයෙන් තියෙන අභියෝගයන් -මේ සියල්ල- අපට කළමනාකරණය කිරීමට ඇතැම් විට අපහසු නැත්නම් අපට අවම මැදිහත්වීමක් සිදු කළ හැකි ගෝලීය අභියෝග වනවා. මේ ගෝලීය අභියෝග හමුවේ මා මුලින් සඳහන් කරපු පංච බල කේන්ද්‍රයක් තුළ ආශ්චර්යයක් කරා අපට යා ගන්නට බැරි වුණොත් අවසානයේ අපට -මේ රටේ ජනතාවට- ඉතිරි වන්නේ වෙනත් පංච බල කේන්ද්‍රයන් මත අමුතු ආශ්චර්යයක් දකින්න ලැබීමයි. වෙනත් විධියකට කිව්වොත් දූර්වල යහපාලනය, වංචාව සහ දූෂණය ඉහවහ යාම, අපචාර සහ අපරාධ රැල්ල, විදේශ ප්‍රතිපත්තියේ ඌනතා, අසමත් ආර්ථික වර්ධනය කියන පංච බලකේන්ද්‍ර වටා ගොනු වෙලයි අපට මේ කතිකාව නැත්නම් මේ සන්දර්භය නැත්නම් ආසියාවේ ආශ්චර්ය දකින්න පුළුවන් වන්නේ කියන කාරණය මා කියනවා.

මගේ කථාව අවසන් කරන්නට යන වෙලාවේ දී මා මේ කාරණයත් සඳහන් කරන්න අවශ්‍යයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මෙදා අය වැයෙන් භෞතික සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සාධනීය මුදල් වෙන් කිරීම පිළිබඳව කථා කළා. ඒ වාගේම අධ්‍යාපනය, සෞඛ්‍ය, ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශ ඇතුළු මෙන්න මේ කියන අමාත්‍යාංශ වෙනුවෙන් වෙන් කරපු මූල්‍යමය ගණන් හිලව්‍ සඳහන් වනවා. හැබැයි, මේ සඳහන් වන මූල්‍යමය ගණන් හිලව්‍ අවසාන විග්‍රහයේදී ක්‍රියාවේ යෙදෙනවාද නැද්ද කියන කාරණය පිළිබඳවයි අපි විමසන්න ඕනෑ. හැබැයි, මෙවර අයවැයෙන් මුදල් වෙන් කළ යුතු වැදගත්ම අංශයක් තමයි, ආධ්‍යාත්මික ශික්ෂණය සහිත පුද්ගලයෙක් බිහි කිරීම සඳහා මුදල් වෙන් කිරීම. ඒ මක් නිසාද යත්, එවැනි මුදල් යෙදවීමක් සිදු නොවන තැන අපේ සමස්ත සමාජය තුළම ආධ්‍යාත්මික ශික්ෂණයෙන් තොර මිනිසුන් බිහි වීමේ ප්‍රවණතාව එන්න එන්න වැඩි වනවා මිසක් අඩු වන්නේ නැහැ. ඒ ප්‍රවණතාවය තුළ තමයි, අවුරුදු 10ක දැරිවියක් පාසල් භූමිය තුළදී -පාසල තුළදී- අපහරණයට ලක් වන්නේ, කෙලෙසෙන්නේ. මෙවැනි සමාජගත පුද්ගලයන්ගේ හරස්කඩක් අපේ පාර්ලිමේන්තුව තුළත් අපට දකින්න ලැබුණොත් අප ඒ ගැන පුදුම වන්න ඕනෑ නැහැ. 2010 mini-Budget එක ගත්තත්, 2011

[ගරු බුද්ධික පතිරණ මහතා]

අයවැය ගත්තත්, 2012 අය වැය ගත්තත් ඒ සඳහා මුදල් යෙදවීමක් දකින්න නැහැ. මෙදා අය වැය කතාතවේ පිටු අංක 4හි "ගුණ ගරුක සමාජයක්" නැමැති මාතෘකාව යටතේ හමුදා සෙබළුන් සහ පොලීසිය සම්බන්ධයෙන් සඳහන් වෙලා තිබුණත් මම සඳහන් කළ ආධ්‍යාත්මික ශික්ෂණය පිළිබඳව මුදල් යෙදවීමක් සිදු වෙලා නැහැ. මේ රටේ උත්තරීතරම ආයතනය පාර්ලිමේන්තුව. ඒ වාගේම ජනාධිපතිවරයා මේ රටේ උත්තරීතරම පුද්ගලයා. උත්තරීතර පාර්ලිමේන්තුවේ මුදල් ඇමතිවරයා ලෙස ජනාධිපතිතුමා ඇවිල්ලා තමුන්ගේ අය වැය කථාව ඉදිරිපත් කළා. උත්තරීතරම පුද්ගලයාත් උත්තරීතරම ආයතනයත් කියන දෙක එකට සුසංයෝගයක් වුණු දවස තමයි එදා අය වැය ඉදිරිපත් කරපු දවස.

මේ කාරණය මා ඉතා පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. එවැනි තැනක පහර දීම්, තර්ජනය කිරීම් සිදු වනවා නම් මේ රටේ ජනතාවට ඇති වන අදහස මොකක්ද? උත්තරීතරම පාර්ලිමේන්තුවේ ජනතා නියෝජිතයින්ට ආරක්ෂාවක් නැත්නම් සාමාන්‍ය ජනතාවගේ ආරක්ෂාව පිළිබඳව ඇති වන්නේ බරපතළ ප්‍රශ්නයක්. රජයට අවශ්‍ය විපක්ෂය නිහඬ කරන්න නම්; රජයට අවශ්‍ය විපක්ෂය සමූල ඝාතනය කරන්න නම් ඒකට කළ යුත්තේ හරිම පහසු දෙයක්. ඒකට කළ යුත්තේ අල්ලා ගෙන තඩි බෑම, අල්ලා ගෙන පහර දීම නොවෙයි.

පසු ගිය අය වැය ලේඛනවල, මහින්ද චින්තනය තුළ, මහින්ද චින්තනය ඉදිරි දැක්ම තුළ ඉදිරිපත් කරලා තිබෙන යෝජනා ටික ගන්න. ඒ යෝජනා සියල්ලම සියයට 100ක් ඉෂ්ට කළාද කියලා බලන්න. 2005 මහින්ද චින්තනයේදී ඉදිරිපත් කළ යෝජනා සියල්ල ඉෂ්ට කළා නම්, 2016 වන විට මහින්ද චින්තන ඉදිරි දැක්මේ සියලු යෝජනා ඉෂ්ට කරන්න පුළුවන් වෙනවා නම්, අය වැය යෝජනා සියයට 100ක් ප්‍රායෝගිකව ඉෂ්ට කරන්න පුළුවන් වෙනවා නම් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අල්ලා ගෙන තඩි බාන්න අවශ්‍යතාවක් නැහැ; පහර දෙන්න, තර්ජනය කරන්න අවශ්‍යතාවක් නැහැ. මේ ආණ්ඩුව තමන්ගේ පොරොන්දු සියල්ල ඉෂ්ට කළ දවසට නියත වශයෙන්ම විපක්ෂය පැත්තකට කරන්න හැකියාව ලැබෙයි. නමුත් ඒ දේ සිදු කරන්නේ නැතිව පහර දීමෙන්, තර්ජනය කිරීමෙන් තමුන්ගේ වැරදි වහ ගන්න උත්සාහ කරනවා නම් ඒ තුළින් මේ රටේ සමස්ත ජනතාවට දෙන්නේත් වැරදි අදහසක්. ඒ, ඔවුන් අනාරක්ෂිතයි කියන හැඟීම. ඒ නිසා මී ළඟ අය වැයෙන්, 2013 අය වැයෙන්වත් ආධ්‍යාත්මික ශික්ෂණය වෙනුවෙන් සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කරලා ඒ වෙනුවෙන් ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් ගන්න බැරි නම් ආපසු සැරයක් මේ රටේ කෝටි 2ක් වුණු ජනතාව අතර මෙවැනි විපරීත පුද්ගලයන් බිහිවීම අරුමයක් නොවෙයි. ඒ පුද්ගලයන්ගේ හරස්කඩක් මේ පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීමත් අරුමයක් බවට පත් වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මී ළඟ අය වැයෙන්වත් ඒ කාරණයට මුදල් වෙන් කරලා, මට පෙනෙන විධියට 2016 දී ඉෂ්ට කරන්න බැරි ආසියාවේ ආශ්චර්ය උදා කර ගන්නට යළිත් කාල රාමු සකස් කර ගැනීමේ අවශ්‍යතාව -මේ රට තුළ එක්සත් ජනතා නිදහස් සන්ධානය නැති වුණත්- රටේ සමස්ත දේශපාලන ක්‍රියාදාමයට තිබෙනවා කියන කාරණය සඳහන් කරනවා. මනුෂ්‍යයෙක් වසලයෙක් හෝ බ්‍රාහ්මණයෙක් වෙන්නේ ඔහු කරන ක්‍රියාවෙන් මිසක්, ඔහු ඉදිරිපත් කරන සුන්දර අදහස්වලින් නොවෙයි. මේ අය වැය ලේඛනය තුළින් කරුණු කාරණා ගණනාවක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ අය වැය ලේඛනයේ ඉදිරිපත් කරන කරුණු කාරණා කොපමණ දුරට ප්‍රායෝගික භාවිතයේ යෙදවූවාද කියන එක උඩයි අනාගතය විසින් අපි පිළිබඳව, මේ උත්තරීතර සභාව පිළිබඳව තක්සේරු කරන්නේ. ඒ තක්සේරුව සාධනීය තක්සේරුවක් වේවා කියමින් ප්‍රාර්ථනය කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[1.40 p.m.]

**ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Deputy Chairman of Committees, may I, at the outset, congratulate and thank His Excellency Mahinda Rajapaksa, Dr. P.B. Jayasundara, Secretary to the Treasury and the other officials, who have given us a very progressive and praiseworthy Budget, which is based on very sound macroeconomic foundations.

Sir, Sri Lanka has had its own ups and downs in the eyes of scholars of politics and development. When you look at our economic and monetary policies from time to time as an illustration of policies, Sri Lanka is an illustrative case of development theory and practice. There was at one time a strong emphasis on import substitution industrialization and social welfare in the '60s and '70s. Thereafter, we gained critical attention for our shift to economic liberalization in 1977 as well as the rise of the neoliberalism and authoritarianism and armed insurgencies in the 1980s.

The last decade, Mr. Deputy Chairman of Committees, has seen a new focus on Sri Lanka as a test case for internationalized conflict resolution and liberal peace-building in a protracted intrastate conflict. We saw the peace process breaking down and thereafter replaced by intense and successful military campaign, which naturally was seen by many as a possibility of defeating terrorism and creating peace by military means. Having achieved this remarkable victory, our President has now produced several Budgets based on very strong foundations of security, development, peace and prosperity. When you look at these links among security, development, peace and prosperity, we cannot forget the transnational impact of localized wars that made the resolution of intrastate conflicts a matter of global security. Following this, international development co-operation has undergone a general shift from being conflict-blind to being conflict-sensitive, thus using development assistance as a tool for transforming conflicts and building liberal peace.

Mr. Deputy Chairman of Committees, politics of market reforms for neoliberal development and the politics of State reforms for liberal democracy, minority rights and power-sharing bring about different implications in different situations. Everybody agrees that the one-size-fits-all policy cannot be imposed on any country.

Yesterday, when I attended the opening ceremony of the Southern Highway, the presence of Mr. Yasushi Akashi, the Special Envoy of the Japanese Government for Peace at one time, brought back some nostalgic memories to me because I was one of those members of

the Government team negotiating with the LTTE. One important feature of this negotiating team of the previous United National Party administration is that all the members who were in the negotiating team are now with His Excellency President Mahinda Rajapaksa. Mr. Yasushi Akashi would definitely be looking at this entire transmogrified situation where Japan, as one of the members of the co-chairs concept including the United States, the European Union and Norway was instrumental in organizing donor conferences as a parallel feature of the negotiations for peace with the LTTE. Having attended every one of those donor conferences, I feel that this whole approach has now been turned on its head and particularly, having attended the opening ceremony of the Southern Highway, Japan being our largest donor would certainly acknowledge and appreciate the efforts taken by His Excellency the President in taking forward the country. This whole process of development ran parallel to a very difficult and atrocious war which had consumed large amounts of our budgeted funds. What was significant was that none of these developments were set aside because there was a war, which was absorbing large amounts of budgeted funds.

Now, we feel it is important for us to focus on a speedy path of development, keeping in mind the necessary macroeconomic fundamentals. On this point, may I divert and digress for a moment, Sir, to refer to a few paragraphs of the Budget Speech, firstly, Paragraph No. 34 and I would like to speak in Tamil because it has some implication for the people, whom I represent.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மேதகு ஜனாதிபதி அவர்கள் வரவு செலவுத் திட்டத்தைச் சமர்ப்பித்து ஆற்றிய உரையிலே, நாடு நெல் உற்பத்தியில் தன்னிறைவு கண்டிருப்பதனால், எமது நாட்டை அரிசி ஏற்றுமதி செய்யும் ஒரு நாடாக மாற்றும் நடவடிக்கைகளுக்கான அத்திவாரங்கள் சிலவற்றைக் குறிப்பிட்டார். அதற்கு உறுதுணையாக விதைநெல் உற்பத்திக்கும் ஆராய்ச்சிக்கும் என 200 மில்லியன் ரூபாயையும் கமநல அபிவிருத்தித் திட்டங்களை மேம்படுத்துவதற்காக 100 மில்லியன் ரூபாயையும் ஒதுக்கியிருப்பது குறித்து சந்தோஷமடைவதுடன், இன்னுமொரு விடயத்தையும் நான் குறிப்பிட்டாக வேண்டும்.

இவ் வரவு செலவுத் திட்டத்தின் 34வது பந்தியிலே நகரப்புறப் பிரதேசங்களில் முக்கியமாக வெள்ள அபாயங்களைக் கட்டுப்படுத்துவதற்கெனச் சில ஒதுக்கீடுகளைச் செய்வதாக மேதகு ஜனாதிபதி அவர்கள் குறிப்பிட்டிருக்கிறார். வெள்ள அபாயத்தைத் தடுப்பதற்கான செயற்றிட்டத்தின்கீழ் கொழும்பு, கம்பஹா ஆகிய மாவட்டங்களைக் குறிப்பிட்டிருக்கின்றபோதும் நாட்டின் இதர பகுதிகளைக் குறிப்பிடத் தவறியுள்ளார். தற்போது கிழக்கு மாகாணத்தில் அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை ஆகிய மாவட்டங்களில் ஏற்பட்டுள்ள வெள்ள அனர்த்தத்தினால் ஆயிரக்கணக்கான ஏக்கர் நெற்காணிகள் பாதிக்கப்பட்டுள்ளன. அப்பிரதேசங்களிலுள்ள பாடசாலைகள் ஒழுங்காக இயங்காத நிலையில் உள்ளன. கிழக்கு மாகாணத்திலுள்ள தாழ்நிலப் பிரதேசங்களில் வருடாவருடம் தவறாது வெள்ள அனர்த்தம் ஏற்படுகின்ற காரணத்தினால் அப்பிரதேசங்களின் நெல் உற்பத்தி பெரிதும் பாதிக்கப்படுகின்றது. இதனால் கிழக்கு மாகாணத்திலே, குறிப்பாக அம்பாறை மாவட்டத்திலுள்ள தாழ்நிலப் பிரதேசங்களிலே, வெள்ள அபாயத் தடுப்புக்கென விசேடமான நிதி ஒதுக்கீடு செய்ய வேண்டியது அவசியம் என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். உலக வங்கியின் செயற்றிட்டமொன்றின்மூலம் அடுத்த 3 வருட காலத்தினுள் நகர்ப்புற அபிவிருத்திக்கென இருபதாயிரம் மில்லியன் ரூபாயை ஒதுக்கியிருப்பதாகவும் குறிப்பிடப்பட்டிருக்கிறது. இந்த இருபதாயிரம் மில்லியன் ரூபாயில் ஒரு பகுதியை, அம்பாறை மாவட்டத்தின் தாழ்நிலப் பிரதேசங்களை வெள்ள அனர்த்தத்திலிருந்து பாதுகாக்கும் வகையில், நல்ல வடிகாலமைப்புத் திட்டத்தை ஏற்படுத்துவதற்காக ஒதுக்க வேண்டுமென்று வேண்டுகோள் விடுக்கின்றேன்.

அதேநேரம், இந்த வரவு செலவுத் திட்ட உரையின் 37ஆவது பந்தியிலே கரையோரப் பாதுகாப்பு என்னும் தலைப்பின்கீழ் தெற்கு, வடக்கு மற்றும் மேற்குக் கரையோரங்களைப் பாதுகாப்பது சம்பந்தமாகக் குறிப்பிடப்பட்டுள்ளபோதும், கிழக்கு மாகாணக் கரையோரம் பற்றி எதுவும் குறிப்பிடப்படவில்லை. அண்மைக்காலங்களில் கிழக்கு மாகாணக் கடலோரப் பிரதேசங்கள், குறிப்பாக ஒலுவில் பிரதேசம், அங்கு துறைமுகம் நிர்மாணிக்கப்பட்ட பின்னர் மிக மோசமான கடல் அரிப்புக்குள்ளாகி வருகிறது என்ற விடயத்தையும் நான் இச்சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். மேதகு ஜனாதிபதி அவர்கள் கடலோரப் பாதுகாப்புக்கென 500 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருப்பதாகக் குறிப்பிட்டிருக்கிறார். அப்பணத்தின் ஒரு பகுதியை இந்த ஒலுவில் துறைமுகச் சுற்றாடலில் ஏற்பட்டுள்ள கடலரிப்பைத் தடுப்பதற்கென ஒதுக்க வேண்டுமென்று நான் மிகுந்த பணிவுடன் கேட்டுக்கொள்கின்றேன். அடுத்து, நான் இந்த வரவு செலவுத் திட்டத்தில் குறிப்பிடப்பட்டுள்ள வேறு சில அம்சங்கள் தொடர்பாக மேலும் சில விடயங்களை ஆங்கிலத்தில் பேசலாமென எண்ணுகின்றேன்.

Sir, the most significant development in the Budget is the further fiscal consolidation bringing down the fiscal deficit to 6.2 per cent next year. What is encouraging is that there is a continuous declining trend since the conclusion of the war in 2009, when the deficit was as high as 9.8 per cent of GDP. We must bear in mind that Budget outcomes are often different to the estimated amounts. There are revenue shortfalls and expenditure overruns, which we have to contend for. But, I am sure, the Treasury would be quite keen to maintain this declining trend in managing the fiscal deficit and now, it has been projected to be 6.2 per cent for the next year. That is a very welcome feature and I am sure those who value macroeconomic fundamentals would certainly appreciate this declining trend in deficit reduction.

Some of my Colleagues in the Cabinet, particularly from the Left - I heard the Hon. Tissa Vitarana too pointing this out today - have not approved of the rationale behind the devaluation of the rupee by 3 per cent. In the short term, the impact on prices of imports may hurt, but by reducing imports and increasing exports, the trade deficit is going to improve. This corrective measure was deemed necessary for some time owing to the massive trade deficit. Therefore, Sir, I am inclined to

[ගරු රවුෆ් හකීම් මහතා]

endorse the policy, though the Central Bank and others may contend that the impact on the widening trade deficit on the current account could be minimal considering the expansion in exports, earnings from tourism and increased inward remittances.

True, these earnings had brought down the trade deficit of the current account to US Dollars 2.2 billion in the first eight months of 2011. But, during that period of eight months this year, the trade deficit reached up to US Dollars 6 billion. During this corresponding period, the export earnings increased by 28.6 per cent to US Dollars 7 billion. Yet, the import expenditure increased by 50.6 per cent to US Dollars 13 billion. So, it would certainly not be healthy for macroeconomic stability not to take any corrective action with respect to the exchange rate. Of course, the Central Bank may argue that the Foreign Exchange Reserves were high and that those would suffice to finance about six months of imports. Then, there is also the argument that a high proportion of these reserves comprised of foreign borrowings rather than earned reserves, which cannot be ignored. Therefore, Sir, I thought the Treasury has been very prudent in imposing this measure of 3 per cent devaluation of the rupee.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ඔබතුමා කරන ප්‍රකාශය ඉතා වැරැදියි. වැරැදි ප්‍රකාශයක් කරන්නේ. මේ අය අනුරාධපුර සිර මැදිරියේ,-[බාධා කිරීමක්] ජංගම දුරකථන 14ක් සොයාගෙන තිබෙනවා. මෙතුමා ජාතිවාදය අවුස්සන්න කටයුතු කරනවා. [බාධා කිරීමක්]

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

They are detainees who are undergoing physical and psychological difficulties and such an attack on them is really inhuman. Due to rigid conditions, hardly any information has been received about the detainees. When the detainees attempted to report that to the jailors, they had not been entertained by them; there was no place to report. At around 7 o' clock, when the Superintendent came, they reported to him, but he had not taken it seriously and advised them to ignore the matter. Following that, these 65 detainees went on a hunger strike, which is still continuing. They want an undertaking that they will be given one hundred per cent security and an assurance that such an incident would not be repeated.

I urge the Hon. Minister to take action and institute an immediate inquiry, provide redress and make arrangements to expedite the legal process with a view to producing them before court.
Thank you.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! The next speaker is the Hon (Dr.) Mervyn Silva. Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

Sir, I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 2.54]

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා (මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா - மக்கள் தொடர்பு, மக்கள் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Mervyn Silva - Minister of Public Relations and Public Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මම ඔබතුමාට ගෞරව කරනවා. දෙවනුව, මම මේ සභාවේ වාඩි කරවපු, ඉහළ, ගැලරියේ සිටින, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැලණිය ආසනයේ මගේ ආදරණීය පාක්ෂික මිතුරු මිතුරියන්ට හිස නමා ආචාර කරනවා. ඒක අපි ගමේ ඉන්න කාලයේ රාජපක්ෂවරුන්ගෙන්, මැදමුලනෙන් ඉගෙන ගත්ත දෙයක්. අද ගම්පහ දිස්ත්‍රික්කයේ නායකයා බැසිල් රාජපක්ෂ මැතිතුමා. එතුමාගේ නායකත්වය යටතේ අද අපි සියලු දෙනාම එක දම්වැලක පුරුක් වාගේයි ඉන්නේ.

අය වැය ගැන කථා කරන්න ඉස්සෙල්ලා මට පොඩි දෙයක් ගැන කථා කරන්න වෙනවා. මේ සභාවේ ඉන්න හැමෝටම ගෘහයක් -ගෙයක්- තිබෙනවා. ඒ වාගේම ව්‍යාපාරයක්, කුඹුරක්, ගොඩ ඉඩමක් තිබෙනවා. මේ හැම දෙයක්ම කළමනාකරණය කරන්න ඕනෑ. ඉල්ලන දේවල් සේරම දෙන්න ගියොත් කොම්පැනියක් වැහෙනවා. එතකොට කොම්පැනිය වහලා යන්න ඕනෑ. මේ සභාවේ ඉන්න කොම්පැනිකාර ඇතැම් උදවිය මේ Budget එක ගැන කියනවා, සහන මදි කියලා. ඒ කොම්පැනි අයිති මහත්වරුන්ට මම කියනවා, තමුන්නාන්සේලාගේ කොම්පැනිය ගැන ඉස්සෙල්ලා බලන්න කියලා. ඒවායින් ඒ අයට දෙන සහන මොනවාද කියලා බලන්න. ඒ වාගේම බලන්න ගෙදර ගැන. ගෙයක් වුණාම කළමනාකරණයක් තිබෙන්න ඕනෑ. ඉල්ලන හැම දේම දෙන්න බැහැ. වී වගාවක් කළත් කළමනාකරණයක් තිබෙන්න ඕනෑ. අපි අය වැය ලේඛනයක් ගැන කථා කරන්න ඉස්සෙල්ලා අපි අපි ගැන හිතන්න ඕනෑ. අපේ දේවල් ගැන හිතන්න ඕනෑ. එහෙම හිතුවොත් මේ විරුද්ධ පක්ෂයට අපි සමඟ හබයක් නැත. අපි සමඟ විරුද්ධ මතයක් නැත. විරුද්ධ මතයක් ප්‍රකාශ කරන්න නම් එක්කෝ දන්සැලකින් කන්න ඕනෑ, එක්කෝ පන්සලකින් කන්න ඕනෑ, එක්කෝ දේවාලයකින් කන්න ඕනෑ, එක්කෝ මුස්ලිම් පල්ලියකින් කන්න ඕනෑ. තමන් විසින් හම්බ කර ගෙන කන කෙනකුට, තමන් විසින් උනන්දුවෙන් ජීවිකාව කර ගන්නා කෙනකුට මේ අය වැය ලේඛනය පිළිබඳව කිසි වචනයක් කථා කරන්න බැහැ.

[ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා]

ලංකාවේ පළමුවැනි අගමැතිතුමා වූ දොන් ස්ටීවන් සේනානායක මැතිතුමාගේ කාලයේ ඉඳලා හැම අවුරුද්දකටම සැරයක් අය වැය ලේඛන ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, අපි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කළේ සංවර්ධනය මුල් කර ගෙන, ජාතික සංවර්ධන ක්‍රියාවලිය නොවෙනස්ව පවත්වාගෙන යන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය සන්තෝෂ වෙන්නට ඕනෑ. මොකද, ලංකා ඉතිහාසයේ බලාපොරොත්තු නොවුණු දෙයක්, ලංකා ඉතිහාසයේ ජ්‍යොතිෂවේදියෙකුටවත් කියන්න බැරි වුණු දෙයක් ඊයේ අතිගරු ජනාධිපතිතුමා දකුණු පළාතෙන් පටන් ගත්ත නිසා. එය උතුරට, නැඟෙනහිරට, ඌවට, සබරගමුවට, මධ්‍යම පළාතට යනාදී හැම තැනටම විහිදෙන පරිදි ඉදිරි කාලය තුළ පටන් ගන්න ලෑස්ති කරලා තිබෙනවා. මෙවැනි සංවර්ධනයක් අපි කරනවා. හාල් සේරුව නිකම් දෙන්නම්, සීනි රාත්තල නිකම් දෙන්නම්, අරක දෙන්නම්, මේක දෙන්නම් කියන සංස්කෘතිය අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය තුළ නැහැ. අද අපි කථා කරන මොහොත වන විට - මම උපන්නේ රුහුණේ, බෙලිඅත්ත ප්‍රදේශයේ. සරණ ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා මැදමුලනට පොඩ්ඩක් මෙහා. සරණ ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමනි, අද අපි කථා කරන මොහොත වන විට- මාතර දිස්ත්‍රික්කය, ගාල්ල දිස්ත්‍රික්කය විශාල ව්‍යසනයකට ලක් වෙලා තිබෙනවා. ස්වභාව ධර්මයෙන් සිදු වන දේවල් නවත්වන්න මේ කවුරු කයිවාරු ගැහුවත් බැහැ. අපටත් බැහැ. අපි ස්වභාව ධර්මයට යටයි. ඒ ස්වභාව ධර්මයේ වෙනසත් එක්ක අපේ දකුණු පළාතේ ආපදාවක් ඇති වෙලා තිබෙනවා. ඒ පිළිබඳව මම පෞද්ගලිකව කනගාටු වන අතර, ශ්‍රී ලාංකිකයන් හැටියට අපි සියලු දෙනාම කනගාටු විය යුතුයි. ඒ වෙනුවෙන් රජය මහත් ඕනෑකමකින් දැන් වැඩ කර ගෙන යනවා. අපෙන් සමුගත්තු ඒ අපේ දයාබර ඥාතිවරුන්ට, මිත්‍රයන්ට අපි නිවන්සුව ප්‍රාර්ථනා කරන්න ඕනෑ. මෙවන් දෙයක් තවත් නොවේවා! ලෝකය ගැන බලන කොට අපට හානි වෙලා තිබෙන්නේ අඩුවෙන්. දෙමවුපියන්ගෙන් කිරි උරපු, දෙමවුපිය සෙනෙහසේ හැදුණු එක්සත් ජාතික පක්ෂයේ උදවිය කීප දෙනෙකු ඒ පිළිබඳව කනගාටු වෙනවා. දෙමවුපිය සෙවණේ හැදුණේ නැති, බෝතලෙන් කිරි බීපු උදවියට මනුස්සකම පිළිබඳව අවබෝධයක් හැඟීමක් නැහැ.

අපේ ජනාධිපතිතුමාට මුදල් ඇමතිතුමා හැටියට සිදු වුණා අය වැය හැදීමේදී එක්තරා කෝණයක් පාවිච්චි කරන්න. නගරය විතරක් නොවෙයි, ගම්, නියම්ගම්වල පොල් කොළ පැදුරේ, වාඩියේ, මාළු ලැල්ලේ, මාලු වාඩියේ ඉන්න නැති බැරි අහිංසක මිනිසුන්ගේ ගෙදර කුස්සියේ ඉඳලා මහා මන්දිරය දක්වා හිතලා එතුමා මේ අය වැය සකස් කරලා තිබෙනවා. අපේ ප්‍රධාන පරමාර්ථය විය යුත්තේ එකයි. අපි සියයට අටක ආර්ථික වර්ධනයක් ඇති කර ගන්න ඕනෑ. ඒ වර්ධනය එහෙම පවත්වා ගන්නත් ඕනෑ. ඒ වර්ධනය තියා ගෙන ජනතාව සුඛිත, මුදිත වෙන්න ඕනෑ. ගමේ කුප්පි ලාම්පුව නිවන්න බැහැ; මහ මන්දිරයේ ලයිට් එක නිවන්නත් බැහැ. ගමේ සිල්ලර කඩේ, පොඩි කඩේ වහන්න බැහැ; කොළඹ තිබෙන මහ කඩ වහන්නත් බැහැ. අන්න ඒක නිසා තමයි, අපේ ජනාධිපතිතුමා ඉතාම අඩු ආදායම් ලබන සමාජ කොටස් පිළිබඳව විශේෂ සහන සේවා සලස්වලා තිබෙන්නේ. අඩු ආදායම්ලාභීන්ගේ ජීවනාධාර සීමාව රුපියල් 750 දක්වා වැඩි කරලා තිබෙනවා. මේක වරදක්ද? අඩු ආදායම්ලාභී සාමාන්‍ය පවුල් සඳහා ලබා දෙන දීමනාව රුපියල් 1,200 දක්වා වැඩි කරලා තිබෙනවා. මේක වරදක්ද, මගේ මිත්‍ර ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි? වරදක් නැහැ. අපි මිත්‍රයෝ. අපි සහයෝගයෙන් වැඩ කරන්න ඕනෑ.

ඊ ළඟට, ගර්භනී හා ළමා පෝෂණය කටයුතු සඳහා කලින් වෙන් කර තිබූ මුදල් ප්‍රමාණයට මෙවර අය වැයෙන් තවත් මිලියන 3,000ක් වෙන් කරලා තිබෙනවා. ඒක වැරැද්ද? රාජ්‍ය සේවක වැටුප් සඳහා සියයට 10ක් වැඩි කර තිබෙනවා. මම මුලදී පටන් ගත්තේ ඒ ගැන කියලායි.

කොම්පැනි අයිති මහත්වරු විරුද්ධ පක්ෂයේ ඉන්නවා. තමන්ගේ කොම්පැනිය පවත්වා ගෙන යන්න නම්, ඉල්ලන හැම දේම දෙනවාද? අල්ලපු ගෙදරට ටීවී එකක් ගෙනාවා කියලා මෙහා ගෙදර දරුවෙකු මෙහෙම කියන්න පුළුවන්, "තාත්තේ, එහා ගෙදර ටීවී එකක් තිබෙනවා. තාත්තේ අපිත් ගෙනෙමුද" කියලා. එහා ගෙදර එක්කෙනා "ඩිමෝ බට්ටෙක්" ගෙනැල්ලා. අපේ බැසිල් රාජපක්ෂ මැතිතුමා ආර්ථික සංවර්ධන ඇමතිතුමා හැටියට ඩිමෝ බට්ටෝ දෙනවා. එතුමා රට පුරාම කොච්චර ලොකු සේවාවක් කරනවාද? මේ රාජපක්ෂ පවුල එසේ මෙසේ පවුලක් නොවෙයි. අතිගරු ජනාධිපතිතුමාගේ මහ පෙන්වීමෙන්, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ වීරවරයෙකු හැටියට මේ රට එක්සේසත් කළා ත්‍රිවිධ හමුදාව හා පොලීසියේ රණ විරුවන් හා ඒකරාශි කරලා. බැසිල් රාජපක්ෂ මැතිතුමා තිස්ස කුමාරයා වාගේ මුළු ආර්ථිකයම කරේ තියා ගෙනයි ඉන්නේ. ඒක වරදක්ද? අපේ කථානායකතුමා -ලොකු අයියා- අද පාර්ලිමේන්තුව මනුෂ්‍යත්වයේ සංකේතය කරලා තිබෙනවා. ඒක වැරැද්ද? නාමල් රාජපක්ෂ තරුණ මන්ත්‍රීතුමා අද පියාගේ අඩි පාරේ යමින්, බාප්පලාගේ උපදෙස් අරගෙන තරුණ ජවය ඒකරාශි කරලා තිබෙනවා. මේකට ඊර්ෂ්‍යායි. මේ උදවිය වැරැදිලා හරි එදා හිටියා නම් නන්ද කුමාරයට මහණ වෙන්න දෙන්නේ නැහැ, අනේ. දෙන්නේ නැහැ. ඇයි? සිද්ධාර්ථගේ මස්සිනා කියයි. මහණ වෙන්න දෙන්නේ නැහැ. ප්‍රජාපතී ගෝතමියට සිද්ධාර්ථට කිරි දෙන්න ඉඩ දෙන්නේ නැහැ. ඒක වැරදියි කියයි. එහෙම ඉතිහාසයක් තිබෙනවා. සංස්කෘතිය, සභ්‍යත්වය අමතක කරන්න එපා.

විශ්‍රාම වැටුප්ලාභීන්ට රුපියල් 1,000ක් වැඩි කළා. ඒක වරදක්ද? මෙතැනදී මට මතක් වනවා බුදුරජාණන් වහන්සේ දේශනා කළ එක සූත්‍රයක්. චක්‍රවර්ති සීහනාද සූත්‍රය. මේක අහගන්න, බණ පොත් ගැන දන්නේ නැත්නම්. අපේ පූජ්‍ය එල්ලාවල මේධානන්ද මහානායක හාමුදුරුවෝ මම නිතරම හම්බ වනවා. උන් වහන්සේ මට බණ ගැන කියලා දෙනවා. ඒ කියන්නේ දැන් අපි සන්තෝෂ වන්න ඕනෑ. මේ තරම් බෞද්ධ කොඩි ඔසවපු යුගයක්, මේ තරම් ධර්ම දේශනා කරන යුගයක්, මේ තරම් ධර්මයට සවන් දෙන යුගයක්, පන්සල්වල සන්ධ්‍යා නාද වන යුගයක්, ඕනෑම ආගමක දරුවන් දහම් පාසල් යවන යුගයක් ඇති වෙලා තිබෙනවාද? දොන් ස්ටීවන් සේනානායක මැතිතුමාගෙන් පස්සේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ විතරයි ආගම දහම පිළිබඳ නිවැරදිව සමාජයට ඕනෑකමක් ඇති වෙලා තිබෙන්නේ; අවශ්‍යතාවක් ඇති වෙලා තිබෙන්නේ. චක්‍රවර්ති සීහනාද සූත්‍රයේ තිබෙනවා, ධනය බෙදී යන්න ඕනෑ කියලා. ධනය බෙදී නොයාම සිදු වුණාම, ධනය බෙදෙන්නේ නැති වුණාම, සමාජ කොටස් අතරේ යහපත් ලෙස ධනය බෙදී නොයාම සිදු වුණාම ඇති වන තත්ත්වයන් බුදුන් වහන්සේ දේශනා කරලා තිබෙනවා. ඒකයි අපේ ජනාධිපතිතුමා මේ සූත්‍රය අර ගෙන තිබෙන්නේ. මේවා කියවන්න, ඔයගොල්ලන්. ඔය කෝට් බෑයකුයි, ටයි බෑයකුයි දමා ගෙන සමාජගත වෙලා වැඩක් නැහැ. ඔය කථා කරන එක මිනිහෙක් වැරදිලා නියරකින් ලිස්සලා ගිහිල්ලාවත් ගොයමට වැටිලා නැහැ. කුඹුරට වැටිලා නැහැ. මිනිස්සු ලිස්සලා යනවා නේ. මේ ගොල්ලන් ලිස්සලා යන්නේ බාත්රූම් එකේ. ඇයි, බාත්රූම් එක ශුද්ධ කරලා නැහැ. නෝනට කම්මැලියි. නෝනා ජීවත් වන්නේ ලිප්ස්ටික් එක අතේ තියා ගෙන; කියුටෙක්ස් එක අතේ තියා ගෙන. ඉතින් බාත්රූම් එක මදින්නේ නැහැ. අපේ ජනාධිපතිතුමා කුඹුරට ලිස්සලා ගිය කෙනෙක් නොවෙයි. රාජපක්ෂ පවුල කුඹුරේ ලිස්සුවේ නැහැ. ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා මන්ත්‍රීකමට ඉල්ලන්න කොළය අත්සන් කරන කොට හිටියේ කුඹුරේ. මඩේ හිටියේ. ඔළුවේ ලේන්සුව බැඳ ගෙන මඩේ හිටියේ. එහෙම ඉඳලා තමයි, ගිරුවාගම් දොළොස්දාහේ, මාගම්පත්තුවේ බොහෝ දෙනාගේ ඉල්ලීම පිට

එතුමා පාර්ලිමේන්තුවට ආවේ. රාජපක්ෂ පවුලට මඩ පුරුදුයි. කුඹුර පුරුදුයි. කවුරු මඩ ගැහුවත්, කවුරු විවේචනය කළත්, කවුරු කුමන්ත්‍රණ කළත්, දෙව්දත් ගියා වාගේ ඒ ගොල්ලන් පොළොව පලා ගෙන යටට යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සූත්‍රයේ තිබෙනවා, ධනය නොබෙදී යාම තුළ සොරකම, වංචාව, වැඩි වන බව. මේවා නැති වන්න නම් අපි ධනය බෙදන්න ඕනෑ. එක තැනක එකතු කරන්න බැහැ. වතුර එක තැනක එකතු වුණොත් පල් වනවා. ළිඳකින් වතුර නොගත්තොත් ඒ ළිඳේ වතුර බොන්න බැරි වනවා. එතුමාගේ ආදර්ශවත් අය වැය ලේඛනය ඉදිරිපත් කරලා තිබෙන්නේ බුද්ධ, ධම්ම, සංඝ රත්නය අනුවයි.

ඊළඟට දිගු කාලීන සහ කෙටි කාලීන යෝජනා කිහිපයක් මේ අය වැය ලේඛනයේ තිබෙනවා. සුභසාධනය, අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය නඟාසිටුවන්නට විශාල කැපවීමක් කරලා තිබෙනවා. එහෙම නැත්නම් රුපියල් බිලියන 53ක අතිරික්තයක් ගන්න තිබුණා. ඒක කියන්න එක්සත් ජාතික පක්ෂයට. අද මගේ ජේවීපී සහෝදරයෝ නැහැ. ද්‍රවිඩ සහෝදරයෝ ඒක දන්නවා. ඒ අය අපට උදවු කරනවා. හිටපු ගමන් පොඩි කාඩ් එකක් ගහනවා. එහෙම කළේ නැත්නම් පොකට් එකට පිට රටින් සල්ලි එන්නේ නැහැ නේ. ඒවා පොඩ්ඩක් එන්න ඕනෑ නේ. කොටියා ඉතිරි කරපු සල්ලි තිබෙනවා. ඒක තමයි සමහර උදවිය කෑගහන්නේ. අපහාස වන නිසා මම නම කියන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ සමහර මන්ත්‍රීවරු උපාධියක් තිබෙන, වෛද්‍ය වෘත්තිය පිළිබඳව බොහොම දක්ෂකමක් තිබෙන මගේ ඉතාම හිතවත් මන්ත්‍රීවරයෙක් ඇතුළු කිහිප දෙනෙක් ඉන්නවා. ඒ අය කොටියාගේ පඩියෙන් ජීවත් වනවා. රුපියල් බිලියන 53ක අතිරික්තයක් ගන්න තිබුණු අය වැයක්.

රුපියල් බිලියන 1.8ක හිඟයක් ආවේ ඇයි? ඒ වාගේ හිඟයක් ආවේ හම්බ කරන මුදල, එක්කාසු කරන මුදල බුදු හාමුදුරුවන්ගේ දේශනාව අනුව බෙදී යන්න සලස්වපු නිසායි. අද අපට කියන්න බැහැ ණය අරගෙන ඒ ණය කෑවා කියලා. මොරගහකන්ද ජලාශය දිහා බැලුවොත්, නොරොච්චෝලේ දිහා බැලුවොත්, මහා මාර්ග දිහා බැලුවොත් ඒ ණයවලින් කරපු දේවල් අපට හිතා ගන්න පුළුවන්. වෙනදා අප සියලු දෙනාම මොකක් හරි සිද්ධියකට මුහුණ දෙනවා. එක්කෝ මඩ ගාගෙන පාර්ලිමේන්තුවට එන්නේ. ඇයි? ගැමි මන්ත්‍රීවරු ගෙදර ඉඳලා මහ පාරට එන කොට වාහනයක් ගියා සල්ලිකාරයාගේ. ඒක වතුර වළේ වැටුණා. මන්ත්‍රීවරයාගේ මුහුණ පුරා මඩ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට වෙන් කළ කාලය නම් නිමාවට පත් වෙනවා දැන්.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ඒක නේ කියන්නේ. එහෙනම් එක දෙයක් විතරක් මා කියන්නම්.

එදා තිලෝගුරු බුදු පියාණන් වහන්සේ දඹදිව ධර්මය දේශනා කරන සමයේ ජේතවනාරාමයේ විශාල පිරිසක් බලාගෙන හිටියා, එතුමා ධර්මය දේශනා කරනකම්. බුදු හාමුදුරුවෝ ධර්ම දේශනාව පටන් ගන්න කොට කට්ටියක් කඩින් කඩ එළියට ගියා. පස්සේ බුදු හාමුදුරුවෝ මේක විමසිල්ලෙන් බැලුවා කවුද මේ යන්නේ කියලා. තීර්ථකලා එදා හිටියා. අර හෙළුවෙන් ඉන්න කට්ටිය, නිඝණ්ඨනාථපුත්තලා. තීර්ථකයෝ. දෙව්දත්ගේ ගෲප් එකේ අය එළියට යනවා. බුදු හාමුදුරුවෝ නිසොල්මන්ව ධර්මය දේශනා කළා. බුදු හාමුදුරුවෝ පන්සිල් පද පහ ගැන දේශනා කළා. එතකොට දෙව්දත් ඇවිල්ලා කිව්වා, "නැහැ, පහක් මදි දහයක් ඕනෑ" කියලා. මේ උදවියත් එහෙම කියනවා. ඒ ගොල්ලෝ අය වැය ලේඛනය ගැන හොඳට දන්නවා. "නැහැ, නැහැ මේ මදි තවත් ඕනෑ" කියනවා. මේ කවුද? දෙව්දත්ගේ කට්ටිය. නිඝණ්ඨනාථපුත්තලාගේ කට්ටිය. සේරම අය නොවෙයි. අන්තිමේදී මොකද වුණේ? බුදු හාමුදුරුවෝ සුවාසූ දහසක් සිත් සතන් ප්‍රබෝධ කරලා ධර්ම මඟට ගෙනියලා නිවන් සුව අත් පත් කර ගත්තා. දෙව්දත්ට මොකද වුණේ, දහය ඉල්ලපු එකාට? පොළොව පලාගෙන අවීචි මහ නරකාදියට ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න බොහෝ දේ තිබුණත් වෙලාව නැති නිසා මම වැඩි දේවල් කියන්නේ නැහැ. බැසිල් රාජපක්ෂ මැතිතුමනි, ඔබතුමාගේ නායකත්වය යටතේ ඔබතුමාගේ පසුපසින් ගමන් කරන පිරිසක් අපි, ගම්පහ දිස්ත්‍රික්කයේ. ඒ ආර්ථික න්‍යාය අද මුළු රටම වෙළා ගෙන තිබෙනවා. ගම්බදින් ආපු අපේ ආචාර්ය පී.බී. ජයසුන්දර මහත්මයා ඒකටම හරියන්න වැඩ කටයුතු කරනවා. අපේ ජනාධිපතිතුමාත් ගම්බද කෙනෙක්. ජයසුන්දර මහත්මයාත් ගම්බද කෙනෙක්. එතුමා සත් කෝරළයේ, බත් කෝරළයේ. අප මාගම් පත්තුවේ ගිරුවාගම් දොළොස්දාහේ අය. මේ දෙගොල්ලන්ම ඒකරාශි වෙලා හැමෝගේම අදහස් අරගෙන, හැමෝටම කිව්වා අදහස් දෙන්න කියලා. එක්සත් ජාතික පක්ෂයටත් කිව්වා. කෝ දෙනවාද අනේ? ඒ ගොල්ලන්ගේ වැඩේ පෙත්සම් ගහන එක; කලබල කරන එක; පත්තරේට ලියුම් ලියන එක; TV එකට ඇවිල්ලා එක එක දේවල් කියන එක. හැම දාම කලබල. නිසොල්මන් වෙන්න. වෙලාව එනකම් ඉන්න. මී වද කඩන්න යන්න අත ඉදිමවා ගන්නේ නැතිව. බඹරුන්ට කියලා අන්නවා ගන්න එපා. ඔබතුමන්ලා මේ ෆොන්සේකා මහත්තයෙක් අල්ලාගෙන දහලනවා. එහෙනම් මම යෝජනා කරනවා හිරේ ඉන්න සියලුම කට්ටිය නිදහස් කරන්න කියලා. රටට, ජාතියට වංචා කරපු මිනිහෙක්, හමුදාවට වංචා කරපු මිනිහෙක් නිදහස් කරනවා නම් හිර ගෙදර ඉන්න සියලුම දෙනා නිදහස් කරන්න ඕනෑ.

පී.බී. ජයසුන්දර මැතිතුමනි, තමුන්නාන්සේ ඇතුළු මුදල් අමාත්‍යාංශයේ සියලුම දෙනාට, ප්‍රඥාවන්තයින්ට මම ගෞරව කරනවා. අතිගරු ජනාධිපතිතුමනි, ඔබතුමාගේ අය වැය ලේඛනය පිළිබඳව යමෙක් වැරදි විධියට කථා කරනවා නම් ඒ දෙව්දත්ගේ කට්ටිය පමණයි. ඔබතුමන්ලා කෑ ගහන්න. අපට කිසි ප්‍රශ්නයක් නැහැ. එතැනදී අප එකක් කියන්න ඕනෑ. ලෝක යුද්ධය ඉවර වෙලා සියලුම දෙනා ඒක රාශි වෙලා ශීඝ්‍ර සංවර්ධනයක් වෙනුවෙන් -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
පොඩ්ඩක් ඉන්න. මේක කියන්නම ඕනෑ.

ලෝකයේ ලොකු යුද්ධයක් තිබුණා ඒක තමයි දෙවැනි ලෝක මහා සංග්‍රාමය. එතැනදී සියලුම දෙනා ඒක රාශි වුණා. ඒක රාශි වෙලා මොකක්ද කළේ? ඒක කියන්න මට විනාඩියක් දෙන්න. එදා ඔවුන් ඒක රාශි නොවුණා නම් ලෝක බැංකුව නැත. එක්සත් ජාතීන්ගේ සංවිධානය නැත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලක් නැත.

කොටින්ම කියතොත් ඇනකොටා නොගන්නා ලෝකයේ රටක් නැත. මෙන්න මේක තමයි ගන්නා උදාහරණය. යුරෝපයට කථා කරන එක්සත් ජාතික පක්ෂය, යුරෝපයට කේලාම් කියන

[ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා]

තමුන්නාන්සේලා, අවුරුදු 30ක යුද්ධය නිම කර අපි මේ රට බේරා ගත්තාම එදා කිව්වේ මොකක්ද? එදා අපි යුද්ධය කර ගෙන යන විට තමුන්නාන්සේලා කිව්වා, "ඔය යන්නේ පාමංකඩ" කියලා. තමුන්නාන්සේලා පාමංකඩම ඉන්න. අපි යන්නම් අලිමංකඩ. තමුන්නාන්සේලා මැදවච්චියේ ඉන්න. අපි යන්නම් කිලිනොච්චියට. මේ අවස්ථාවේදී මා හැමෝටම ස්තුති කරනවා. බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, මේ වැඩ පිළිවෙළ ඔබතුමාගේ අතේ තිබෙන්නේ. උරුම අරුණ සංරක්ෂණ අරමුදල නමින් අරමුදලක් පිහිටුවා වැඩ පිළිවෙළක් කිරීමට මෙවර අය වැයෙන් යෝජනා කර තිබෙනවා. තමුන්නාන්සේ මේක එදා මට කිව්වා. තමුන්නාන්සේගේ උපදෙස් මතයි කියන්නේ. දඹදෙණිය, පඬුවස්නුවර, කුරුණෑගල හා යාපහුව පැරණි රාජධානි ආශ්‍රිත වයඹ චතුරස්‍ර සංවර්ධනයටද රුහුණු මාගම්පුර පෞරාණික රාජධානිය ආශ්‍රිත පුරා වස්තු සංරක්ෂණයටද අරමුදල් වෙන් කරනවා. මෙහෙම යෝජනා වන විට -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාගෙන් හෝ මට විනාඩි දෙකක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එහෙම නම් ආණ්ඩු පක්ෂයේ කාලයෙන් අඩු කරන්න වනවා.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
විපක්ෂ නායකතුමාට විනාඩි දෙකක් දෙන්න පුළුවන් නම් ඇයි, මට දෙකක් දෙන්න බැරි?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ඉක්මනට අවසාන කරන්න.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ශ්‍රී ලංකා ඉතිහාසයේ කෝට්ටේ රාජධානි යුගයේ ප්‍රාන්ත රාජ්‍යයක් හැටියට අපගේ වංශ කථාවේ සඳහන් වන උඩුගම්පොල පැරණි රාජධානිය සංරක්ෂණය කර දෙන්න, බැසිල් රාජපක්ෂ මැතිතුමනි. සකල කලා වල්ලභ කියා රජ කෙනෙක් හිටියා. ඒ රජ්ජුරුවෝ තමයි හලාවත මුහුදු තීරයෙන් පරදේසක්කාරයෝ එනකොට උන්ට ගහලා එලෙව්වේ. එහෙම ඉතිහාසයක් අපට තිබෙනවා.

උඩුගම්පොල රාජධානිය තියෙන්නේ ගම්පහ දිස්ත්‍රික්කයෙන්. රුවන් විජයවර්ධන මැතිතුමා මේ සම්බන්ධව සන්තෝෂ වනවා ඇති. අපි හරි කරන්න එපායැ මේක. මෙන්න මේ අවශ්‍යතාව ඉෂ්ට කරන්න කියා මතක් කරනවා. දේවදත්තයිනි, -ඕනෑ කෙනෙක් භාර ගන්න.- නිගණ්ඨයිනි, තීර්ථකයිනි, ඔබ සැමට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මා නවතිනවා. මේ කථාවට කිසිම කලබලයක් නොකර ඇහුම්කන් දුන් එක්සත් ජාතික පක්ෂයේ මගේ ප්‍රවීණ මිත්‍රයින්ට මා ගෞරව කරනවා. ඔන්න ඔහොම තමයි ඉන්න ඕනෑ. වේගයෙන් දුවන අඟුරු කෝච්චියක් වන්න එපා. Highway එකක් වන්න. එන්න, අරලියගහ මන්දිරයට; රජ ගෙදරට. පොඩි classes කිහිපයක් අපි ලැහැස්ති කර තිබෙනවා. ඒකේ මටත් දේශනාවක් තිබෙනවා. එන්න. බොහොම ස්තුතියි.

[අ.භා. 3.16]

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජයේ හත්වන අය වැය විවාද කරන මේ අවස්ථාවේදී අදහස් කිහිපයක් දැක්වීමට ඉඩ ලබා දීම පිළිබඳව මා පළමු වෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මා 1989 ඉඳලා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් මන්ත්‍රීවරියක් හැටියට විපක්ෂයේත් ආණ්ඩු පක්ෂයේත් කටයුතු කළා. එම කාල වකවානු තුළ ඉදිරිපත් වූ අය වැය අතුරින් දැකපු හොඳම හොඳ අය වැයක් හැටියටයි අතිගරු ජනාධිපතිතුමාගේ මෙම හත්වන අය වැය ලේඛනය දැක්කේ. විශේෂයෙන්ම ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා පාර්ලිමේන්තු සභා ගර්භයට ඇවිත් මෙවැනි අය වැයක් ඉදිරිපත් කරන අවස්ථාවේදී විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් පවා හැසිරුණු ආකාරය පිළිබඳව අද ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා හා ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා එතුමන්ලාගේ කථාවේදී කිව්වා, ඒ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හා ඇමතිවරුන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පහර දුන්නා කියා ලොකු චෝදනාවක් එල්ල කරමින් එතුමන්ලා කථා කළා. මීට පෙරත් මේ ගරු සභාවේදී මේ සම්බන්ධව බොහෝ මන්ත්‍රීවරු කථා කරනවා මා අහ ගෙන හිටියා. ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ සභා ගර්භයේ එවැනි අය වැයක් ඉදිරිපත් කරන අවස්ථාවේදී, එතුමා සභා ගර්භයේ සිටියදී විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පහර දුන්නා; එවැනි කටයුතු කළාය කියා.

අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ සභාවේ ඉතාමත්ම වැදගත්, රටේ පහළ මට්ටමේ ඉඳලා ඉහළ මට්ටම දක්වා නැත්නම් දිළිඳුම තත්ත්වයේ ඉඳලා ඉහළම මට්ටම දක්වා ජීවත් වන ජනතාවගේ ජීවිත සාර්ථක කර ගන්න පුළුවන් විධියේ හොඳම හොඳ අය වැයක් ඉදිරිපත් කරන අවස්ථාවේදී එතුමන්ලා මේ සභාවට ඇවිල්ලා අතිගරු ජනාධිපතිතුමාට සහ රජයට විරුද්ධව බෝඩ් ඇල්ලීම සුදුසුද කියලා මම විශේෂයෙන්ම අහන්න කැමැතියි. මේ වෙලාවේ එතුමා මේ ස්ථානයේ නැහැ. එතුමන්ලා කළ වැඩය ඉතාම නින්දාසහගතයි කියලා මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

කොයි තරම් හොඳ දෙයක්, හොඳ වැඩක්, හොඳ අය වැයක් රජය ඉදිරිපත් කළත් ඒකට විරුද්ධ වීම සහ නොයෙකුත් ආකාරයේ විරුද්ධ ප්‍රතිචාර දැක්වීම හැමදාම එක්සත් ජාතික පක්ෂය සහ විපක්ෂය කරන දෙයක්. අපිත් විපක්ෂයේ හිටියා. ඒ කාලයේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අපිත් නොයෙකුත් විරෝධතා දැක්වූවා. මම දකින හැටියට විරෝධතාවල සාධරණකමක් තියෙන්නට ඕනෑ. රජයක් විසින් හොඳ දෙයක් ඉදිරිපත් කරන විට, පෙන්වලා දෙන විට, නැත්නම් ජනතාවට යම් සහනයක් ඇති වෙන ආකාරයට කටයුතු කරන විට ඔබතුමන්ලාත් ඒකට එකඟ වෙනවා නම් තමයි ඉතාමත්ම හොඳ කියලායි මම දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඉදිරිපත් කරලා තිබෙන මෙම අය වැය සම්බන්ධයෙන් කථා කරන විට විපක්ෂය මොනවා කිව්වත්, ඩොලර් 1,000කට වඩා අඩුවෙන් තිබූ ඒක පුද්ගල ආදායම මේ වන විට ඩොලර් 2,800ක් වී තිබෙන බව මම මතක් කරන්නට ඕනෑ. ඒ වාගේම අපි අමතක නොකළ යුතු තවත් කරුණක් තිබෙනවා. මෑතක් වනතුරුම දිස්ත්‍රික්ක රාශියක කිසිම සංවර්ධනයක් සිදු වෙලා තිබුණේ නැහැ. පසු ගිය කාල වකවානුව තුළම ඉතාම පසුගාමී තත්ත්වයක තමයි සංවර්ධනය පැවතුණේ. උතුරු - නැඟෙනහිර ප්‍රදේශවල සංවර්ධනය තියා ඒ ප්‍රදේශවලට ඇතුළු වීමටවත් කිසිම නායකයෙකුටවත්, කිසිම කෙනෙකුටවත් පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඇත්තටම අද විපක්ෂයට මේවා අමතක වෙලා තිබෙන එකයි අපට කනගාටුව. අද විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පවා බියෙන් සැකයෙන් තොරව මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා විවේචනය කරන්න, නොයෙක් තැන්වල ගිහින් විවේචනය කරන්න, පෙළපාළි යන්න, නොයෙකුත් උද්ඝෝෂණ කරන්න නිදහසේ ජීවත් වන්නට පුළුවන් වාතාවරණයක්, පසු බිමක් ඇති වෙලා තිබෙන්නේ අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් සහ ගෝඨාභය රාජපක්ෂ ලේකම්තුමාගේ යුද නායකත්වය යටතේ අපේ ත්‍රිවිධ හමුදාව යුද්ධයක් කරලා මේ රට එල්ටීටීඊ ත්‍රස්තවාදයෙන් සම්පූර්ණයෙන්ම නිදහස් කර ගත්ත නිසාය කියන එක විශේෂයෙන්ම අමතක කරන්නට එපා. ඒ නිසායි අද ඔබතුමන්ලාටත් නොයෙකුත් විවේචන, පෙළපාළි වැනි දේවල් භයක්, සැකයක් නැතිව කරන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ. ඒ ආකාරයට රට නිදහස් කර ගත්ත, රට බේරා ගත්ත නායකයෙකුව විවේචන කරලා අගෞරව කරනවා නම් අපි දකින විධියට ඒක ඉතාමත්ම වැරදි දෙයක්.

දැනට වසර දෙකකට පමණ පෙර මෙම යුද්ධය සම්පූර්ණයෙන්ම තුරන් කිරීමට අපේ රටේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ පුළුවන්කම ලැබීම අපි කවුරුත් ලැබූ භාග්‍යයක් හැටියටයි මම දකින්නේ. ඒ වාගේම එදා එතුමා අපේ රට නිදහස් කර ගන්න අවස්ථාව වන විටත්, ඒ කියන්නේ යුද්ධය තිබියදීත් රටේ සංවර්ධනය ඇති කළා. විශේෂයෙන්ම මං මාවත් සකස් කළා. ඒ වාගේම අඩු ආදායම් ලාභී ජනතාව වෙනුවෙන් සමෘද්ධි ආධාර වැඩි කරලා ලබා දීම වැනි දේවල් කළා. සමෘද්ධි ව්‍යාපෘතිය යටතේ ඒ අයට තවත් ආධාර ක්‍රම රාශියක් ලබලා දුන්නා. ඒ විතරක් නොවෙයි එතුමා රටේ යුද්ධය පවතින කාලයේත් මං මාවත්, පානීය ජලය, සෞඛ්‍ය, අධ්‍යාපනය වෙනුවෙන් විශාල කැප වීමක් කළා.

2010 වසරේදී ලෝක ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා වැටෙන තත්ත්වයක් ඇති වුණා. ඇමෙරිකාව වාගේ රටක් අපි සලකන්නේ ලෝකයේ ඉතාමත්ම බලවත් රටක් හැටියටයි. නමුත් ඇමෙරිකාව වාගේ රටවලත් ආර්ථිකය කඩා වැටිලා, රාජ්‍ය සේවයේ නියුතු අයට රැකියාවල් අහිමි වෙලා නොයෙකුත් විනාශයන් ඒ රටවල වෙද්දීත් අපේ රටේ ආර්ථිකය සමබරතාවකින් පවත්වා ගෙන, කඩා වැටුණු ආර්ථිකයත් ශක්තිමත් කර ගෙන යන්නට විශේෂයෙන්ම අපේ රටේ නායකතුමාට හැකියාවක් ලැබුණා. යුද්ධය අවසන් කර, රටේ සංවර්ධනය ඇති කරමින්, සියයට 8ක ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට අපේ රජයට හැකියාව ලැබුණා.

අද ගෘහ ආර්ථිකය කේන්ද්‍ර කර ගත් සංවර්ධන වැඩ පිළිවෙළ තුළින් රටේ සංවර්ධනය ඇති වීම නිසා උද්ධමනය සියයට 5ක් දක්වා අඩු මට්ටමකට ගෙන ඒමට හැකි වී තිබෙනවා.

"නිල්ල පිරුණු රටක්, අටුකොටු පිරුණු ගෙටක්"යනුවෙන් අපේ අතිගරු ජනාධිපතිතුමා, අපේ රජය ඉදිරිපත් කළ ඒ සංකල්පය යථාර්ථයක් කරමින් අද වන කොට අපේ රට සහල්වලින් ස්වයංපෝෂිත වී තිබෙනවා. රැකී රක්ෂා හිඟය සියයට 8 සිට සියයට 5 දක්වා අඩු කරන්නට පුළුවන්කම ලැබිලා තිබෙනවා. දිළිඳු ජනගහනය සියයට 15.6 සිට සියයට 8.9 දක්වා අඩු කිරීමට හැකියාව ලැබී තිබෙනවා. සියයට 7කින් පමණ දිළිඳුකම තුරන් කරන්නට හැකියාව ලැබීම අප රජය ලැබූ ජයග්‍රහණයක් හැටියට මා දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රස්තවාදී තර්ජන පැවැති ප්‍රදේශවල ජන ජීවිත යහපත් අතට පත් වී ඇති නිසා ඉන්දියාවේ සිට පැමිණෙන සරණාගතයින් සහ එල්ටීටීඊ සටන්කාමීන් සමාජයට එක් කිරීමට හැකියාව ලැබී තිබෙනවා. වතුකරයේ ජීවත් වන ද්‍රවිඩ ජනතාවගේ සෞඛ්‍ය, අධ්‍යාපනය ගැන අවධානය යොමු කර ඇති අතර, රජයේ සේවාවන් ලබා දීමේදී භාෂා ප්‍රශ්නය නිසා ඇති වන අපහසුතාවන් වළක්වා ලීමට සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන ත්‍රෛභාෂා වැඩ පිළිවෙළකට මේ වන කොට සමාජය යොමු කර තිබෙනවා. එයින් සියලු ජනතාවගේ භාෂා අයිතිය ආරක්ෂා කර තිබෙනවා. උතුරේ ජනතාව බෙදා වෙන් කර තිබූ ඒ ත්‍රස්තවාදය තුරන් කිරීමෙන් පසුව එම ප්‍රදේශවල ජනතාවට අවශ්‍ය පොදු පහසුකම් මේ වන කොට ලබා දී තිබෙනවා. විනාශ කළ මාර්ග, පාලම්, බෝක්කු ඒ වාගේම වරායන්, දුම්රිය මාර්ග, ගුවන් තොටු පොළවල්, ජල සම්පාදනය හා වාරි පද්ධතිය ශීඝ්‍රයෙන් ඉදි කරලා තිබෙනවා; ඉදි වෙමින් පවතිනවා. මේ සඳහා ඩොලර් මිලියන 4,000ක මුදලක් ආයෝජනය කර තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමියගේ වේලාව අවසන්.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
මට ඉතාම සුළු වේලාවක් ඔබතුමා දෙන්නේ. අනෙක් අයට වැඩි වේලාවක් දෙනවා. මටත් තව වේලාව දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරේ පැවැති යුදමය වාතාවරණය සම්පූර්ණයෙන්ම නැති කිරීමට හැකි වන්නේ නැහැ, අපේ හමුදාවේ සහ විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය සහ කැපවීම නොතිබුණා නම්. ඒ නිසාම හමුදා පවුල්වල උපදින තුන්වන දරුවාට ලබා දෙන රුපියල් ලක්ෂයක මුදල අද පොලිසියේ පවුල්වල උපදින තුන්වන දරුවාටත් ලබා දීමට අතිගරු ජනාධිපතිතුමා කටයුතු කර තිබෙනවා. ඒ අයගේ ශුභසාධනය වෙනුවෙන් එය මහත් රුකුලක් වනු ඇතැයි මා විශ්වාස කරනවා.

ත්‍රස්තවාදී සටන්වලදී දිවි පිදූ රණ විරුවන් වෙනුවෙන් ඔවුන්ගේ අඹු දරුවන්ට මෙතෙක් ඒ වැටුප ලබා දුන්නා. මින් ඉදිරියට ඒ අයගේ දෙමවුපියන්ටත් රුපියල් 750ක දීමනාවක් ලබා දීමට කටයුතු කිරීම ඉතාම වැදගත් දෙයක්. මොකද, යුද්ධය වෙනුවෙන් සටන්වලට ගිහිල්ලා අපට අහිමි වූ රණ විරුවන් වෙනුවෙන් බිරිඳට යම් කිසි මුදලක් ලැබුණත් අසරණ දෙමවුපියන්ට යමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මෙය ඉතාම වැදගත් දෙයක් හැටියටයි මං දකින්නේ. ඒ වාගේම ආබාධිත රණ විරුවන්ට ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 1,700ක පමණ මුදලක් රණ විරු අධිකාරියට වෙන් කිරීමත් ඉතාම වැදගත්.

ආබාධිත පුද්ගලයන් වෙනුවෙන් රුපියල් 3,000ක මාසික දීමනාවක් ලබා දීමට යෝජනා කර තිබෙනවා. අසරණ වැඩිහිටි අයට ලබා දෙන දීමනාව රුපියල් 300කින් වැඩි කර තිබෙනවා. වෙනත් විවිධ හේතු මත අසරණ වූ අයට ලබා දෙන මහ ජන ආධාරය -අපි මෙතෙක් ලබා දුන් රුපියල් 100, 200 වාගේ මුදල - රුපියල් 500 දක්වා වැඩි කිරීමටත් කටයුතු කර තිබෙනවා. අඩු

[ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය]

ආදායම්ලාභී පවුල් සඳහා ලබා දුන් රුපියල් 650 සමෘද්ධි දීමනාව රුපියල් 750 දක්වා රුපියල් සියයකින් වැඩි කිරීමට කටයුතු කර තිබෙනවා.

කාන්තා හා ළමා සෞඛ්‍ය යටතේ අඩු ආදායම්ලාභී පවුල්වල මවුවරුන් සහ ළමුන් වෙනුවෙන් පෝෂණ වැඩසටහන් සහ අධ්‍යාපනික වැඩසටහන් සඳහා දැනට වෙන් කර ඇති මුදලට අමතරව රුපියල් මිලියන 3,000ක් වෙන් කර තිබෙනවා. අති දුෂ්කර ගම්මාන සංවර්ධනය, ආගමික ස්ථාන සංවර්ධනයට සහ පාසල්, මාතෘ සායන, පානීය ජලය, මාර්ග වැනි මූලික පහසුකම් ලබා දීමට රුපියල් මිලියන 300ක් වෙන් කර තිබෙනවා. කලාකරුවන්ගේ සහ ජන මාධ්‍යවේදීන්ගේ - විශේෂයෙන්ම වයෝවෘද්ධ අය වෙනුවෙන් - සේවය අගයීම සඳහාත් විශේෂ අරමුදලක් පිහිටු වීමට කටයුතු කර තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 50ක් වෙන් කර තිබෙනවා. කලාකරුවන් සඳහා වාහන මිල දී ගැනීමට ලක්ෂ 12ක පොලී රහිත ණය මුදලක් ලබා දීමටත් යෝජනා කර තිබෙනවා. ඒක ඒ අයට කරන ලොකු ගෞරවයක් හැටියටයි අපි දකින්නේ.

"පුර නැඟුම" කේන්ද්‍ර කර ගත් සංවර්ධන වැඩ පිළිවෙළ ශක්තිමත් කිරීම සඳහා පළාත් බල ප්‍රදේශවල සහ විශේෂයෙන්ම මධ්‍යම රජයේ වැඩ පිළිවෙළ ඉතාම සාර්ථකව ක්‍රියාත්මක වනවා. ඒ සඳහා මේ වන කොටත් අතිගරු ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය, අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වී කටයුතු කරන අතර, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් අද සියලුම නගර සංවර්ධනය සඳහා ඉතාමත්ම කැප වීමෙන් කටයුතු කරනවා. ඉතාමත්ම අලංකාර නගර නිර්මාණය කිරීම සඳහාත්, නගර සකස් කිරීම සඳහාත් මේ වන කොට කටයුතු කරමින් පවතිනවා. වෙනදා අපි බැලූ බැලූ තැන්වල -නගරාසන්න ප්‍රදේශවලත්, පුංචි නගරවලත්- කුණු ගොඩවල් එකතු වෙලා තිබුණා. අද මේ වන කොට ඒ සියලුම කුණු ගොඩවල් ඉවත් වෙලා, ඉතාමත්ම අලංකාර ලස්සන නගර බවට පත් වෙමින් තිබෙනවා. ඒ තමයි අපේ රට ආසියාවේ ආශ්චර්ය බවට පත් කරන පෙරනිමිති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ බැසිල් රාජපක්ෂ මැතිතුමන් මේ වන කොට දිවයින පුරාම සෑම දිස්ත්‍රික්කයකටම ගිහිල්ලා, දිස්ත්‍රික් සංවර්ධන රැස්වීම්වලට සහභාගි වෙමින්, මාර්ග පහසුකම්, පානීය ජල පහසුකම් ලබා දීම, පාසල් පද්ධතිවල දරුවන් වෙනුවෙන් සනීපාරක්ෂක ව්‍යාපෘති ඇති කිරීම වැනි දේවල් සඳහා විශාල මුදලක් ලබා දීලා තිබෙනවා. මේ වන කොට දිවයින පුරාම යමින් එතුමා ඒ කටයුතු කරනවා.

ඉතින් මේවා ගත්තාම අපේ රටේ වේගවත් සංවර්ධනයක් ඇති වෙමින් පවතින බව කියන්නට පුළුවන්. විශේෂයෙන් ඊයේ දවස වන කොට අපේ රටේ කොට්ටාව සිට ගාල්ල දක්වා අධිවේගී මාර්ගය විවෘත කළා, ඒක කවුරුත් දැක බලා ගන්නට ඇති. එවැනි අධිවේගී මාර්ග විශාල ප්‍රමාණයක් ඇති කරන්නට කටයුතු කර තිබෙනවා. ඊළඟට මාතර දක්වාත්, මඩකලපුව දක්වාත්, මහනුවර දක්වාත් අධිවේගී මාර්ග සංවර්ධනය වනකොට අපේ රටේ ආර්ථික ප්‍රශ්න ඇතුළු රැකී රක්ෂා ප්‍රශ්නත් බොහෝ දුරට විසඳා ගන්නට පුළුවන්කම ලැබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, දැන් අවසන් කරන්න.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
මේ ආකාරයට කටයුතු කරමින් ඉදිරිපත් කර තිබෙන මේ අය වැය ඉතාමත්ම සාර්ථක -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමියනි, කරුණාකර කථාව අවසන් කරන්න. අනෙකුත් මන්ත්‍රීතුමන්ලාගේ වෙලාව අඩු වෙනවා. ඒක අසාධාරණයක්.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
මේ වන කොට අපේ රටේ තිබුණු හුඟාක් ප්‍රශ්න මඟ හරවමින් සාර්ථක අය වැයක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම පිළිබඳවත්, ජනතාවට සහන රාශියක් ලබා දෙන අය වැයක් ඉදිරිපත් කිරීම පිළිබඳවත්, අතිගරු ජනාධිපතිතුමාටත්, ඒ වාගේම මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රධාන නිලධාරින්ටත් ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරුතර අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ. ඔබ වහන්සේට විනාඩි දහයක් වෙන් කර තිබෙනවා.

[අ. භා. 3.31]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 වර්ෂයේ අය වැය වෙනුවෙන් අදහස් කිහිපයක් දක්වන්නට මා බලාපොරොත්තු වනවා. මෙවර ප්‍රධාන වශයෙන්ම මහ ජන සුබසාධනය ඉලක්ක කර ගත් අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම මේ අය වැයේ දී මෙන්න මේ කාරණය නිශ්චිතවම රටේ ජාතික ආර්ථිකයට හානිකරයි කියලා, මෙන්න මේක විනාශකාරියි කියලා කිසි කෙනෙක් නිශ්චිතව පැහැදිලි කළේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ ඇතුළු විරුද්ධ පක්ෂයේ විවිධ අය අදහස් උදහස් ඉදිරිපත් කරනවා මා අහගෙන සිටියා. එවැනි නිශ්චිත පැහැදිලි කිරීමක් කළේ නැහැ.

මෙවර අය වැය පිළිබඳව අපි කථා කරද්දී, මා මූලික අවධානය කරුණු කිහිපයක් කෙරෙහි යොමු කරවන්නට කැමැතියි. අපි දන්නවා, මේ මොහොත වන විට සමස්ත ලෝක ආර්ථිකයේම විශේෂ ප්‍රවණතා රාශියක් ඇති වෙලා තිබෙන බව. ග්‍රීසිය ප්‍රමුඛ කර ගත් යුරෝපා වළල්ලේ ඇති වෙලා තිබෙන ආර්ථික අවපාතය අපි හැම දෙනාම කියවා හොඳින් දන්නා කාරණයක්. ඒ වාගේම එක්සත් ජනපදය අද අය වැය පරතරය පියවීම සඳහා චීනයෙන් මුදල් ලබා ගන්නා තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේක ගෝලීය ආර්ථිකයේ අලුත් පැතිකඩක්. එක පැත්තකින් ආසියාවට ලෝකයේ ප්‍රාග්ධනය මාරු වීම සනිටුහන් වන අතරේ, පැරණි ඒකාධිකාරී ප්‍රාග්ධන සංචිත හිමි කර ගෙන හිටපු එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර රටවල් යම් කිසි අර්බුදයකට පාත්‍ර වෙලා තිබෙනවා. නමුත් මේ ප්‍රශ්නය දිහා අපි බලන්නේ, ඒක පාර්ශ්විකව මෙය එක්සත් ජනපදයේ හෝ චීනයේ හෝ ප්‍රශ්නයක් හැටියට නොවෙයි.

විශේෂයෙන් මෙවර අය වැයේදී අපි කල්පනා කරන්නේ, අපේ රටේ අවධානය යොමු කළ යුතු ප්‍රධාන කාරණා තුනක් පිළිබඳවයි. එකක් තමයි, අපේ රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කර ගන්නේ කොයි ආකාරයෙන්ද කියන එක. අය වැයක තිබෙන ඉතාම ප්‍රමුඛ ලක්ෂණය රටේ මහ ජනයාගේ මූලික අවශ්‍යතාවක් වන ආහාර සුරක්ෂිතතාව ඇති කර ගැනීම පිළිබඳ අපේ ඉලක්කය කුමක්ද කියන එකයි. දෙවන එක තමයි, විදේශ ප්‍රාග්ධනයෙන්, විදේශ ණයවලින් අපි ස්වාධීන, ස්වායත්ත තත්ත්වයට පත් වන්නේ කොහොමද කියන එකයි. ඒ වාගේම තුන්වනුව තමයි, අපේ බලශක්ති විභවයන් පවත්වා ගෙන යන්නේ කොයි විධියටද කියන එකයි. මෙන්න මේ කරුණු තුන රටේ ආර්ථිකයේදී ඉතා වැදගත් වනවා.

දේශපාලනය, ආර්ථිකය හා යුද හමුදාව කියන මූල ධර්ම තුන මත තමයි යම් කිසි රටක රාජ්‍යයක් පවතින්නේ. හැබැයි දේශපාලනය කියන කාරණයේදී වැදගත් වනවා, ඒ රාජ්‍ය තුළ තිබෙන, රාජ්‍යයක් පවතින්න අවශ්‍ය කරන මතවාදිමය ශක්තිය, ඒ රාජ්‍ය පිළිබඳ ජනතාවගේ කැමැත්ත හා මතවාදී පෞරුෂය අපි කොයි තරම් පවත්වා ගෙන යනවාද කියන එක. මා හිතන හැටියට අද රටේ සුවිශාල ආර්ථික අර්බුදයක්, සුවිශාල උද්ධමනයක් තිබෙන බව කාටවත් පෙන්වන්න පුළුවන්කමක් නැහැ. ලෝක ආර්ථික ප්‍රවණතා ඉදිරියේදී ඉලක්කම්වලින් අපට පෙන්වන්න පුළුවන් වෙලා තිබෙනවා, පසු ගිය අවුරුදු තුන ඇතුළත අපි එක්තරා දුරකට ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගෙන ගිය බවත්, 2014 දක්වා අපට සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගෙන යන්න හැකියාව තිබෙන බවත්.

අනික් අවශේෂ කාරණා පිළිබඳව ලෝකයත් එක්ක සංසන්දනය කර බලන කොට අපේ රටේ ආහාර සුරක්ෂිතතාව පිළිබඳව සඳහන් කරන්න ඕනෑ. අපි මෙවර අය වැයෙන් පොහොර සහනාධාරය පිළිබඳව වැඩසටහනක් ඉදිරිපත් කරලා තිබෙනවා. විපක්ෂය යම් යම් විවේචන ඉදිරිපත් කළත් මා හිතන හැටියට විපක්ෂයේ ඉල්ලීම වන්නේ, කෙසේ හෝ පොහොර සහනාධාරය දෙන්න කියන එකයි. අපේ ඉල්ලීමේදී පොහොර සහනාධාරය සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් කරුණු කිහිපයක් තිබෙනවා. මා කැමැති නැහැ, ඉලක්කම් ඉදිරිපත් කරන්න ගිහින් මගේ ඉතා සුළු කාලය නාස්ති කරන්න. පොහොර සහනාධාරය සඳහා රුපියල් බිලියන 50ක් වාගේ විශාල මුදලක් වෙන් කරන කොට පොහොර සහනාධාරය දෙන්නේ කොයි විධියටද, ඒකේ ප්‍රතිලාභය කොපමණද කියන එක අපි සාකච්ඡාවට භාජනය කරන්න ඕනෑ. එහිදී විශේෂයෙන්ම අද ලෝකයේ ආර්ථික ස්වෛරීත්වය ගොඩ නඟා ගැනීම සඳහා කෘෂි කර්මාන්තය නිර්ණය වෙලා තිබෙන්නේ මොන විධියටද කියන එක පිළිබඳව බලන්න ඕනෑ.

උදාහරණයක් වශයෙන්, අද අපි පාවිච්චි කරන කෘමි නාශක, වල් නාශක හා දිලීර නාශක එනම් කෘෂි යෙදවුම් විශාල වශයෙන් ඉහළ ගිහින් තිබෙනවා. ඒ වාගේම එහි ප්‍රධාන සාධකය වන පොහොර යෙදවීමත් අතිවිශාල වශයෙන් ඉහළ ගිහින් තිබෙනවා. මේවා එකක්වත් අපේ රටේ නිෂ්පාදනය කරන්නේ නැහැ. කෘමි නාශක හා බොහෝ කෘෂි යෙදවුම් අපි විදේශ රටවලින් ගෙන්වා ගන්නවා. විශේෂයෙන් අපි බහුලව යොදන යූරියා -ගොවීන්ට අපි අද ලබා දෙන සහනාධාරය- තෙල් නිෂ්පාදනයේ අතුරු නිෂ්පාදනයක් හැටියට තමයි ලබා ගන්නේ. එතකොට මේ පොහොර ලබා ගැනීමේදී, පොළොවට මේ පොහොර දැමීමේදී ලෝකය පුරාම ඇති වී තිබෙන කතිකාවතක් තිබෙනවා. විපක්ෂය විසින් මේ ප්‍රශ්නය පිළිබඳ කිසිම සාකච්ඡාවක් මතු කළේ නැහැ. මා හිතන හැටියට මෙවර අය වැය තුළින් අපේ කෘෂි කර්මාන්තය යන දිශානතිය දිහා බැලුවාම පොහොර සහනාධාරය දිහා අපි බලන්නේ ඊට වඩා වෙනස් ආකාරයකින්. පොහොර සහනාධාරය දිය යුතුයි. නමුත් අපට අවුරුදු තුනක හෝ පහක සැලැස්මක් තිබිය යුතුයි, අපේ රටේ ගොවි ජනතාව පොහොර භාවිතයෙන් තොරව ගොවිතැන් කරන්නේ කොහොමද කියන එක පිළිබඳව. ඒ කියන්නේ තිරසාර ගොවිතැන පිළිබඳ දර්ශනයක් අපි තුළින් ඉදිරිපත් විය යුතුයි.

ජාතික හෙළ උරුමය හැටියට අපි මේ අය වැය තුළින් දකින මුදල් වෙන් කිරීම්වල අඩු වීම් පිළිබඳව මා ඉලක්කම්වලින් කියන්න යන්නේ නැහැ, මෙන්න මේක අඩු වෙලායි, මේක අඩු වෙලායි කියලා. නමුත් සමස්තයක් හැටියට ගත්තාම මේ අය වැය තුළින් විශාල දර්ශනයක් ඉදිරිපත් නොවුණාට යම් කිසි ස්ථායිතාවක් පවත්වා ගෙන යන්න හැකි වෙලා තිබෙනවා. අපට එය ඒ ආකාරයෙන් පවත්වා ගෙන යන්න පුළුවන් වුණේ, විශේෂයෙන්ම ත්‍රස්තවාදයෙන් පස්සේ රට ඇතුළේ ස්වාභාවික සාමකාමී සමාජ වාතාවරණයක් නිර්මාණය වීම නිසායි. ඒක තමයි අපි ලබා ගත් විශාලම ජයග්‍රහණය. නමුත් එතැනින් එහාට ගිහින්, අර මා මුලින් කියපු කාරණා තුන සාක්ෂාත් කර ගැනීමේදී, අපි කවුරුත් නිතර කථා කරන ලෝක ආර්ථික අර්බුදය ඉදිරියේ අප කොතරම් කාර්යක්ෂමව, එහෙම නැත්නම් යම් කිසි පදනමක් මත ඉදිරියට යනවාද කියන ගැටලුව තිබෙනවා. ඒ ගැන විශාල සාකච්ඡා තිබෙනවා. හැබැයි කොතරම් සාකච්ඡා තිබුණත් මේ ප්‍රශ්නයේ ඇතුළත කුමක්ද කියන එක පිළිබඳව විග්‍රහයක් නැහැ. ඉලක්කම්වලින් අප කවුරුත් කථා කරනවා. මොකක්ද මේකේ ඇතුළ? අප මේක දකින්නේ අද ලෝකයේ පවතින බලශක්ති අර්බුදයේ කොටසක් හැටියටයි. බලශක්ති අර්බුදය කියන්නේ අද ලෝකයේ සුපිරිය කියන රටවල්වල - සාමාන්‍යයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය වාගේ රටවල්වල- ඒක පුද්ගල කාබන් පිට කිරීම -$Co_2$ කාබන් ඩයොක්සයිඩ් වායුව පිට කිරීම- කිලෝග්‍රෑම් 16,000කට වඩා වෙනවා. ලංකාව වාගේ රටක අපේ කාබන් emission එක -කාබන් පිට කිරීම- කිලෝග්‍රෑම් 600කයි පවතින්නේ. ඉන්දියාවේ කාබන් ඩයොක්සයිඩ් පිට කිරීම කිලෝග්‍රෑම් 1,500ක් වෙනවා. චීනය ඊට ටිකක් වැඩියෙන් පවත්වා ගෙන යනවා. සාමාන්‍යයෙන් දෙදාහකට අඩුවෙනුයි පවත්වාගෙන යන්න ඕනෑ. නමුත් අපේ සීමාව ඕනෑවටත් වඩා ඉක්ම ගිහින් තිබෙනවා. ඒ කියන්නේ මේකේ ප්‍රතිඵලයක් හැටියට දැවැන්ත කාලගුණ විපර්යාසයක්, බලශක්ති අර්බුදයක්, බලශක්ති ක්ෂය වීමක්, ඒ වාගේම ලැව්ගිනි පැතිරීම්, ගංවතුර, නාය යාම්, කුණාටු, සුළි සුළං -ස්වාභාවිකවම නොවෙයි- මිනිහා සීමාව ඉක්මවා අද ලෝකයේ පිට කරන කාබන් ඩයොක්සයිඩ් නිසා ඇති වී තිබෙන බව කවුරුත් දන්නා දෙයක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබ වහන්සේට තව විනාඩියක් තිබෙනවා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
විනාඩියකින් කථාව අවසාන කරන්න හුඟාක් අමාරුයි. මට විනාඩි දෙකක් දෙන්නට පුළුවන් ද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එතකොට අනෙක් මැති ඇමතිවරුන්ට කථා කරන්නට තිබෙන කාලය කැපෙනවා, ස්වාමීන් වහන්ස.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
එම නිසා මෙවර බලශක්ති ක්ෂේත්‍රයේදී තරගකාරීව අප ගල් අඟුරු මත යනවාද? එනම්, වෙනත් විකල්ප බලශක්ති විභවයන් කරා අපේ අවධානය යොමු කර තිබෙනවාද කියා අප බලන්න ඕනෑ. විකල්ප බලශක්ති විභවයන් සම්බන්ධයෙන් මෙවර අය

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

වැයේදී යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒවා අය වැයේදී ඉදිරිපත් කළා වාගේම ඒවා සාර්ථක කර ගැනීම සඳහා අපට ඉදිරියේදී වැඩ පිළිවෙළක් අවශ්‍ය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපගේ අය වැය පරතරය පියවා ගැනීමේදී ප්‍රශ්නය තිබෙන්නේ මෙයයි. රට ඇතුළට ගෙන්වන ආහාරවලට වැඩි මුදල් ප්‍රමාණයක් වැය වීමයි. මෙවර යම් යම් භාණ්ඩවලට බදු වැඩි කර එයින් යම් කිසි පාලනයක් කරන්නට බලාපොරොත්තු වෙනවා. සාපේක්ෂ වශයෙන් අප අද විදේශ රටවලින් ලූනු ගෙන්වනවා; කරවල ගෙන්වනවා; සැමන් ටින් ගෙන්වනවා. මේ සියල්ල පාලනය කර අපට අනවශ්‍ය භාණ්ඩ ගෙන්වූවාම, -වාහන අපේ රටට ගෙන්වා ගත යුතු දෙයක්. අපේ ප්‍රධාන දෙය අප ලබා ගන්නා විදේශ මුදල් සංචිතය. එනම්, තේ පිටරට යැවීම අපේ ප්‍රධාන වශයෙන් මුදල් ලබා ගැනීමේ ක්‍රමයක්. ඒ වාගේම විදේශවලට මනුෂ්‍ය ශ්‍රමය යැවීමෙන් අප විදේශීය වත්කම් ලබා ගන්නවා. මේ සියල්ලටම වඩා අප අද විදේශයෙන් ගෙන්වා ගන්නා බඩුවලට අපෙන් වැය වන මුදල වැඩි වී තිබෙනවා. විශේෂයෙන් අපට විශාල මුදල් ප්‍රමාණයක් වැය වන්නේ ඉන්ධන පරිභෝජනය සඳහායි. පසු ගිය කාලවල අපට ජලය හිඟ වීම නිසා සුවිශාල වශයෙන් අපට ඉන්ධන පරිභෝජනයට ගන්න සිද්ධ වුණා. ඒ කියන්නේ, අපේ බලශක්ති උත්පාදනය විශාල වශයෙන් ඩීසල් බලාගාර මත කරන්න වුණා. එය සියයට 80ක් පමණ පසු ගිය කාලයේ ඉහළ ගියා. එම නිසා ඉදිරි කාලය තුළ අපේ රටේ ස්ථායිතාව වෙනුවෙන් අප බල ශක්තිය යොදා ගන්නේ කොයි විධියට ද, අපේ රටේ ආර්ථික සුරක්ෂිතතාව අප ඇති කරන්නේ කොහොමද, අපේ ගොවිතැන පරාධීන නොවී ස්වායත්තව ගෙන යන්නේ කොහොමද කියන කාරණා කෙරෙහි අපේ අවධානය යොමු කළ යුතුය කියායි අප කල්පනා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැය ලේඛනයේ මූලික අංග ලක්ෂණ පිළිබඳව මේ ගරු සභාවේ සාකච්ඡා වුණත්, අපේ රට ලෝක අර්ථිකයේ ප්‍රවණතා එක්ක, විශේෂයෙන්ම ඇතිවෙලා තිබෙන බලශක්ති අර්බුදයත් එක්ක අප ආර්ථිකය ගෙන යන්නේ කොහොමද කියන එක පිළිබඳව සාකච්ඡා වන්නේ නැහැ. ඒ සම්බන්ධව අපට වැඩ පිළිවෙළක් නැහැ. අප හා සමාන්තරව ඒකපුද්ගල ආදායමක් තිබෙන රටවල මිනිසුන්ගේ ආයු කාලයට වඩා අපේ රටේ මිනිසුන්ගේ ආයු කාලය වැඩියි. වයස 74ක් පමණ වෙනවා. ඒ වාගේම අපේ රටේ සාක්ෂරතාව සියයට අනුව ඉක්මවා තිබෙනවා. ඒ වාගේම සෞඛ්‍යය හා අධ්‍යාපනය අතින් අප දකුණු ආසියානු කලාපයේ ඉදිරියෙන්ම සිටින රට බවට පත් වී තිබෙනවා. මේවා අප මානව දර්ශක විධියට ගත්තාම අප හුඟාක් ඉහළින් ඉන්නවා. ලෝකයේ මිනිහෙක් ජීවත් වන කාලය පමණක් නොවෙයි. දැන් අලුතින් සතුටු දර්ශකය -Happy Index - අරගෙන තිබෙනවා. ඒවා අරගෙන බැලුවත් ලෝකයේ අනෙක් රටවලට වඩා අප ඉදිරියෙන් ඉන්නවා.

එම නිසා අපේ රට කාලකණ්ණි නරක තත්ත්වයක ඉන්න රටක් නොවෙයි. මේ රට යම් කිසි යහපත් තත්ත්වයකට ගොඩ නඟා ගත හැකි තත්ත්වයකයි තිබෙන්නේ. එම නිසා මේ සභා ගර්භය තුළ මේ කරන සාකච්ඡාවලින් අප කොහොම ද අපේ රට හරි තැනකට ගෙනයන්නේ කියන ප්‍රතිපත්තිය අප සාකච්ඡා කරන්නට ඕනෑ. අන්න ඒකෙදී කෘෂි නාශක, වස විෂෙන් තොරව අප ගොවිතැන් කරන්නේ කොහොමද, පොහොර භාවිතාව අඩු කර විකල්ප කෘෂි යෙදවුම් කරා අප ගමන් කරන්නේ කොහොමද කියන එක සාකච්ඡා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඉදිරියේදී අපට ඇති වන්නට තිබෙන බීජ ආක්‍රමණය ගැන සාකච්ඡා කරන්න ඕනෑ. අද අපේ රටේ සම්පූර්ණ බීජ ගොවිපළවල් බහුජාතික සමාගම් පාලනය කරන තත්ත්වයකට පත් වී තිබෙනවා. මේක අනාගතයේ අපේ මුළු ජීවිතයම පාලනය කරන තත්ත්වයට පත් වෙන්න පුළුවන්. මේකෙන් අපට ගැලවෙන්නට තිබෙන උපාය මාර්ගය මොකක්ද? මේ පිළිබඳ සාකච්ඡා මේ සභා ගර්භයේ වෙනවාද? අන්න ඒවායි මම දකින්නේ, මේ අය වැය තුළින් අප සභා ගර්භය තුළ සාකච්ඡා කළ යුතු මූලික කාරණා හැටියට. අද අපේ හුඟක් බීජ ගොවිපළවල් බහු ජාතික සමාගම් පාලනය කරන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ස්වාමීන් වහන්ස, වේලාව අවසානයි.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
එම නිසා අපේ රටේ ස්වයංපෝෂිතභාවය ගොඩ නඟන ආර්ථිකයක් පිළිබඳව මේ සභා ගර්භයේ මීට වඩා සාකච්ඡාවක් ඇති විය යුතුය කියා අප කල්පනා කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.43]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය දෙවැනි වර කියවීමේ විවාදයට අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මුලින්ම මගේ ස්තුතිය පුද කරනවා. ඒ එක්කම මාතර දිස්ත්‍රික්කයේ වූ ස්වාභාවික ව්‍යසනයෙන් ජීවිත හානි වුණු, අතුරුදන් වුණු, තුවාල වුණු හා අවතැන් වුණු සියලු දෙනාටම මගේ කනගාටුව ප්‍රකාශ කරන්නත් මෙය අවස්ථාවක් කර ගන්නවා.

2012 අය වැය ගැන කථා කරන කොට මුලින්ම මේ අය වැය සකස් කරපු ක්‍රමවේදය පිළිබඳව මගේ ප්‍රශංසාව පුද කරන්න ඕනෑ. මොකද, මේ අය වැය ඉතාම පුළුල් පදනමක් යටතේ තමයි සකස් වෙලා තිබෙන නිසා. සමාජයේ විවිධ කණ්ඩායම්, වෘත්තීය සමිති, මහ ජන නියෝජිතයෝ, ඉහළ රාජ්‍ය නිලධාරීන් හා පෞද්ගලික අංශය ඇතුළු සාමාජික කණ්ඩායම් 2,718ක් සමඟ රැස්වීම් වාර 56ක් පවත්වලා අදහස් එකතු කර ගෙන සකසපු අය වැයක් තමයි මේ. ඒ නිසා මෙය සැබැවින්ම හොඳ ජනතා නියෝජනයක් තිබෙන, හැම ජන කොටසකටම, හැම කණ්ඩායමකටම සහන සලසන අය වැයක් හැටියට අපි දකිනවා. ඒ නිසා එය ඉතාම ප්‍රශංසනීය බව මතක් කරන්න ඕනෑ. ඒ පිළිබඳව මගේ ස්තුතිය මුදල් අමාත්‍යතුමා හැටියට අතිගරු ජනාධිපතිතුමාටත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ නිලධාරි මණ්ඩලයටත් පුද කරන්න ඕනෑ. මේක තමයි රටක් සංවර්ධනය වෙනවා කියන්නේ. අපි දකිනවා සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් අද වාර්තා වෙලා තිබෙන බව. ඒ වාගේම දිළිඳුකම සියයට 15.6 සිට සියයට 8.9 දක්වා අඩු වෙලා තිබෙනවා. 2010 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8ක් තිබුණු අය වැය හිඟය 2011 වන කොට සියයට 6.8 දක්වා අඩු වෙලා තිබෙනවා. මේක ඉතාම සංතෝෂයට කාරණාවක්. මේ රටේ තිබිච්ච යුද්ධය අවසන් කිරීමත්, ඒ වාගේම රටේ තිබෙන නිවැරදි ආර්ථික ප්‍රතිපත්තියත් නිසා තමයි මේ වාගේ සංවර්ධනයක් අපි ළඟා කර ගෙන තිබෙන්නේ කියන එක මෙහිදී මතක් කරන්න ඕනෑ.

අද යුද්ධය අවසන් වෙලා තිබෙනවා. ත්‍රස්තවාදීන් විසින් ඇත් කරලා හිටපු ඒ ජන කොටස්වලට, උතුර සහ නැඟෙනහිරට අද ලොකු සංවර්ධනයක් වන බව අපි දකිනවා. විශේෂයෙන්ම ප්‍රධාන

මාර්ග පද්ධතිවල දුෂ්කරතා තිබුණා. පාලම් කැඩිලා, දුම්රිය මාර්ග කැඩිලා ගමනාගමන දුෂ්කරතා තිබුණා. විදුලිය නොමැති ප්‍රදේශ විශාල වශයෙන් තිබුණා. රෝහල්වල අඩු පාඩු තිබුණා. පාසල්වල අඩු පාඩු තිබුණා. අද ඒ සියල්ලම දැවැන්ත ලෙස සංවර්ධනය වෙලා තිබෙන බව දැකීමත් සතුටට කරුණක්. මේ සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 4,000ක් වැය කරලා තිබෙන බවත් අපි දකිනවා. මීට මාසයකට කලින් මට මඩකළපුව ප්‍රදේශයේ සංචාරය කිරීමට අවස්ථාවක් ලැබුණා. 2002 වසරට පසු, -අවුරුදු 9කට පස්සේ- දැවැන්ත සංවර්ධනයක් ඒ පළාතේ සිදු වන බව අපි දැක්කා. අද ඒ ප්‍රදේශවල හෝටල් කර්මාන්තයේ ලොකු දියුණුවක් අපි දකිනවා. ඒ සියල්ලටම ප්‍රධානම සාධකය හැටියට අපි දකින්නේ යුද්ධය නිමා වීමයි. ඒ නිසා මේ වෙලාවේදී යුද්ධය නිමා කිරීමට දේශපාලන නායකත්වය දීපු අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ, ආරක්ෂක ලේකම්තුමා සහ සියලුම රණ විරුවන්ට මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ.

රජය ඉදිරිය ගැන හිතලා දෙමළ, සිංහල ද්වි භාෂා ඉගැන්වීම සඳහා අතිරේකව රුපියල් මිලියන 125ක් වෙන් වෙලා කරලා තිබෙනවා. දීර්ඝ කාලීනව ජනතාව අතර සහයෝගීතාව ඇති කර ගැනීම සඳහා මෙය ඉතාම අවශ්‍ය දෙයක් බවට අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය විවාදය කරන අවස්ථාවේදී විපක්ෂයෙන් චෝදනාවක් ගෙනාවා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට වැඩි පුර ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා කියලා. නමුත් 2011ට සාපේක්ෂව ප්‍රතිශතයක් හැටියට ගත්තාම, 2011 සියයට 19.9ක් තිබුණු ඒ ප්‍රතිපාදන මෙවර සියයට 14.9 දක්වා අඩු වෙලා තිබෙනවා. යුද්ධයක් ඉවර වුණා කියලා වෙන් කරන ප්‍රතිපාදන අඩු කරන්න බැහැ. යුද්ධය සඳහා රණ විරුවෝ ලක්ෂ 3කට වඩා වැඩි ප්‍රමාණයක් සම්බන්ධ වුණා. යුද්ධය ඉවර වුණා කියලා ඔවුන් ගෙවල්වලට යවන්න බැහැ. ඔවුන්ට පඩි ගෙවිය යුතුයි. ඔවුන්ගේ සුබසාධන කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න ඕනෑ.විශේෂයෙන් ආබාධිත රණ විරුවන්ගේ සුබසාධනය බලන්න ඕනෑ. ඒ නිසා යුද්ධයක් අවසන් වුණා කියලා එක පාරට ඒ වියදම් අඩු කරන්න බැහැ. සිංගප්පූරුව වාගේ කිසිම ත්‍රස්තවාදයක් නැති, කිසිම තර්ජනයක් නැති රටේ පවා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 3 සහ 5 අතර ප්‍රමාණයක් ආරක්ෂක අමාත්‍යාංශයට වෙන් වෙනවා. ඒ නිසා මෙය ඉතාම අවශ්‍ය බව තමයි අපට පෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි යුද්ධය අවසන් වීම නිසා අපි අද සංචාරක ව්‍යාපාරයේ දැවැන්ත දියුණුවක් දකිනවා. 2010ට සාපේක්ෂව මේ වන කොට සංචාරක ව්‍යාපාරය සියයට 34.3කින් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ආදායම සියයට 46.1කින් වැඩි වෙලා තිබෙනවා. 2010ට සාපේක්ෂව US Dollars මිලියන 580ක ආදායමක් දැනට ලැබිලා තිබෙනවා. ඒ වාගේම තමයි මෙහි එන සංචාරකයන්ගෙන් කෙනකු වියදම් කරන මුදල් ප්‍රමාණයත් ඩොලර් 88 සිට 97 දක්වා වැඩි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මීගමුව ආශ්‍රිත ප්‍රදේශයේත් සංචාරක කර්මාන්තයේ ලොකු වැටීමක් තිබුණා. නමුත් යුද්ධයෙන් පස්සේ රජයේ නිවැරදි ප්‍රතිපත්ති නිසා සංචාරක කර්මාන්තයේ විශාල පිබිදීමක් ඇති වෙලා.

අද හෝටල් නවීකරණය වෙලා. අද එය විශාල වශයෙන් රැකියා උත්පාදනය කරන කර්මාන්තයක් බවට පත් වෙලා තිබෙනවා. සංචාරක කර්මාන්තයේ දියුණුවත් එක්කම, හෝටල් කර්මාන්තය ආශ්‍රිත සංචාරක මඟ පෙන්වන්නන්, සංචාරක රියැදුරන්, කුලී රථ සේවා සපයන්නන්, ස්වයං රැකියා කරන්නන් ආදි සියලු දෙනාගේ ආර්ථිකයේ යම් කිසි දියුණුවක් ඇති වෙලා තිබෙන බව අපි දැක තිබෙනවා. මේවා තමයි සංවර්ධනය කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අය වැය තුළින් අපේ සමාජයේ ඉන්න දිළිඳු සමෘද්ධි සහනාධාර ලබන අය ගැනත් අවධානය යොමු වෙලා තිබෙනවා. ඔවුන්ට ලැබෙන සමෘද්ධි සහනාධාර වැඩි කරලා තිබෙනවා. ඔවුන්ගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා විශාල වශයෙන් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම උතුර සහ නැඟෙනහිර ප්‍රදේශවල සමෘද්ධි සහනාධාර නොලැබුණු දිළිඳු පවුල්වල අයටත් ඒ සහනාධාර ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම සමෘද්ධි සහනධාර ලබන පවුල් වෙනුවෙන් සේවා සපයන සමෘද්ධි සංවර්ධන නිලධාරින් ද රාජ්‍ය දෙපාර්තමේන්තුවකට අන්තර්ග්‍රහණය කරලා, ඔවුන් සඳහාත් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. අපට මතකයි 2004 එක්සත් ජාතික පක්ෂය බලයේ ඉන්න කොට සමෘද්ධි සංවර්ධන අධිකාරිය අහෝසි කරලා සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ රැකියාවල අස්ථාවර බවක් ඇති කර ගන්න උත්සාහ කළා. නමුත් ඒ වෙනුවට මේ රජය ඔවුන්ට ස්ථාවර බවක් ලබා දීලා විශ්‍රාම වැටුපක් ලබා දීමට කටයුතු කර තිබෙන බව සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩිහිටි සුබසාධනය ගැන කථා කරන්න ඕනෑ. අද ලංකාවේ වැඩිහිටි අයගේ ප්‍රතිශතය වැඩි වෙමින් පවතිනවා. වැඩිහිටියන් කෙරෙහි අද රජය අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන්ම අවුරුදු 70ට වඩා වැඩි වැඩිහිටියන්ට ලබා දෙන රුපියල් 300 දීමනාව රුපියල් 1,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒක ඉතාම හොඳ දෙයක්. වැඩිහිටි වියේ ඉන්න අයට සමහර විට පවුල්වල රැකවරණය ලැබෙන්නේ නැහැ. ඒ නිසා මෙය ඔවුන්ට ඉතාම ලොකු සහනයක් වන බවට අපි විශ්වාස කරනවා. ඒ වාගේම අසරණ අය සඳහා දෙන දීමනාවත් රුපියල් 100 සිට රුපියල් 500 දක්වා වැඩි කිරීම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලංකාව පුරාම මාතෘ සහ ළමා සෞඛ්‍ය පහසුකම් හොඳින් සැපයීම සඳහා ග්‍රාමීය මට්ටමින් ගෘහස්ථ මට්ටමින් දැවැන්ත වැඩ පිළිවෙළක් තිබෙනවා. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් ගෙවල්වලට ගිහිල්ලා ඔවුන්ට අවශ්‍ය සේවාව සපයනවා. 2012 අය වැයේත් ඒ හා සමානව වැඩිහිටි සෞඛ්‍ය පහසුකම් සැපයීම සඳහා ග්‍රාමීය සේවාවක් ස්ථාපනය කිරීමට යෝජනා කර තිබෙනවා. ඒ සඳහා අතිරේකව රුපියල් මිලියන 1,100ක් වෙන් කරලා තිබෙනවා. ඒක ඉතාම සුදුසු හොඳ දෙයක් හැටියට මම දකිනවා. වැඩිහිටි ජන ගහනය වැඩි වෙන කොට ඔවුන් සඳහා සහනාධාර, ඔවුන් සඳහා සෞඛ්‍ය සේවා -විශේෂිත සෞඛ්‍ය සේවා- පහසුකම් ලබා දෙන ක්‍රමවේදයක් ඇති කරන්න ඕනෑ කියන එකත් මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ මම අහ ගෙන හිටියා අපේ ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා කියපු කථාවක්. එතුමා ලෙඩකු බලන්න ගිහිල්ලා. ඒ ලෙඩාට බෙහෙත් තිබුණේ නැති ලු. ඒ නිසා එතුමා රුපියල් 8,000ක් දුන්නා කියන කථාව තමයි කියැවුණේ. නමුත් ඒ පමණින් කියන්න බැහැ රෝහල්වල බෙහෙත් හිඟයක් තිබෙනවා කියලා. සමහර විට අපේ ගෙවල්වල වුණත් හිටපු ගමන් හාල් හිඟ වෙනවා, සීනි හිඟ වෙනවා, අවශ්‍ය කරන ප්‍රමාණය අපි ගිහිල්ලා ගබඩාවෙන් ගත්තේ නැත්නම්. එක්කෝ අපි කඩේට ගිහිල්ලා සල්ලි දීලා ගත්තේ නැත්නම්. ඒ වාගේ ගබඩාවල තිබෙන බෙහෙත් රෝහල්වලට, වාට්ටුවලට හරියට වෙලාවට ලැබුණේ නැත්නම් කලාතුරකින් ඒ විධියේ ගැටලු ඇති වෙනවා. ඒ එක සිද්ධියකින් අපට තීරණය කරන්න බැහැ රටේම බෙහෙත් හිඟයක් තිබෙනවා කියලා. අද එතුමාට සමහර දේවල් අමතක වෙලා.

අද මේ රටේ වකුගඩු බද්ධ කිරීම් කරනවා. ඒ සඳහා රජය විශාල මුදලක් වැය කරනවා. මේ රටේ හෘද රෝගීන් සඳහා බයිපාස් සැත්කම කරනවා. ඒ සඳහා විශාල වශයෙන් රජය මුදල්

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

වැය කරනවා. මුදල් අය කරන්නේ නැහැ. අක්මාව බද්ධ කිරීමේ කටයුතු සාර්ථකව අද ලංකාවේ රෝහල්වල සිද්ධ කරනවා. මේ සඳහා විශාල මුදලක් වැය වෙනවා. අද කිසිම රක්ෂණයක් නැහැ. නොමිලයේයි ඒ සියලුම සේවාවන් ලබා දෙන්නේ. ඒ නිසා මේ ඉඳලා හිටලා දකින අඩු පාඩුවක් නිසා සමස්ත සෞඛ්‍ය ක්ෂේත්‍රයම විවේචනය කිරීම ඉතාමත්ම අසාධාරණ බව මා මේ අවස්ථාවේදී මතක් කරනවා. අද ඉතාමත්ම ගුණාත්මක සේවාවක් සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළින් ලබා දෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ලැබී තිබෙන කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)
විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අය වැය අපි දකින්නේ සියලුම ජන කොටස් ඉලක්ක කර ගනිමින් සකස් කරපු අය වැයක් හැටියටයි. ඒ වාගේම මේ අය වැය මහින්ද චින්තන ඉදිරි දැක්මේ තිබෙන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සකස් කරපු අය වැයක් බව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

[பி. ப. 3.54]

**ගරු සිල්වෙස්ත්‍රි අලාන්ටින් මහතා**
(மாண்புமிகு சில்வேஸ்திரி அலன்றின்)
(The Hon. Silvastrie Alantin)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2012ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்ட விவாதத்தில் கலந்துகொண்டு, எமது நாடும் அரசாங்கமும் கவனத்திற் கொள்ளவேண்டிய விடயங்கள் தொடர்பாக என்னுடைய கருத்துக்களைக் குறிப்பிட விரும்புகிறேன். யுத்தம் முடிந்த பின்னர் சமர்ப்பிக்கப்பட்டுள்ள மூன்றாவது வரவு செலவுத் திட்டம் இதுவாகும். யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்டதன் பின்னர் எமது மக்கள் கௌரவமான, அமைதியான, முன்னேற்றமான நல்வாழ்வு கிடைக்குமென்றே எதிர் பார்த்திருக்கின்றனர். அதேவேளை, நீண்டகால யுத்தத்தினால் களைப்படைந்த மக்களுக்கு அமைதியான புதிய சூழல் மகிழ்ச்சியைத் தந்திருக்கிறது. யுத்தமற்ற ஒரு சூழலை உருவாக்கித் தந்ததற்காக நான் மேதகு ஜனாதிபதி அவர்க ளுக்கும் அதற்காகப் பாடுபட்ட அனைத்துத் தரப்பினருக்கும் என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். ஆனால், மக்களின் வாழ்க்கை பொருளாதார ரீதியிலும் ஏனைய பல விடயங்களிலும் முன்னேற்றமடைய வேண்டியுள்ளது; மக்கள் அதனையே எதிர்பார்க்கிறார்கள். 'மஹிந்த சிந்தனை' அடிப் படையிலான அபிவிருத்திக் கொள்கையை நாம் வரவேற் கிறோம். சுய பொருளாதார நிலைமைகளைக் கவனத்திற் கொள்ளும் இந்த அபிவிருத்தித் திட்டம் குறிப்பிடத்தக்க வெற்றிகளை ஈட்டி வருகின்றது. ஆனால், நாட்டின் எதிர்பார்ப்புகள் இன்னும் பல படிகளில் முன்னேற்றமடைய வேண்டியுள்ளது.

வடக்கு, கிழக்குப் பகுதிகளைப் பொறுத்தவரை அங்கே மேற்கொள்ளப்படவேண்டிய அபிவிருத்திப் பணிகள் அதிகமாக உள்ளன. 'வடக்கின் வசந்தம்', 'கிழக்கின் உதயம்' என்ற சிறப்புத் திட்டங்கள் அரசாங்கத்தினால் மேற்கொள்ளப்பட்டு வருவது குறிப்பிடத்தக்கது. ஆனாலும், அங்கே மக்களை மீள்நிலைக்கு கொண்டுவருவதற்கு மேலும் உதவிகளும் அபிவிருத்தி நடவடிக்கைகளும் அவசியமாகும். நாட்டின் பொதுமைப்படுத்தப்பட்ட திட்டங்கள் வடக்கு, கிழக்குப் பகுதிகளுக்குப் பற்றாக்குறைகளையே ஏற்படுத்தியுள்ளன. வடக்கு, கிழக்கு பகுதிகளுக்கு மேலும் விசேடமான விரைவு படுத்தப்பட்ட திட்டங்கள் அவசியமாகவுள்ளன. மீள்குடியேறிய மக்களது பிரதேசங்களின் கட்டுமானங்கள் தொடக்கம் அவர்களுக்கான அவசியத் தேவைகள் வரையில் இது மேற் கொள்ளப்பட வேண்டியுள்ளது. யுத்தத்துக்குப் பின்னர் இவ்வளவு விரைவில் மீள்குடியேற்றம் சாத்தியப்பட்டமைக்கு நாம் அரசுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கிறோம். ஆனால், மீள்குடியேறிய மக்களுடைய வாழ்க்கையைக் கட்டியெழுப்புவதில் தாமதங்களே ஏற்பட்டுள்ளன. இந்த நிலைமையைச் சீர்செய்வதற்கான ஏற்பாடுகள் அவசியமாக உள்ளன. நாட்டின் அபிவிருத்திக்குப் பங்களிப்பதற்கு வடபகுதி மக்கள் தயாராக இருக்கின்றனர். ஆனால், அவர்களுடைய பங்களிப்புக்கான அடிப்படை வசதிகளை உருவாக்கவேண்டிய தேவை இருக்கிறது.

போரினால் சிதைந்துபோயிருக்கும் சமூகத்தையும் உட்கட்டுமானங்களையும் பொருளாதார அடிப்படைகளையும் மீளுருவாக்கம் செய்யும்போதே இந்த மக்களை முழுமையான அபிவிருத்திக்காக ஊக்கப்படுத்த முடியும். வடக்கிலே போரின் காரணமாகச் செயலிழந்துபோன தொழிற்சாலைகள் மீளமைக் கப்படவில்லை; அவற்றுக்கான ஏற்பாடுகளும் இன்னும் ஆரம்பிக்கப்படவில்லை. இந்தத் தொழிற் சாலைகளை மீளமைப்பதன் மூலமாக ஆயிரக்கணக்கானவர்களுக்கு வேலை வாய்ப்புக்களை வழங்க முடியும். இதேபோல, இந்தப் பிரதேசங்களுக்குப் பொருத்தமான தொழில் மையங்களை இனங்கண்டு அமைக்கவேண்டியு முள்ளது. இதன்மூலம் மேதகு ஜனாதிபதி அவர்களின் சிந்தனைக்கமையச் சமச்சீரான பொருளாதார நிலையைச் சாதகமாக்கலாம். அதேவேளை, தகர்ந்துபோயிருக்கும் பிரதேசப் பொருளாதாரத்தையும் குடும்பப் பொருளாதாரத் தையும் நிவர்த்தி செய்யக்கூடியதாக இருக்கும். இந்த நிலை நாட்டின் பொருளாதார அபிவிருத்தியையும் மேம்படுத்தும்.

அடுத்ததாக, மீன்பிடி, விவசாயம் போன்றவற்றை விருத்தி செய்வதற்கான ஏற்பாடுகளும் அங்கே விசேடமாக முன்னெடுக்கப்பட வேண்டும் என்பதை நான் இங்கே சுட்டிக்காட்ட விரும்புகிறேன். கிளிநொச்சியில் விதை நெல் உற்பத்தி மற்றும் நெற்களஞ்சியம் போன்றவை ஆரம்பிக்கப் பட்டிருப்பது வரவேற்கத்தக்கது. ஆனால் யாழ்ப்பாணம், கிளிநொச்சி ஆகிய மாவட்டங்களின் விவசாய மேம் பாட்டுக்காகச் சிறப்புத் திட்டங்கள் அறிமுகப்படுத்தப்பட வேண்டும். நீண்டகாலமாகவே பல்வேறு தடைகளாலும் நெருக்கடிகளாலும் பாதிக்கப்பட்டவர்கள் வட பகுதி விவசாயிகளாவர். இவர்கள் தற்போது உருவாகியிருக்கும் சூழலில் மீண்டும் நம்பிக்கையுடன் பயிர்ச்செய்கையில் ஈடுபடத் தொடங்கியுள்ளனர். ஆனால், இவர்களுக்கான உதவித் திட்டங்களும் ஆதரவுத் திட்டங்களும் அவசியமாக வுள்ளன. குறிப்பாக, மீள்குடியேறிவரும் பகுதிகளிலுள்ள விவசாயிகள் மீண்டும் விவசாயச் செய்கையில் ஈடுபடுவதற்கு நிலத்தைப் பண்படுத்தவே பெரும் செலவு ஏற்படுகிறது. ஆகவே, விவசாயப் பொருளாதாரத்தைப் பிரதானமாகக் கொண்ட வடக்கு விவசாயிகளுக்கு அரசாங்கம் விசேட உதவித் திட்டங்களை அறிமுகப்படுத்த வேண்டும். குறைந்தபட்சம் இவர்களுக்கு வட்டியில்லாக் கடனையாவது

வழங்குவதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வட பகுதியில் இன்னொரு முக்கிய பொருளாதார நடவடிக்கை மீன்பிடியாகும். இப்போது அங்கே மீன்பிடிப்பதற்கான சூழல் முன்னரைவிடவும் மேம்பட்டுள்ளது. ஆனால், இவர்களுக்கு இந்திய மீனவர்களின் அத்துமீறல்கள், மீன்பிடித் துறைமுக வசதியின்மை போன்ற இரண்டு பிரதான பிரச்சினைகள் இருக்கின்றன. இந்திய மீனவர்களின் அத்துமீறல்களால் நெருக்கடிகள் ஏற்பட்டாலும், எமது மீனவர்கள் மீண்டும் நம்பிக்கையோடு தொழிலில் ஈடுபட்டு வருகின்றனர். சில மீன்பிடித் துறைமுகங்களைக் கட்டுவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டாலும் உரிய வசதிகள் கிடைக்கும் பட்சத்திலேயே அந்தத் தொழிற்றுறையை மேம்படுத்த முடியும். ஆகவே, குறிப்பிட்ட துறைகளுக்கான நிதி ஒதுக்கீட்டையும் அவற்றுக்கான திட்டங்களையும் அரசாங்கம் தன்னுடைய பொருளாதாரத் திட்டங்களில் உட்படுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், மீள்குடியேறவேண்டிய நிலையிலுள்ள ஆயிரக் கணக்கான குடும்பங்கள் இன்னமும் வெளிச்சூழலில்தான் வாழ்கின்றனர். இவர்கள் ஒரு நிலையான பொருளாதாரத் திட்டங்களைக் கொண்டிருக்கவில்லை. நிவாரண உதவிகளை யும் சமுர்த்தித் திட்ட உதவிகளையும் பெறவேண்டிய நிலையிலேயே அவர்கள் இருக்கின்றனர். வரவு செலவுத் திட்டத்தினூடாக மேற்கொள்ளப்படும் அபிவிருத்திப் பணிகளின்மூலம் இந்தப் பிரதேச மக்களின் வாழ்க்கைத்தரம் உயருமானால் அந்த மக்கள் பிறருடைய உதவிகளில் தங்கி யிருக்கும் நிலை மாறிவிடும். அவ்வாறே, பாதிப்புக்குள்ளாகிய ஆயிரக்கணக்கான குடும்பங்கள் வாழ்வாதார உதவிகளை எதிர்பார்த்திருக்கின்றன. இவர்களை மீள்நிலைப்படுத்திச் சமூகத்தில் சமநிலை கொள்ள வைப்பதற்கான ஏற்பாடு களையும் நாம் மேற்கொள்ள வேண்டியுள்ளது. அத்துடன் சமூக நலன் மற்றும் சமூக உதவித் திட்டங்களின்மூலமாக அவர்களுடைய சுய பொருளாதார அடிப்படைகளை உருவாக்க வேண்டியுள்ளது.

இதேவேளை, வடக்குக்கான சில பொதுவான திட்டங்கள் பற்றிக் கவனம் செலுத்தப்பட வேண்டியுள்ளது. முக்கியமாக வீடமைப்பு, சுகாதார வசதிகள், போக்குவரத்து, குடிநீர், வீதி போன்றவற்றைச் சீர்படுத்துவதற்கான உதவித் திட்டங்களே அவை. இந்தத் திட்டங்களுக்கான உதவிகளும் ஒதுக்கீடுகளும் நாட்டின் ஏனைய பகுதிகளை விடவும் அதிகமாக வடக்கு, கிழக்கில் தேவை. ஏனென்றால் வடக்கு, கிழக்குப் பகுதிகளில் தான் இவை அதிகம் பின்தங்கிய நிலையிலும் அதிகப் பாதிப்புக்குள்ளான நிலையிலும் உள்ளன. அடிப்படைக் கட்டமைப்புக்களும் அடிப்படைப் பொருளாதாரமும் தகர்ந்து போன நிலை இந்தப் பகுதிகளுக்கும் இந்தப் பிரதேசங்களில் வாழும் மக்களுக்குமே அதிகமாக உள்ளது. அண்மையில் யாழ். மாவட்ட அரசாங்க அதிபர் வெளிப்படுத்திய தகவல் இங்கே மிக முக்கியமானது. அதாவது, யாழ்ப்பாண மாவட்டத்திலே வறுமைக்கோட்டுக்குக்கீழ் வாழ்கின்ற மக்களின் பொருளாதார நிலை மிக மோசமாக உள்ளது என்றும் அவர்களுடைய அடிப்படைத் தேவைகளான உணவு, உடை போன்றவற்றுக்கே அவர்கள் சிரமப்படுவதாகவும் அவர் சுட்டிக்காட்டியிருந்தார். அதைப்போலவே தொழில் வாய்ப்பு இல்லாத நிலையில் ஆயிரக்கணக்கான இளைஞர்களும் யுவதிகளும் இருக்கின் றார்கள். இந்த நிலை நீடிக்குமானால் சமூகச் சீரழிவுகளும் பாதுகாப்பற்ற ஒரு நிலையும் உருவாகும். அதேவேளை இளைய தலைமுறையின் ஆற்றலையும் அறிவையும் அவர்களுடைய சக்தியையும் இந்த நாடு இழந்துவிடும். ஆகவேதான் இவற்றைச் சீர்படுத்திக் கொள்வதற்கு விசேட திட்டங்களையும் சிறப்பு ஒதுக்கீடுகளையும் மேற்கொள்ள வேண்டுமென்று வலியுறுத்த வேண்டியுள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வடக்கில் வீடமைப்புத் திட்டங்களையும் மக்கள் கூடிய அளவில் எதிர்பார்த்திருக்கின்றனர். இவர்கள் காலங்கடந்த தற்காலிக வீடுகளில் மிகுந்த சிரமங்களின் மத்தியில் வாழ்க்கை நடத்திக்கொண்டிருக்கின்றனர். இந்த அரசாங்கமானது துன்பங்களை நீக்கித் துயரங்களைப் போக்கி நல்லதொரு பொற்காலத்தை உருவாக்கும் என்ற மனப் பதிவை நாம் இந்த மக்களுக்கு ஏற்படுத்த வேண்டும். இன்று மக்கள் இயல்பு நிலையை நோக்கி முன்னேறிக்கொண்டிருக்கின்றனர். இழந்து போன கடந்த காலத்தின் வாழ்வையும் இழந்த வாய்ப்புக் களையும் மீண்டும் பெற்றுக்கொள்ள வேண்டும் என்ற துடிப்புடன் இவர்கள் காத்துக்கொண்டிருக்கின்றனர். சமர்ப்பிக்கப்பட்டிருக்கும் வரவு செலவுத் திட்டத்தில் தமக்கான நன்மை என்னவென்று மக்கள் எதிர்பார்த்திருக்கின்றனர். அரசாங்கத்தின் திட்டங்களிலும் அதனுடைய செயற்பாடு களிலும் தங்களுடைய எதிர்பார்ப்புக்களை வைத்திருப்பது மக்களுடைய இயல்பாகும். ஆகவே, இந்த அடிப்படையில் மக்களை ஆறுதல்படுத்தக்கூடியவாறு, அவர்களுக்கு நம்பிக்கையளிக்கக்கூடியவாறு, அவர்களை மகிழ்ச்சிப்படுத்தக் கூடியவாறு இந்த வரவு செலவுத் திட்டத்தின் ஒதுக்கீடுகள் அமைய வேண்டும்.

இப்பொழுது யாழ்ப்பாணத்திலுள்ள பொது மருத்துவமனை நவீன வசதிகளுடன் புனரமைக்கப்பட்டு வருகின்றது. இந்தத் திட்டத்தை மக்கள் வரவேற்றுள்ளனர். இதேபோல் யாழ்ப் பாணத்துக்கான குடிநீர் விநியோகத் திட்டத்தையும் பாரிய திட்டமாக மேற்கொள்வதற்கு அரசாங்கம் முன்வந்துள்ள தையும் நான் பாராட்டுகின்றேன். ஆனால், நிலத்தடி நீரைச் சேமிப்பதற்கான அடிப்படைகளை யாழ்ப்பாணத்தின் தீவகம், வடமராட்சி கிழக்கு, தென்மராட்சி மற்றும் கிளிநொச்சி மாவட்டத்தின் பல்வேறு பகுதிகளிலும் மேற்கொள்வதற்கு முயற்சி எடுக்க வேண்டும். நிலத்தடி நீர்ச் சேகரிப்பானது குடிநீருக்கு மட்டுமல்ல, பயிர்ச் செய்கைக்கும் அவசியமானது. இந்தத் திட்டங்கள் மேற்கொள்ளப்பட்டு வந்தாலும் இவை மந்த கதியிலேயே நடைபெற்று வருகின்றன; அத்துடன் அவை முழுமையாக நடைபெறவுமில்லை. எனவே, இவற்றுக்கும் உரிய கவனமெடுத்து உரிய ஒதுக்கீட்டைச் செய்ய முன்வர வேண்டும்.

வட பகுதியின் அபிவிருத்திப் பணிகளிலும் மற்றும் மீள் நிர்மாணப் பணிகளிலும் பொருளாதார அபிவிருத்தி அமைச்சே அதிக பங்களிப்பைச் செய்து வருகின்றது. இந்த அமைச்சைத் திறம்பட நிர்வகித்துவரும் மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்கள் அடிக்கடி வட பகுதிக்கு வந்து நிலைமைகளை நேரிலே அவதானித்து அறிந்துகொள்ளக்கூடிய ஒரு நிலையில் உள்ளார். ஆயினும், நாம் அங்கே காணப்படுகின்ற நிலைமை களின் தன்மையை இங்கே எடுத்துரைப்பதன் மூலமாக அவற்றை மற்றவர்களும் மேலும் புரிந்து கொள்ளக்கூடியதாக இருக்கும்.

இன்று உள்நாட்டிலும் சர்வதேச அரங்கிலும் உள்ள சில சக்திகள் இலங்கையில் நெருக்கடிகளை அதிகமாக்கவே விரும்புகின்றனர். இதனை நாம் அனைவரும் ஒன்றிணைந்து முறியடிப்போம்! இதற்கு நாம் ஒருங்கிணைந்த பொருளாதார, சமூக, அரசியல் செயற்பாட்டை மேற்கொள்ள வேண்டும். அதற்கான அடிப்படைகளை நோக்கிய என்னுடைய எண்ணங்களை இங்கே வெளிப்படுத்தியிருக்கின்றேன். மக்களின் எதிர்பார்ப்புக்களை நிறைவேற்றுவதில்தான்

[ගරු සිල්වෙස්ත්‍රි අලන්ටින් මහතා]

நல்லாட்சியின் மகிமை தங்கியிருக்கின்றது. எமது மக்கள் அரசியல் தீர்வுக்காகவும் அபிவிருத்திக்காகவும் இந்த அரசாங்கத்தின்மீது நம்பிக்கை வைத்து எதிர்பார்த்திருக் கின்றனர். இந்த இரண்டையும் இந்த அரசாங்கம் நிறைவேற்று மானால், இந்தக் காலகட்டம் இலங்கையின் வரலாற்றில் ஒரு பொற்காலம் என்றே வரலாறு சான்றுபகரும் என்று கூறி, என்னுடைய உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி. வணக்கம்.

[අ. භා. 4.03]

**ගරු අබ්දුල් හලීම් මහතා**
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

මුලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන මා ඉතාමත්ම සතුටු වෙනවා. වර්තමාන රජයේ හත්වැනි අය වැය වාගේම මේ රටේ අවුරුදු ගණනාවක් තිබුණු යුද්ධය අවසන් වෙලා අවුරුදු දෙකකුත් පසු වෙලා මේ රජය ඉදිරිපත් කළ අය වැය සම්බන්ධවයි අපි මේ සාකච්ඡා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ යුද්ධය තිබුණු කාලවල නම් යුද්ධයට විශාල මුදලක් දරන්නට සිදු වූ නිසා රටේ ජනතාව බලාපොරොත්තු වුණු සහන ලබා දෙන්න බැරි වූ බව සැබෑවක්. නමුත් වීරෝදාර රණ විරුවන්ට පිං සිදු වෙන්න අද යුද්ධය අවසන් වෙලා රට තුළ සාමකාමී පරිසරයක් ඇති වී තිබෙනවා. රටේ තිබුණු යුද්ධය අවසන් වෙලා අවුරුදු දෙකහමාරක් පසු වෙලාත් රටේ ජනතාව බලාපොරොත්තු වුණු සහනය මේ අය වැයෙන් දකින්න නැහැ. විශේෂයෙන් ලක්ෂ 13ක් පමණ රජයේ සේවකයින් ප්‍රමුඛ වැඩ කරන ජනතාව බලාපොරොත්තු වුණු වැටුප් වැඩි වීම ලබා දීලා නැහැ. අතිගරු ජනාධිපතිතුමා ජනාධිපති මැතිවරණ කාලවල රාජ්‍ය සේවකයින්ට ලබා දුන් පොරොන්දුව රුපියල් 2,500ක පඩි වැඩි කිරීමක්. නමුත්, අද සිදු වී තිබෙන්නේ තමන්ගේ මූලික වැටුපෙන් සියයට 10ක් වැනි දීමනාවක් එකතු කිරීමක් පමණයි. රජයේ සේවකයින්ගෙන් බහුතරයක් බලාපොරොත්තු වුණේ මෙවර රුපියල් 2,500කටත් වඩා වැඩි වැටුපක් ලැබෙයි කියලායි. රජයේ නිලධාරීන්ට එසේ සියයට 10ක දීමනාවක් හෝ ලැබුණත් පෞද්ගලික අංශයේ සේවය කරන ලක්ෂ 60කටත් අධික ජනතාවට ඒ කිසිවක් නැහැ. එම පිරිස සම්පූර්ණයෙන්ම මේ අය වැය ලේඛනයෙන් අමතක කරලා. ඔවුන්ගේ ජීවන වියදම සම්බන්ධව, ඔවුන් මොන ආකාරයෙන් එයට මුහුණ දෙන්නේද කියා රජයට හිතන්නට තිබුණා කියායි මා කියන්නේ.

අය වැය ඉදිරිපත් කිරීමේ ක්‍රමය ඉස්සර කාලවලට වඩා අද වෙනස් වෙලා තිබෙනවා. අද කාලයේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නට සති දෙකකට පෙර රටේ ඉන්ධන මිල ඉහළ යනවා. ජනතාව ප්‍රශ්න කළොත් ඉතාමත්ම ලෙහෙසි පහසු උත්තරයක් දෙනවා. ඒ තමයි "ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ඉහළ යාම නිසා අපටත් වැඩි කරන්න සිදු වුණා" කියන එක. නමුත් අපි අනෙක් පැත්තට ඇහුවොත්, "ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල අඩු වුණොත් ඒ අඩු වීම අපට දෙනවාද" කියලා, ඒ ප්‍රශ්නයට නම් උත්තර නැහැ. කෙසේ වෙතත්, ඉන්ධන මිල වැඩි වීමෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාම වළක්වා ගන්න බැරි වෙනවා. තව ටික කාලයකින් විදුලි ගාස්තුත් වැඩි කරන්නට රජය බලාපොරොත්තු වන බවට තොරතුරු ලැබී තිබෙනවා. එවැනි තත්ත්වයක් ඇති වුණොත් ජීවන වියදම තව තවත් වැඩි වීම කාටවත් වළක්වන්න බැහැ.

අද කොටස් වෙළෙඳ පොළේ ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන බලන්න. රටක ආර්ථික සංවර්ධනය පෙන්නුම් කරන කැඩපතක් වශයෙන් කොටස් වෙළෙඳ පොළ සලකන්න පුළුවන්. ලෝකයේ තිබෙන ඉතාමත්ම හොඳ කොටස් වෙළෙඳ පොළ තිබෙන්නේ ලංකාවේ බවට පසු ගිය කාලයේදී විශාල ප්‍රචාරයක් ලබා දුන්නා. නමුත් අද සිදු වී තිබෙන්නේ මොකක්ද? කොටස් වෙළෙඳ පොළ දිනෙන් දින කඩා වැටෙන බව තමයි අපට අහන්න ලැබෙන්නේ. එහෙම නම් එයින් පෙන්නුම් කරන්නේ රටේ ආර්ථික දෝෂයක් එහෙම නැත්නම් කඩා වැටීමක් නේද? මා හිතන හැටියට කොටස් වෙළෙඳ පොළ කඩා වැටීමට එක හේතුවක් තමයි මහා පරිමාණ ආයෝජකයන් ඒ වාගේම විදේශ ආයෝජකයන් සම්බන්ධ නොවීම. ඒක තමයි අද කොටස් වෙළෙඳ පොළ දිනෙන් දින කඩා වැටෙන්න එක හේතුවක් වෙලා තිබෙන්නේ. එහි ලා හේතූන් ගණනාවක් තිබෙන්න පුළුවන්. පසු ගිය කාලයේ විපක්ෂයේ විරෝධය මැද්දේ ව්‍යාපාර පවරා ගැනීමට පනත් කෙටුම්පත් සම්මත කර ගන්නකොට විපක්ෂය ඒ සම්බන්ධයෙන් පෙන්නුම් කර දුන්නා.

මේ අන්දමට ව්‍යාපාර පවරා ගන්නකොට ආයෝජකයන් තමන්ගේ මුදල් ආයෝජනය කිරීමට බය වෙනවා, මැළි වෙනවා. ඒ නිසා අද බොහෝ සමාගම්වල කොටස් මිල ශීඝ්‍ර ලෙස අඩු වෙමින් පවතිනවා. ඒ වාගේම මේ ආණ්ඩුව විසින් බැංකු පොලිය අඩු කිරීම නිසා විශ්‍රාමිකයන්, මාස් පතා ලැබෙන පොලියෙන් ජීවත් වෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් කොටස් වෙළෙඳ පොළේ විශාල ලෙස මුදල් ආයෝජනය කිරීමට පෙළඹී සිටියා. මේ තත්ත්වය නිසා අද කුඩා පරිමාණයේ ආයෝජකයන් අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. පසුගිය කාලයේ රජය ගොවි විශ්‍රාම වැටුප් ලබා දෙන බවටත්, ඔවුන් ශක්තිමත් කරන්න බලාපොරොත්තු වෙන බවටත් විශාල ප්‍රචාරයක් ලබා දී තිබුණා. හැබැයි මේ අය වැය ලේඛනයේ නම් ගොවි විශ්‍රාම වැටුප් ගැන කිසිම සඳහනක් නැහැ. ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිය සම්බන්ධයෙන් හෝ පෙන්නුම් කරන කිසිම ක්‍රමවේදයක් මේ අය වැය ලේඛනයේ පෙන්නුම් කරලා නැහැ. ඒ වාගේම උපාධිධාරින්ගේ රැකියා අවස්ථා සම්බන්ධයෙන් මේ අය වැයේ කිසිම සඳහනක් කරලා නැහැ. නමුත් පළාත් සභා ආදායම වැඩි කිරීම සඳහා යතුරුපැදි, ත්‍රී වීලර්, එන්ජින් ධාරිතාව අඩු වාහන ලියාපදිංචි ගාස්තු වැඩි කිරීමක් කරලා තිබෙනවා. එයින් සිදු වන්නේ අඩු ආදායම්ලාභීන් මත තවත් බර පැටවීමක් නොවෙයිද කියා මා අහනවා. විශේෂයෙන්ම අපි කවුරුත් දන්නවා, ත්‍රී වීලරයෙන් උපයන මුදලින් පවුල් නඩත්තු කරන බොහෝ අය ඉන්නා බව. ඒ නිසා ඒවායේ ලියා පදිංචි ගාස්තුව වැඩි කරන්නේ නැතුව එය අඩු කළොත් වටිනවා. ඒ තුළින් ඒ අයට විශාල සහනයක් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පිට රටවලින් ලැබෙන දුරකථන ඇමතුම් ගාස්තු වැඩි කර තිබෙනවා. ධනවත් අයට එය ප්‍රශ්නයක් නොවුණත් තමන්ගේ පවුල නඩත්තු කිරීම සඳහා විදේශගතව සිටින ශ්‍රමිකයන්ට එය ප්‍රශ්නයක් වෙනවා වාගේම ඒක ඒ අය මත තවත් බර පැටවීමක් තමයි එයින් සිදු වී තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල අවප්‍රමාණය කිරීම තුළින් අපනයනකරුවන්ට වාසි ලැබුණත් අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාම කාටවත් වළක්වන්න බැහැ. ඒ වාගේම ඒ තුළින් වාහන මිල තවත් වැඩි වීමක් සිදු වෙනවා. ජනතාවට සහන සලසන බව සඳහන් කර තිබෙන බොහෝ යෝජනා දිහා බලන විටත්, ප්‍රායෝගික වශයෙන් බලන විටත් ඒවා නිකම් යෝජනාවලට පමණක් සීමා වුණු බව පේනවා. අවසාන වශයෙන් මෙම අය වැය ජනතාවගේ බලාපොරොත්තු කඩ වුණු අය වැයක් බව කියමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.13]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාමත් සතුටු වෙනවා, මේ අවස්ථාව මට ලබා දීම ගැන. මේ ගරු සභාව ඇතුළේ මම අය වැය කථා දහසයක් අහගෙන ඉඳලා, වාද විවාද කරලා ඒවාට සම්බන්ධ වෙලා තිබෙනවා. මේ අය වැය දහසයේදීම විපක්ෂයෙන් ගෙනාපු තර්කවලට හා විවේචනවලට සමාන විවේචන තමයි මම අදත් දැක්කේ. අලුත් විවේචනයක් ගෙනාවේ නැහැ. මේ සැරේ ඊට වඩා දෙයක් මේ සභාවේදි අපි දැක්කා. අය වැය දැක්කෙත් නැතුව අය වැයට විරෝධය පෑවා. ඉස්සර නම් අය වැය දැකලා, ඒක විවේචනය කරලා, ඒකේ අඩු පාඩු පෙන්වලා දීලා තමයි විරුද්ධ පක්ෂය විරුද්ධ වුණේ. අය වැය දැක්කෙත් නැතුව, ඒකෙන් කෙරෙන්නේ මොනවාද කියලා දන්නේත් නැතුව, මේ අය වැයේ කිසිම තොරතුරක් දන්නේ නැතුව විරුද්ධත්වය පෑවා. අපි කවදාවත් ඒ වාගේ දෙයක් දැක්කේ නැහැ. මේකෙන් තේරෙන්නේ, ඒ උදවිය -විරුද්ධ පක්ෂය- මේ යන ගමන අවබෝධයක් ඇතිව යන ගමනක් නොවෙයි කියන එකයි. ඔහේ විරුද්ධ වෙන්නන් වාලේ විරුද්ධ වෙනවා; විවේචනය කරන්නන් වාලේ විවේචනය කරනවා. සමහරු කියනවා, මේක සීනි තැවරූ තිත්ත බෙහෙතක් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උපමාව ගෙනාවේ ආචාර්ය විජයානන්ද දහනායක මැතිතුමා එක්තරා අය වැය විවාදයකදීයි. අදත් ඒක පාවිච්චි කරනවා. මේ විවේචන හැම දාම කෙරෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය ලේඛනයකින් අපි බලාපොරොත්තු වන්නේ ඉදිරි වර්ෂය තුළ මේ රට මෙහෙයවන්නේ කොයි විධියේ ආර්ථික රාමුවක් තුළද කියන එක පිළිබඳව අවබෝධයක් ලබා දීමයි. මේකේ අඩු පාඩුකම් ඕනෑ තරම් තිබෙන්න පුළුවන්. ඒ වාගේම අපි බලාපොරොත්තු නොවුණු ප්‍රශ්නත් ඇති වෙන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා පසු ගිය 25 වැනි දා අපි බලාපොරොත්තු නොවුණු සුළි කුණාටුවක් දකුණට හැමූ බව. වැලිගම ආසනය සම්පූර්ණයෙන් විනාශ වුණා. වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක තුළ ජීවත් වන අහිංසක මනුස්සයන්ගේ ගෙවල් 6,000කට වැඩි ප්‍රමාණයක් විනාශ වුණා. මේ වන කොට මිනිස් ජීවිත 40ක් නැති වෙලා තිබෙනවා. මුහුදු ගිය ධීවරයන්ගේ ධීවර බෝට්ටු 60ක් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. මේවා අය වැය ලේඛනයකට ඇතුළු කරලා නැහැ. නමුත් මේවා ගැන අපි කනගාටු වෙනවා. රට ඉදිරියට යන කොට අපි මේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න ඕනෑ. මේවාත් එක්කයි අපි ඉදිරියට යන්නේ. ඒ ප්‍රදේශයේ ජනතාවට අපි සහන සලසන්නට ඕනෑ. මේ විනාශ වුණු දේපළ නැවත ගොඩ නඟා ගන්න ඒ උදවියට උදවු කරන්නට ඕනෑ. ඒක තමයි අය වැය ලේඛනයකින් අපි බලාපොරොත්තු වන්නේ. අය වැය ලේඛනයකින් ප්‍රතිපාදන වෙන් කරන්නේ ඒකටයි. රට කොතැනටද යන්නේ, රටේ ඊ ළඟ ඉලක්කය කොතැනද, අපි කොහාටද මේ රට මෙහෙයවන්නේ කියන එක තීරණය කරන්නේ අය වැය ලේඛනයෙනුයි. අපි අමතක කරන්න නරකයි මේ වකවානුව, අපේ අතිගරු ජනාධිපතිතුමා සහ මේ රටේ වීරෝදාර රණ විරුවන් මේ රට මහා විනාශයකින් ගලවා ගෙන සාමකාමී මාවතක යන්න හදන වකවානුවක්ය කියන එක. අපි තව ඉදිරියට මෙහෙම යන්නට ඕනෑ. අපේ රට ශක්තිමත් කරන්නට ඕනෑ. මේ සාමකාමී ගමන අඩ පණ කරන්න අද විවිධාකාර කුමන්ත්‍රණ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙටත් උද්ඝෝෂණයක් කරනවා. මොකක්ද මේ උද්ඝෝෂණය? මොකක්ද මේ ගැටලුව? විසඳා ගන්න බැරි ගැටලුවක්ද? ඒ පක්ෂයේ තිබෙන අවුල විසඳා ගන්න බැරුව මේ රටේ ජනතාව මේ කලබැගෑනිවලට මෙහෙයවන්න උත්සාහ කරනවා. විවිධ රටවල මෙහෙම කරනවා. අවුරුදු 30ක් තිස්සේ ඊජිප්තුව සාමකාමීව පාලනය කළ හොස්නි මුබාරක් මහතාට විරුද්ධව යම් යම් දේවල් කරලා එතුමා බලයෙන් ඉවත් කළා. එතුමා පැහැදිලිව බලයෙන් ඉවත් වෙලා ගියා. අද මොකද වෙලා තිබෙන්නේ? අද ඒ රට නැවතත් කුමන්ත්‍රණ සහ ප්‍රතිකුමන්ත්‍රණවලට ලක් වෙලා තිබෙනවා. අද ඒ රටේ ජනතාවට නිදහසක් නැහැ. හැමදාම කලකෝලාහල, හැමදාම රණ්ඩු. අපි ගමන් කරන්නත් ඕනෑ ඒ වාගේ තැනකටද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒක තමයි අපි අද විරුද්ධ පක්ෂයෙන් අහන්නේ. මේ රට ඒ වාගේ තැනකට යවන්නටද වුවමනා කරන්නේ? අහිංසක මනුස්සයෝ ගෙනැල්ලා, විවිධාකාර ප්‍රශ්න ගැටලුවලට මුහුණ දීලා ඉන්න අපේ ජනතාව ගෙනැල්ලා අපේ රට ගෙනියන්නේ එතැනටද? මේක අපේ රට අපි ආරක්ෂා කර ගත යුතු වෙලාවක්. මම කියන්නේ ඒකයි. අපි බොහොම ප්‍රවේශමෙන් කල්පනා කරන්නට ඕනෑ. මේ රට නිදහස් රටක්. අපි ඉතා අමාරුවෙන් සාමය දක්වා මේ රට ගෙනැල්ලා තිබෙනවා. එහෙම නම් අපි අනික් රටවල්වල වෙන්නේ මොනවාද කියන එක ගැන අවබෝධයක් තියා ගන්නට ඕනෑ. එහෙම අවබෝධයක් තියා ගෙනයි අපේ දේශපාලන ගමන් මඟ සකස් කරන්නට ඕනෑ. ඒ වගකීම විරුද්ධ පක්ෂයටත් තිබෙනවා. මේ රට කලබැගෑනියකට ලක් වුණොත්, මේ රටේ විශාල විනාශයක් ඇති වුණොත්, කැරලි කෝලාහල ඇති වුණොත් ඒකේ ප්‍රශ්නය අපට විතරක් නොවෙයි, ඒ උදවියටත් එනවා. ඊට පස්සේ ඒක සාමකාමී කර ගන්න එක ඊටත් වඩා අමාරු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවත් පසු ගිය කාලයේ අපේ රටේ තිබුණු මහා යුද්ධයට මැදිහත් වුණු බව එදා තමුන්නාන්සේ දකින්නට ඇති. ඒ උදවිය උත්සාහ කළා ඒක නතර කර ගන්න. ඒ ගොල්ලන්ගේ ආණ්ඩුව කාලයේත් මේ රට සාමයට ගේන්න ඒ උදවිය විවිධාකාර මාර්ග යෙදුවා. නමුත් එක්සත් ජාතික පක්ෂයේ ඒ වැඩ පිළිවෙළ ඉතාමත් අවාසනාවන්ත විධියට අසාර්ථක වුණා. ඒ, විවිධ කුමන්ත්‍රණ නිසා, විවිධ ගැටලු නිසා, එකමුතුභාවයක් නැතිකම නිසා, එක එක්කෙනා එක එක විධියට හිතපු නිසා. ඉතා අවාසනාවන්ත විධියට ඒ ප්‍රශ්නය ඉදිරියේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු සියල්ලම කඩා ගෙන වැටුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අපිත් එක්ක ගැටලුවක් ඇති වුණේත් ඔය වාගේ ප්‍රශ්න නිසායි. එහෙම තත්ත්වයක් යටතේ තමයි අපේ ජනාධිපතිතුමා අද මේ රට සාමකාමී තත්ත්වයකට අරගෙන ආවේ. එතුමාට සාමය ගේන්න පුළුවන් වුණේ වෙන කිසි හේතුවක් නිසා නොවෙයි, එතුමා තිරසාරව මේ විධියට කටයුතු කරනවා කියන දැඩි අධිෂ්ඨානයකින් යුතුව කටයුතු කළ නිසායි. ඒ අධිෂ්ඨානය නිසායි අද අපි මෙතැන ඉන්නේ. ඒ අධිෂ්ඨානය නිසායි අපේ රට සාමකාමී වුණේ. ඒ දැඩි නායකත්වය නිසායි අද අපේ රට අපට නිදහසේ ජීවත් වෙන්න පුළුවන් රටක් බවට පරිවර්තනය වුණේ. එදා ඒ නායකයින්ට ඒක තිබුණේ නැහැ. එදා හිටපු එක්සත් ජාතික පක්ෂ නායකයින්ට ඒක තිබුණේ නැහැ. ඒ ගොල්ලන්ට තිබුණේ එකිනෙකා අතරේ තිබුණු විවිධාකාර ගැටලු, ප්‍රශ්න විතරයි. ඒ ගොල්ලන්ට රට ගැන හැඟීමක් තිබුණේ නැහැ. කුමන ආකාරයෙන් හරි අපේ රට ආරක්ෂා කර ගන්නවාය කියන හැඟීමක් ඒ උදවියට තිබුණේ නැහැ. රටෙන් කොටසක් බාර දීලා හරි, පාවලා දීලා හරි තමන්ගේ බලය, තමන්ගේ ශක්තිය රැක ගැනීම සඳහා කටයුතු කරන වගකීම තමයි ඒ ගොල්ලන්ට තිබුණේ. එතැනයි ඒ ගොල්ලන් අසාර්ථක වුණේ. ඒ අසාර්ථක වීම නිසා තමයි අදත් පල්ලම් බහින්නේ. අදත් මේ විධියට විනාශ වෙන්නේ ඒක නිසායි. ඒ නිසා ඒ පක්ෂයට අද තිබෙන්නේ මන්ද බුද්ධික නායකත්වයක්. එක්කෝ විකෘති මනසක් ඇති නායකත්වයක්. ඒ නිසා තමයි මෙහෙම විරෝධතාවන් පවත්වන්නේ. ඒ නායකත්වයට කවදාවත් මේ රටේ බලය ලබා ගන්න බැහැ. ජනතාව මේ රටේ බලය දෙන්නේ නැහැ. මේ රටේ ජනතාව අපට වඩා ඉදිරියෙන් ඉන්න බව අපි තේරුම් ගන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකයි තත්ත්වය. මේ රටේ ජනතාව රවටන්න බැහැ. දැන් මේ රටේ ජනතාව කැරලි කෝලාහලවලට ඇදා ගන්න බැහැ. විනාශකාරී පරිසරයක් තුළ මේ රටේ ජනතාව ඇති වෙන්න දුක් විඳලායි ඉන්නේ. හෙට හයිඩ්

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

පාක් එකට එන්න කිව්වාට මේ රටේ ජනතාව එන්නේ නැහැ. එහෙම ඇවිල්ලා මේ රටේ කලබල කරන්න ඒ ගොල්ලන්ට අවශ්‍ය නැහැ. ඒ ගොල්ලන්ට ඕනෑ සාමකාමීව ජීවත් වෙන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 වසරට විතරක් නොවෙයි ඉදිරි වසර 5ක්, 6ක් ඇතට යන තෙක් අපේ රට ගමන් කරන්නේ කුමන දිශාවකටද කියන එක පිළිබඳව පැහැදිලි අවබෝධයක් මේ අය වැය ලේඛනයෙන් අපේ අතිගරු ජනාධිපතිතුමා ලබා දීලා තිබෙනවා. 2015ට අපට යන්න තිබෙනවා. එතුමා මට කියනවා, "2015 දී අපි සහල් ටොන් 2,50,000ක් අපනයනය කරන්න ඕනෑ, ඒකට සැලසුම් හදපන්, මෙන්න මුදල්" කියලා. මේකයි මේ අය වැය ලේඛනයේ තිබෙන්නේ. 2015 දී සහල් ටොන් 2,50,000ක් අපනයනය කිරීම සඳහා ඉලක්කයක් හදා ගන්න මුදල් දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඒ වාගේ පැහැදිලි දර්ශනයක් සහිතව යන ගමනක්. එතුමා මේ රටේ සෑම ක්ෂේත්‍රයකටම, සෑම අංශයකටම අවධානය යොමු කරලා තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරලා තිබෙන්නේ. අද මේ විරුද්ධ පක්ෂය විකාර දොඩවන්නේ. මේ උදවියට මේ වාගේ කල්පනාවක් එදා තිබුණේ නැහැ. මේ වාගේ සැලසුමක් එදා තිබුණේ නැහැ. එදා ඒ ගොල්ලන්ට තිබුණේ, රටේ තිබුණු බරපතල ප්‍රශ්නය වන උතුරු නැඟෙනහිර යුද්ධයෙන් ගැලවෙන්නේ කොහොමද, ජීවිත බේරා ගන්නේ කොහොමද කියන එක පිළිබඳ ප්‍රශ්නයක්. අවුරුද්දක් ඈතට, අවුරුදු 5ක් ඈතට හිතන්නට ඉලක්කයක් ඒ ගොල්ලන්ට තිබුණේ නැහැ. ඒ නිසායි අද මේ ගොල්ලන් අතරමං වෙලා ඉන්නේ. ඒක නිසායි අද මේ ගොල්ලන් මේ සමාජය විනාශ කරන්න හදන්නේ.

මේ සමාජය විනාශ කරන්න උත්සාහ කරන්නේ ඒක නිසායි. මේ කුමන්ත්‍රණයට අහු වෙන්න එපා කියලා මේ රටේ ජනතාවට මම කියනවා. අපේ රට දැන් යම් කිසි ගමන් මඟක ගමන් කරමිනුයි ඉන්නේ. අපි මේක ආරක්ෂා කර ගනිමු. අනාගතයේ අපට බය වන්න තිබෙන්නේ මේ එන ස්වාභාවික විපත්වලටයි. වර්ෂාවෙන්, නියඟයෙන්, කුණාටුවලින් ආදී වශයෙන් සිදු වූ විවිධාකාරයේ ස්වාභාවික විපත් රාශියක් දැන් අපට අත්විඳින්න ලැබිලා තිබෙනවා. ඒ වාගේම අනාගතයේත් අපට තව තවත් ඒවා එන්න පුළුවන්. මෙන්න මේවා ගැනයි අපි කල්පනා කරන්නට ඕනෑ. මේවා ගැනයි අපි සැලසුම් හදන්නට ඕනෑ.

වැලිගම අසරණ වුණු ජනතාවට නැඟිටින්න අපේ ශක්තිය දෙන්නට ඕනෑ. ඒ මිනිස්සුන්ගේ ඒ කටයුතු කර ගැනීම සඳහා විනාශ වෙලා ගිය ධීවර බෝට්ටු වෙනුවට ධීවර බෝට්ටු ටිකක් කොහොම හරි අපි ලබා දෙන්නට ඕනෑ. අපි ඒ ගොල්ලන්ගේ ගෙවල් හදලා දෙන්නට ඕනෑ. ඒ ගොල්ලන්ගේ අහිමි වූ රැකියා නැවත ගොඩ නැඟීම සඳහා අපි උදවු කරන්නට ඕනෑ. ඒ ගොල්ලන්ගේ ගෙවල්වල කැඩිලා ගිය වහල අපි හදලා දෙන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි මේ රජයේ ඉලක්කය. මේ ඉලක්කය දිනා ගැනීම සඳහා තමයි මේ අය වැය ලේඛනය යොමු කරලා තිබෙන්නේ. හෙට අනිද්දා වන විට අපට එන ප්‍රධානම ගැටලුව තමයි ස්වාභාවික විපත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දන්නවා මේ මොහොත වන විට ලෝකයේ විවිධාකාර රටවල විවිධාකාර ස්වාභාවික ගැටලු මතු වෙලා තිබෙන බව. ඒ නිසා අපට බරපතළ ගැටලුවලට, ප්‍රශ්නවලට අනාගතයේ මුහුණ දෙන්න වෙයි. අද මේ මොහොත වන විට අපිත් යම් කිසි ප්‍රමාණයකට මේ ගැටලුවට මුහුණ දීලායි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් අපි කල්පනා කරන්නට ඕනෑ අපේ රටේ ඇති විය හැකි මෙන්න මේ ස්වාභාවික ගැටලුවලට අනාගතයේ අපි මුහුණ දෙන්නේ කොහොමද, මේවාට ජනතාව පුරුදු කර ගන්නේ කොහොමද කියලා. එහෙම නැතිව මේ විධියේ අස්වාභාවික ගැටලු හදලා, අස්වාභාවික ප්‍රශ්න හදලා රටේ තිබෙන සාමකාමී පරිසරය නැති කරලා රට නැවතත් මහා විශාල විලෝපනයකට ගෙන යන්න විරුද්ධ පක්ෂය දරන උත්සාහය ඇත්ත වශයෙන්ම අපි කනගාටුවෙන් යුක්තව හෙළා දකිනවා. මේක කරන්න එපා. අපි කවුරුත් සහයෝගයෙන් මේ කටයුත්ත කරමු. මේ රට ගොඩ නැඟීම සඳහා තමුන්නාන්සේලාට දෙන්න පුළුවන් හොඳම සහයෝගය තමයි, මේ රට සාමකාමී තත්ත්වයෙන් මිදෙන්නට ඉඩ නොදෙන එක. ඒකට විරුද්ධ පක්ෂයත් එකතු වන්න. අද අපි මේ අය වැය ලේඛනය ගැන කථා කරන්නේ ඒකයි.

සෑම අංශයක් ගැනම අවධානයක් යොමු කරපු, සෑම අංශයක් ගැනම ඉතා සීරුවෙන් බලපු, අය වැය ලේඛනයක් හැටියටයි මම මේ අය වැය ලේඛනය දකින්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්න කලින් අපේ ජනාධිපතිතුමා මේ රටේ විවිධ ක්ෂේත්‍රයන් එක්ක, විවිධ අංශ එක්ක රැස්වීම් 33ක් තිබ්බා. එහෙම තියලා, ඒ උදවියගේ අදහස් අර ගෙන, ඒ උදවියගේ අදහස් මේ රටේ යහපත සඳහා යොදා ගන්න පුළුවන් වන්නේ කොයි ආකරයෙන් ද, ව්‍යාපාරික ප්‍රජාව, කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන කරන ප්‍රජාව, සුළු කර්මාන්තකරුවන්ගේ ප්‍රජාව, කුඩා ව්‍යාපාරික ප්‍රජාව ආදී වශයෙන් මේ සියලු දෙනා එක්ක රැස්වීම් 33ක් පවත්වලා ඒ අයගේ අදහස් අර ගෙන තමයි මේ අය වැය ලේඛනය සකස් කරලා ඉදිරිපත් කළේ. මේ අය වැය ලේඛනය තුළ ඒක දකින්න ලැබෙනවා. එතුමා සෑම අංශයක් ගැනම කල්පනා කරලා තිබෙනවා. ඒක තමයි රටේ නායකයාගේ වගකීම. රටේ නායකයා තම රට මෙහෙයවන්නට නම් මේ සියල්ල ගැනම අවබෝධයක් තිබෙන්න ඕනෑ. එතුමා ඒ අවබෝධය ලබා ගෙන තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කළේ. ඒ අවබෝධය තුළින් තමයි වයසට ගිය අයට -වැඩිහිටියන්ට- රුපියල් 1000ක් දෙන්න එතුමා යෝජනා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නේ නැහැ මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්න සති දෙකකට කලින් වයසක සීයා කෙනෙක් එයාගේ දරුවන් විසින් කැලණි විහාරස්ථානය ළඟට ගෙනැවිත් දමලා තිබුණා. දරුවෝ දෙදෙනා එයාව එතැනට ගෙනැත් අතරමන් කරලා දමලා ගිහිල්ලා තිබුණා. ඒ ප්‍රශ්නය අතිගරු ජනාධිපතිතුමා ළඟට යන තෙක් ගියා. ජනාධිපතිතුමා ඒ ගැන සොයලා බලලා ඒ තාත්තාට සුදුසු ස්ථානයක රැකවරණය ලබා දුන්නා. අද අපට ලැබිලා තිබෙන තොරතුරුවල හැටියට නම් ඒ දරුවන්ට වයසක පියාව නඩත්තු කරන්න බැරිකමක් නොවෙයි. වෙන කුමක් හෝ හේතුවක් නිසා එහෙම අතරමන් කරලා ගිහිල්ලා තිබුණා. මේ රටේ මේ වාගේ දේවල් සිද්ධ වනවා. ඒවා ඕනෑ තරම් පත්තරවල දකින්න ලැබෙනවා. අම්මලා ගෙනැල්ලා මඟ දමලා යනවා. කොහේ හරි තැනක අතහැරලා දමලා යනවා. අද තිබෙන්නේ එහෙම සමාජයක්. දෙමවුපියන්ට ගරු කරන, දෙමවුපියන්ට සලකන උදවිය මේ සමාජය තුළ සිටින අතර, අර විධියට සලකන උදවියත් මේ සමාජය තුළ ඉන්නවා. එහෙම නම් ඒ වයසක උදවියගේ වගකීම අපි භාර දෙන්නේ කාටද? ඒක භාර ගන්නේ කවුද? ඒක රජය භාර ගන්නට ඕනෑ. මේ රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ, තමන්ට හැකියාව තිබෙන කාලයේ තමන්ට පුළුවන් සේවයක් රටට කරලා අවසානයේ නැති බැරි වෙලා, නැඟිට ගන්න බැරි වුණාම දරුවොත් ඒ අයව එළියට ඇදලා දමනවා නම් ඒ අය බලා ගන්න රජය ඉදිරිපත් වන්නට ඕනෑ.

ඒක තමයි අතිගරු ජනාධිපතිතුමා කිව්වේ, මේක අපේ වග කීමක්; අප මේ කටයුත්තට අත ගහන්න ඕනෑ කියලා. ඒ නිසා තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 1,000ක දීමනාවක් වැඩිහිටියන්ට දෙන්න එතුමා යෝජනා කළේ. දෙමව්පියන්ට අද සමාජයේ සමහර තැන්වල ලැබෙන සැලකිල්ල ඉතාමත් අවාසනාවන්තයි. දිළිඳු උදවියටත් මේ රජය සහන ලබා දීලා තිබෙනවා.

සමෘද්ධි දීමනාව පහළ මට්ටමේ ඉඳලා රුපියල් 500 දක්වා වැඩි කළේ මේ ක්ෂේත්‍රය රැක ගන්න ඕනෑ නිසායි. මේ උදවිය අපේ නිෂ්පාදනයට දායක කර ගන්න ඕනෑ. මේක වැරැදියි කියලාද මේ මහත්වරු කියන්නේ? මේක වැරැදියි කියලාද විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කියන්නේ? මේකද මේ සැලැස්මක් නැහැ කියලා කියන්නේ? මේක නිසාද මේ රටේ ආර්ථිකය විනාශ කළා කියලා කියන්නේ? මේකයි අප අහන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ මොහොත වෙන කොට අප හොඳ ශක්තිමත් ආහාර සුරක්ෂිතභාවයක ඉන්නවා. අපට ලබන අවුරුද්දේ අප්‍රේල් මාසය අවසන් වෙනකම් මේ රටේ ජනතාවට දෙන්න ආහාර තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

මේ ආහාර සුරක්ෂිතභාවය තියා ගෙන අප විවිධ ප්‍රශ්නවලට දැනුත් මුහුණ දෙනවා. අද ස්වාභාවික පරිසරය අපට විරුද්ධව යන වෙලාවක් මේ. විවිධාකාර ගැටලු ඇති වෙලා තිබෙන වෙලාවක්. එහෙම තියෙද්දිත් අද අපට ඉලක්කයක් දීලා තිබෙනවා, 2014 වසර වන විට වසරකට මෙට්‍රික් ටොන් ලක්ෂ දෙකක් වශයෙන් සහල් අපනයනය කරන්න සූදානම් වෙන්න කියලා. අප ඒ ඉලක්කය දිනා ගන්න කටයුතු කරනවා. අප එතැනට යනවා. ඒකට වුවමනා කරන සියලුම පහසුකම් අප ලබා ගන්නවා. ඒකට ගන්න පුළුවන් සියලුම පියවර අප ගන්නවා. ඒක තමයි අපේ ඉලක්කය. ඒක තමයි අපේ අතිගරු ජනාධිපතිතුමා මේ අය වැය ලේඛනයෙන් අපට දීලා තිබෙන ඉලක්කය. මේ ඉලක්කය දිනා ගැනීමට අපට ශක්තිය තිබෙනවා. අප ඒ කටයුත්ත කරනවා. ඒ වාගේම සියලුම කර්මාන්තවලට ලබා දෙන්න පුළුවන් සහන එතුමා ලබා දීලා තිබෙනවා. අපේ රටේ විවිධාකාර කුඩා කර්මාන්ත රාශියක් තිබෙනවා. ඒ සියලු කර්මාන්ත ආරක්ෂා කරන්න වුවමනා කරන පරිසරය සකස් කර දීලා, ඒ කර්මාන්ත දියුණු කරන්න අවශ්‍ය පියවර එතුමා මේ අය වැය ලේඛනය තුළින් අරගෙන තිබෙනවා. මේක වැරැදියි කියලාද මේ මහත්වරු කියන්නේ? එතුමන්ලාට ඒක කර ගන්න බැරි වුණු එක ගැන අප කනගාටු වෙනවා. එතුමන්ලාට එහෙම කරන්න වුවමනාවක් තිබුණෙත් නැහැ. එතුමන්ලාට එහෙම කරන්න හැකියාවක් තිබුණෙත් නැහැ. එතුමන්ලා එහෙම කරන පරිසරයක ජීවත් වුණෙත් නැහැ. ඒ නිසායි එතුමන්ලාට ඒක කර ගන්න බැරි වුණේ. ඒ නිසායි එතුමන්ලා අද අසාර්ථකභාවයට පත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවි නැඟුම වැඩ පිළිවෙළ තුළින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරන්න අප දැනට ක්‍රියා කරගෙන යනවා. ගෙවතු 25,00,000ක් දක්වා එම වැඩ පිළිවෙළ ව්‍යාප්ත කරන්න මේ මොහොත වෙන කොට කටයුතු කර ගෙන යනවා. ඒකත් අප ජය ගන්නවා. ඒ දීලා තිබෙන ඉලක්කය ජය ගැනීමට අපට හැකියාව තිබෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ලේඛනය අපේ රටේ ආර්ථිකය නියම මාර්ගයේ ගෙන යන අය වැයක්. 2012 වසරේදී මෙන්න මේ විධියේ සාර්ථක ගමනක් අප යනවා. ජීවන මට්ටම මේ මට්ටමේම පවත්වාගෙන යෑමේත්, උද්ධමනය මේ මට්ටමින් පවත්වාගෙන යෑමේත්, ආර්ථික වර්ධන වේගය සියයට 8ක මට්ටමක පවත්වාගෙන යෑමේත් ඉලක්කය තමයි එතුමා අපට දීලා තිබෙන්නේ. මේ රටේ ඉන්න සියලු දෙනාම මේ ඉලක්කය තේරුම් ගෙන එතුමා මෙහෙය වන ඒ වැඩ පිළිවෙළට එතුමාට ශක්තිය සහ ධෛර්යය දෙන්න අප වාගේම ඔබතුමන්ලාත් එකතු වෙන්න කියලා විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 4.31]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 අය වැය හා සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මුලින්ම ඔබතුමාට මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි. විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන තරුණ මන්ත්‍රීවරයෙක් හැටියට මම ඉතාමත් කනගාටු වෙනවා මේ රට නිදහස් කර ගත්ත නායකයාට එදා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු සලකපු ආකාරය පිළිබඳව. අප දේශපාලනය පැත්තකට තියලා මේ රටේ ජීවත් වන සාමාන්‍ය පුරවැසියන් හැටියට කල්පනා කරලා බැලුවොත් අපට තේරෙනවා අද අපට නිදහසේ ගමනක් බිමනක් යන්න, සිතන්න පතන්න, රැකීරක්ෂාවක් කර ගන්න, පාසල් යන්න, විශ්වවිද්‍යාලයට යන්න අවශ්‍ය වටපිටාව සකස් කර දුන්නේ එතුමා විසින් බව. මේ රටේ ඉතිහාසයත් එක්ක ගත්තාම කිසිම නායකයෙක් නොකරපු විධියේ දැවැන්ත සංවර්ධන යෝජනා ක්‍රම රාශියක් තුළින් මේ රට සංවර්ධනය කරලා, යටිතල පහසුකම් සංවර්ධනයේදී මේ රට කරපු කිසිම රාජ්‍ය නායකයෙකුට නොදෙවෙනි ලෙස ඉතිහාසයේ දැවැන්තම ලෙස යටිතල පහසුකම් සංවර්ධනය කළේත් අපේ අතිගරු ජනාධිපතිතුමායි. සමාජ සුබසාධනය ගත්තාම ඒ සුබසාධන වැඩ පිළිවෙළවල් එකක්වත් කප්පාදු කරන්නේ නැතිව ඒවා සියල්ලක්ම එතුමා ජනතාවට ලබා දුන්න මේ නායකයා මේ ගෞරවණීය පාර්ලිමේන්තුවේ අය වැය ඉදිරිපත් කරන්න එන කොට, විපක්ෂයේ මන්ත්‍රීවරු -විපක්ෂ නායකතුමාත් ඇතුළුව- හැසිරුණු ආකාරය පිළිබඳව පාර්ලිමේන්තුවට ආපු නවක මන්ත්‍රීවරයෙක් හැටියට මා ඉතාමත් කනගාටු වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපේ රටට වෙලා තිබෙන විශාලම විනාශය තමයි විපක්ෂයේ තිබෙන බෙදීම. විපක්ෂයේ සජිත් කණ්ඩායම සහ රනිල් වික්‍රමසිංහ කණ්ඩායම අතර තිබෙන බෙදීම තමයි අපට තිබෙන විශාලම විනාශය. ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාට එරෙහිව අධිකරණයේ තීන්දුවක් දෙන කොට සජිත් ප්‍රේමදාස කණ්ඩායම විරෝධය දැක්වූවා. එතකොට රනිල් වික්‍රමසිංහ මැතිතුමා ලංකාවේ සිටියේ නැහැ. ඊට පස්සේ එතුමාගේ කණ්ඩායම ගිහින් එතුමාට කියනවා, "ඔබතුමා හිටියේ නැහැ. ඒ ගොල්ලෝ මේ විධියට කළා. දැන් ඔබතුමාත් මොනවා හෝ කරන්න" කියලා. එතුමා ලංකාවට ආවාට පස්සේ එතුමාත් මොනවා හෝ කරන්න තමයි වටපිටාව සකස් කර ගත්තේ. ඒක තමයි එදා පාර්ලිමේන්තුවේදී සිද්ධ වුණේ. විපක්ෂ නායකතුමාත් එක්ක සියලු දෙනා ඉන්නවා කියා එතුමාගේ නායකත්වය පෙන්වන්න පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන්ම යොදා ගෙන ජනාධිපතිතුමාගේ කථාව අහන්නත් කලින් සභාව තුළ විරෝධතා පෝස්ටර්ස් පෙන්වමින් සම්පූර්ණයෙන්ම මේ සභාව විහිළුවට ලක් කළා. ඒකෙන් අය වැය කථාව ඉදිරිපත් කරන්න ආපු ජනාධිපතිතුමාගේ ගෞරවයත් සම්පූර්ණයෙන්ම කෙළෙසුණා කියලායි මා හිතන්නේ.

අපට සරත් ෆොන්සේකා මැතිතුමා දේශ ප්‍රේමියෙක්; වීරයෙක්. හැබැයි එතුමා දේශ ප්‍රේමියකු, වීරයකු වන්නේ චීනයට යන කල් විතරයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔහු අවසාන මොහොතේ චීනයට ගියා. ඒ චීනයට ගිය ගමනේදී ඔහු කාවද හම්බ වුණේ කියලා අපි දන්නවා. චීනයට ගිය සරත් ෆොන්සේකා නොවෙයි ආපසු ආවේ. ඒ ආව සරත් ෆොන්සේකා මැතිතුමා "ද සන්ඩේ ලීඩර්" පුවත් පතට ප්‍රකාශයක් කළා. "ද සන්ඩේ ලීඩර්" පුවත් පත කියන්නේ ආණ්ඩුවේ පුවත් පතක් නොවෙයි. ෆෙඩ්රිකා ජැන්ස් කියන්නේ ආණ්ඩුව ගැන හොඳ කියපු මාධ්‍යවේදිනියක් නොවෙයි. ෆෙඩ්රිකා ජැන්ස් ගැන මා දන්නවා. ෆෙඩ්රිකා ජැන්ස්ගේ ස්වාමිපුරුෂයා අපිත් එක්ක ශ්‍රීලන්කන් ගුවන් සේවයේ සේවය කළා. ඔහු එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ කෙනෙක්.

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

ෆෙඩ්රිකා ජැන්ස් ආණ්ඩුවට සම්බන්ධ ප්‍රවෘත්ති ලියපු කෙනෙක් නොවෙයි. නමුත් "ද සන්ඩේ ලීඩර්" පුවත් පත සමඟ ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා සමඟ සම්මුඛ සාකච්ඡාවක් කළා. එම සම්මුඛ සාකච්ඡාවේදී ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා ඒ කථාව කිව්වාමයි. ඒ කථාව උඩ තමයි මේ නඩුව ගියේ. එතැනදී තමයි එතුමා අපට දේශ ද්‍රෝහියකු වන්නේ. මේ රටේ රණ විරුවන් ජීවිත පරිත්‍යාගයෙන්, ලේ, කඳුළු, දහදිය හෙළා ඒ යුද්ධය අවසන් කරන මොහොතේදී යම් කිසි සිදු වීමක් වුණා නම්, එවකට හිටපු හමුදාපතිවරයා හැටියට එතුමා ඒ රහස් රකින්න ඕනෑ. හැබැයි එතුමා සම්පූර්ණයෙන්ම රණ විරුවන් පාවා දුන්නාය කියලායි අපි හිතන්නේ. එම නිසා එදා ඉඳලා එතුමා අපට දේශ ද්‍රෝහියෙක්.

මේ රටේ රාජ්‍ය නායකයාට පුළුවන් නම් එතුමාට සමාව දෙන්න, අනෝමා ෆොන්සේකා මැතිනිය ගිහින් ජනාධිපතිතුමාගෙන් ඒ ඉල්ලීම කරන්න ඕනෑ. විජය කුමාරණතුංග මැතිතුමාව නැක්සලයිට් චෝදනාව යටතේ හිරයට දැම්මා. ඒ වෙලාවේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය හැසිරුණු ආකාරය අපට මතකයි. එතුමිය එවකට හිටපු ජනාධිපතිවරයාට නොයෙක් විධියේ ඉල්ලීම් කළා. [බාධා කිරීමක්] අපි කියන්නේ නැහැ, දණින් වැටෙන්න කියලා. අපි එහෙම කියන්නේ නැහැ. නමුත් තමන්ගේ ස්වාමිපුරුෂයා හිරේ ඉන්නවාටද කැමැති? අඩු ගණනේ ඉල්ලීමක්වත් කරන්න ඕනෑ. ඉල්ලීමක්වත් කරන්නේ නැහැ. බොරුවට ජනතාව කුපිත කරවන ආකාරයට හැසිරෙනවා. විපක්ෂය සම්පූර්ණයෙන්ම ඒක දඩ මීමා කර ගෙන මේ රට අවුල් ජාලාවක් බවට පත් කරන්න තමයි හෙටත් ඔය උද්ඝෝෂණයක් තියන්නේ. එච්චර කැක්කුමක් තිබෙනවා නම් විපක්ෂයේ මන්ත්‍රීවරයකු අයින් වෙලා ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට එන්න අනෝමා ෆොන්සේකා මැතිනියට අවස්ථාව දෙන්න ඕනෑ; එහෙම නැත්නම් වෙන මොනවා හෝ අවස්ථාවක් දෙන්න ඕනෑ. එහෙම කරන්නේ නැතුව, දැන් ජනරාල් ෆොන්සේකාව සම්පූර්ණයෙන්ම දඩ මීමා කර ගෙන, එතුමා කරපු සේවයත් සම්පූර්ණයෙන්ම නිගරුවට පත් කරන ආකාරයට වැඩ කටයුතු කිරීම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අපි සම්පූර්ණයෙන්ම හෙළා දකිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මා මේ පාර්ලිමේන්තුවට එන්න කලින් ගුවන් සේවයක වැඩ කරපු කෙනෙක්. පසු ගිය ඉතිහාසයත් එක්ක ගත්තාම කිසිම අය වැයකින් ශ්‍රීලන්කන් ගුවන් සේවයට ප්‍රාග්ධන ආයෝජනයක් කරලා තිබුණේ නැහැ; භාණ්ඩාගාරයෙන් මුදල් දීලා තිබුණේ නැහැ. මේ අය වැය ගැන කථා කරද්දී අද අපි ඉතාම සන්තෝෂ වනවා, මේ අය වැයෙන් පළමුවන වතාවට ඒ ගුවන් සේවයට මුදල් වෙන් කර තිබීම ගැන. ශ්‍රීලංකන් ගුවන් සේවය අවුරුදු 10ක් එමිරේට්ස් සමාගමට දීලා තිබුණා. පසු ගිය කාලයේ සම්පූර්ණයෙන්ම එහි අයිතිය තිබුණේ එමිරේට්ස් සමාගමටයි. එමිරේට්ස් සමාගම ගියාට පස්සේවත්, එමිරේට්ස් සමාගම ඉන්න වෙලාවේදීවත්, ඊට පෙරවත් මේකට ප්‍රාග්ධන ආයෝජනයක් කරලා තිබුණේ නැහැ. අද අපි ඉතාම සන්තෝෂ වනවා, ඒ සඳහා රුපියල් මිලියන 10,000ක ප්‍රාග්ධන ආයෝජනයක් කරලා තිබෙන එක ගැන.

ඒ විතරක් නොවෙයි. මේ රටේ සියලුම ගුවන් තොටු පොළවල් සංවර්ධනය කරනවා. නිදහසින් පස්සේ මේ රටේ ඇති වන පළමුවන ජාත්‍යන්තර ගුවන් තොටු පොළ මත්තල හදන කොට, කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළත් සංවර්ධනය වනවා.

අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් වන රත්මලාන ගුවන් තොටුපොළ සංවර්ධනය කරන්න, නුවරඑළිය, නුවර, ඉරණමඩු ගුවන් තොටුපොළවල් සංවර්ධනය කරන්න රුපියල් මිලියන 750ක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගොල්ලෝ හැම දාම වරාය සංවර්ධනය ගැන කථා කරද්දී දක්ෂිණ වරාය සම්පූර්ණයෙන්ම විවේචනයට ලක් කළා. අපි ඊයේ දිනයේදී මේ රටේ සියලු දෙනාට ආශ්චර්යයේ පිවිසුම විවෘත කළා; දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දක්ෂිණ වරායට ඩොලර් මිලියන 360ක් අපි ආයෝජනය කරලා තිබෙනවා. ලබන 5වන දා කර්මාන්ත 4කට මුල්ගල් තබනවා. ඒ, sugar refinery එකක්, සිමෙන්ති නිෂ්පාදන කර්මාන්තශාලාවක්, bottling factory එකක් ඇතුළු කර්මාන්තශාලා 4කට. ඒ කර්මාන්තශාලා හතරේ ආයෝජනය විතරක් ඩොලර් මිලියන 750ක්. මේ වරාය සංවර්ධනය කරපු එක සමහර අය විවේචනය කළත්, අද ඒ වරායෙන් ප්‍රතිලාභ ලැබෙන්න පටන් අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ පෙරේදා කොළඹ වරායේ dockyard එකට තෙල් ගවේෂණ නෞකා දෙකක් ප්‍රතිසංස්කරණය කරන්න ආවා. ඒ යාත්‍රා දෙකම කොළඹ වරායේ පිවිසුම් දොරටුවෙන් ඇතුළට ගන්න බැහැ. නමුත් අපිට අහිමි වෙන්න ගිය ඒ අවස්ථාව අපි ලබා ගත්තා. හම්බන්තොට වරායේ පිවිසුම්වලින් ඒවා ඇතුළට අරගෙන ප්‍රතිසංස්කරණය කරන්න අපි ගිවිසුම් අත්සන් කළා. ඒ අනුව අපට පෙනෙනවා දක්ෂිණ වරාය තුළින් මේ රටේ දරුවන්ට අනාගතයේ වන සේවය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අවුරුදු 30ක් තිස්සේ දුක් විඳපු ඒ ව්‍යසනය අවසන් කරලා ඒ ප්‍රදේශවල ජනතාවට දැවැන්ත සංවර්ධනයක් මේ රජය ලබා දීලා තිබෙනවා. ඒ ප්‍රදේශවලට විදුලි බලය ලබා දෙන්න, ඒ ප්‍රදේශවල මාර්ග සංවර්ධනය කරන්න, ධීවර කටයුතු නංවාලන්න, සංචාරක කටයුතු නංවාලන්න දැවැන්ත ආයෝජනයක් කරලා තිබෙනවා. අද අපි ඒක ක්‍රියාවෙන් පෙන්වලා තිබෙනවා. එල්ටීටීඊ සංවිධානයේ 15,000ක් පුනරුත්ථාපනය කරලා තිබෙනවා. 2,95,000ක් නැවත පදිංචි කරලා තිබෙනවා. වර්ග කිලෝමීටර් 2,046ක් සම්පූර්ණයෙන්ම බිම් බෝම්බවලට ගොදුරු වෙලායි තිබුණේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකෙන් වර්ග කිලෝමීටර් 1,412ක් සම්පූර්ණයෙන්ම නිදහස් කර ගෙන තිබෙනවා. රටක් හැටියට ගත්තාම, රටේ ආර්ථික වර්ධන වේගය සියයට 8යි. රටේ උද්ධමනය අඩු වෙලා තිබෙනවා. රැකී රක්ෂා හිඟය අඩු වෙලා තිබෙනවා. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ගත්තාම අද අය වැය හිඟය ක්‍රමක්‍රමයෙන් අඩු වෙගන යනවා. උතුරේ ආර්ථික වර්ධන වේගය සියයට 23යි. මේක විශ්වකර්ම වැඩක්. මේ තත්ත්වය ඇති කරන්න උතුරේ සංවර්ධනය සඳහා දැවැන්ත ආයෝජනයක් කරලා තිබෙනවා. රටේ ආර්ථික වර්ධන වේගය සියයට 8ක් වන කොට උතුරේ සියයට 23ක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ඉතිහාසයේ හිටපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයන්ට, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමාට හැම දාමත් චෝදනා කළා භාෂා ප්‍රශ්නය නිසා තමයි මේ වාර්ගික ප්‍රශ්නය ඇති වුණේ කියලා. මේ භාෂා ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම නැති කරන්න අතිගරු ජනාධිපතිතුමා රුපියල් මිලියන 125ක් වෙන් කරලා තිබෙනවා. හැම රාජ්‍ය නිලධාරියකුටම ද්වි භාෂා දැනුම ලබා ගන්න, -දෙමළ සිංහල දැනුම ලබා ගන්න- ඒ ප්‍රදේශවලට දෙමළ භාෂාව කථා කරන්න පුළුවන් නිලධාරීන් යවන්න, පාසල් තුළ දෙමළ අධ්‍යාපනය නඟා සිටුවන්න දැවැන්ත වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැම දාමත් අපේ රටේ අධ්‍යාපනය ගැන කථා කරන කොට තිබුණු ප්‍රශ්නයක් තමයි, ප්‍රධාන පාසල්වලට දරුවන් ඇතුළත් කර ගැනීමේදී දෙමවුපියන් විඳින දුක්, අඳෝනා, කරදර හා කම්කටොලු. අද ඒවා නැති කරන්න විද්‍යා, ගණිත, වාණිජ උසස් පෙළ පන්ති සහිත, පරිගණකාගාර, භාෂාගාර ඇතුළු සියලුම පහසුකම් දීලා හැම

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම ද්විතීයික පාසල් දෙක ගණනේ පාසල් 1000ක් සංවර්ධනය කරන්න අතිගරු ජනාධිපතිතුමා මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ප්‍රාථමික පාසල් දියුණු කරන්න වැඩ කටයුතු කරලා තිබෙනවා.

අපි හැම දාමත් විශ්වාස කරන දෙයක් තමයි මේ රට දියුණු කරන්නට නම් සංචාරක ව්‍යාපාරය, ධීවර කර්මාන්තය සහ කෘෂි කර්මාන්තය දියුණු කරන්නට වුවමනායි කියන කාරණය. අද, කෘෂි කර්මාන්තය දියුණු කරන්න දැවැන්ත ආයෝජනයක් කර තිබෙන අවස්ථාවක්. සහල් අපනයන කලාප හතරකට බෙදා ඉදිරි කාලයේදී සහල් මෙට්‍රික් ටොන් ලක්ෂ දෙකක් අපනයනය කිරීමට දැවැන්ත ආයෝජනයක් කර තිබෙන අවස්ථාවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ධීවර කර්මාන්තය ගත්තත් අපේ ප්‍රදේශවල ධීවර නැංගුරම්පළවල්, ධීවර තොටුපළවල් සම්පූර්ණයෙන්ම සංවර්ධනය කරනවා. ඒ වාගේම මට කියන්නට බැරි වුණා, විශේෂයෙන්ම කෘෂි කර්මාන්තයේදී වී නිෂ්පාදනය සඳහා පොහොර සහනාධාරය දිගින් දිගටම රජය දෙනවා කියන එක. පසු ගිය කාලයේ ලොකු ඉල්ලීමක් තිබුණා, පොහොර සහනාධාරය දෙනකොට එළවලු නිෂ්පාදනයටත් පොහොර සහනාධාරය දෙන්නය, පොල්, රබර්, තේ කර්මාන්ත සඳහාත් පොහොර සහනාධාරය දෙන්නය කියා. අද අපේ ප්‍රදේශවල; විශේෂයෙන් අප නියෝජනය කරන පුත්තලම් දිස්ත්‍රික්කයේ මේ පොහොර සහනාධාරය ලබා ගැනීම පොල් වගා කරන අයට දැවැන්ත ශක්තියක් වෙලා තිබෙනවා.

මට පෙර කථා කළ අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ පොහොර භාවිතය ගැන යම් යම් අදහස් ඉදිරිපත් කළා. මේ පොහොර භාවිතය ගැන, කාබනික සහ අකාබනික පොහොර භාවිතයෙන් රටට වන දේ ගැන අප දන්නවා. නමුත් ඒක එකපාරටම කරන්නට බැහැ. යම් කිසි වැඩ පිළිවෙළකට යන්නට ඕනෑ. කාබනික පෙහොර භාවිතයට ජනතාව පුරුදු කරන්නට නම් අප ක්‍රමවත් වැඩ පිළිවෙළකට යන්නට ඕනෑ. ඒ වැඩ පිළිවෙළ ක්‍රම ක්‍රමයෙන් අපි සකස් කරමු. අද වෙනකොට රජය මේ කර තිබෙන ආයෝජනයෙන්, මේ පොහොර සහනාධාරය ලබා දීම තුළින් මේ රටේ වී නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. එළවලු නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. තේ, පොල් සහ රබර් නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුබසාධනය පැත්තෙන් ගත්තත් දැවැන්ත ආයෝජනයක් කර තිබෙනවා. අද සමෘද්ධි සහනාධාරය වැඩි කර තිබෙනවා. සමහරක් අය ආණ්ඩුව එන්නට ඉසසෙල්ලා කථා කළේ සමෘද්ධි ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම අකුළා දාන්නටයි. අද සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විශ්‍රාම වැටුප් ගන්නා රාජ්‍ය නිලධාරීන් බවට පත් කරන්නට, එය රාජ්‍ය දෙපාර්තමේන්තුවක් බවට පත් කරන්නට හෙට අනිද්දාට මේ අය වැයත් එක්ක වැඩ පිළිවෙළක් සකස් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ආබාධිත අයට, වැඩිහිටි අයට ඒ සියලු දෙනාටම අවශ්‍ය කරන සුබසාධන වැඩ පිළිවෙළවලවල් සඳහා මේ රජය මුදල් වෙන් කර තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)
මට තව තත්පරයක කාලයක් දෙන්න, ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි.

රණවිරු පවුල්වලට, ආබාධිත රණවිරුවන්ට, මියගිය රණවිරුවන්ගේ දෙමව්පියන්ට සුබ සාධන අවස්ථා සලසා දී තිබෙනවා. මෙය, එක පැත්තකින් සුබසාධනය කප්පාදු නොකළ රජයක්; තව පැත්තකින් දැවැන්ත ආයෝජනයක් කළ රජයක්. මාර්ග සංවර්ධනය ගත්තාම, පළාත් මාර්ග ප්‍රාදේශීය සභා මාර්ග, අධිවේගී මාර්ග, ඒ වාගේම අපේ රටේ ප්‍රධාන මාර්ග සියල්ලක්ම සංවර්ධනය කළ රජයක්.

මිනිස් සිරුරේ රුධිර නාල පද්ධතිය වාගේ තමයි අපේ රටේ මාර්ග සංවර්ධන පද්ධතිය. ඒකෙන් තමයි අපේ සේවාවන් හුවමාරු වෙන්නේ. භාණ්ඩ හුවමාරු වෙන්නේ. මිනිසුන්ගේ කාලය ඉතිරි වන්නේ. මේ, ඒ මාර්ග සංවර්ධනයට දැවැන්ත ආයොජනයක් කළ රජයක්. සුබසාධනය කප්පාදු නොකරපු දැවැන්ත සංවර්ධනයක් කරපු ඒ වාගේම ග්‍රාමීය සංවර්ධනයක් කරපු මේ වාගේ විශ්මකර්ම රජයක්, විශ්මකර්ම ජනාධිපතිවරයෙක් මේ රටේ ඉතිහාසයේවත් සිටියේ නැහැයි කියා අප කියනවා. අපේ රටේ මිනිසුන්ට ඉවසීම තිබෙනවා නම්, අපේ රටේ මිනිසුන්ට එතුමාගේ දැක්ම තේරෙනවා නම් මා හිතන්නේ මේ රට ආසියාවේ ආශ්චර්යය කරා යන එක මොන බලවතෙකුටවත්, මොන බලවේගයකටත් නවතන්නට බැහැයි කියන කාරණාව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

[பி. ப. 4.46]

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த வரவு செலவுத் திட்ட விவாதத்திலே கலந்துகொள்வதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு உங்களுக்கு நன்றியைக் கூறிக் கொண்டு என்னுடைய உரையை ஆரம்பிக்கின்றேன். யுத்தம் முடிவடைந்து ஏறக்குறைய இரண்டரை வருடங்களின் பின்பு நடைபெறும் மூன்றாவது வரவு செலவுத் திட்ட விவாதத்திலே நாங்கள் கலந்துகொண்டிருக்கின்றோம். உண்மையிலேயே ஓர் ஆயுதப் போராட்டம் - ஓர் ஆயுத யுத்தம் - முடிவுக்கு வந்தபோதிலும், பொருளாதார ரீதியான, சமூக ரீதியான, கலாசார ரீதியான ஒரு யுத்தத்துக்கு வடக்கு, கிழக்கிலே வாழ்கின்ற எங்களுடைய மக்கள் இப்பொழுது முகம்கொடுத் துக்கொண்டிருக்கின்றார்கள். அதற்கும் அப்பால், தீர்வின்றி நீடித்து நிலைத்து நிற்கின்ற இனப்பிரச்சினைக்குத் தீர்வு காண்பதற்கான ஓர் அரசியல் யுத்தத்திலே தமிழ்த் தேசியக் கூட்டமைப்பும் இந்த அரசாங்கமும் ஈடுபட்டுக் கொண்டிருக் கின்றன. இந்த அரசியல் யுத்தத்திலே நிச்சயமாக அரசாங்கமும் வெல்ல வேண்டும், தமிழ்த் தேசியக் கூட்டமைப்பும் வெல்ல வேண்டும். அதன்மூலம்தான் உண்மை யான ஒரு சமாதானத் தையும் மக்கள் நம்பிக்கை வைக்கக்கூடிய ஓர் இறுதித் தீர்வையும் நோக்கி நாங்கள் நகர முடியும். நிச்சயமாக எங்களுடைய இந்த வெற்றியின்மூலம்தான் மக்களுக்கு வெற்றி கிடைக்கும்.

இந்தப் பாராளுமன்றத்திலே முன்பு ஒவ்வொரு மாதமும் அவசரகாலச் சட்டம் நிறைவேற்றப்படுவதுபோல் இந்த வரவு செலவுத் திட்ட விவாதமும் நடைபெற்று, இறுதியிலே நிறைவேற்றப்படும். ஆனால், வடக்கு, கிழக்கிலே யுத்தத்தால் மிக மோசமாகப் பாதிக்கப்பட்ட எங்களுடைய மக்களுக்கு இதன்மூலம் நிம்மதியான ஒரு வாழ்வோ அல்லது விடிவோ கிடைக்குமா என்றால், அது நிச்சயமாக இல்லை என்றுதான் கூறவேண்டும். நேற்றைய தினம்கூட, மேதகு ஜனாதிபதி அவர்கள் தெற்கு அதிவேக நெடுஞ்சாலையைத் திறந்து வைத்துப் பேசுகின்றபொழுது, "யாழ்ப்பாணத்துக்குச் செல்லும் ஏ-9 வீதியையும் நான்கு மணி நேரத்துக்குள் அங்கு

[ගරු එස්. විනෝ මහතා]

செல்லக்கூடியதாக அதிவேகப் பாதையாக மாற்றுவதன்மூலம் பிரதேசவாதத்தையோ அல்லது இனங்களுக்கிடையில் இருக் கின்ற அந்த இடைவெளியையோ மிகக் குறுகியதாக்கி அதிலே நாங்கள் வெற்றிபெற முடியும்" என்று கூறியிருக்கின்றார். ஆனால், வீதிகளை அமைப்பதன்மூலம் மட்டும் நிச்சயமாக இந்த இலக்கினை எட்ட முடியுமா? என்று நான் சந்தேகம் கொள்கின்றேன். ஏனென்றால், உண்மையான ஒரு நல்லிணக் கத்தை ஏற்படுத்தும்வகையில் எங்களுடைய மக்களின் - ஒவ்வொரு வீட்டிலும், ஒவ்வொரு கிராமத்திலும், ஒவ்வொரு மாவட்டத்திலும் இருக்கின்ற ஒவ்வொரு தமிழ் மகனினதும் - மனங்களை வெல்லக்கூடிய நடவடிக்கைகளை மேற் கொள்ளாமல், அதற்கு என்ன செய்ய வேண்டுமோ அதைச் செய்யாமல், வீதிகளைத் திறப்பதன்மூலம் நிச்சயமாக எங்களுடைய மக்களின் பிரச்சினைகளைத் தீர்க்க முடியாது.

இந்த இனப் பிரச்சினையைத் தீர்ப்பதற்காகக் கடந்த காலங்களிலே எத்தனையோ ஒப்பந்தங்கள் செய்யப்பட்டன. அதாவது, எங்களுடைய தமிழ் அரசியல் தலைவர்கள் சிங்கள அரசியல் தலைவர்களுடன் அரசியல் ரீதியாகப் பல்வேறு ஒப்பந்தங்களைச் செய்தார்கள். அதேபோல், எங்களுக்கு ஏற்பட்ட பிரச்சினைகளைத் தீர்ப்பதற்காக அவ்வப்போது எத்தனையோ ஆணைக்குழுக்கள் நிறுவப்பட்டன. ஆனால், எதுவுமே எங்களுக்கு வெற்றி தரவில்லை. அதேபோல்தான் எல்.எல்.ஆர்.சி. எனப்படுகின்ற நல்லிணக்க ஆணைக்குழு அண்மையில் ஜனாதிபதியிடம் கையளித்திருக்கின்ற அறிக்கை யின் பிரகாரம் தமிழ் மக்கள் எதிர்பார்க்கின்ற அளவுக்கு நீதியோ நியாயமோ நிச்சயமாகக் கிடைக்கப்போவதில்லை. அதிலே சுட்டிக்காட்டப்பட்ட விடயங்களை விசாரிப்பதற்காக, ஆராய்வதற்காக அல்லது குற்றஞ்சாட்டப்பட்டவர்களுக்குத் தண்டனை கொடுப்பதற்காக மீண்டும் ஓர் ஆணைக்குழு நிறுவப்படலாம். அந்த ஆணைக்குழுவின் அறிக்கைகூட, அரசாங்கம் தமிழ் மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்கு முயற்சிக்கின்றது, அல்லது யுத்தத்தின் இறுதி நாட்களிலே நடத்தப்பட்ட அந்தக் கொலைகள் சம்பந்தமாக விசாரணை செய்கின்றது, செய்யப்போகின்றது என்ற ஒரு நிலைப் பாட்டைச் சர்வதேசத்துக்குத் தெரிவிப்பதற்கானதாக, அல்லது இந்த அறிக்கையைத் தொடர்ந்து வரப்போகின்ற ஆணைக்குழு அல்லது சம்பந்தப்பட்ட ஏதாவதொரு விசாரணைக்குழு பற்றியதாக அமையுமே தவிர, நிச்சயமாகத் தமிழ் மக்களுக்கு ஒரு நீதியான தீர்ப்புக் கிடைப்பதற்கு வழி செய்யாது.

இன்று வன்னியைப் பொறுத்தவரையில், வன்னியிலே இடம்பெயர்ந்த மக்கள் மீள்குடியேற்றம் செய்யப்பட்டுக் கொண்டிருக்கின்றார்கள். ஆனால், அதைக்கூடச் சர்வதேசத் துக்குச் சொல்வதற்காகத்தான் செய்கின்றார்கள். இன்று வவுனியா மெனிக் பாம் முகாமிலிருந்து அந்த மக்களைக் கொண்டுசென்று அவர்களுடைய சொந்தக் கிராமங்களிலே மீண்டும் குடியமர்த்துவதாகக் கூறுகின்றார்களே தவிர, உண்மையில் அது அவ்வாறு நடப்பதில்லை. அதாவது, அவர்களை ஒரு முகாமிலிருந்து இன்னுமொரு முகாமுக்குக் கொண்டுசென்று சேர்ப்பதுதான் அங்கு உண்மையிலே நடைபெறுகிறது. அது இடைத்தங்கல் முகாமாக இருக்கலாம்; அல்லது அரை - நிரந்தர வீடுகளாக இருக்கலாம். இவை யெல்லாம் ஒரு தற்காலிக ஏற்பாடுகளே தவிர, அவர்களை அவர்களது பூர்வீகக் கிராமங்களில் நிரந்தரமாக மீள்குடி யேற்றம் செய்வதற்கான எந்த ஏற்பாடுகளும் இல்லை. அவர்கள் அவர்களது சொந்தக் கிராமங்களில் நிரந்தரமாக மீள்குடியேற்றம் செய்யப்படுகின்றபொழுதுதான், அது உண்மையான மீள்குடியேற்றமாகக் கருதமுடியும். நேற்று முன்தினம்கூட, இங்குள்ள முகாம்களிலிருக்கின்ற 72க்கும் மேற்பட்ட குடும்பங்கள் திம்பிலி என்ற கிராமத்தில் மீள்குடியமர்த்தப்பட்டிருக்கின்றார்கள். அங்கு அவர்களுக்கு எந்தவிதமான அடிப்படை வசதிகளும் இல்லை. அங்குள்ள வீடுகள் கொட்டில்கள்போலவே காணப்படுகின்றன. அதற்குப் பொருத்தப்பட்டிருக்கின்ற கூரைகள் கடும் மழையினைத் தாக்குப்பிடிக்க முடியாத நிலையிலுள்ளன. இதனால் அக்கொட்டில்களுக்குள் மழைநீர் செல்கின்ற நிலைமை காணப்படுகின்றது. மேலும், அக்கிராமத்தை ஊடறுத்து வெள்ளநீர் பாய்ந்தோடுகின்ற மிக மோசமான நிலைமை காணப்படுகின்றது. அங்குள்ள காடுகளைச் சீராக வெட்டித் துப்புரவு செய்யாமையினால் நுளம்புகள் மற்றும் விஷ ஜந்துக்களின் தாக்கங்களுக்கு அந்த மக்கள் உள்ளாக வேண்டியிருக்கின்றது. வேண்டுமாயின், அண்மையில் அங்கு இடம்பெற்ற சில சம்பவங்களை எங்களால் இங்கு குறிப்பிட முடியும். நேற்று முன்தினம்கூட சன்னார் கிராமத்தில் பாம்பு தீண்டி ஒரு சிறுமி உயிரிழந்திருக்கிறாள். அங்குள்ள மக்களுக்கு அடிப்படை வசதிகள் செய்து கொடுக்கப்படாத காரணத்தி னால்தான் இவ்வாறான மரணங்கள் ஏற்படுகின்றன. அந்த மக்களை அவர்களது சொந்தக் கிராமங்களில் நிரந்தரமாக மீளக்குடியேற்றும் வரைக்கும், மீள் குடியேற்றமென்ற பெயரில் ஒரு முகாமிலிருந்து இன்னுமொரு முகாமுக்கு அனுப்புகின்ற இந்த நிலைமையை மாற்றியமைக்க வேண்டுமென்று நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

முல்லைத்தீவு மாவட்டத்தின் கரைதுறைப்பற்றுப் பிரதேச செயலகப் பிரிவிலுள்ள புதுமாத்தளன், அம்பலவன் பொக்கணை, வலைஞர்மடம், முள்ளிவாய்க்கால் கிழக்கு, முள்ளிவாய்க்கால் மேற்கு போன்ற பகுதிகளிலே கண்ணி வெடிகள் அகற்றப்படவில்லை என்று கூறப்படுகின்றது. அதேபோல், முல்லைத்தீவு மாவட்டத்திலே புதுக்குடியிருப்புப் பிரதேசத்திலுள்ள பத்தாம் வட்டாரம், ஏழாம் வட்டாரம், இரண்டாம் வட்டாரம், முதலாம் வட்டாரம் மற்றும் ஒன்பதாம் வட்டாரம் போன்ற கிராமங்களில் இன்னமும் மீள்குடியேற்றம் செய்யப்படவில்லை. அதற்கும் இதே காரணம்தான் கூறப் படுகின்றது. எனினும், தெற்கிலிருந்து அப்பிரதேசத்துக்குச் செல்கின்ற வியாபாரிகள், குறிப்பாக பழைய இரும்பு விற்பனையில் ஈடுபட்டுள்ளவர்கள், அங்குள்ள ஒவ்வொரு வீடாகச் சென்று அவற்றினை உடைத்து, அங்குள்ள பழைய இரும்புகளைக் களவாகவோ அல்லது வேறுவழிகள் மூலமாகவோ பெற்று, அவற்றினைத் தென்பகுதிக்கு கொண்டு செல்கின்றார்கள். அவர்களுக்கு அங்கே கண்ணிவெடி அபாயம் இல்லையா? என்று கேட்க விரும்புகின்றேன். அதேபோல், அப்பகுதியில் திருடர்களின் கைவரிசை காணப்படுகின்றது. அப்பிரதேசத்தில் காணப்படுகின்ற வீடுகளிலுள்ள கதவுகள், நிலைகள், யன்னல்கள் போன்ற பெறுமதியான பொருட்கள் கூட கழற்றியெடுக்கப்பட்டு, அவையெல்லாம் ஏதோ ஒரு வகையில் விற்பனை செய்யப்படுகின்றன. தெற்கிலிருந்து செல்கின்ற மொத்த வியாபாரிகளுக்கு அப்பெறுமதியான பொருட்கள் மிகக்குறைந்த விலைக்கு விற்பனை செய்யப் படுகின்றன. இவ்வாறு அவர்களுக்கு அங்குள்ள வீடுகளுக்குச் சென்று இவற்றையெல்லாம் கழற்ற முடியும் என்றால், அவர்கள் ஒருவருக்கேனும் கண்ணிவெடி அச்சுறுத்தல் இல்லாதிருப்பது எவ்வாறு? எனவே, "அங்குள்ள கண்ணி வெடிகள் முற்றாக அகற்றப்பட்ட பின்புதான் மீள்குடியேற்றம் செய்யப்படும்" என்று சொல்லுகின்ற நொண்டிச்சாட்டை நாங்கள் நிச்சயமாக ஏற்றுக்கொள்ள முடியாது. அப்படியா னால், அந்தத் திருடர்களுக்கும் வியாபாரிகளுக்கும் இது வரையில் ஒரு கண்ணிவெடியின் மூலமாவது அச்சுறுத்தல் ஏற்பட்டிருக்கின்றதா? என்று நான் கேட்க விரும்புகின்றேன். இவ்வாறு அங்கு ஒவ்வொரு பொருளாகக் களவு போய்க் கொண்டிருக்கின்ற அல்லது வியாபாரப் பொருட்களாக்கப் பட்டுக் கொண்டிருக்கின்ற நிலைமை இருந்து கொண்டிருப்

பதனால்தான் அம்மக்கள் விரைவில் சென்று தங்களுடைய சொந்தக் கிராமங்களில் வாழவேண்டும் என்று விரும்பு கின்றார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீங்களும் ஒரு கவிதைப் பிரியன் என்ற ரீதியிலே உங்கள் முன்னிலையில் ஒரு வாராந்தப் பத்திரிகையில் வெளிவந்த, யுத்தத்தினால் மிகவும் பாதிக்கப்பட்ட முல்லைத்தீவைச் சேர்ந்த கி.பி. நிதுன் என்ற ஒரு பட்டதாரிக் கவிஞனுடைய கவிதையை நான் இங்கு வாசிக்க விரும்புகின்றேன்.

"அந்தக் குருவிகள் கூடு கட்டும்!
இலைகளிலேனும் மரக் கிளைகளிலேனும்
மதிற்சுவர்க் குடையல்களிலேனும்
வேலிக் கரைகளிலேனும்
அவை கூடு கட்டும்"

"இலைக் காம்புகளைக் கொண்டாயினும்
இரும்புக் கம்பிகளைக் கொண்டாயினும்
கயிற்றுத் தும்புகளைக் கொண்டாயினும்
இற்றுப்போன ஓலைத் துண்டங்களைக் கொண்டாயினும்
செத்துப் போன தடிகளைக் கொண்டாயினும்
அவை கூடு கட்டும்"

"தமக்காக இல்லாவிட்டாலும்
தம் சந்ததிக்காக வேனும்
அவை கூடு கட்டும்
புயல்களுக்குள்ளும் இடிகளுக்குள்ளும்
உஷ்ணப் பரப்புகளுக்குள்ளும் அடை
மழைக்குள்ளும் வாழப் பழகிக்கொண்டவை
எப்போதும் தமக்காக கூடு கட்டும்"

"அந்தக் குருவிகளை அடைக்கப்பட்ட
முட்கம்பிக் கூட்டுக்குள் இருந்து
சுதந்திரமாகப் பறக்கவிட்டால் -அவை
தமக்காக தாமே கூடுகட்டும்"

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
"கூடுகட்டும் குருவிகள்" - இந்தக் கவிதையைத் தந்த நூல் அல்லது பத்திரிகை எது?

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)
"துயரக் கடல்" என்ற ஒரு கவிதைப் புத்தகத்திலுள்ள இந்தக் கவிதையை நான் வாராந்த 'சுடர் ஒளி' பத்திரிகையில் தேர்ந் தெடுத்தேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
மிகவும் நன்று.

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)
இது மிகவும் அருமையான கவிதை! ஓர் இளம் பட்டதாரிக் கவிஞனால், அவனது உள்ளக் குமுறலை வெளிப்படுத்தி, "குருவிகளுக்கு எப்படிக் கூடு தேவையோ அதேபோலத்தான் மனிதர்களுக்கு வீடு தேவை. அந்த மனிதர்கள் தாங்களாகவே அந்தக் குடில்களை - வீடுகளைக் கட்டுவதற்குச் சுதந்திரம் கொடுத்தால், அவர்களால் அங்கே சுதந்திரமாக வாழ முடியும்" என்ற கருத்திலே இந்தக் கவிதை புனையப்பட்டுள்ளது.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
மிகவும் அருமையான கவிதை!

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வன்னியிலிருந்து இடம்பெயர்ந்து இந்த முகாம்களிலே இருக் கின்ற ஒவ்வொரு வன்னி மகனுடைய துயரக் குமுறல் இதுவாகவே இருக்கின்றது என்பதை இந்த நேரத்திலே நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அதேபோலத்தான் இப்பொழுது பெய்கின்ற கடும் மழையி னால் வன்னியிலே விவசாய நிலங்கள் மிகவும் மோசமாகப் பாதிக்கப்பட்டுக்கொண்டிருக்கின்றன. விவசாயப் பயிர்ச் செய்கை செய்ய முடியாத அளவுக்கு அங்கே நிலைமை இருக்கின்றது. அண்மையிலே மாத்தறையில் இடம்பெற்ற வெள்ள அனர்த்தத்தினால் 19க்கு மேற்பட்டவர்கள் இறந்திருக் கிறார்கள்; 40க்கு மேற்பட்டவர்கள் காணாமற் போயிருக் கிறார்கள். அந்த மக்களுக்காகத் தமிழ்த் தேசியக் கூட்ட மைப்பின் சார்பாக நான் ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக்கொள்வதோடு, அந்த நிலைமை மீண்டும் ஏற் படாமல் தடுப்பதற்கான அவசர நடவடிக்கைகளை அரசாங்கம் மேற்கொள்ளவேண்டுமென்றும் இந்த நேரத்திலே கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வடக்கு, கிழக்கைப் பொறுத்தவரையிலே, குறிப்பாக யாழ்ப் பாணத்தில், இன்று மிக மோசமான கலாசாரச் சீரழிவு மறைமுகமாக நடைபெற்றுக்கொண்டிருப்பதை நீங்கள் பத்திரிகை வாயிலாக அறிந்திருப்பீர்கள். யாழ்ப்பாணம், தமிழ் மக்களுடைய பாரம்பரிய கலாசாரத்துக்குப் பெயர்போன ஓர் இடமென்று நாங்கள் பெருமை பாராட்டிக்கொண்டிருக்கின்ற நிலையில், மிக மோசமான கலாசார சீரழிவுக்குள் எங்களு டைய மண் இன்று சிக்கியிருக்கின்றது. அதற்குக் காரணம் யார்? இவற்றை ஏன் இந்த அரசாங்கத்தினால் தடுக்க முடியாதிருக்கின்றது? என்று நான் இச்சந்தர்ப்பத்திலே கேட்க விரும்புகின்றேன். அண்மையிலே விபச்சார விடுதிகள் அங்கே முற்றுகையிடப்பட்டிருக்கின்றன. அதேபோல், மாணவர்கள் மத்தியிலே போதைப்பொருள் பாவனை மிக மோசமாக நடந்தேறிக்கொண்டிருக்கின்றது. இவற்றைத் தடுப்பதற்குப் பொலிஸாரோ அல்லது இந்த அரசாங்கமோ என்ன நடவடிக்கை எடுத்திருக்கிறது? என்று நான் கேட்க விரும்பு கின்றேன். அண்மையிலே தற்போதைய அரசாங்க அதிபர் இமெல்டா சுகுமார் அவர்கள்கூட, தான் எட்டு வருடங்களுக்கு மேலாக வன்னியிலே அரசாங்க அதிபராகக் கடமையாற்றி

[ගරු එස්. විනෝ මහතා]

யதாகவும் அங்கே எந்தவொரு பாலியல் துஷ்பிரயோகமோ பாலியல் ரீதியான எந்தத் துன்புறுத்தல்களோ நடைபெற வில்லையென்றும் தனக்கு அப்படிப்பட்ட முறைப்பாடுகள் எதுவும் கிடைக்கவில்லையென்றும் பெருமையாகக் கூறி யிருந்தார். அப்பொழுது அது விடுதலைப் புலிகளின் கட்டுப் பாட்டில் இருந்த பகுதி. ஆனால், இன்று யாழ்ப்பாணத்திலே என்ன நடக்கின்றது? தான் பதவியேற்று எட்டு மாதங்களுக் குள்ளேயே 250க்கு மேற்பட்ட பாலியல் துன்புறுத்தல்கள் நடைபெற்றிருப்பதாக அவர் சொல்கிறார். அப்படியாயின், இப்பொழுது அந்தக் காலம் - அந்தச் சூழ்நிலை மாற்றப் பட்டிருக்கின்றது. ஏதோவொரு வகையிலே இளம் சமுதாயம் திசைதிருப்பப்பட்டு, அங்குள்ள சமூகத்தின் மத்தியிலே இப்படியான கலாசாரச் சீரழிவுகள் திட்டமிட்டுத் திணிக்கப் படுகின்றது என்றே நாங்கள் கருதவேண்டியிருக்கின்றது. அதேபோலத்தான் சிறந்த ஒழுக்கமும், கல்விலே மிகவும் உயர்ந்த மட்டத்திலுமிருக்கின்ற யாழ்ப்பாணக் கல்விச் சமூக மட்டத்திலே, மாணவர்கள் மத்தியிலான இந்த போதைப் பொருள் பாவனை இன்று அச்சமூட்டும் ஒரு விடயமாக இருக்கிறது. போதைவஸ்து வியாபாரிகளாக இருந்தாலும் சரி, அல்லது பாவனையாளர்களாக இருந்தாலும் சரி, அவர்கள் அந்த அளவுக்கு அங்கு அதிகரிப்பதற்கு, அவற்றை மாணவர்களே பாவிக்கின்ற அளவுக்கு அங்குள்ள நிலைமை யிலே மாற்றம் ஏற்பட்டுள்ளமைக்கு யார் யாரணம்? இதைத் தடுப்பதற்கு ஏன் நடவடிக்கை எடுக்கப்படவில்லை?என்று இந்த நேரத்திலே நான் இந்தக் கௌரவ சபையிலே கேட்க விரும்புகின்றேன்.

வன்னியைப் பொறுத்தவரை, அங்கே கல்வி நிலைமை மிக மோசமாகச் சென்றுகொண்டிருப்பதை நாங்கள் உங்களுக்கு இந்த நேரத்திலே சுட்டிக்காட்ட விரும்புகிறோம். அங்கே பாடசாலைகளுக்கு ஒழுங்கான கட்டிடங்கள் இல்லை. கட்டிடங்கள் இருந்தாலும் கூரைகள் இல்லை. மழைகாலத்தில் வகுப்பறைகளுக்குள் வெள்ளம் வருகிறது; வகுப்பறைகளில் குடைபிடித்துக்கொண்டுதான் கல்வி கற்கவேண்டிய ஒரு துர்ப்பாக்கியமானதும் வேதனையானதுமான நிலைமை காணப்படுகிறது. அண்மையிலே அது தொடர்பான புகைப்படம்கூட பத்திரிகையில் பிரசுரிக்கப்பட்டிருந்ததை நீங்களும் பார்த்திருப்பீர்கள். கல்வி அபிவிருத்திக்கு வரவு செலவுத் திட்டங்களிலே நிதி ஒதுக்கப்பட்டாலும்கூட, அங்குள்ள கல்வி நடவடிக்கைகளுக்கு அந்த நிதி சென்ற டையாததன் காரணமாகத்தான் அந்த நிலைமை ஏற்படுகிறது. அங்கே பாடசாலைகளுக்கு வேலிகள் இல்லை. கடந்த கால யுத்தம் காரணமாக அவை சேதமடைந்திருக்கின்றன. அங்குள்ள பாடசாலைகளில் பகலிலே மாணவர்கள் கல்வி கற்கின்றார்கள்; இரவிலே ஆடு, மாடுகள் தங்குகின்றன. அங்கிருக்கின்ற இப்படியான நிலைமைகள் மாற்றியமைக்கப்பட வேண்டும். மேலும், கணினிகள் இருக்கின்ற பாடசாலைகளுக்கு கணினிக் கூடங்களும் மின்சாரமும் இல்லை. மின்சாரமும் இல்லாமல், கணினிக்கூடங்களுக்கான வசதிகளும் செய்து கொடுக்காமல் கணினிகளை மாத்திரம் கொடுப்பதில் எந்தவித அர்த்தமும் இல்லை.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
எந்தப் பகுதியைப் பற்றிக் குறிப்பிடுகின்றீர்கள்?

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வன்னி மாவட்டம் முழுவதும் இதே நிலைமைதான் இருக்கின்றது.

நான் ஏற்கெனவே கூறியதுபோல் மழை காலத்தில் மீள்குடியேற்றக் கிராமங்கள் மிக மோசமாகப் பாதிக்கப் பட்டுக்கொண்டிருக்கின்றன. இயற்கை காரணமாக பயிர்ச் செய்கையில் ஈடுபடமுடியாத நிலைமை ஒருபுறம்! மீனவர்கள் கடற்றொழிலுக்குச் செல்ல முடியாத நிலைமை இன்னொரு புறம்! அதைவிட, மீள் குடியேற்றம் செய்யப்பட்ட கிராமங் களிலே வெள்ளம் புகுந்துகொண்டிருக்கின்றது. பருவ மழையினை அந்தக் கூடாரங்களால் தாக்குப்பிடிக்க முடிய வில்லை. இதன் காரணமாக அவர்களுடைய வசிப்பிடங்கள் மிக மோசமான நிலைக்குள்ளாகியிருக்கின்றன. குறிப்பாக, அவர்களுக்கான வீட்டுத்திட்டங்கள் - அது அரைகுறையான ஒரு வீட்டுத்திட்டமாக இருந்தாலும்சரி - எதுவுமே செய்து கொடுக்கப்படவில்லை. மீள்குடியேற்றம் செய்யப்பட்டதன் பின்பு அவர்களுக்கு வழங்கப்பட்டது ஒரு தறப்பாளும் நான்கு தகரங்களும் 4 - 5 தடிகளும்தான்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)
இப்போது முடித்துக்கொள்கின்றேன்.

முல்லைத்தீவு மாவட்டத்திலே ஹிஜ்ராபுரம், நீராவிப்பிட்டி, தண்ணீரூற்று போன்ற பகுதிகளிலே முஸ்லிம் மக்கள் மீள்குடி யேறியிருக்கிறார்கள்; அவர்களுக்கும் இதே நிலைமைதான்! அரசாங்கம் அவர்களுக்கு உதவி செய்யவில்லையென்பதை அமைச்சர்களே ஒத்துக்கொள்கிறார்கள். அவர்களின் வாழ்வா தாரத்துக்கு உதவி செய்யவில்லை; அவர்களின் அடிப்படைத் தேவைகள் பூர்த்தி செய்யப்படவில்லையென்று அமைச்சர்களே கூறுகிறார்கள். அமைச்சர்களே தாம் சார்ந்திருக்கின்ற அரசாங் கத்தை குறைகூறுகிறார்கள். முல்லைத்தீவு மாவட்டத்திலே கொக்கிளாய், கொக்குத்தொடுவாய், கருநாட்டுக்கேணி போன்ற கிராமங்கள் மிகமோசமாகப் பாதிக்கப்பட்ட கிராமங் களாகும். அவர்கள் ஏறக்குறைய 24 வருடங்களுக்குப் பின்பு இப்போதுதான் மீளக்குடியேற்றம் செய்யப்பட்டிருக்கிறார்கள். அவர்களுடைய நிலையை எண்ணிப்பார்க்க வேண்டும். காடுகளிலும் மரநிழல்களிலும் அவர்கள் குடிசைகளை அமைத்து வாழ்ந்து கொண்டிருக்கிறார்கள். இதற்கும் அரசாங்கம் உரிய தீர்வை முன்வைக்க வேண்டும்.

மேலும், மன்னாரிலே தமிழ், முஸ்லிம் என்ற வேறு பாடில்லாமல் அவர்களுடைய வாழ்வாதாரத்துக்கு அரசாங்கம் உதவ வேண்டும். இந்த மழை காலத்திலே உடனடியாக அந்த மக்களுக்குத் தேவையான உதவிகளைச் செய்து, அவர்க ளுடைய அவசியத் தேவைகளைப் பூர்த்திசெய்து கொடுக்க வேண்டியது அரசாங்கத்தின் கடமையாகுமென்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

[අ. භා. 5.07]

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில் முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය නැති බය නැති ජනතාවක් වශයෙන් ශ්‍රී ලාංකිකයින් ලෝකය හමුවේ ඔසවා තබන්නට අපේ රජය කටයුතු කරමින් සිටින වකවානුවකයි අපි මේ කථා කරන්නේ. මේ රටේ ජනතාවගේ හිරි වැටුණු ශරීරවල රතු ලේ වෙනුවට ඇල් වතුර දුවපු යුග කිහිපයක් අපි පසු කර තිබෙනවා. ඒ සෑම යුගයක්ම වෙළා ගනිමින් වසර 30ක් පුරා මේ රට ගිනියම් කළ ත්‍රස්තවාදය නැති කර දමන්නට ඉතිහාසයේ සිටි කිසිම නායකයකුට හැකියාවක් ලැබුණේ නැති බව කවුරුත් දන්නවා. එය ශ්‍රී ලාංකිකයින් වශයෙන් පක්ෂ, පාට අමතක කර ආඩම්බර විය යුතු කරුණක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම දිනා ගත් නිදහස රැක ගැනීම රටක වග කීමක් වෙනවා. අද වන විට ඒ වගකීම පැහැර හරිමින්, ජාතිකත්වය අමතක කර ජාත්‍යන්තරයට ගැති වෙමින් කටයුතු කරන්නට විවිධ කණ්ඩායම් උත්සාහ ගනිමින් සිටිනවා. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රටට දිනා දුන් නිදහස හැල්ලු කරන ප්‍රධාන කණ්ඩායම බවට රටේ වග කීමක් දරන විපක්ෂය පත් වෙමින් සිටිනවා. එය කනගාටුවට කරුණක්. ඒ වාගේම ලජ්ජාවටද කාරණාවක්. පාර්ලිමේන්තුවට මෙවර අය වැය ඉදිරිපත් කළ අවස්ථාවේ විපක්ෂය පාර්ලිමේන්තුව තුළ හැසිරුණේ ලිප්ටන් වට රවුමේ හැසිරෙන ආකාරයටයි. එය රටක් වශයෙන් උඩ බලා ගෙන මුහුණට කෙළ ගසා ගැනීමක් බව අමුතුවෙන් කිව යුතු නැහැ. එය හරිම ලජ්ජාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 අය වැය සියලු ක්ෂේත්‍රයන් ආවරණය කරමින් සැකසූ සාර්ථක අය වැයක් බව මොළය ඇති ඕනෑම කෙනෙකුට තේරුම් ගන්න අපහසු නැහැ. ආර්ථික විශේෂඥයින්ගේ පැසසුමට පවා මෙවර අය වැය ලක් වෙමින් තිබෙනවා. එය තුලිත අය වැයක් බව තරයේ මා කියා සිටිනවා. රටේ ගනුදෙනු කළමනාකරණයෙන් ඔබ්බට යමින් දිගු කාලීන සංවර්ධනයක් කරා රට තල්ලු කරන අය වැයක් වශයෙන් මෙය කැපී පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර තිහක ත්‍රස්තවාදයක් අතු ගා දමා වේගවත් සංවර්ධනයක් ඉතා කෙටි කාලයක් තුළ උදා කළ රජයකින් මීට වඩා තවත් දේවල් බලාපොරොත්තු වෙනවා නම් "ඇස් ගෙඩිවලට හෙණ ගැහිලද වැසියන්ගේ" කියලා අහන්න සිද්ධ වෙනවා.

මේ රට සංවර්ධනය කරා යන ගමනේදී අඩු පාඩු තිබෙන්න පුළුවන්. අපි එය නැහැ කියන්නේ නැහැ. නමුත් අපි මීට වසර කිහිපයකට පෙර සිටියේ කොතැනද කියන එක අමතක කරනවා නම් එය තමන්ටම කර ගන්නා වූ අපරාධයක්. යුද්ධයක් අවසන් කර ගත වුණේ වසර තුනයි. මේ වසර තුනේ ආණ්ඩුව නිකම් හිටියා නම් අය වැය ගැන විවේචන එල්ල කළාට කමක් නැහැ. නමුත් සංවර්ධන ක්‍රියාදාමයන් දැවැන්ත ලෙස ක්‍රියාත්මක කරමින් මීට වඩා සාර්ථක අය වැයක් ඉදිරිපත් කරන්න සක්කරයාටවත් බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනාගත ලෝකයට ආහාර භියක් කරා යන ගමනේදී ජාත්‍යන්තරයට බලපෑ හැකි ප්‍රශ්න අපි මේ වන විටම හඳුනා ගෙන තිබෙනවා. ඒ අනුව "නිල්ල පිරුණු රටක්, අටු කොටු පිරුණු හෙටක්" යන තේමාවෙන් මේ රට සහලින් ස්වයංපෝෂිත වීම අපේක්ෂා කර තිබෙනවා. ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් "දිවි නැඟුම" සවියක් වී තිබෙනවා. ඒ තුළින් දැනටමත් උද්ධමනය සියයට 5ක් දක්වා අඩු කර ගැනීමට රජය කටයුතු කර තිබෙනවා. ඒ වාගේම කොම්පැනි සතුව තිබෙන ප්‍රයෝජනයට නොගන්නා ඉඩම් මේ රටේ අහිංසක දුප්පතුන්ට වගා කිරීමේ අයිතියට පවරන්නට යෝජනා කර තිබෙනවා. මේවාටද මේ අය "ලජ්ජයි" කියන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා මේ රටේ අනාගත පරපුර ගැන නිතරම සිහින දකින නායකයෙක් ලෙස සෑම විටම ප්‍රචලිත වී තිබෙනවා. අද දරුවා හෙට මේ රටේ පාලකයා වන නිසා අධ්‍යාපනයක් සහ යහපත් හැසිරීමක් සමඟ රටට ආදරය කරන පුද්ගලයෙකු ලෙස නිර්මාණය වනවා දැකීම එතුමාගේ සංකල්පයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ සඳහා තල්ලුවක් මේ අය වැයෙන් ලැබී තිබීම අදට වඩා අනාගතයේ සතුටු වීමට හැකි කාරණයක් ලෙස මා දකිනවා. අනාගතය නොපෙනෙන විපක්ෂය ලජ්ජාවට පත් විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඈත ගම් දනවුවල පාසල් සංවර්ධනයට මේ අය වැය තුළින් විශාල කැප කිරීමක් කර තිබෙනවා. දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා සියලු දරු දැරියන් ලක් මවගේ දරුවන් ලෙස මෙවර අය වැයෙන් සලකා තිබෙනවා. ඔවුන් කිසිවකු මෙවර අය වැයෙන් අමතක කර නැති බවත් මා දකිනවා. ඒ වාගේම රටම ආවරණය වන සමෘද්ධි නිලධාරින්, රණවිරුවන්, ගොවියා, ධීවරයා, කම්කරු පන්තිය ඇතුළු සමස්ත වැඩ කරන ජනතාව දෙස අවධානය යොමු කළ අය වැයක් ලෙස මා මේ අය වැය දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. මේ අය වැය රටවැසියන්ගේ සෞඛ්‍ය සම්පන්න බව, ආගමික පුනර්ජීවනය, විද්‍යාව, කලාව සහ තොරතුරු සන්නිවේදනය අමතක නොකළ සියලු අක්මුල් සිසාරා ගිය අය වැයක් බව පෙන්වා දිය හැකිව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මකුළු දැල් බැඳිලා තිබුණ තැනක් පිරිසිදු කළාම එතැන එක රොඩ්ඩක් තිබුණොත් චෝදනා එන්නේ එය පිරිසිදු කළ පුද්ගලයාටයි. ඒ වාගේම පිහන් බිඳෙන්නේ පිහන් සෝදන මිනිසා අතින්. මකුළු දැල් බැඳිලා තිබුණු රටක් ශුද්ධ කරලා ගත්තු ජනාධිපතිතුමාට විවිධ අභූත චෝදනා එල්ල කරන්න විපක්ෂය උත්සාහ කරනවා. ඒ දේශපාලන කුහකකම ප්‍රදර්ශනය කිරීම මිස වෙන කිසිවක් නොවෙයි. මේ අය වැය රටේ සංවර්ධනය ඉලක්ක කර තිබෙන අය වැයක් මිස දේශපාලන වාසි ලබා ගන්න ඉදිරිපත් කළ අය වැයක් නොවන බව විපක්ෂය වෙත මා දැඩිව අවධාරණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2005 සිට මේ දක්වා ජනාධිපතිතුමන්ගේ වැඩ පිළිවෙළ තුළ සියලු පාර්ශ්වයන්ගේ දේශපාලන පැවැත්මට අවශ්‍ය සටන් පාඨ හිඟ වෙමින් පවතිනවා. එය ඔවුන්ගේ ඉදිරි ගමනට විශාල බාධාවක් වෙලා තිබෙනවා. කාලයක් යුද්ධය ප්‍රධාන සටන් පාඨයක් වෙලා තිබුණා. දැන් ඒකත් නැහැ. රටේ දිළිඳුකම තවත් සටන් පාඨයක් බවට පත් වෙමින් තිබුණා. දැන් ඒකත් නැහැ. සංවර්ධනයක් නැතිකම තවත් එක සටන් පාඨයක් වුණා. දැන් රට සංවර්ධනය වෙනකොට ඒකත් නැතිව ගොස් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අයගේ පැවැත්ම උදෙසා අපි කර ගෙන යන සංවර්ධන ක්‍රියාදාමයන් නවතා දැමිය යුතු දැයි මා ප්‍රශ්න කරනවා.

කොටින්ම කියනවා නම් මෙවර අය වැය මව් ගුණ හඳුනන, දරු සෙනෙහස උතුරා ගිය, කළගුණ හඳුනන, ලෙන්ගතුකම වැපිරුණ, ආගන්තුක සත්කාරයෙන් සපිරි, නීති ගරුකවුත්, නිරහංකාරවුත්, ධාර්මික අය වැයක් ලෙස මා අර්ථකථනය කරනවා. මෙය තවත් තේරුම් ගන්න බැරි නම් ඒ වාගේ අයට ඉතිරි වන්නේ ලජ්ජාව පමණයි. ස්තුතියි.

[අ.භා. 5.15]

**ගරු ඩුලිප් විජේසේකර මහතා (ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு துலிப் விஜேசேகர - அனர்த்த முகாமைத்துவ பிரதி அமைச்சர்)

(The Hon. Duleep Wijesekera - Deputy Minister of Disaster Management)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය පිළිබඳව අදහස් දක්වන්නට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ඉතාමත්ම ස්තුතිවන්ත වනවා. ආපදා කළමනාකරණ නියෝජ්‍ය ඇමතිවරයා හැටියට මං ප්‍රථමයෙන්ම කියනවා, පසු ගිය දවසක මාතර, වැලිගම ප්‍රදේශයේ ඇති වුණු හානිය සම්බන්ධව. එහිදී ජීවිත 20කට වැඩිය හානි වෙලා පුද්ගලයන් 40කට වැඩිය අතුරුදන් වෙලා තිබෙනවා. ඒ සියලු දෙනාටම අපේ කනගාටුව රජය වෙනුවෙන් ප්‍රකාශ කරන්න ඕනෑ.

විපක්ෂයේ මන්ත්‍රීවරු සියලු දේවල් අමතක කර රෝස මල් යහනාවන් තුළින් මේ දක්වා ආවා වාගේ මේ අය වැය සම්බන්ධව කථා කිරීම ගැන අද අපි ඉතාමත්ම කනගාටු වනවා. මේ දින ගණනාව තුළම ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කථා කරපු සියලු දෙනාම පෙණහල්ල පිරෙන්න හුස්ම ගත්තේ 2009 මැයි මාසයේ 18වන දායින් පසුවයි. මේ තත්ත්වය උදා කර දුන්නේ අතිගරු ජනාධිපතිතුමායි. ආරක්ෂක ලේකම්තුමා, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු සියලු දෙනාම රජයක් හැටියට ඉතාමත්ම ඕනෑකමින් ඒ කටයුතු මෙහෙයවූවා. පසු ගිය වසර ගණනාව තුළ එකින් එක ප්‍රශ්න විසඳා ගෙන එන විට ලොකුම ප්‍රශ්නය හැටියට තිබුණු තිස් වසරක යුද්ධය මානුෂික මෙහෙයුම හැටියට මායිල් ආරුවෙන් ආරම්භ කරලා මාස 30ක් ඇතුළත අවසන් කළා. අපිට ඕනෑම වෙලාවක මේ රටේ හතර දිග් බාගයේ යන්න එන්න අවකාශය හදලා දුන්නා.

අපේ අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා, මේ වෙලාව දේශපාලන පක්ෂ පාට භේද සියල්ල අමතක කර අපේ රටේ යම් නොපෙනෙන බලවේගවල ශක්තියත් තුළින් ඉතාමත්ම හොඳින් කටයුතු කර ගෙන යන වෙලාවක් බව. අතිගරු ජනාධිපතිතුමාගේ දෙවන පදවි ප්‍රාප්තියත් සමඟ හත්වන අයවැය ඉදිරිපත් කරපු වෙලාවයි මේ. විපක්ෂයේ ඉතාමත්ම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් සිටියදී විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු, අය වැය කථාව ඉදිරිපත් කරන්න පටන් අරගෙන ඉතාමත්ම සුළු වෙලාවකින් ඉතාමත්ම අශෝභන විධියට හැසිරුණා. මේ රට බේරාගත් මුළු මහත් ශ්‍රී ලංකාවම ඉතාමත්ම ආදරය කරන රාජ්‍ය නායකයායි මෙවර අය වැය ඉදිරිපත් කළේ. විපක්ෂයේ සියලු දෙනා අතිගරු ජනාධිපතිතුමා ගමේ ජනතාවගෙන් වෙන් කරන්න නොයෙක් උත්සාහ ගත්තා. නමුත් ගහට පොත්ත වාගේ ජනතාව සමඟ බද්ධ වෙලා ඉන්න ඒ නායකයා ඉදිරියේ එතුමන්ලා හැසිරුණු ආකාරය, "ලැජ්ජයි" කියලා බෝඩ් එකක් එතුමාට අල්ලපු ආකාරය අපි දැක්කා. විපක්ෂ නායකතුමාත් එක්ක ඉන්න ඒ ගොල්ලන්ට ලජ්ජා ඇති. තරුණ මන්ත්‍රීවරුන් හැටියට අපි සියලුම දෙනා අපේ නායක අතිගරු ජනාධිපතිතුමාත් එක්ක ඉන්න ඉතාමත්ම ආඩම්බර වනවා. ඒ ගොල්ලෝ ලජ්ජා වන කොට අපි ආඩම්බර වනවා. 2005 ඉඳලා අතිගරු ජනාධිපතිතුමාත් එක්ක මේ ඉන්න පිරිස ඉතාමත්ම ආඩම්බරයෙන් ඉන්නේ; ගමට යන්නේ. ගමේ සංවර්ධනය, මඟ නැඟුම, ගම නැඟුම, දිවි නැඟුම -මේ සියල්ල- එක්ක අද ගමේ ජනතාව ඉතාමත්ම හොඳින් මේ රජයත් එක්ක අතිගරු ජනාධිපතිතුමාත් එක්ක ඉන්න වෙලාවක්, මේ.

විශේෂයෙන්ම මේ දින ගණනාව තුළ අපේ ඇමතිවරු, මන්ත්‍රීවරු -බොහොම තරග කරලා තමයි මේ වාගේ පුංචි වෙලාවක් වුණත් ලබා ගත්තේ.- සියලු දෙනාම වාගේ අය වැය ගැන කථා කළා. අතිගරු ජනාධිපතිතුමා එම මන්දිරයේ රැස්වීම් වාර විශාල ගණනාවක් කැඳවලා, වෘත්තීය සමිති ඇතුළු සියලුම ජන කොටස්වල අදහස් අරගෙන, සියලු දෙනාම ඉතාමත්ම හොඳින් ආවරණය වන විධියට ඉතාමත්ම හොඳින් සකස් කරලා අය වැය ඉදිරිපත් කළා. අපේ එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්තුමා කිව්වා -මේ ගැන අපේ කෘෂිකර්ම ඇමතිතුමාත් කලින් කිව්වා.- මේ අය වැය බොහොම තිත්ත බේතක සීනි ආලේප කළා වාගේ අය වැයක් කියලා. තිත්ත බෙහෙතක් කියන්නේ බොහොම ගුණ ඖෂධයක් නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක අමාරුවෙන් කටට දා ගත්තොත් බොහොම ගුණයි. එහෙම නම් මේ අය වැයේ තිබෙන හොඳ තමයි එතුමාත් වක්‍ර ආකාරයෙන් ප්‍රකාශ කර තිබෙන්නේ.

විශේෂයෙන් අද සියලු දෙනාටම අමතක වෙලා තිබෙන දෙයක් තිබෙනවා. අද රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ගැන කථා කරනවා. එදා 16/01 චක්‍රලේඛනය ගෙනැල්ලා, විශ්‍රාම යන අය වෙනුවට නැවත බඳවා ගැනීම් නවත්වලා, රාජ්‍ය සේවය ලක්ෂ හයකට කප්පාදු කරලා කටයුතු කරන්න හදපු අය අද රාජ්‍ය සේවකයාගේ වැටුප ගැන කථා කරනවා. ලක්ෂ 13කට වැඩි රාජ්‍ය සේවයක් පෝෂණය කරමින්, තවත් සේවකයන් බඳවා ගෙන, ඊට අමතරව, ස්වයං රැකියා හැටියට කටයුතු කරන්න, සුළු කර්මාන්ත, වගාවන්, සත්ත්ව පාලනය, මේ වාගේ සෑම අංශයකින්ම වුවමනාව, අවශ්‍යතාව, හැකියාව තිබෙන අයට දෙපයින් නැඟිටලා රට දිනන්න, ලෝකය දිනන්න අවශ්‍ය විධියට ඒ පහසුකම් සපයන්න කටයුතු කර ගෙන යන අය වැයකුයි අද අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ වාගේ වැඩ පිළිවෙළක් අපේ රජය හැටියට ඉතාමත්ම හොඳින් දියත් වනවා.

අපි මතක් කරන්න ඕනෑ, අතිගරු ජනාධිපතිතුමා 2005 දී පළමුවන ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙච්ච වෙලාවේ සිට එක්සත් ජාතික පක්ෂය ඉතාමත්ම කැත විධියට, එතුමා ජාතිවාදියෙක්, ලේ පිපාසිතයෙක්, යුද්ධ කරලා මේ රට විනාශ කරයි කියලා කිව්ව බව. ඔබතුමා දන්නවා, තමුන්නාන්සේලාගේ පල්ලිවල මුස්ලිම් ජාතිකයනට යාච්ඤා කරන්න හම්බ වෙන එකක් නැහැ, මේවා තහනම් කරයි කියලා ඔවුන් අවුස්සලා එතුමාගේ ජයග්‍රහණය වළක්වන්න හැදූ බව. ඒකෙන් එතුමන්ලා පරාද වුණා. ඒ හින්දාත් එතුමන්ලාට ලජ්ජයි.

රුපියල් තුන්සිය පණහකට පොහොර සහනාධාරය දෙන්නේ ඒ වියදමෙන් සියයට 96ක් රජය දරලායි. ඉතාමත්ම සුළු කොටසකුයි ගොවියාගෙන් අය කරන්නේ. ඉස්සෙල්ලාම වී වගාවට ඒ සහනය ලබා දුන්නා. ඉතාමත් හොඳ අවස්ථාවකට මමත් සහභාගි වුණා. පොල් පොහොර සහනාධාරය ලබා දෙන වෙලාවේ ඒ රැස්වීමට මටත් සම්බන්ධ වන්න හැකියාව ලැබුණා. එය ඉතාමත්ම වටිනා රැස්වීමක්. පොල් වගා කරන ඒ සියලු දෙනා අද ඒ පොහොර සහනාධාරය ලබමින් ඉතාමත්ම හොඳින් ඒ කටයුතුවල නිරත වෙලා ඉන්නවා. කුඩා තේ වතු හිමියන් පොහොර සහනාධාරය ලබා ගනිමින් අද තේ කර්මාන්තය අපේ රටේ ඉතාමත්ම ශක්තිමත් ව්‍යාපාරයක් හැටියට පවත්වාගෙන යනවා. ඒ වාගේමයි අනෙකුත් සුළු අපනයන භෝග සම්බන්ධවත්. කුරුඳු, ගම්මිරිස් ඇතුළු අනෙකුත් සුළු අපනයන භෝගවලටද ඉතාමත්ම හොඳ මිලක් ලැබෙනවා. ඒ භෝග ඉතාමත්ම හොඳින් වගා කරන්නට ඒ සියලු දෙනාට අවශ්‍ය පහසුකම් සපයමින් කටයුතු කරන මොහොතක් මේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විශේෂයෙන්ම මම මතක් කරන්නට ඕනෑ, අද උදේ අපේ ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා කිව්ව කථාවක්. එතුමා ලෙඩෙක් බලන්න ගියාලු. රුපියල් අටදාහක් ගෙව්වා ලු, බෙහෙත් අරන් දෙන්න. අපේ මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා ඒ අවස්ථාවේ ගරු සභාවේ සිටියා. එතුමා නැඟිටලා ඒකට පිළිතුරු දුන්නා. ඖෂධ ගෙන්වන ව්‍යාපාරිකයන් විශාල පිරිසක් අපේ රටේ සිටිනවා. අපේ රටි

කරුණානායක මන්ත්‍රීතුමා -පසු ගිය කාලයේ හිටපු අපේ වෙළෙඳ ඇමතිතුමා- දැන් බොහොම ආඩම්බරයෙන් ජාතික ඇඳුම ඇඳලා බොහොම උනන්දුවෙන් කථා කරනවා. පසු ගිය කාලයේ ලංකාවට ඖෂධ ගෙනාපුවාම යම් සූත්‍රයක් අනුව මිල පාලනයක් තිබුණා. එතුමා වෙළෙඳ ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ තමයි ඒක ඉවත් කළේ. ඒ නිසා අද රුපියල් 100කට ගෙනෙන බෙහෙත් එක රුපියල් 1,500ටත් විකුණනවා. ගරු ජෝශප් මයිකල් මන්ත්‍රීතුමාට රුපියල් අටදාහක් ගෙවන්න වුණේ ඒක තමයි. ඒ නිසා අපේ සෞඛ්‍ය ඇමතිතුමා නැවත වතාවක් ඖෂධ සඳහා මිල පාලනයක් ගෙනෙන්න කටයුතු කරගෙන යනවා.

මේ අය අද බොහොම ජාති ආලයෙන්, ජනතාවට ආදරයෙන් කථා කෙරුවාට ඒ කාලයේ කරපු ඒවාත් මතක් කරන්නට ඕනෑ. එතුමන්ලා යුද්ධය පැවතුණු වෙලාවේ අපේ මේ රට ආරක්ෂා කරපු මුර දේවතාවුන් වැනි අපේ ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ අයට අපහාස කළා. අලිමංකඩ කියලා පාමංකඩ යනවා කිව්වා. කිලිනොච්චිය කියලා මැදවච්චියට යනවා කිව්වා. ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන් කිව්වා, අපේ කිරිඇල්ල මන්ත්‍රීතුමා. හිටපු ජනරාල් උන්නැහේ ගැළවීමේ හමුදාවට සුදුසුයි කිව්වා. ඒ අයට කරපු ඒ අපහාසය, අවමානය තමයි වක්‍ර ආකාරයෙන් එතුමන්ලාට අද සාප වෙලා තිබෙන්නේ කියලා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ මොන ආකාරයෙන් කැගැහුවත් අපේ රටේ ජනතාව මේ අය ගැන ඉතාම හොඳින් දන්නවා. අපේ ජනතාව බොහොම බුද්ධිමත්. රුපියල් 10,000ක් වැටුප් වැඩි කරනවා කියලා එදා ඒ අය කිව්වාට ජනතාව දැන ගෙන සිටියා ඒවා කරන්න බැරි වැඩ කියලා. රජය හැටියට අපි දෙනවාය කියපු ඒ රුපියල් 2,500ක වැටුප් වැඩි වීම ගැන එතුමන්ලා විශ්වාස කරලා, පසු ගිය මැතිවරණවලදී ඉතාම හොඳින් ඡන්දය දුන් කරපු ආකාරය අපි දැක්කා.

මානුෂික මෙහෙයුම අවසන් වන්නට කලින් අපේ උතුරේ, නැගෙනහිර සමහර මන්ත්‍රීවරු බොහොම ද්වේෂ සහගතවයි කථා කළේ. එතුමන්ලා කථා කරපු ආකාරය අපි දැක්කා. පසු ගිය මාස ගණනාවක් තිස්සේ අපේ දයාශ්‍රිත තිසේරා ඇමතිතුමාත්, විජය දහනායක නියෝජ්‍ය ඇමතිතුමාත් ඇතුළු අපි පේදුරුතුඩුව ප්‍රදේශයට ගියා. එහි දෙමළ ජනතාවත් සමඟ සම්බන්ධ වෙලා කටයුතු කළා. මැතිවරණයෙන් පසුවත් අපි දෙපාරක් ගියා. විශේෂයෙන් යාපනය ප්‍රදේශයේ බොහොම උනන්දුවෙන් වගා කටයුතු කරන ජනතාවක් සිටිනවා. ඒ අය ලූනු, මිරිස් ආදිය වගා කරනවා. සත්ත්ව පාලනය කරනවා. යාපනය අර්ධද්වීපයේ තිබුණු ගොවි ජන මධ්‍යස්ථාන 15ක් පසු ගිය කාලයේ ප්‍රතිසංස්කරණය කරලා ලූනු වගාවට, මිරිස් වගාවට, සත්ව පාලනයට, ඒ අවශ්‍ය පහසුකම් ලබා දෙන්නට අපි කටයුතු කළා. ඒ වාගේම අපි පාසල් ගණනාවක කටයුතුවලට සම්බන්ධ වුණා. ඒ සියලු දරුවන්ට අධ්‍යාපනය ලබන්න අවශ්‍ය පහසුකම් ලබා දුන්නා. නමුත් මෙතුමන්ලා මෙතැන ඉඳ ගෙන රජය අපහසුතාවට ලක් වන ආකාරයට කථා කරනවා.

මේ යුද තත්ත්වය දශක තුනක් -අවුරුදු 30ක්- තිබුණා. ඉංජිනේරුවෝ, දොස්තරවරු, accountantsලා ඒ කාලයේ කොච්චර ඒ පළාතෙන් බිහි වුණාද? අපේ ගමේ අපි පුංචි කාලයේ බෙහෙත් ගත්තේ ඒ යාපනය ප්‍රදේශයෙන් ආපු වෛද්‍යවරුන්ගෙන්. අපේ ගම්වල අදටත් ඒ වෛද්‍යවරු ඉන්නවා. පසු ගිය අවුරුදු 30ක කාලය තුළ එවැනි අය කී දෙනෙක් ඒ ප්‍රදේශයෙන් බිහි වුණාද? දෙමළ ජනතාවගේ විමුක්තිය සොයනවා කියලා කථා කරපු අය ඒ ජනතාවගේ ඡන්දය අරගෙන කොළඹ ආවා. ඒ නියෝජිතයන්ගේ දරුවෝ එක්කෝ ඉන්නේ කොළඹ, නැත්නම් පිට රට. හිඟන්නාගේ තුවාලය වාගේ මේ ප්‍රශ්නය හැම දාම තියා ගෙන ඒ ජනතාවගේ ඡන්දය ලබා ගන්න පමණක් ඒ අය කටයුතු කළා. ඒ ප්‍රදේශවලට අපි ගිහිල්ලා ප්‍රශ්න විසඳන්නට කටයුතු කරනවාට ඒ නියෝජිතයන්ගේ කැමැත්තක් තිබුණේ නැහැ. ඒ නිසා මා ඉතාම වග කීමෙන් කියන්න කැමැතියි, මේ නිදහස් කර ගත් රට ඉදිරියට ගෙන යන්න අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය තුළ සියලු දෙනාගේම සහයෝගය ලබා ගෙන අපි කටයුතු කරමු කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කෘෂිකර්ම ඇමතිතුමා පසු ගිය කාලයේ කටයුතු කරපු ආකාරය අපි දැක්කා. කෘෂි රසායන ද්‍රව්‍යවලට අදාළ පනත වසර 40කට වඩා පැරණියි. එතුමා එය සංශෝධනය කළා ආසියාවේ ආශ්චර්යය කරා ගෙන යන මේ රටට ගැළපෙන ආකාරයට.

ඉදිරි කාලය තුළ නිරෝගිමත් ජනතාවක්, විශේෂයෙන් නිරෝගිමත් දරු පරපුරක් හැදීමයි අපේ අරමුණ. ළමා සායන, මාතෘ සායන එදා කාගේවත් අවධානයට ලක් වෙලා තිබුණේ නැහැ. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි අද ඒ ස්ථාන ඉතාම හොඳින් නවීකරණය කරමින්, මැණිවරුන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙමින්, ඒවා බොහෝ පහසුකම් සහිත ස්ථාන බවට පත් කරමින් නිරෝගිමත් දරු පරපුරක් බිහි කර ගන්න අවශ්‍ය කටයුතු කරනවා. පාසල් පද්ධතියත් එසේමයි. ඒ වාගේම පෙර පාසල් සඳහා විශේෂ වැඩසටහනක් දියත් කරලා පහසුකම් සපයා දෙන්න අවශ්‍ය කටයුතු කර ගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සඳහන් කරන්න ඕනෑ වාරි මාර්ග සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ පසු ගිය වසර ගණනාව තිස්සේම ලබා දෙන ප්‍රතිපාදන පිළිබඳව. මා හිතන හැටියට රජ කාලයෙන් පස්සේ දැවැන්තම මුදල් සම්භාරයක් ඒ වෙනුවෙන් යොදවලා තිබෙනවා. කෘෂිකර්ම ක්ෂේත්‍රය ප්‍රධාන කර ගෙන වාරි මාර්ග පද්ධතිය සඳහා ලබා දී තිබෙන මුදල් ප්‍රමාණය ඉතාම විශාලයි. ඉතාම හොඳින් සෑම පළාතකම ඒ වැඩ කටයුතු කෙරෙනවා කියන එක මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,"අද අපේ ජනතාවට ජීවත් වෙන්න අමාරුයි. අපේ ජනතාවට අමාරුයි." කියලා විපක්ෂය කෑ ගහනවා. අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමා කථා කරන වෙලාවේත් කිව්වා, අද ටාටා කොම්පැනියට, ලේලන්ඩ් කොම්පැනියට ලොරියක් ගන්න ගියොත් මාස ගණන් පෝලිමේ ඉන්න ඕනෑ කියලා. අද ප්‍රශ්නයක් වන තරමට කොළඹ අවට ටිපර් රථ, ලොරි රථ ගමන් කරනවා, නොයෙකුත් සංවර්ධන වැඩ කටයුතු සඳහා. ඇහුවොත්, පස් අදින්න යනවා කියයි, ගල් අදින්න යනවා කියයි. ඒවා අර ගෙන ගෙදර නිකම් තියා ගෙන ඉන්නවා නොවෙයි. ඒවා නොයෙකුත් ව්‍යාපෘති සඳහා යොදවලා තිබෙනවා. ඒ වාගේම කුඩා පවුලකට පාවිච්චි කරන්න පුළුවන් විධියට ඩිමෝ බට්ටෝ, කාර් ආදි වශයෙන් පුංචි පහේ වාහන වර්ග ඇවිත් තිබෙනවා. අද කොම්පැනියකට ගියොත් එහෙම පෝලිමේ ඉන්න ඕනෑ මේවා ගන්න. අපේ ජනතාව ඒවාට යොමු වෙලා, ඒවා මිල දී අර ගෙන තමන්ගේ ගමන් බිමන් සුව පහසු විධියට යන්න කටයුතු කරන කාලයක්, විපක්ෂය මොන ආකාරයෙන් කථා කළත්.

අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා, තරුණ මන්ත්‍රීවරුන්ට, නියෝජ්‍ය ඇමතිවරයකු වන මට, අපට විශාල ශක්තියක් ලබා දෙනවා. එතුමන්ලා ගෙන යන වැඩ පිළිවෙළ තුළින් මේ රට ඉදිරියට ගෙන යන්න අපි සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන්න කටයුතු කරමු කියන ගෞරවණීය ඉල්ලීම කරමින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ. භා. 5.31]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා මෙම අය වැය විවාදයේදී කථා කරන්න මට කාලය වෙන් කර දීම සම්බන්ධයෙන්. ජනතාවට සහන රැසක් ලබා දීපු, ඒ වාගේම ආයෝජනවලට විශාල ශක්තියක් එක් කරපු, ප්‍රාග්ධන වියදම් තුළින් අපේ රටේ වත්කම් විශාල ප්‍රමාණයක් ආරක්ෂා කරන්න කටයුතු කරපු අය වැයක් තමයි මෙවර ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ වාගේම යහපත් ආර්ථික මට්ටමක් ඇති කරමින්, අපේ ආර්ථික වර්ධන වේගය නියතව පවත්වා ගෙන යමින් ඉතාම සාර්ථක අය වැයක් ඉදිරිපත් කරන්න කටයුතු කරපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට අපි ගෞරවය පුද කරන්න ඕනෑ. මුදල් ඇස්තමේන්තුව අර ගෙන බැලුවාම, බිලියන 2,220ක් වැනි විශාලම මුදල් ප්‍රමාණයක් සංසරණය වන යෝජනා ඇතුළත් අය වැයක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. එවැනි විශාල මුදල් ප්‍රමාණයක් සංසරණය වන බව කිව හැකි දැවැන්තම ඇස්තමේන්තුවක් තමයි මෙවර පාර්ලිමේන්තුවට අපේ අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දිගින් දිගටම දැක්කා විපක්ෂය කියනවා, "මේක නිකම්ම නිකම් පුස්සක්. සිහින මාළිගාවක්. මෙහි ජනතා සහන කිසිවක් නැහැ." කියලා. අපි බොහොම පැහැදිලිව කියනවා, මේ අය වැය කථාවේ, මේ විසර්ජන පනත් කෙටුම්පතේ සියල්ල හරියට පරිශීලනය කළා නම්, හරියට තේරුම් ගත්තා නම් මොන ආකාරයේ ජනතා සහන ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවාද කියන එක. ඒ වාගේම අපේ රටේ ආර්ථික ශක්තිය වර්ධනය කිරීමේ, මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව අපි යන ගමනේදී අපේ රට සංවර්ධිත රටක් බවට පත් කිරීමේ, ආසියාවේ ආශ්චර්යවත් රට බවට පත් කිරීමේ, අපේ රට පංචබල කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ ඒ ජාතික අරමුණට මොන තරම් දායකත්වයක් ලබා දෙන විධියටද මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන එක අපට පෙනී යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි විපක්ෂයට කියනවා, මේකෙන් ජනතාවට සහන තිබෙනවා, හැබැයි විපක්ෂයට සහන නැහැ කියලා. විපක්ෂය හොයලා බැලුවා, මේ වෙනුවෙන් ඔවුන්ට හඬ නඟන්න තිබෙන මාතෘකා මොනවාද කියලා. ඔවුන්ට කථා කරන්න මාතෘකා නැහැ. ඒ නිසා ඔවුන් කියනවා, ජනතාවට සහන දීලා නැහැ, ආධාර දීලා නැහැ, උපාධිධාරීන්ට රැකියා දීලා නැහැ, ඒ හැම දෙයක්ම නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අය එහෙම කථා කළාට පැහැදිලිව එකින් එක, විස්තරාත්මකව ගත්තාම අපි දන්නවා ජනතාවගේ ආර්ථික ශක්තිය වර්ධනය කරන්නත් ඒ වාගේම පුද්ගලයන්ගේ ආදායම් තත්ත්වය වර්ධනය කරන්නත් විශාල ශක්තියක් වන විධියටයි මේ අය වැය ඉදිරිපත් කරන්න අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ රජය කටයුතු කරලා තිබෙන්නේ කියන එක.

අපි ත්‍රස්තවාදයෙන් මේ රට මුදවා ගත්තාට පස්සේ අද මේ රට ක්‍රමානුකූලව සාර්ථක රාජ්‍යයක් බවට පත් වෙලා තිබෙනවා. විපක්ෂයේ සමහර අය විවිධ අවස්ථාවලදී විවිධ මාධ්‍ය ඔස්සේ දැඩි චෝදනාවක් එල්ල කරනවා, අපේ රට අසාර්ථක වෙලායි තිබෙන්නේ, සියල්ල බිඳ වැටිලායි තිබෙන්නේ කියලා. නමුත් අසාර්ථක රාජ්‍යයක නම් සංවර්ධන කටයුතු කරන්න බැහැ. අපේ රටේ සංවර්ධන කටයුතු සිදු වන ආකාරය කුඩා දරුවාගේ ඉඳලා දන්නවා කියායි මා හිතන්නේ.

ඊයේ ආශ්චර්යයේ පිවිසුම් මාර්ගය එනම් අධිවේගී මාර්ගය විවෘත කිරීම දක්වා පමණක් නොවෙයි, අස්සක් මුල්ලක් නැර අපේ රටේ සෑම ග්‍රාම නිලධාරි වසමකම අද විශාල සංවර්ධනයක් කර ගෙන, ජාතික ව්‍යාපෘතිත්, ග්‍රාමීය ව්‍යාපෘතිත් විශාල වශයෙන් කර ගෙන යනවා. එහෙනම් අපේ රටේ සංවර්ධන කටයුතු ඉතා ඉහළින් සිදු වෙනවා. ඊළඟට අසාර්ථක නම් රජයකට සුභසාධන කටයුතු කරන්න බැහැ. නමුත්, සුභසාධන කටයුතු අතින් බලන විට අපේ රට ලෝකයේ ප්‍රබලම රටක් බවයි මා හිතන්නේ. විශාල වශයෙන් සහනාධාර ලබා දෙමින් අඩු ආදායම්ලාභී පවුල් නඟා සිටුවන්න විශාල ශක්තියක් එකතු කරන, විශාල දායකත්වයක් ලබා දෙන රටක් බවට අද අපේ රට පරිවර්තනය වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අපේ රටේ දිළිඳු භාවයේ ප්‍රතිශතය - දුප්පත්කමේ ප්‍රතිශතය- අද සියයට 8.2 දක්වා අඩු කර ගන්න පුළුවන්කම ලැබුණේ ඒ වාගේ සහන විශාල ප්‍රමාණයක් ලබා දෙන නිසායි. අසාර්ථක රාජ්‍යයක් නම් හදිසි ආපදාවක් වුණාම එය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න රජයට හයියක් නැහැ. සුනාමි ව්‍යසනය ආපු වෙලාවෙත්, මේ ඊයේ පෙරේදා ඇති වෙච්ච අවාසනාවන්ත සිද්ධිය ගත්තත් ඒ හැම අවස්ථාවකදීම අපේ රජය එය යථා තත්ත්වයට පත් කරන්න අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීමේ, ඒ වාගේම පුද්ගලයන්ට වන්දි දීමේ කටයුතු මෙන්ම ඒ පුද්ගලයන්ගේ සුභසාධනය වෙනුවෙන්ද විශාල වශයෙන් කටයුතු කර තිබෙනවා. අසාර්ථක රාජ්‍යයක් නම් රැකියා අවස්ථා එකක්වත් ඒ රට තුළ දෙන්න බැහැ. නමුත් අද අපේ රටේ අතිවිශාල ප්‍රමාණයකට රජයේ රැකියා වාගේම පෞද්ගලික අංශයේ රැකියාවලට දොර විවෘත කරන්න කටයුතු කරලා තිබෙනවා. මා නියෝජනය කළ වයඹ පළාත් සභාවේ ගුරු සේවයට, මේ වර්ෂය තුළ ගුරුවරුන් 600ක් බඳවා ගැනීමට කටයුතු කර ගෙන යනවා. ඒ පිළිබඳව මා අද උදේ වයඹ පළාත් සභාවේ ප්‍රධාන ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කළා. ඒ නිසා රාජ්‍ය අංශවලට සේවකයන් බඳවා ගන්නවා; සංවර්ධන කටයුතු කරනවා; ඒ වාගේම සුභසාධන කටයුතු කරනවා; යම් කිසි ආපදාවක් ආවොත් එය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය සියලු කටයුතු කරනවා. එහෙනම් අපේ රට ඉතාම ශක්තිමත්ව ඉදිරියට යන රටක්.

අද ලෝකයේ රටවල් ගත්තාම ඒ රටවල ආර්ථිකයන් විශාල වශයෙන් කඩා වැටිලා තිබෙන වෙලාවක තමයි අපිට සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යන්න පුළුවන් වෙලා තිබෙන්නේ. අද ලෝකයේ රටවල් ගත්තාම ඒ රටවල ආර්ථිකය විශාල වශයෙන් කඩා වැටෙනවාට අමතරව රටවල් සෑහෙන ප්‍රමාණයක් දේශපාලන බිඳ වැටීම්වලටත් ගොදුරු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ රටවල් අද ආරක්ෂාව පැත්තෙනුත් ඉතාම දුර්වල තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. නමුත් අද අපේ රටේ ආරක්ෂාව පැත්තෙන් ගත්තාම එවැනි තත්ත්වයක් නැහැ. ලෝකයේ ආරක්ෂාව පිළිබඳව ඒ වාගේම නිදහස, සාමය පිළිබඳව ස්ථාවර භාවයට පත් වෙච්ච රටවල් තිබෙනවා නම් ඒ ඉතාම අතළොස්සයි. ඒ රටවල් අතළොස්ස අතරේ අපේ ශ්‍රී ලංකාව අද ඉදිරියෙන්ම තියන්න අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ රජයට හැකියාව ලැබිලා තිබෙනවාය කියන එක ගෞරවයෙන් මා මතක් කරන්න ඕනෑ.

ඉතින් එවැනි අවස්ථාවක තමයි අපි ඉතාම ශක්තිමත්ව මේ අය වැය ඉදිරිපත් කරන්නේ. අද බලන්න, ජනතාවගේ පොහොර සහනාධාරය කපා හැරලා නැහැ. සමෘද්ධි සහනාධාරය ඒ මහින්ද චින්තන වැඩ පිළිවෙළේ කියාපු ආකාරයටම ලබා දීලා තිබෙනවා. රුපියල් 210 - 615 දක්වා තිබුණු සමෘද්ධි මුද්දරය රුපියල් 750 දක්වා වැඩි කරන්නත් ඒ වාගේම රුපියල් 900ට තිබුණු සමෘද්ධි මුද්දරය රුපියල් 1,200 දක්වා වැඩි කරන්නත් ඒ අඩු ආදායම්ලාභී පවුල්වල ගැබිනි මවුවරුන්ගේ ඒ වාගේම දරුවන්ගේ මන්ද පෝෂණ තත්ත්වය නැති කිරීම සඳහාත් සාමාන්‍යයෙන් වෙන් කරපු මිලියන 9,300ට අමතරව, අතිරේක මුදලක් හැටියට මිලියන 300ක් වෙන් කරන්න අතිගරු ජනාධිපතිතුමා කටයුතු කරලා තිබෙන්නේ අපි අර සියයට 8.2ක නවත්වා ගෙන තිබෙන

දිළිඳුබවේ ප්‍රතිශතය තවත් පහළට ගෙනැල්ලා මේ රටේ හැම පවුලකම ආර්ථික ශක්තිය වර්ධනය කරන්න, ඒ අයට දිරියක් දෙන්නය කියන එක අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

අද සමෘද්ධි ව්‍යාපාරය හරහා මේ ආධාර ලබා දෙනවා විතරක් නොවෙයි ඔවුන් ජීවනෝපාය සංවර්ධනයට යොමු කර, ස්වයංරැකියාවලට යොමු කිරීම සඳහා කටයුතු කර තිබෙනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් හැටියට අපි දන්නවා, අපේ ප්‍රදේශ ගැන බැලුවාම, මා නියෝජනය කරන අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලක්ෂ 40කට වැඩි වටිනාකමකින් යුත් ජීවනෝපාය සංවර්ධන උපකරණ ජනතාව අතට පත් කරන්න පසු ගිය දා අපි කටයුතු කළා. නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් එහෙමයි. කුරුණෑගල දිස්ත්‍රික්කයේත් එහෙමයි. මුළු රටේමත් එහෙමයි. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා ඉතාම වැදගත් තීන්දුවක් ගත්තා, අපේ රටේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් සම්බන්ධයෙන්. මේ රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කරන්න, ඒ වාගේම අඩු ආදායම්ලාභී පවුල් නඟා සිටුවමින් ඔවුන් සවිබල ගැන්වීම සඳහා අතිවිශාල කැප වීමක් කරපු නිලධාරින් පිරිසක් තමයි සමෘද්ධි සංවර්ධන නිලධාරින් කියන්නේ. එවැනි සමෘද්ධි සංවර්ධන නිලධාරින් 24,000ක් අපේ රටේ ඉන්නවා. අන්න ඒ සමෘද්ධි සංවර්ධන නිලධාරින් 24,000 විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක කරලා "දිවි නැඟුම" ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව හදා ඒ තුළට අන්තර්ග්‍රහණය කර, ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කරනවා වාගේම තවදුරටත් අපේ රටේ අඩු ආදායම්ලාභී පවුල් නඟා සිටුවීම සඳහා හොඳ මානසිකත්වයක් ඇතිව කටයුතු කරන්න අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම පිළිබඳව විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාට මේ වෙලාවේදී අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම මේ අය වැයේ දකින ඉතා සංවේදී පැතිකඩක් තිබෙනවා. අපි පසුගිය කාලයේදී මේ අය වැය යෝජනා සම්බන්ධයෙන් සාකච්ඡා කරද්දී අතිගරු ජනාධිපතිතුමා නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනුත් කැඳවා අපේ අදහස්, යෝජනා ලබා ගත්තා. ඒ අනුව අප විසින් කරන ලද ඉල්ලීම් පවා මෙවාට ඇතුළත් වෙලා තිබෙනවා. ඒ අනුව අපි විශේෂයෙන්ම ගරු කරන්න ඕනෑ ජනමාධ්‍යවේදීන්සම්බන්ධයෙන් ලබා දුන් සහන සම්බන්ධයෙන්. සමහර පොලිස් නිලධාරින්ට, තවත් සමහර අංශවල අයට වාගේ ඒ අයට තමන්ගේ වරප්‍රසාද පිළිබඳව කතා කරන්න බැහැ. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා පසුගිය අය වැයේදීටත් වඩා ඉතාම සංවේදී විධියට කලාකරුවන් සහ ජනමාධ්‍යවේදීන් පිළිබඳව මේ අය වැයේදී අවධානය යොමු කර තිබෙනවා. අපි දන්නවා, ප්‍රාදේශීය ජනාමාධ්‍යවේදියෙක් වුණත්, ජාතික වශයෙන් පෙනී සිටින ජනාමාධ්‍යවේදියෙක් වුණත් අද විශාල වශයෙන් ආර්ථික ගැටලු හා විවිධාකාර ප්‍රශ්නවලට මුහුණ දෙන්න ඒ අයට සිදු වෙලා තිබෙනවාය කියලා. ඒ අය ඉතාම අහිංසක පිරිසක්. එක පැත්තකින් යම් ආත්ම තෘප්තියක් ලබන්න, රටේ ජාතික ප්‍රශ්නයක් වේවා, එහෙම නැත්නම් ප්‍රාදේශීය ප්‍රශ්නයක් වේවා, රටක කෙරෙන්න ඕනෑ සංවර්ධන කටයුත්තකදී වේවා ඒ ජනමාධ්‍යවේදීන් රටේ ජනතාවගේ, බලධාරින්ගේ, නිලධාරින්ගේ අවධානය යොමු කිරීම සඳහා විශාල කැප කිරීමක් කරනවා. අපි දැක්කා, එල්ටීටීඊ ත්‍රස්තවාදයෙන් මේ රට මුදා ගන්න ගිය ගමනේදී අපේ රටට සුබවාදී ජනමාධ්‍ය ආයතන සහ ඒ ජනමාධ්‍යවේදීන් සියලු දෙනාම එකට අත්වැල් බැඳ ගෙන මේ රටෙන් ත්‍රස්තවාදය තුරන් කිරීම සඳහා ගිය ඒ ගමනේදී අන්තිමට සියලු දෙනාම ඒකාබද්ධ වෙලා කටයුතු කළාය කියලා. ඒ අනුව ඒ ජනමාධ්‍යවේදීන් විශාල ශක්තියක් ලබා දුන්නා. ඇත්තෙන්ම සමහර ජනමාධ්‍යවේදීන්ට ස්ථිර නිවසක් ඇත්තේ නැහැ. සමහර විට අවමඟුල් කටයුත්තක් වුණොත් ඒ අවමඟුල් කටයුත්ත හරියාකාරව කර ගන්න පවා අපහසු අවස්ථා තිබෙනවා.

කලාකරුවනුත් එහෙමයි. අපේ රටේ සුප්‍රකට කලාකරුවන්ගේ ආර්ථික පසුබිම දිහා බැලුවාම විශාල ප්‍රශ්න ගොඩක් මැද්දේ තමයි ඔවුන් ඒ ජාතික යුතුකම ඉටු කරන්නේ. ඉතාම වැදගත් පොතක් ලියන්න, කවියක් ලියන්න, විවිධ දේවල් රචනා කරන්න, චිත්‍රපට නිර්මාණය කරන්න කටයුතු කරපු අපේ රටේ කලාකරුවන් දිහා ආපසු හැරී බලන්න කිසි කෙනෙක් නැති වෙලාවක අපේ අතිගරු ජනාධිපතිතුමා ඔවුන් වෙනුවෙන් වෙනම අරමුදලක් පිහිටුවීම සඳහා රුපියල් මිලියන 25ක් වෙන් කර තිබෙනවා. සමහර කෙනෙක් මේක විවේචනය කරන්න පුළුවන් ඒ මුදල මදියි කියා. නමුත් රුපියල් මිලියන 25කින් හෝ එවැනි අරමුදලක් ආරම්භ කිරීම විශේෂයෙන් අපි අගය කරනවාය කියන එක මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වාගේම අපේ රටේ කලාකරුවන් වෙනුවෙන් අද ආසියාවේ විශාලතම සංස්කෘතික හා කලා මධ්‍යස්ථානය කොළඹ 7 ප්‍රදේශයේ ඉදි කරන්න මේ වනකොට සියලු කටයුතු සූදානම් කර තිබෙනවා. ඒකෙන් කලාකරුවන්ට සහ ඒ සංස්කෘතික අංශවලට විශාල ශක්තියක් ලැබෙනවාය කියන එකත් මතක කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ මා තවත් කරුණක් වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන්නේ ඓතිහාසික දඹදෙනිය ප්‍රදේශයයි. දඹදෙනිය කියන්නේ මේ රටේ තුන්වන රාජධානියයි. හැම අවස්ථාවකදීම ජනතාවගේ ඉල්ලීමක් තිබුණා. කාලයකට පස්සේ දඹදෙනිය ප්‍රදේශය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයකු හැටියට මගේත් විශාල වුවමනාවක් සහ ඕනෑකමක් තිබුණා. ජනතාවගේත් ඉල්ලීමක් තිබුණා. කුරුණෑගල දිස්ත්‍රික්කයට ඉතාමත් ඓතිහාසික වටිනාකමක් තිබෙනවා. එය දඹදෙනිය, යාපහුව, පඬුවස්නුවර, කුරුණෑගල කියන රාජධානි හතරකින් සමන්විතයි. මේ රාජධානි හතර සංවර්ධනය කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා මහින්ද චින්තනයෙන් ඉඩකඩක් ලබා දීලා "උරුම අරුණ" කියන වැඩසටහනට එය බද්ධ කරලා, විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා ඒවා සංරක්ෂණය කරන්න කටයුතු කර තිබෙනවා. අවුරුදු 2500ක ඉතිහාසයක් තිබෙන අපේ ඉතිහාසය තුළ අපට තිබෙන සංස්කෘතික උරුමයන් ඒ වාගේම අපට තිබෙන ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා විශේෂ අවධානයකින් කටයුතු කිරීම ඉතාම වැදගත් වෙනවා. වැදගත් ජාතික නායකයකුගේ කටයුත්තක් හැටියට විශේෂයෙන් අපේ අතිගරු ජනාධිපතිතුමා ඒ වෙනුවෙන් කටයුතු කිරීම මේ වෙලාවේදී අගය කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. දහම් පාසලට මුදල් ලබා දෙන ජාතික වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. හැම වෙලාවේම අපේ ගෞරවණීය ස්වාමීන් වහන්සේලා, ඒ වාගේම පූජකතුමන්ලා දහම් පාසලට මුදල් හොයා ගන්න මන්ත්‍රීවරුන් පිටු පස්සේ ගිහිල්ලා ඔවුන්ගේ විමධ්‍යගත අරමුදලෙන් රුපියල් 5,000ක්, 10,000ක් අරගෙන තමයි දහම් පාසලේ ඩෙස්ක් බංකු ටික හදා ගන්නේ. ඒ නිසා ප්‍රථම වතාවට දහම් පාසල් ශක්තිමත් කිරීම සඳහාත්, අපේ දරුවන්ගේ මූලික අධ්‍යාපන හුරුව ලබන පෙර පාසල් ශක්තිමත් කිරීම සඳහාත් මේ 2011 අවුරුද්දේ වාගේම 2012 අවුරුද්දේදීත් දහම් පාසලටත්, පෙර පාසලටත් විශේෂ අවධානයක් යොමු කරමින් ඒ වෙනුවෙන් රුපියල් මිලියන 150ක මුදල් ප්‍රමාණයක් වෙන් කිරීම අපි විශේෂයෙන්ම අගය කරන්න ඕනෑ.

අද මේ විපක්ෂය කියන කථාවලට අපට හිනා යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ජනතා සහන පිළිබඳව ඔවුන් විවිධ කථා කියනවා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් දිවි නැඟුම වැඩ පිළිවෙළ යටතේ ඒ ලබා දෙන සියලුම සහන, ඒ ලබා දෙන දේවල් පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ලබා දෙනවා. ඕනෑම පවුලකට නැඟිටිනවා නම් නැඟිටින්න පුළුවන් විධියටත්, අනෙක් පැත්තෙන් ඔවුන්ට හොඳ ආහාර වේලක්, නීරෝගී ආහාර වේලක් ලබා ගන්නටත් -වස විසෙන් තොර ආහාර වේලක් ලබා ගන්නටත්- ගෙවත්ත ශක්තිමත් කර තිබෙනවා. සමහර අය හිතනවා, "දිවි නැඟුම" කියන්නේ පැළ බෙදා දෙන එකයි, මේ ගෙවතු වගා කරන එකයි කියලා.

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක විතරක් නොවෙයි. පවුලේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම ශක්තිමත් කරන්න සෑම අංශයකින්ම දිරි දෙන වැඩ පිළිවෙළක් තමයි දිවි නැඟුම වැඩ පිළිවෙළ කියලා කියන්නේ. මම දැක්කා, ඊයේ පෙරේදා ජන මාධ්‍යය තුළ විශේෂයෙන්ම කාටුන් තුළ ඇඳලා තිබ්බේම මේ පොල් පැළයක් දීම සම්බන්ධයෙනුයි. මේ අය වැයෙන් ජනතාවට සහන වශයෙන් පොල් පැළේ දෙන එක විතරක් හැටියට තමයි දිගටම පුවත්පත්වල කාටුන්වලට ඇඳලා තිබෙනවා අපි දැක්කේ. නමුත් මේ දිවි නැඟුම වැඩ පිළිවෙළ යටතේ අපේ ප්‍රාදේශීය කොට්ඨාස මඟින් මේ 2011 අවුරුද්දෙත් පළතුරු පැළ විශාල ප්‍රමාණයක් ඒ වාගේම වෙනත් පැළ වර්ග විශාල ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. ඒ අතරේ පොල් පැළත් ලබා දෙමින් ජනතාවට විශාල ශක්තියක් ලබා දුන්නා. ඔවුන්ට බීජ ලබා දෙන්න කටයුතු කළා. ඒ වාගේම ඒවා අධීක්ෂණය කරන්න නිලධාරින් වෙනම පත් කරලා ඉන්නවා. අපේ ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාගේ අධීක්ෂණය, උපදෙස් මත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ඉතාම හොඳ වැඩ පිළිවෙළක් ඒ වෙනුවෙන් හදලා අපේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් හරහා ඒවා අධීක්ෂණය කරමින් ඉතාම යහපත් ආකාරයට ඒ වැඩ කටයුතු කර ගෙන යනවා. ඒ දිවි නැඟුම වැඩ පිළිවෙළේ ගෘහ කර්මාන්තවලට විශාල සහනයක්, ශක්තියක් ලබා දෙන්න මේ අය වැය තුළින් මුදල් වෙන් කරලා තිබෙනවා. සමහර අයට ලබා ගත්තු දැනුම තිබෙනවා, ඒ වාගේම ඕනෑකම තිබෙනවා ව්‍යවසායකයෙකු බවට පත් වෙන්න; නැත්නම් ස්වයං රැකියාවක් ආරම්භ කරන්න; ගෘහ කර්මාන්තයක් ආරම්භ කරන්න. හැබැයි ශක්තිය දෙන්න කෙනෙකු නැහැ. එවැනි අවස්ථාවක මේ අය වැය තුළින් දිවි නැඟුම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ හරහා ව්‍යවසායකයකු බවට පත් වෙන්න ඒ වාගේම ශක්තිමත් ව්‍යාපාරිකයෙකු බවට පත් වෙන්න අවශ්‍ය ශක්තිය ලබා ගන්න, දිරිය ලබා ගන්න මේ අය වැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කනගාටු වුණා, අපේ දෙමළ සන්ධානය නියෝජනය කරන සමහර ගරු මන්ත්‍රීතුමන්ලා ඊයේ අතිගරු ජනාධිපතිතුමා කරන ලද කථාව විවේචනය කිරීම ගැන. මීට පෙර කථා කළ දෙමළ සන්ධානයේ ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා, ඒ-9 පාර දක්වා මේ අධිවේගී මාර්ගය හදනවා කියලා තිබෙනවා, හැබැයි ඒ මාර්ග හැදුවට දෙමළ සිත් හදන්න බැහැ කියලා. උතුරේ අහිංසක ජනතාව, දකුණේ ජනතාවත් එක්ක බද්ද වෙලා -සිංහල ජනතාවත් එක්ක, මුස්ලිම් ජනතාවත් එක්ක සියලු දෙනාමත් එක්ක එකට බද්ද වෙලා- මේ දැනුම බෙදා හදා ගනිමින්, අදහස් හුවමාරු කර ගනියි කියන ලොකු බියක් තිබෙන බව ඒ අයගේ ප්‍රකාශවලින් අපට පේනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ අතිගරු ජනාධිපතිතුමා ඊයෙත් ප්‍රකාශ කළේ, ඒ වාගේම හැම දාම ප්‍රකාශ කළේ අප අතර කිසිම භේදයක් නැහැ, අපි අතර හොඳ සම්බන්ධතාවක් ගොඩ නැඟෙන්න ඕනෑ කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඊයේ විවෘත කරපු අධිවේගී මාර්ගය දිහා බලන්න. අපි ඉතිහාසයේ අධිවේගී මාර්ග දැකලා තිබෙන්නේ පිට රටකට ගියාමයි. චීනයට හරි ඇමෙරිකාවට හරි ජපානයට හරි ගියාම තමයි අපි අධිවේගී මාර්ගයක් දැක්කේ. ඒ අධිවේගී මාර්ග දැකලා අපි හුල්ල හුල්ල ආවා. අපි සුසුම් හෙළුවා, අපේ රටේ මේ වාගේ අධිවේගී මාර්ගයක යන්න නොවෙයි නිකම් අධිවේගී මාර්ගය කිලෝමීටරයක් දකින්න හම්බ වෙන්නේ කවදාද කියලා. ඒ සිහිනය සැබෑ කරන්න අතිගරු ජනාධිපතිතුමා කටයුතු කළා. ඒ සිහිනය සැබෑ කරන්න කටයුතු කළා විතරක් නොවෙයි කොට්ටාව ඉඳන් ගාල්ලටත්, ඊටත් එහාට එනම්, මාතර දක්වා දීර්ඝ කරන්නත් කටයුතු කරනවා. ඒ වාගේම යාපනය දක්වාත් අධිවේගී මාර්ගයක් හදනවාය කියලා කිව්වාම ඒකට දෙමළ සන්ධාන මන්ත්‍රීවරු සන්තෝෂ වෙන්න ඕනෑ. නමුත් අද ඒ අය මොකක්ද කිව්වේ? "ඔවා හැදුවාට වැඩක් නැහැ. ඔවා හැදුවාට දෙමළ සිත් හැදෙන්නේ නැහැ" කියලා කිව්වා. ඒ අය බයයි. ඒ අයට මනාප 25ක්, 30ක් අරගෙන නැත්නම් ඡන්ද 200ක්, 300ක් අරගෙන පාර්ලිමේන්තුවට එන්න තිබෙන අවස්ථාව අහිමි වෙයි කියන ලොකු බියක් ඒ තුළ තිබෙනවා.

ඒ අය ආත්ම වංචාවෙන්, එහෙම නැත්නම් ආත්මාර්ථකාමීව තමයි ඒ කටයුතු කරන්නේ. එහෙම නැත්නම් ඒ අය සන්තෝෂ වෙන්න ඕනෑ.

අද උතුරු නැඟෙනහිර ප්‍රදේශවල පාසල් හැදෙනවා, රෝහල් හැදෙනවා, බෝක්කු පාලම් ටික හැදෙනවා. කුප්පි ලාම්පුවේ එළියෙන් පාඩම් කළ අහිංසක දරුවන්ට පාඩම් කටයුතු කිරීමට ඒ ගම් දනව්වලට විදුලිය ලබා දෙනවා, විශාල විදුලි ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා. අද ඒ ප්‍රදේශවල අහිංසක දෙමළ ජනතාව එදා අහිමි වෙලා තිබුණු කෘෂි කර්මාන්තයේ යෙදිලා ඔවුන්ගේ පවුල්වල ආර්ථික ශක්තිය වර්ධනය කර ගැනීම සඳහා ඉදිරියට ඇවිල්ලා කටයුතු කරනවා. දිවි නැඟුම ව්‍යාපෘතියෙන් ප්‍රයෝජන ගන්නවා. ගම නැඟුම ව්‍යාපෘතියෙන් ප්‍රයෝජන ගන්නවා, මග නැඟුම ව්‍යාපෘතියෙන් ප්‍රයෝජන ගන්නවා. ඒ සියල්ල අරගෙන ඒ පවුල් ශක්තිමත් වෙනවාට දෙමළ සන්ධානයේ මන්ත්‍රීවරු බයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි ඒ විධියේ ජාතිවාදී දේවල් අවුස්සන්නේ. ඒ නිසා ඒ මන්ත්‍රීවරුන්ට අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, විශේෂයෙන්ම මේ අය වැය ගැන පැහැදිලිව කල්පනා කර බලන්න කියලා. උතුරු නැඟෙනහිර ප්‍රදේශවල අහිංසක පවුල්වලට අහිමි වෙලා තිබුණු ආර්ථික ශක්තිය නඟා සිටුවීම සඳහා සමෘද්ධි වැඩ පිළිවෙළ දියත් කර සමෘද්ධි සහනාධාරය ලබා දෙන්න අතිගරු ජනාධිපතිතුමා මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබීම විශේෂයෙන්ම අපේ රටේ පුරවැසියෙක් හැටියට මම මේ වෙලාවේ අගය කරනවා.

අපි ඒ ප්‍රදේශවලට ගිහිල්ලා ඒ ජනතාවත් එක්ක කථා කරපුවාම, ඒ අය "Thirteen Plus" ගැන කථා කළේ නැහැ. දේශපාලන විසඳුම් ගැන ඒ අය කථා කළේ නැහැ. "අපේ පාර හැදෙනවා නම් අනේ අපට හොඳයි, අපේ දරුවන්ට ඉගෙන ගන්න පාසල් හැදෙනවා නම්, විශ්වවිද්‍යාල හැදෙනවා නම්, ගිනි තියලා දාපු පුස්තකාල ටික හරියට හැදිලා අපේ දරුවන්ට පුස්තකාල පහසුකම් ලැබෙනවා නම්, අපේ දරුවන්ට බෙහෙත් ටික ගන්න, අපට බෙහෙත් ටික ගන්න රෝහල හැදෙනවා නම්, ඒ සෞඛ්‍ය පහසුකම් ලැබෙනවා නම් ඒක තමයි අපට ලැබෙන හොඳම plus එක" කියලා තමයි ඒ අහිංසක දෙමළ ජනතාව හැම වෙලාවේම කිව්වේ. අතළොස්සක් වුණු මේ කිහිප දෙනාට තමයි එක එක දේවල් ඕනෑ වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි ඒ අයට බොහොම පැහැදිලිව කියනවා,-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න. වෙලාව හරි.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
நான் தமிழில் பேச விரும்புகிறன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ரொம்ப நன்றி.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

நாங்கள் எல்லோரும் ஒற்றுமையாக இலங்கையைக் கட்டியெழுப்புவோம். இன, மத பேதம் இல்லாமல் கட்சி பேதம் இல்லாமல் நாங்கள் எல்லோரும் இலங்கையில் ஒற்றுமையாக இருப்போம். நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

உங்களுடைய தமிழ் வார்த்தைகளுக்கு ரொம்ப நன்றி. දැන් කථා කරන්නේ ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමා.

[අ. භා. 5.50]

**ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා**
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉතාමත් සන්තෝෂ වෙනවා, 2012 වර්ෂයට ඉදිරිපත් කර ඇති අය වැය පිළිබඳව කරනු ලබන විවාදයේදී මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව. නොවැම්බර් 21 වැනිදා අතිගරු ජනාධිපතිතුමා අය වැය කථාවට මුල පුරමින් සඳහන් කළා, 1977න් පස්සේ මේ රටේ යුද්ධයත් සමඟම, ඒ වාගේම ආර්ථික ක්‍රමයත් සමඟ මේ රටේ ඇති වුණු අවාසනාවන්ත ප්‍රශ්න, අවාසනාවන්ත තත්ත්වය පිළිබඳව. මම තරුණයෙක් විධියට අතීතයට ගිහිල්ලා කියවලා ලබා ගත් දැනුම විතරයි තිබෙන්නේ. නමුත්, අවුරුදු 10කට පමණ පෙර, අපි අ.පො.ස.(උ./පෙළ) කරන කාලයේ -2000-2001 වාගේ කාලයේදී- මේ රට ඉස්සරහට ගෙන යා නොහැකි වීමට හේතු වුණු ප්‍රධාන ප්‍රශ්න දෙකක් තිබුණා. එකක් තමයි කුරිරු යුද්ධය. අනිත් ප්‍රශ්නය තමයි දේශපාලන ස්ථාවරභාවයක් නොමැතිකම. ඒ යුගයේ පාර්ලිමේන්තුවේ බහුතරය හදා ගැනීම විශාල ප්‍රශ්නයක් වෙලා තිබුණා. මේ රටට ආර්ථික වශයෙන් ඉස්සරහට යන්න දෙන්නේ නැතුව මේ ප්‍රශ්න දෙක විශාල බාධකයක්ව තිබුණා. අපට මතකයි, 2000-2004 කාලයේදී විතරක් පාර්ලිමේන්තු මැතිවරණ 3ක් තිබුණා. අවුරුදු 18කින් පවත්වන්න ඕනෑ පාර්ලිමේන්තු මැතිවරණ අවුරුදු 4කින් තියන මට්ටමේ කාලකණ්ණි තත්ත්වයකට තමයි මේ රට ඇද වැටිලායි තිබුණේ. නමුත් අද 2012 වර්ෂය සඳහා වන අය වැය යෝජනාව ඉදිරිපත් කර තිබෙන මේ මොහොත වන විට අපේ රටට තිබුණු ප්‍රධාන ප්‍රශ්න දෙකම විසඳී තිබෙනවා. අවුරුදු 30ක කුරිරු යුද්ධය නිමා වෙලා තිබෙනවා. 1999-2000 වාගේ කාලයේ යුද්ධය ඉවර කර ගන්නවා කියන එක හීනයක් වෙලායි තිබුණේ. ඒ වාගේම පාර්ලිමේන්තුවේ 113 දෙනෙක් එකතු කර ගන්න බැරුව හිටියේ. පාර්ලිමේන්තුවේ 150 දෙනෙක් හඳනවා කියන්නේත් ඒ කාලයේ හීනයක්. නමුත් කියන්න සන්තෝෂයි, අද වන විට අතිගරු ජනාධිපතිතුමාගේ අභීත නායකත්වය යටතේ සියලුම ජනතාවට සතුටු වෙන්න පුළුවන් තත්ත්වයක් ඇති කර තිබෙනවාය කියන එක. යුද්ධයක් නැති රටේ පාර්ලිමේන්තුවේ නියෝජිතයන් 160ක් එක්ක ආසියාවේ ආශ්චර්යය කරා යන ගමනේදී අනාගත අභියෝගවලට -දිගු කාලීන සහ කෙටි කාලීන අභියෝගවලට- මුහුණ දෙමින් එතුමා මේ අය වැය ඉදිරිපත් කර තිබෙනවාය කියන කාරණය මේ අවස්ථාවේ සිහිපත් කරන්න ඕනෑ.

අපේ මීළඟ අභියෝගය වන්නේ ශක්තිමත් ආර්ථිකයක් ඇති කර ගැනීමයි. ඒ සඳහා යටිතල පහසුකම් පද්ධතිය ශක්තිමත් කර ගන්නට ඕනෑ. ඒ අනුව මාර්ග සංවර්ධනය සඳහා මේ අය වැයෙන් විශාල තැනක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ජනතාවට පානීය ජලය ලබා දීම සඳහාත්, සියයට සියයක් විදුලිය ලබා දීම සඳහාත් මේ අය වැයෙන් විශාල තැනක් ලබා දීලා තිබෙනවා.

ලංකාවේ ප්‍රථම අධිවේගී මාර්ගය ඊයේ විවෘත කළා. ඒ ගැන මගේ සතුට ප්‍රකාශ කරන්නට ඕනෑ. ඒ පිළිබඳව මේ ගරු සභාවේ නොයෙකුත් කථා කියනවා ඇහුණා. ඒ ගැන විශ්ලේෂණය කරලා බැලුවොත් අධිවේගී මාර්ගයකින් අපට ලැබෙන වාසි කියලා නිම කරන්නට බැහැ. ඉන්ධනවල ඉතිරිය වැනි වාසි වාගේම කාලය ඉතිරි කර ගැනීමටත් හැකි වෙනවා. විධායක ශ්‍රේණියේ නිලධාරියාගේ ඉඳලා කම්කරුවා, පාසල් යන දරුවා දක්වා වාහන තදබදය නිසා මානසික පීඩාවකට ලක් වෙලා සිටින බව කිසිම භේදයක් නැතිව අපි හැමෝම දන්නවා. සිකුරාදා දවස්වලට කොළඹ ඉඳලා නුවරට යන්නත්, සඳුදා දවස්වලට නුවර ඉඳලා කොළඹ එන්නත් අපට පැය පහක් හයක් යනවා. කොළඹින් හවස 4.00ට විතර ගියොත් නුවරට යන්න අඩුම වශයෙන් පැය පහක් යනවා. මේ වාගේ තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඉදිරියේදී ඉදි කිරීමට යෝජනා කර තිබෙන කොළඹ-නුවර අධිවේගී මාර්ගය නිම කළාට පසුව අපට පැයකින් කොළඹ ඉඳලා නුවරට යන්න පුළුවන් වෙනවා. මේක අපේ රටේ ආර්ථිකයට විශාල ශක්තියක්. ඒ වාගේම මහාමාර්ග අමාත්‍යාංශයට අයත් අනෙකුත් මාර්ග සංවර්ධනය කිරීම සඳහා රුපියල් බිලියන 123ක් වෙන් කර තිබෙනවා. ඒක ඉතාමත් සතුටට කරුණක්. එය රටේ ආර්ථිකයටත් විශාල ශක්තියක් වනවාය කියන කාරණය මේ අවස්ථාවේ සඳහන් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය විවාදයේදී විශාල වශයෙන් කථා කරපු කාරණයක් තමයි අධ්‍යාපනය. විපක්ෂය චෝදනා කරනවා, අධ්‍යාපනය කප්පාදු කරලාය, වෙන් කරන මුදල අඩු කරලාය කියා. ඒ අය නොයෙකුත් අසුබවාදී කරුණු කියනවා. එහෙම වෙලා තිබෙන්නේ කොහේද, කොතැනද කියලා හරියට කියන්නේ නැහැ. එතුමන්ලා කථා කරන අධ්‍යාපනයේ අසුබවාදී තත්ත්වය තිබෙන්නේ කොහේද? ඒක කියන්නය කියලා අපි අභියෝග කරනවා. අපේ හිටපු අධ්‍යාපන ඇමති කන්නන්ගර මහත්මයා -නිදහස් අධ්‍යාපනයේ පියා- එක්දහස් නවසිය හතළිස් ගණන්වල මේ රටේ අහිංසක දුප්පත් තරුණ තරුණියන්ට අධ්‍යාපනය ලබා දීම වෙනුවෙන් කරපු ඒ විප්ලවයෙන් පස්සේ මේ රටේ සිදු වන විශාලතම අධ්‍යාපන විප්ලවය ලබන ජනවාරි මාසයෙන් ඇරඹීමට නියමිතයි. ඒකට ශක්තියක් එකතු කරමින් මේ අය වැයෙන් රුපියල් මිලියන 2,500ක් වෙන් කරලා තිබෙනවා. අපි දන්නවා, අපේ රටේ තිබෙන්නේ නිදහස් අධ්‍යාපනය කියලා. අපට ලෝකයේ ඕනෑම රටකට ගිහිල්ලා කියන්න පුළුවන් අපේ රටේ තිබෙන්නේ නිදහස් අධ්‍යාපනයක් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මතක ඇති අපි ගිය චීන සංචාරය. ඒ රටේ නව වන වසරින් ඉහළට අධ්‍යාපනය ලැබීම සඳහා මුදල් ගෙවන්න ඕනෑ. නමුත් අපේ රටේ තිබෙන්නේ නිදහස් අධ්‍යාපනයයි කියලා අපට ආඩම්බරයෙන් කියන්න පුළුවන්. ඒක ඇහුවාම මිනිස්සු ඇස් ලොකු කර ගන්නවා. මොකද, එහෙම රටවල් ඉතාමත් සීමිතයි. මම නම් දන්නේත් නැහැ. නමුත් පසු ගිය කාලයේ අපේ රටේ අධ්‍යාපනය විශාල ගැටලුවලට මුහුණ දුන්නා. ග්‍රාමීය අධ්‍යාපනය කඩා වැටිලා, ඒවා නගරයට කේන්ද්‍ර වුණු, එහෙම නැත්නම් ලංකාවේ ප්‍රධාන පාසල් කිහිපයකට සීමා වුණු අධ්‍යාපන ක්‍රමයක් බවට මේ නිදහස් අධ්‍යාපනය පත් වුණා. අපට නගරයේ ඉස්කෝලයකට යන්න පුළුවන් නම් කියලා ගමේ ළමයි හීල්ලුවා. නගරයේ ඉස්කෝලෙකට තමන්ගේ ළමයා දමා ගන්න එක ගමේ හැම දෙමවුපියකුටම සිහිනයක් වුණා. මේ තුළින් නිර්මාණය වුණු ආර්ථික ප්‍රශ්න විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා කථා කරන්න වෙලාව නොවෙයි, මේ. අතිගරු ජනාධිපතිතුමා 2005 දී ඉදිරිපත් කළ මහින්ද චින්තන වැඩසටහන යටතේත්, 2010 දී ඉදිරිපත් කළ මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේත් පොරොන්දුවක් විධියට මේ ගැන සඳහන් කර තිබෙනවා. 2010

[ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා]

මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ අතිගරු ජනාධිපතිතුමා සඳහන් කළා, ලංකාවේ අධ්‍යාපනය සකස් වෙන්න ඕනෑ කොහොමද කියලා. ඒ අනුව යමින් ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා යටතේ අද අධ්‍යාපනයේ විශාල පෙරළියක් ඇති වෙමින් තිබෙනවා.

මේ රට ආසියාවේ ආශ්චර්ය බවට පත් වන කොට එහි ශ්‍රම බලකාය ඇති කිරීම සඳහා අවුරුදු ගණනක් තිස්සේ සාකච්ඡා කරලා මේ රටට ගැළපෙන අධ්‍යාපන ප්‍රතිපත්තියක් දැන් ඉදිරිපත් කර තිබෙනවා. හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම පාසල් දෙක බැගින් සංවර්ධනය වන ආකාරයට පාසල් දහසක් සංවර්ධනය කරන්න අවුරුදු පහක පමණ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා, ඒවාට සම්බන්ධ කළ හැකි ප්‍රාථමික පාසල් 5,000කුත් සමඟ. ඒකට ශක්තියක් වශයෙන් මේ අය වැයෙන් රුපියල් මිලියන 2,500ක් වෙන් කරලා තිබෙනවා. මීට පෙර කථා කළ ද්‍රවිඩ ජාතික සන්ධානයේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, එක පාසලක්වත් හදලා නැහැ, එක රුපියලක්වත් වෙන් කරලා නැහැ කියලා. මා එතුමන්ලාට කියන්න කැමැතියි, කරුණාකරලා සුබවාදීව මේවා දකින්න කියලා. අසුබවාදීව බලන නිසා තමයි ප්‍රශ්න ඇති වුණේ. එතුමා කිව්වා රජයත් සතුටු වන, ද්‍රවිඩ ජාතික සන්ධානයත් සතුටු වන, ජාත්‍යන්තරයත් සතුටු වන විසඳුමක් අවශ්‍යයි කියලා. අතිගරු ජනාධිපතිතුමා හැම වෙලේම කියා තිබෙනවා කාටවත් සතුටු කරන්න අවශ්‍ය නැහැ, එතුමාට අවශ්‍ය මේ රටේ ජනතාව සතුටු වන විධියේ විසඳුම් ලබා දෙන්නයි කියලා. හැම පැත්තේම වැරදි තිබෙනවා. අප තරුණයෝ හැටියට ඔබතුමන්ලාට අත දිගු කරනවා. අප අනවශ්‍ය විධියට හිතන්නේ නැහැ. මේ ප්‍රශ්නය සුබවාදීව විසඳා ගන්න කථා කරන්නය කියා අපි කියනවා. එතුමාගේ කථාව ඇහුණාම අපට කනගාටු හිතුණා. මේ ආර්ථිකය සියයට 8කින් වර්ධනය වෙන කොට -සියයට 23ක වර්ධනයක් තිබෙනවා උතුරු පළාතේ විතරක්- මේ ගැන සුබවාදී ආකල්ප තියෙන්න ඕනෑ. ඒ ජනතාව ඉන්න තැනිනුත් තව පල්ලෙහාට දමන්නේ නැතිව, ඒ ජනතාවත් එක්ක එකතු වෙලා අතිගරු ජනාධිපතිතුමාත් එක්ක එකතු වෙලා මේ රට ආසියාවේ ආශ්චර්යය කරා ගෙන යන්න අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා ද්‍රවිඩ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන්ගෙන් මා කාරුණිකව ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපට ආඩම්බර වෙන්න තිබෙන තවත් අංශයක් තමයි අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය. තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයක් විධියට මට මේ ළඟදි තායිලන්තයේ ලෝක ජනගහන හා සංවර්ධනය පිළිබඳව සමුළුවකට සහභාගි වෙන්න ලැබුණා. මේකෙදි අපට ලංකාව ගැන ගොඩක් කථා කරන්න අවස්ථාව ලැබුණා. අතිගරු ජනාධිපතිතුමාත් අය වැය කථාවේදී සඳහන් කළා, ලෝකයේ දියුණු රටවල දර්ශක මට්ටමට අපේ රටේ සෞඛ්‍යත් තිබෙනවාය කියලා. ඒ අනුව අප අධ්‍යාපනය හා සෞඛ්‍යය අතින් ඉහළින්ම ඉන්නවා. ඔබතුමන්ලා කොච්චර චෝදනා කළත් සෞඛ්‍යය සහ අධ්‍යාපනය සඳහා රුපියල් බිලියන 45.4ක් වෙන් කර තිබෙනවා. ඊට අමතරව රෝහල් 1,000ක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 1,000කුත්, පාසල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 2,500කුත් වෙන් කර තිබෙනවාය කියන කාරණය මම සතුටින් සඳහන් කරන්න ඕනෑ. ඒ සමුළුවේදී මතු වෙච්ච ආකාරයට ලංකාවේ අපට තිබෙන අභියෝගයක් තමයි අනාගතයේදී අපේ වැඩිහිටි ජනගහනය වැඩි වීම. මේක අපට අභියෝගයක්. මොකද අද තරුණ ජනගහනය අඩු වෙලා වැඩිහිටි ජනගහනය වැඩි වෙලා තිබෙනවා. ඒ ජනගහන පිරමිඩය අනුව වැඩිහිටියෝ විශාල ප්‍රමාණයක් නඩත්තු කිරීමට මේ රටට සිදු වනවා. ඒ අනුව අනාගතයේදී ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසන්න, රෝහල්වල වැඩිහිටි වාට්ටු ඇති කිරීම ඇතුළු වැඩිහිටියන් සඳහා අවශ්‍ය නොයෙකුත් කටයුතු කිරීම සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,100ක් වෙන් කර තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියකින් අවසන් කරන්න.

**ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා**
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 70න් ඉහළ වැඩිහිටියන් සඳහා දෙනු ලැබූ රුපියල් 300ක දීමනාව රුපියල් 1,000 දක්වා වැඩි කර තිබෙනවා. වෙනත් විවිධ හේතු නිසා අසරණ වූ පුද්ගලයන්ට දෙන රුපියල් 100යේ දීමනාවත් රුපියල් 500 දක්වා වැඩි කර තිබෙනවා. මේවා අනාගතයේ මතු වන අභියෝග දැකලා කරපු ආයෝජන විධියට සලකන්න පුළුවන්.

අනික් කාරණය තමයි ග්‍රාමීය සංවර්ධනය. 1948 දී අප නිදහස ලබා ගත්තාට පස්සේ කිසිම ආණ්ඩුවක්, කිසිම නායකයෙක් සලකපු නැති විධියට මේ රටේ බහුතර ජනතාව වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා පසු ගිය අවුරුදු හය තුළම ඉදිරිපත් කරපු අය වැයවලදී මුදල් වෙන් කළා. මේ අය වැයෙනුත් ඒ විධියටම සහන සලසා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් සභාව කල් තබන මොහොතයි.

**ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා**
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
මට තව විනාඩියක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා**
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)

දුෂ්කර ගම්මාන නඟා සිටුවන්න රුපියල් මිලියන 300ක් වෙන් කර තිබෙනවා. දිවි නැඟුම වැඩ පිළිවෙළ ඒ සඳහා විශාල ශක්තියක් වී තිබෙනවා. පැරණි ශිල්ප ගම්මාන සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 100ක්, පළාත් මාර්ග කාපට් කරන්න රුපියල් මිලියන 30,000ක්, පුර නැඟුම සඳහා රුපියල් මිලියන 7,000ක්, ගමින් ගම යා කරන මාර්ග පද්ධතිය සඳහා රුපියල් බිලියන 5ක් විධියට මේ අය වැයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න ඕනෑ. මේ ශ්‍රී ලංකා මාතාව පසු ගිය අවුරුදු තිහ ඇතුළත කුණු වළක වැටිලා, එහි එරිලා, හිර වෙලා ගොඩ එන්න බැරිවයි හිටියේ කියලා.

අතිගරු ජනාධිපතිතුමාගේ අභීත නායකත්වය යටතේ අද අපි ඒ කුණු වළෙන් එළියට ඇවිත් තිබෙනවා; මඩෙන් එළියට ඇවිත් තිබෙනවා. දැන් ඒ කුණු පිහ දමා ගන්න ඕනෑ. සතුටට කාරණය අපි ඒකෙන් එළියට ඇවිල්ලා තිබෙන එකයි. ඒක මේ රටට ශක්තියක්. විපක්ෂයේ නොයෙකුත් අය චෝදනා කරන්න පුළුවන්, අපි ළඟ තවම කුණු තිබෙනවා; තවම ගඳයි කියලා. අඩු පාඩු තිබෙන්න පුළුවන්. වැදගත් වන්නේ, ඒ අඩු පාඩු පෙන්වන එකයි. අපි ටිකෙන් ටික මේ කුණු වළෙන් උඩට එනවාය කියන කාරණය

මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. විශේෂයෙන්ම ද්‍රවිඩ ජාතික සන්ධානය ඇතුළු විපක්ෂයේ සියලු දෙනාමත්, අපි සියලු දෙනාමත් එකතු වෙලා මේ රට ජයග්‍රහණය කරන්නත්, මේ රට ආසියාවේ ආශ්චර්යය කරා ගෙන යැමටත් කටයුතු කරමුයි කියා ආරාධනා කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 6.00 වුයෙන්, කටයුතු අත් හිටුවා විවාදය කල් තබන ලදී.***

***එතැන් සිට විවාදය 2011 නොවැම්බර් 29වන අඟහරුවාදා පවත්වනු ලැබේ.***

*அப்போது பி.ப. 6.00 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத் தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம், 2011 நவம்பர் 29, செவ்வாய்க்கிழமை மீளத் தொடங்கும்.*

*It being 6.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Tuesday, 29th November, 2011.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු සාලින්ද දිසානායක මහතා (දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க - சுதேச மருத்துவத்துறை அமைச்சர்)
(The Hon. Salinda Dissanayake - Minister of Indigenous Medicine)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

සභාව කල් තබන අවස්ථාවේදී යෝජනාව ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා.

## උක් ගොවීන් මුහුණදී ඇති ගැටලු
## கரும்புச் செய்கையாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்
## PROBLEMS FACED BY SUGARCANE CULTIVATORS

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය හිඟුරාන සීනි කර්මාන්තය ආරම්භක අවධියේදී සාර්ථකව පවත්වා ගෙන යනු ලැබිය. එබැවින් ඒ ආශ්‍රිත උක් වගාවද එලෙසම වර්ධනය විය. එනමුත් විවිධ අවස්ථාවන්හිදී ගනු ලැබූ දේශපාලන තීරණ හේතුවෙන් මෙම කර්මාන්තය හා ඒ ආශ්‍රිත උක් වගාවද මුළුමනින්ම පාහේ විනාශ විය. 1994න් පසු කිසිදු නිෂ්පාදන කටයුත්තක් නොවිය. එබැවින් උක් වගා කළ ගොවීන්ද මහත් අසරණභාවයට පත් විය. ඔවුන් ගැන කිසිවකුත් සොයා බැලුවේද නැත. එබැවින් ජීවත් වීම සඳහා ඔවුන් උක් වගාව වෙනුවට වී ගොවිතැන තෝරා ගනු ලැබිය.

එහෙත් වසර ගණනාවකට පසුව එක වර ගල්ඔය වැවිලි සමාගම මඟින් නැවත ඔවුන්ට උක් වගා කරන ලෙස බල කරමින් තිබේ. ඒ පිළිබඳව බරපතළ ගැටලු ගණනාවක් මතු වී ඇති බැවින් වහාම එම ප්‍රශ්නයට මැදිහත් වී ගොවීන්ට සාධාරණයක් ඉටු කර දෙන ලෙස මේ සභාවට යෝජනා කර සිටී."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1980 දී ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයට අයිති අක්කර 12,500ක ඉඩම් ප්‍රමාණයක් අක්කර දෙකහමාර බැගින් ඒ ප්‍රදේශයේ ගොවීන්ට බෙදා දුන්නා. ඇත්තටම ගත්තොත් ඒ කර්මාන්තශාලාවේ වැඩ කරපු කම්කරු ගොවි ජනතාවට තමයි මේ ඉඩම් ප්‍රමාණය ලබා දුන්නේ. ඔවුන් උක් වගා කරලා, ඒ උක් වගාවෙන් ලැබෙන අස්වැන්න හිඟුරාන සීනි කම්හල වෙත ලබා දෙන පොරොන්දුව මත තමයි මේ ඉඩම් අක්කර දෙකහමාරේ ඉඩම් කොටස් ඔවුන්ට ලබා දෙනු ලැබුවේ. නමුත් ඊට පසුව අවස්ථා ගණනාවකදී ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයට අයිති සමාගමේ ක්‍රියාකාරිත්වය දේශපාලන තීන්දු, තීරණ මත වෙනස් වුණා. පසුව එය ශ්‍රී ලංකා සීනි සමාගම ලෙසට වෙනස් වුණා. හැබැයි ඒත් අර ඉඩම් කට්ටිකරුවන්ගේ ඉඩම් අයිතිය වෙනස් කළේ නැහැ. ඒ ලබා දීපු ඉඩම් එලෙසම ඒ කම්කරුවන්, ගොවීන් සතුව තිබුණා. 1991 කාල වකවානුවේදී සීමාසහිත හිඟුරාන සීනි සමාගම ලෙස වෙනස් වුණත්, ඒ ඉඩම් කට්ටිවල හිමිකාරිත්වය වෙනස් වුණේ නැහැ. 1997 දී එය නැවත රජයට පවරා ගත්තත් ඒ ඉඩම් කට්ටිවල හිමිකාරිත්වය වෙනස් වුණේ නැහැ. නමුත් අපි දන්නවා, මෙම රජයේ ආයතන පෞද්ගලීකරණය කරන්නේ නැහැ, රජයේ ආයතන තව තවත් ශක්තිමත් කරනවාය කියන පොරොන්දුව මත බලයට පැමිණි රාජපක්ෂ පාලනය 2006 වසරේදී රජය සතුව තිබුණු මෙම ආයතනයේ සියයට 51ක් රජය සතුව පවත්වා ගෙන, ඉතුරු සියයට 49 පෞද්ගලික අංශයට -බ්‍රවුන් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් එකටත්, ලංකා ඔරික්ස් ලීසිං කම්පැනි ලිමිටඩ් එකටත්- පවරා දුන්නු බව. ගල්ඔය වැවිලි සමාගමටත් ඉඩම් හෙක්ටයාර් 277.75ක් පවරා දුන්නා. අද වන කොට අවුරුදු 6ක් ගත වෙලා තිබෙනවා. 2006 ඉඳලා අවුරුදු 6කට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. හරියටම ගත්තොත් අවුරුදු 5යි. අවුරුදු 6ටත් ළඟඹෙනවා. මේ කාලය තුළ ඇත්තටම ගත්තොත්, ගල්ඔය වැවිලි සමාගමට අයිති ඉඩම් සම්බන්ධයෙනුත්, ඒ වාගේම මේ ගොවීන්ට අයිති ඉඩම් සම්බන්ධයෙනුත් රජය නිවැරැදිව මැදිහත් වෙලා, ඒ ගොවියන්ට සහනයක් ලැබෙන ආකාරයටත්, අනික් පැත්තෙන් රජයට, රටට ලාභදායි වන ආකාරයටත් මේ ඉඩම් යොදා ගෙන නැහැ.

එම නිසා තමයි අද මේ අලුත් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙන්නේ. පසු ගිය කාලය තුළම, විශේෂයෙන් 1994 සිට මේ ගෙවුණු අවුරුදු තිස් එකක කාලය තුළ මේ ප්‍රදේශයේ ගොවි පවුල් 5000කට ආසන්න ප්‍රමාණයක් -අක්කර දෙකහමාර බැගින් ඉඩම් කට්ටි 5000ක් බෙදා දී තිබෙනවා. එතකොට පවුල් පන්දාහක ජනතාව- විවිධ රජයන් මඟින් ගනු ලැබූ තීන්දු, තීරණ නිසා මහත් පීඩාවට පත් වුණා. ඔවුන්ට තමන්ගේ උක් වගාව නිසියාකාරව කර ගෙන යන්නට හැකියාවක් ලැබුණේ නැහැ.

හිඟුරාන සීනි කර්මාන්තශාලාව රජයෙන් පෞද්ගලික අංශයට පැවරූ පසු ඒ පෞද්ගලික අංශයේ ආයතන බංකොලොත් වුණා. ඒ බංකොලොත් වෙච්ච ආයතන පාඩු ලැබුවා. පාඩු ලැබීමත් එක්ක ඒ පාඩුව ගොවීන්ටත් අත් විඳින්නට සිද්ධ වුණා. ගොවීන්ගේ උක් වගාව සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ගියා.

ඊට පස්සේ මේ අවුරුදු 31ක කාලය තුළ කිසිදු රජයක් ගොවීන් පත් වෙච්ච මේ තත්ත්වය පිළිබඳව සොයා බැලුවේ නැහැ. ගොවීන් උක් වගා කරනවා ද? ගොවීන් ජීවත් වන්නේ කොහොමද? ඒ ගොවීන්ගේ යැපුම් මාර්ගය මොකක්ද කියන එක මේ කවුරුවත් සොයා බැලුවේ නැහැ. ඒ, අවුරුදු 31ක කාලයක්;

[ගරු විජිත හේරත් මහතා]

සුළුපටු කාලයක් නොවෙයි. ඒ අවුරුදු 31ක කාලය තුළ ඔවුන්ට වෙන කර කියා ගන්නට දෙයක් නැති නිසා, උක් වගාව පමණක් කරන්න කියා අක්කර දෙකහමාර දුන්නා වුණත්, ඒ හිඟුරාන සීනි සමාගම බිඳ වැටිලා නම්, ඒක පවතින්නේ නැත්නම්, උක් වගා කර, වගා කළ උක් ටික විකුණා ගන්න තැනක් නැත්නම්, ඔවුන්ට ආදායමක් නැත්නම් ඔවුන්ට කරන්නට තිබෙන එකම දෙය වෙනත් විකල්ප භෝග සඳහා මාරු වෙන එක පමණයි.

රජය ඒ ගැන සෙව්වේ නැත්නම්, අදාළ සමාගම් ඒ ගැන සොයා බැලුවේ නැත්නම් අනිවාර්යයෙන්ම වෙනත් විකල්ප වගාවන්ට යන්නට ඒ ගොවි ජනතාවට සිද්ධ වෙනවා. ඒ අනුව තමයි බොහෝ ගොවීන් ඒ තමන්ගේ අක්කර දෙකහමාර බිම් කොටසේ වී වගාව ආරම්භ කළේ. ඇත්තටම වී වගාව ආරම්භ කරන්න විශාල වෙහෙස මහන්සියක් දරන්න වුණා. ඒ බිම් නැවත අලුතෙන් සකස් කරන්න සිද්ධ වුණා. එහෙම අමාරුවෙන් සකස් කර තමයි කුඹුරු හදලා වී වගාවට මාරු වුණේ. එහෙම වී වගාව කර ගෙන ආ ගොවීන්ට අලුතෙන් මේ ඇති කර තිබෙන ගල්ඔය වැවිලි පෞද්ගලික සමාගම දැන් බලපෑම් කරනවා, වී වගාවෙන් ඉවත් වෙලා උක් වගාව කරන්නය කියා. අද වෙනකොට සමාගම මගින් ඒකපාක්ෂික ගිවිසුමක් හදා තිබෙනවා. ඒ ඒකපාක්ෂි ගිවිසුමේ වගන්ති, කොන්දේසි කිසිවකට ගොවීන් කම්කරුවන් එකඟවෙලාත් නැහැ. ඔවුන්ට ගිවිසුම පෙන්වලාත් නැහැ. පෞද්ගලික සමාගම පැත්තෙන් හදපු මේ ගිවිසුම මත ඉඳ ගෙන අනිවාර්යයෙන්ම මේ ගොවීන්ට උක් වගාව පමණක් කරන්නටය කියා බලපෑම් කරනවා.

මෙතෙක් ඇත්තටම රජය මේ පිළිබඳව නිවැරදිව මැදිහත් වීමක් සිද්ධ කර නැහැ. මේ පිළිබඳව විවිධ සාකච්ඡා තිබිලා තිබෙනවා, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, රජයේ නිලධාරින් අතර. නමුත් අවසානයේදී ඒ කිසිදු මැදිහත් වීමකදී ඒ ගොවීන්ට සහනයක් අත් වන ක්‍රියා මාර්ගයකට අවතීර්ණ වෙලා නැහැ. එම නිසා තමයි අද මේ ගොවි පවුල් 5000කට වැඩි ප්‍රමාණයක් තමන්ගේ ජීවනෝපාය මාර්ගය පවත්වා ගෙන යන්නට බැරි අසීරු තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ. අද වෙනකොට මේ සමාගම මැදිහත් වෙලා ඒ ගොවීන්ව බලහත්කාරයෙන් උක් වගාව කරන තැනට ගේන්න උත්සාහ කරනවා. සමහර මැර කණ්ඩායම් යොදවා පහර දීම් පවා කර තිබෙනවා. මා ළඟ තිබෙනවා ඒ පිළිබඳ ඡායාරූප. මේ ඡායාරූපවල පැහැදිලිව තිබෙන්නේ මේ ආයතනය මගින් විවිධ මැරයන් පොලු මුගුරු අරගෙන ගිහින් පොලීසිය බලාගෙන ඉන්දැද්දී ගොවීන්ට පහරදීලා "උක් වගා කරපල්ලා" කියා බලපෑම් කරන හැටියි.

අපේ රටේ සහල් නිෂ්පාදනය ගැන අද කථා කරනවා. ආසියාවේ ආශ්චර්යය කරන්නට කථා කරනවා. මට මතකයි, දකුණු ආසියානු සමුළුව වෙලාවේ ශ්‍රී ලංකාව තුළ සහල් ගබඩාවක් ඇති කරන්නට කථා කළා; විවිධ ප්‍රවෘත්ති නිර්මාණය කළා. ලෝකයට පරකාස කරලා අවසානයේදී ගෙදර තිබෙන තත්ත්වය මේකයි. මොකක්ද? ඒ වී වගා කරන ගොවි ජනතාව එතැනින් බලහත්කාරයෙන් ඉවත් කරන්න මැර කණ්ඩායම් යෙදා ගෙන පහරදීම් සිද්ධ කරනවා. ඒ කුඹුරුවලට අවශ්‍ය කරන ජලය ලබා දෙන ඇළ මාර්ග මේ ආයතනයේ මැර කණ්ඩායම් ගිහින් බලහත්කාරයෙන් බැකෝ යන්ත්‍ර දාලා වහලා තිබෙනවා. ඒ ඇළ වේළි වහලා ඒ ජල මාර්ගයේ තිබෙන ගේට්ටු ඉබි යතුරු දාලා වහලා, ඒවාට පස් දාලා වහලා ඒ ගොවීන්ට තමන්ගේ කුඹුරු කරන්නට තිබෙන වතුර ටික ලබා දෙන්නේ නැති තත්ත්වයකට පත් කර තිබෙනවා.

බැකෝ යන්ත්‍ර යොදලා ඒ ප්‍රදේශයේ ගොවි බිම් මුළුමනින්ම විනාශ කරන තත්ත්වයක් අද මේ ගල්ඔය වැවිලි සමාගම මඟින් ඇති කරමින් තිබෙනවා. එහෙම දේවල් කරමින්, ගොවීන්ට පහර දෙමින්, ගොවීන්ගේ කුඹුරුවල වගාව සම්පූර්ණයෙන්ම විනාශ කරන තත්ත්වයට මේ ගල්ඔය වැවිලි සමාගම මැදිහත් වෙද්දී, රජය ඊට කිසිදු මැදිහත් වීමක් නැතුව ඉන්නවා. දැන් රජයේ ප්‍රතිපත්තිය විය යුත්තේ මොකක්ද? රජයේ ප්‍රතිපත්තිය විය යුත්තේ මීට අවුරුදු 31කට කලින් ඒ ප්‍රදේශයේ බිම් උක් වගාවට දුන්නා නම්, අවුරුදු 31ක් තිස්සේ ඒ ගැන බලන්න බැරි වුණා නම්, මේ වන කොට ඒ බිම් වී වගාව සඳහා භාවිත කරනවා නම්, අඩුම ගණනේ ඒ පිළිබඳව සලකා බලලා අලුත් තීන්දුවක් ගන්න; වෙනස් තීන්දුවක් ගන්න දැන් රජයට වග කීමක් තිබෙනවා, යුතුකමක් තිබෙනවා. නමුත් එහෙම තීන්දුවක් ගත්තේ නැහැ. 2006 ගල්ඔය වැවිලි සමාගමට මේ ඉඩම් පවරන කොට ඒ අය බැලුවේ ලාභය විතරයි. ඔවුන්ට ලැබෙන ලාභය ගැන විතරයි කල්පනා කළේ. රුපියල් මිලියන 502කට මෙය ඉල්ලුම් කරද්දීත් ආණ්ඩුව මොකද කළේ? ආණ්ඩුව කිසිදු ටෙන්ඩර් පටිපාටියකින් තොරව මේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 277ක් පවරලා දුන්නා ගල්ඔය වැවිලි සමාගමට. LOLC සමාගම රුපියල් මිලියන 495කට ලබා ගන්න එකඟතාවකට ගියා. අන්තිමට මොකද වෙලා තිබෙන්නේ? මේ ආයතනවලට පළමුවැනි අවස්ථාවේ රුපියල් මිලියන 50ක ණයක් දීලා තිබෙනවා. ඊ ළඟ අවස්ථාවේ මහ භාණ්ඩාගාරය මැදිහත් වෙලා රුපියල් මිලියන 750ක ණයක් අරගෙන දුන්නා. මේවා රටේ සල්ලි; රටේ ජනතාවගේ සල්ලි. ජනතාවගේ සල්ලි මේ කොම්පැනිවලට දීලා, කොම්පැනිවලට ණය අරගෙන දීලා ඒ හරහා ගොවීන්ට අද බලපෑම් කරනවා, මේ ගොවි බිම්වලින් වහාම ඉවත් වෙන්න කියලා. අද ඒ ප්‍රදේශයේ ගොවීන්ට බලපෑම් කරලා මොකක්ද කියන්නේ? "අනිවාර්යයෙන්ම උක් වගාව කරන්න. ඒ උක් වගාවේ අස්වැන්න මෙට්‍රික් ටොන් එකක් රුපියල් 3,000 ගණනේ ගන්නවා" කියලා දැන්වීම් පළ කළා. රුපියල් 3,000 සිට ඉහළට, රුපියල් 3000, 3100, 3800 දක්වා. මේක තමයි ගොවීන්ට ඉස්සර වෙලා දීපු පොරොන්දුව. "දිරියෙන් ඉදිරියට යන ඔබට සවිමත් අත්වැලක් වන්නට ගල්ඔය වැවිලි සමගම දැන් සූදානම්." රජයට මේ සමාගමේ සියයට 51ක් අයිති නම් රජයට මේ වග කීමෙන් ගැළවෙන්න බැහැ. මේ වගකීම පුද්ගලික සමාගමට විතරක් පවරලා ඉන්න බැහැ. මේ දැන්වීමෙන් ගොවීන්ට දුන්නු පොරොන්දුව මොකක්ද? රුපියල් 3000 සිට 3800 දක්වා උක් මෙට්‍රික් ටොන් එකක් ගන්නවා. ඒ නිසා භය නැතුව උක් වගාවට එන්න කිව්වා. නමුත් 2011 අගෝස්තු මාසයේ 03 වැනිදා-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසන් කළ යුතුයි. දැන් මිනිත්තු 15 අවසන්.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

අගෝස්තු මාසයේ 03 වැනිදා අලුත් දැන්වීමක් දාලා තිබෙනවා, මිල රුපියල් 2,565ක් කියලා. ඒ නිසා මේ ගොවීන් උක් වගා කළත් ගන්න පුළුවන් වාර්ෂික ලාභය වෙන්නේ රුපියල් 44,000යි; මාසයකට රුපියල් 3,666යි. රුපියල් 3,666ක් ලාභ ගන්න උක් වගා කරලා මාස 12ක් යනවා එළදාව එන්න. ඒ මාස 12 ඇතුළේ ඔවුන්ට කිසිදු ආදායමක් නැහැ. ඔවුන්ට ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ. ඒකට මැදිහත් වීමක් නැහැ. ඒ නිසා මම රජයට අවධාරණය කරනවා, රජයෙන් ඉල්ලා සිටිනවා, වහාම මේ ගොවීන්ට ඒ අවශ්‍ය කරන ණය පහසුකම් දෙන්න, ඒ ඉඩම් කට්ටි සඳහා රක්ෂණ ක්‍රමයක් දෙන්න, අඩුම ගණනේ මේ කන්නයේ වී වගාවට ඉඩ ලබා දෙන්න, රජය වහාම මැදිහත් වෙලා ඒ අහිංසක ගොවීන්ගේ වී ගොවිතැන ආරක්ෂා කරන්න මැදිහත් වෙන්න කියලා. මේ පුද්ගලික සමාගම් එක්ක තිබෙන ගිවිසුම් අහෝසි

කරලා හෝ පවුල් 5,000ක් වන ගොවි ජනතාවගේ අයිතිය ආරක්ෂා කරලා දෙන්න වහාම මැදිහත් වෙන්න, කඩිනම් පියවර ගන්න කියලා බල කරනවා. මේ අවස්ථාවේදී ඒ සඳහා මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිමින් මා නතර වෙනවා.

**ගරු අබ්දුල් හලීම් මහතා**
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කල් තැබීමේ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව මම ඉතාම කෙටියෙන් කරුණු කිහිපයක් සඳහන් කරන්න කැමැතියි. එතුමා සඳහන් කළා වී වගාව නැති කරලා උක් වගාව කරන්න රජය කටයුතු කරනවා කියලා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මේ වන කොට අපේ රටේ වී වගාව සඳහා අවශ්‍ය බිම් ප්‍රමාණය තිබෙනවා විතරක් නොවෙයි, උතුරු නැඟෙනහිර ත්‍රස්තවාදයෙන් බේරා ගත්තාට පස්සේ ඒ ප්‍රදේශවලත් විශාල වශයෙන් වී වගා කරන්න පුළුවන් ඉඩම් ප්‍රමාණයක් අද වැඩි දියුණු කරමින් පවතින බව.

පසු ගිය මාස් කන්නයට වඩා වැඩි ඉඩම් ප්‍රමාණයක් දැන් වැඩි දියුණු කරමින් පවතිනවා. 2010, 2011 මාස් කන්නයේදී විශාල ගංවතුරක් ඇවිල්ලා දිස්ත්‍රික්ක කිහිපයක් වතුරෙන් යට වුණා. විශේෂයෙන්ම මඩකළපුව, ත්‍රිකුණාමලය, අම්පාර, පොළොන්නරුව සහ අනුරාධපුර දිස්ත්‍රික්ක. ඒ ගංවතුරෙන් වගාවට හානි සිදු වුණා. එහෙම වෙලාත් අපේ රටේ සහල් අතිරික්තයක් තිබෙනවා. විශේෂයෙන්ම උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ පසු ගිය කන්නයට වඩා මේ කන්නය වන විට වී වගා කරන්න තිබෙන භූමි ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම අපි නොයෙකුත් වාරි මාර්ග ව්‍යාපෘති යටතේ වී වගාව සඳහා අලුතින් කුඹුරු අස්වැද්දීම් සිදු කරනවා. අපිට අවශ්‍ය සහල් ප්‍රමාණය නිෂ්පාදනය කර ගන්න පුළුවන් ඉඩම් ප්‍රමාණයක් අපට තිබෙනවා.

නමුත් අපට අවශ්‍ය සීනි පිට රටින් ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙනවා. කන්තලේ තිබුණු විශාල සීනි කර්මාන්තශාලාව එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ විනාශ කර දමා තිබෙනවා. ඒ නිසා අපේ රටට අවශ්‍ය සීනි ප්‍රමාණයෙන් ඉතාම සොච්චමක් තමයි නිෂ්පාදනය වන්නේ. අපේ රටේ සීනි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා උක් වගාවට යම් කිසි බිම් ප්‍රමාණයක් වෙන් කරන්න ඕනෑ. ඒ වාගේම මිරිස්, කවුපි මුං ඇට වාගේ අතුරු භෝග - විදේශවලින් ගෙන්වන දේවල්- අපේ රටේම නිෂ්පාදනය කර ගන්නත් මේ රටේ භූමි භාගයක් වෙන් කිරීමට සිදු වනවා. එතකොට තමයි රටේ නිෂ්පාදනවල සමතුලිත තත්ත්වයක් ඇති වන්නේ. මේ සම්බන්ධව දයාශ්‍රිත තිසේරා ඇමතිතුමා සමඟත් නියෝජ්‍ය ඇමතිතුමා සමඟත් මම සාකච්ඡා කළා. එතුමන්ලා ඒ පිළිබඳව අධීක්ෂණය කර තිබෙනවා; විමර්ශනය කර තිබෙනවා. උක් වගාවෙන් වැඩි ආදායමක් ලැබෙන නිසා ඒ ප්‍රදේශවල ගොවි මහත්වරු විශාල පිරිසක් උක් වගා කරන්න කැමැතියි කියා ඒ අනුව අපට දැන ගන්න ලැබුණා. වී වගාවට යන ජල ප්‍රමාණයම උක් වගාව සඳහා යොදන්න අවශ්‍ය වන්නේ නැහැ. උක් වගාව අහස් වැස්සෙනුත් කරන්න පුළුවන්.

නමුත් ඒ විධියට වී වගාව කරන්න බැහැ. ඒ නිසා අපි උක් ගොවියාට අවස්ථාව දෙන්න ඕනෑ. සහල් අතිරික්තයක් නැත්නම් අපේ සහල් නිෂ්පාදනයේ අඩුකමක් තිබෙනවා නම් ඇත්තටම අපි වී වගාව සඳහා වැඩි භූමි ප්‍රමාණයක් යොදවන්න ඕනෑ. නමුත් මා වග කීමෙන් යුතුව කියනවා, දැනටත් අපේ රටේ වී අතිරික්තයක් තිබෙනවා බව; සහල් අතිරික්තයක් තිබෙන බව. 2011, 2012 මාස් කන්නයත් ඉතාම සාර්ථකව කෙරීගෙන යනවා. ඒ සහල් අවශ්‍යතාව සම්පූර්ණ වන විට වෙනත් වගා සඳහා ඉඩම් වෙන් කළාට ප්‍රශ්නයක් වන්නේ නැහැ. ඒ ප්‍රදේශවල ගොවීන් සුළු පිරිසක් ඒකට විරුද්ධ වන්න පුළුවන්. නමුත් බහුතරයක් උක් වගාවට කැමැතියි කියන එක අපට දන්වා තිබෙනවා.

අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට -වී වගාව සඳහා බිම් ප්‍රමාණයක් වෙන් කරන්න ඕනෑ, ඒක ආරක්ෂා කරන්න ඕනෑ කියන යෝජනාවට- මාත් එකඟ වනවා. නමුත් අද තිබෙන තත්ත්වයේ හැටියට අපට වෙනත් වගාවලට බිම් ප්‍රමාණයක් වෙන් කරන්න සිදු වනවා. එහෙම වෙන් වුණාට ප්‍රශ්නයක් නැහැ කියන එකයි මගේ මතය වන්නේ. මා මීට වඩා දුර කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. බොහොම ස්තුතියි.

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரத் குமார குணரத்ன - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Sarath Kumara Gunaratne - Deputy Minister of State Resources and Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරන්නත් තමුන්ගේ කෙනෙක් නැතිව, වී වගාවක් ගැන දන්නේ නැති මන්ත්‍රීවරයෙක් බොහොම අමාරුවෙන් මේ යෝජනාව ස්ථිර කරලා එතුමාත් එළියට ගියා. කෙසේ හෝ වේවා ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කියා තිබෙන කාරණා පිළිබඳව අපේ සම්පූර්ණ අවධානය යොමු කරනවා. නමුත් අර "බල කරමින්" කියන වචනය තමුන්නාන්සේලාගේ පක්ෂයේ වචනයක් විධියට තමයි යෝජනාවට දමන්න ඇත්තේ. එහෙම බල කිරීමක් අපි කවදාවත් කරන්නේ නැහැ. මා පී. දයාරත්න ඇමතිතුමාත් එක්ක ගිහින් ගොවීන් එක්ක සාකච්ඡා කරලා ඒ ගොවීන්ට අවශ්‍ය කරන සම්පූර්ණ සහාය ලබා දුන්නා. වී වගාවට අවශ්‍ය කරන සහනාධාර දීලා, සහාය දීලා, මුදල් ආධාර දීලා, බිම් සකස් කරලා, අවශ්‍ය කරන සියලුම දේ දීලා ගොවීන් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. ඔබතුමා කියන මැර ක්‍රියා නොවෙයි. ඒ කාලයේ ගොවි ජන සේවා මධ්‍යස්ථාන කඩලා, බස් ගිනි තියලා විනාශ කළා. තමුන්නාන්සේලාගේ ඒ අතීතයට අපි යන්නේ නැහැ. ගරු ඇමතිතුමාත්, මමත් පොරොන්දු වුණා. යම් කිසි විධියකින් කවුරු හෝ අර වාගේ දාමරික ක්‍රියා කරලා තිබෙනවා නම්, ඒ පිළිබඳව මම ඉතා කනගාටු වෙනවා. අපි මේ සතියේ සියලු දෙනාම සාකච්ඡාවකට කැඳවලා තිබෙනවා. එහෙම දාමරික ක්‍රියා කරන්න අපි කවදාවත් ඉඩ දෙන්නේ නැහැ. මේ වන විට තමුන්නාන්සේලාට ඔවා කියලා මිනිසුන්ව අවුස්සන්නත් බැහැ. පොළොන්නරුවේ ගොවීන් තමුන්නාන්සේලාට විරුද්ධව ඡන්දය දුන්නා. ගොවි ජනතාව ඡන්දය දුන්නා. තමුන්නාන්සේලාට පාඩම් උගන්වලා ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට අතිගරු ජනාධිපතිතුමා මේ සීනි කර්මාන්තශාලාව ගොඩ නඟන්න අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. පෞද්ගලිකරණයක් නොවෙයි කරලා තිබෙන්නේ. සියයට 51ක් අපි ගාව තියා ගෙන සියයට 49ක් දීලා තිබෙනවා. ඒ නිසා මම තමුන්නාන්සේට පැහැදිලිව කියනවා, පෞද්ගලීකරණය කියන වචනය අපේ මහින්ද චින්තනයේ නැහැ කියලා. ඔබතුමා කියපු එක ඇත්ත. එක්සත් ජාතික පක්ෂ රජයෙන් මේක දුන්නා. ඒ ව්‍යාපාරිකයා මේක විනාශ කරලා පැනලා ගියා.

[ගරු සරත් කුමාර ගුණරත්න මහතා]

අවසානයේදී කැබිනට් තීරණයක් මත නැවත පවරා ගෙන, සියයට 51ක් අපි ළඟ තබා ගෙන දීලා තිබෙනවා. එහිදී යම් වැරැද්දක් වෙනවා නම් ඒ ගැන සොයා බලන්න ගරු ඇමතිතුමාත්, මාත් ඉන්නවා. මම ගරු දායාරත්න ඇමතිතුමා සමඟත් සාකච්ඡා ගණනාවක් කළා. මේ ඉඩම් දීලා තිබෙන්නේ වී වගාවට නොවෙයි, උක් වගාවටයි. නමුත් මෙතැනදී සිදු වුණ බිඳ වැටීමත් සමඟ ඒ අය වී වගාවට පුරුදු වුණාට අපි බාධා කළේ නැහැ. මෙතැනදී බාධා කිරීමකින් තොරව අපි ඒ අයට දුන්නා. ඒ දීපු සමහර ඉඩම් මේ වන විට වෙනත් අයට විකුණලා තිබෙනවා. ඒ අයව අයින් කිරීමට යම් කිසි නීතියමය ක්‍රියා මාර්ගයක් ගන්න සිදු වෙලා තිබෙනවා. මොකද, උක් වගාවට අවශ්‍ය කරන වතුර ප්‍රමාණය වී වගාවට හැරවුණොත් ප්‍රශ්නයක් ඇති වෙනවා. උක් වගාවට වඩා වතුර ප්‍රමාණයක් වී වගාවට යනවා. එතකොට ගොවීන්, ගොවීන් අතරත් විශාල අර්බුදයක් ඇති වෙනවා. ඒ නිසා ගොවීන්, ගොවීන් අතරේ අර්බුදයක් ඇති නොවී, වී වගාව කරන ගොවීන්ට වී වගාවට අවශ්‍ය කරන සහනය ලබා දීලා තිබෙනවා. මේ වන විට උක් වගාවට නියමිත ඉඩම් සම්බන්ධව ඒ අයට පැහැදිලි කරලා දීලා, ඒ සකස් කළ බිම් නැවත සකස් කරලා, අත්තිකාරම් මුදලක් දීලා අවශ්‍ය කරන සෑම දෙයක්ම කරන්න වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. Brown and Company PLC එක සහ LOLC කියන්නේ ලංකාවේ ප්‍රසිද්ධ සමාගම්. නමුත් ඒ අය හෝ යම් කිසි වැරදි ක්‍රියාවක් කරනවා නම් ඒ පිළිබඳව ක්‍රියා කරන්න ගරු ඇමතිතුමා ඕනෑම වෙලාවක සූදානම් වෙලා ඉන්නවා, සෙවනගල පවරා ගත්තා වාගේ.

මම ඔබතුමාට සෙවනගල ගැන කියන්න කැමැතියි. පසු ගිය කාලයේ වගා කළ උක් සෙවනගලට ගෙනිච්චාම ගන්නේ නැතිව හරවලා එව්වා. ඒ වාගේ ප්‍රශ්න ගණනාවක් ආවා. ඒ නිසා තමයි සෙවනගල පවරා ගන්න තීරණය කළේ. අර විධියටම උක් වගාව කඩා වැටිලා, උක් වගාව සම්පූර්ණයෙන්ම ලංකාවෙන් විනාශ වෙයි කියන කාරණය උඩ තමයි මේ වෙලාවේ සෙවනගල පවරා ගන්න අපි තීරණය කළේ.

අපේ ගරු චන්ද්‍රසේන ඇමතිතුමා කිව්වා වාගේ රටට අවශ්‍ය කරන සීනි නිපදවන්න උක් වගාව ලංකාවට අවශ්‍ය කරනවා. මේ වන විට ඒ දීපු ඉඩම් උක් වගාව සඳහා නීතිමය තත්ත්වයෙන් බැඳිලා. ඔබතුමා කියන්නා වාගේ කට්ටි විධියට වී වගාවට යොමු කරලා තිබෙන ඉඩම් නැවත උක් වගාවට යොමු වෙන්න ඕනෑ. ඒක ඔබතුමන්ලා කියනවා වාගේ "ඡන්දය දාන්න යන්න එපා, එහෙම කළොත් අත කපනවා "වාගේ බල කිරීමක් නොවෙයි; යොමු කිරීමක්. බල කිරීම කියන වචනය වෙනුවට එතැනට යොමු කිරීම කියන වචනය දා ගන්න. ඒ යොමු කිරීම කරන්න අවශ්‍ය සෑම දෙයක්ම අපි මේ වන විට සූදානම් කරලා තිබෙනවා. අපේ ගරු චන්ද්‍රසේන ඇමතිතුමා කිව්වා වාගේ ඒ යොමු කිරීම තුළ කිසිම දවසක ගරු ඇමතිතුමාවත්, මමවත්, අතිගරු ජනාධිපතිතුමාවත් ගොවියාව අතර මං කරන්නේ නැහැ. ඒ නිසා තමයි ගොවියා අපට ඡන්දය දුන්නේ. ඒ නිසා තමයි ඒ කාලයේ ජනතා විමුක්ති පෙරමුණ විසින් මුළා කරලා යම් යම් දේවලට යොමු කළ ගොවීන් තමුන්නාන්සේලාට විරුද්ධව ඡන්දය දුන්නේ. මේ වාගේ දේවල්, තමුන්නාන්සේලා වාගේ දාමරිකකම් කරලා, තමුන්නාන්සේලා වාගේ ගොවි ජන සේවා මධ්‍යස්ථාන ගිනි තියලා, ඒ වාගේ බල කිරීම් කරලා කරන්න පුළුවන් ක්‍රියාවන් නොවෙයි. ගරු ඇමතිතුමාත්, මමත්, ගරු චන්ද්‍රසේන ඇමතිතුමාත්, අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් ගොවීන්ට ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ ප්‍රශ්නය විසඳන්න සූදානම්. ඔබතුමා කියනවා වාගේ යම් කිසි අසාධාරණයක් වෙලා තිබෙනවා නම් ඒවා විසඳන්න අපි සූදානම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපට අවශ්‍ය වන්නේ ප්‍රදේශයේ ගොවි ජනතාවත් එක්ක මේ සීනි කර්මාන්තශාලාව ගොඩ නඟන්නයි. මේ වන විට කර්මාන්තශාලාවේ ඔක්කොම machines කඩාකප්පල්කාරින් විසින් කඩලා, යකඩ විකුණලා, විනාශ කරලා. මේක ගත්ත ව්‍යාපාරිකයා ලංකාවෙන් පැනලා ගිහිල්ලා. ඒ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබුණා. ඉන් පසුව තමයි මේක යථා තත්ත්වයට පත් කරන්න සිදු වුණේ.

අපේ ගරු දයාශ්‍රිත ඇමතිතුමායි, මමයි, රටට ධන සම්පත් ගෙන ඒමේ අරමුණින් මේ වාගේ සියලුම වැටිච්ච ආයතන ගොඩ නඟන වැඩ පිළිවෙළක් භාර අරගෙන තිබෙනවා. මේ වන විට ලංකා පොස්පේට් සමාගම සහ ලංකා ඛනිජ වැලි සමාගම විශාල ලෙස දියුණු වෙලා තිබෙනවා. අපි විශාල මුදල් සම්භාරයක් භාණ්ඩාගාරයට සපයනවා. අපි ඉදිරි අනාගතයේදී කන්තලේ සීනි කර්මාන්තශාලාව දියුණු කරන්න විශාල වැඩ පිළිවෙළක් යොදලා තිබෙනවා. මේ වන විට ආයෝජකයෝ ඇවිල්ලා තිබෙනවා. ඒවාත් අපි බදු ක්‍රමයට දෙනවා. මහින්ද චින්තනය යටතේ බදු ක්‍රමය තුළින් මේවා ගොඩ නඟන්න අපට අවශ්‍යයි. අපි කර්මාන්තශාලාවක් ගොඩ නඟන්න ආයෝජකයකුට දෙන කොට ඒ කර්මාන්තශාලාවේ වැඩ කළ හැම සේවකයෙකුටම සාධාරණයක් ඉටු කරනවා. අපි අනිද්දාට කඩදාසි කර්මාන්තශාලාවේ සියලු දෙනාටම හිමිකම් දීමනා සියල්ලම ප්‍රදානය කරනවා. එක් අයෙකුට විශාල මුදල් සම්භාරයක් ලැබෙනවා. අපි කවදාවත් අපේ කම්කරුවන්, ගොවියන් අතර මං කරන්නේ නැහැ.

ප්‍රශ්න තිබෙන කොට අපත් එක්ක විවෘතව කථා කරන්න. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මම කිව්වා, "විජිත හේරත් මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරන්න කෙනෙක් නොසිටියා නම් ඒ යෝජනාව මම ස්ථිර කරන්නම්" කියලා. හොඳ යෝජනාවලට ඒ තරම් සහයෝගය දෙන්න ලැහැස්තියි. නමුත් කඩාකප්පල්කාරී ක්‍රියාවලට අපි කවදාවත් ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා ගොවීන්ව කලබල කරලා පාරට බස්සන්න එපා. ගොවීන්ගේ ප්‍රශ්න විසඳන්න සුහදව සාකච්ඡා කරන්න අපි හැම වෙලාවේම සූදානම් වෙලා ඉන්නවා. යම්කිසි අසාධාරණයක් වනවා නම්, දාමරික ක්‍රියාවක් සිදුවනවා නම් ගරු ඇමතිතුමාත් මමත් ඔබත් එක්ක එකතු වෙලා ඒක විසඳන්න සූදානම්. කිසිම විධියකින් අපි බල කිරීමක් කරන්නේ නැහැ.

ගොවියාව නැවත උක් වගාවට යොමු කරවන්න අවශ්‍යයි. උක් වගාවෙන් තමයි වී වගාවට වඩා වැඩි ආදායමක් ලැබෙන්නේ. අපි ඒක සම්පූර්ණයෙන් ගොවීන්ට පෙන්නුම් කර දී තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කරන සහාය ඉදිරි අනාගතයේදී දෙන බවට අපි පොරොන්දු වෙමින් යම්කිසි අසාධාරණයක් වනවා නම් ඒකටත් අවශ්‍ය වැඩ පිළිවෙළක් සඳහා ගරු ඇමතිතුමාගේ කථාවේදී ප්‍රතිඥාවක් දෙයි කියා කියමින් මම නිහඬ වනවා.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில் முயற்சி அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අදාළ හිඟුරාන සීනි කර්මාන්තශාලාව 1993 පෞද්ගලීකරණය කරලා, 1996 වෙද්දී ඒ ආයෝජකයා මේ කර්මාන්තශාලාව අත හැර ගොස් තිබුණු ආයතනයක්. උක් වගාව සම්පූර්ණයෙන්ම විනාශ කරලා දමලා තිබුණු භූමි ප්‍රමාණයක් තමයි මේ ස්ථානය තුළ දැක ගන්න තිබුණේ. මේ වෙද්දී ඒ ආයතනයේ කොටස්වලින් සියයට 51ක් රජයටත්, සියයට 49ක් ලංකා ඔරික්ස් ලීසින් කම්පැනි ලිමිටඩ් ආයතනයට සහ බ්‍රවුන් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් ආයතනයට ලබා දීලා, ඒ උදවිය ගරු

මන්ත්‍රීතුමනි, ඒ කර්මාන්තශාලාව ගොඩ නඟලා එන වර්ෂයේදී ඒ කර්මාන්තශාලාව ආරම්භ කිරීමට කටයුතු කරනවායි කියලා අපට දැනුම් දීලා තිබෙනවා. ඒ වාගේම ඒ උදවියට කර්මාන්තශාලාව ආරම්භ කිරීමට උපදෙස් ලබා දීලා 2012 දක්වා කාලය ලබා දී තිබෙනවා. ඒ වාගේම 2012 දී කර්මාන්තශාලාව ආරම්භ කරන්නේ නැත්නම් අපි නීතිමය පියවර ගන්නවායි කියන අවසන් ලිපියත් යවලා තිබෙනවා.

මේ වෙද්දී ගොවීන් හමු වෙලා, ගොවීන් සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. කාලයක් ඒ ගොවීන් වී ගොවිතැනේ සිටිය බව ඇත්ත. නමුත් මේ කර්මාන්තශාලාව ආරම්භ වෙද්දී මේ භූමි භාගය ඒ උදවියට බලපත්‍රයකින් ලබා දීලා තිබෙන්නේ උක් වගා කරන්න. ඒ නිසා ඒ උදවියට යම් සහන ලබා දීලා ඒ උදවියව උක් වගා කළ ඒ භූමි තුළ නැවත උක් වගා කිරීමේ වැඩ පිළිවෙළ සඳහා යොමු කර ගැනීමට කටයුතු කිරීමට රජය මැදිහත් වනවා. ඒ ගොවි මහත්ම මහත්මීන් හම්බ වෙලා අපි සාකච්ඡා කළා. මේ කර්මාන්තශාලාව ආරම්භ කරනවා නම් කැමැතියි කියන එක තමයි ඒ උදවියගෙන් හුඟක් දෙනෙක් මීට මාස අටකට වාගේ ඉහතදී අපි ගියාම අපට ප්‍රකාශ කළේ. එන වර්ෂයේදී මේ කර්මාන්තශාලාව අනිවාර්යයෙන්ම ආරම්භ කිරීමට නියමිතව තිබෙනවා. ඒ වාගේම ආරම්භ කරන්නේ නැත්නම් කිව්ව ආකාරයට, මේ වෙද්දී යවලා තිබෙන ලිපිය අනුව කටයුතු කිරීමටත් සැලසුම් සකස් කරනවා.

මේ වෙද්දී උක් වගා කිරීමේ වැඩ පිළිවෙළවල් ආරම්භ කරලා හෙක්ටයාර් 850ක් පමණ උක් වගා කරලාත් තිබෙනවා. ඒ නිසා එන වර්ෂයේදී ඒ උක්වලින්ම තවත් ප්‍රදේශයක් වගා කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා මේ රටට අවශ්‍ය සීනි ප්‍රමාණය නිෂ්පාදනය කිරීමට සැලසුම් සකස් කිරීමට තමුන්නාන්සේලාගේ සහයෝගය, ශක්තිය අපට ලැබුණොත් හොඳයි ගරු මන්ත්‍රීතුමා. මේවා අපේ රට තුළ තිබුණු දැවැන්ත කර්මාන්තශාලාවල්. ඒවා යම් යම් යුගවල කඩා වැටිලා තිබෙනවා. මම කැමැති නැහැ, එක එක්කෙනාට ඇඟිල්ල දික් කරන්න. අද තිබෙන තත්ත්වයෙන් මේ කර්මාන්තශාලා ගොඩ ගැනීමට යම් වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. වග කිව යුතු රජයක් හැටියට අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය සාර්ථක කිරීමට අපි සැවොම ඒක රාශි වෙලා, මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න දූවා දරුවන් වෙනුවෙන්, එදා ශක්තිමත්ව තිබිලා අද වැටී තිබෙන මේ කර්මාන්තශාලා ගොඩ නැඟීමට ඒ කර්මාන්ත සහ ඒ ගොවිතැන් ගොඩනැඟීමට අපි කටයුතු කරමු.

***එකල්හි වේලාව අ. භා.6.30 වුයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2011 නොවැම්බර් මස 08 වන දින සභා සම්මුතිය අනුව, 2011 නොවැම්බර් මස 29 වන අඟහරුවාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி. ப. 6.30 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2011 நவம்பர் 08 ஆந் திகதிய தீர்மானத்திற்கிணங்க, 2011 நவம்பர் 29, செவ்வாய்க்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 6.30 p.m., MR. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 9.30 a.m. on Tuesday, 29th November, 2011, pursuant to the Resolution of Parliament of 08th November, 2011.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

1 වන ප්‍රශ්නය - 1451/'11

2 වන ප්‍රශ්නය - 1452/'11

3 වන ප්‍රශ්නය - 1453/'11

4 වන ප්‍රශ්නය - 1454/'11

5 වන ප්‍රශ්නය - 1455/'11

6 වන ප්‍රශ්නය - 1456/'11

7 වන ප්‍රශ්නය - 1457/'11

8 වන ප්‍රශ්නය - 1458/'11

9 වන ප්‍රශ්නය - 1459/'11

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ඉහත අංක දරන ප්‍රශ්නවලට පිළිතුරු දීමට සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා මාස තුනක් කල් ඉල්ලා ඇත.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.